සාධු දැක්ම
The Excellent View

10

විශ්වීය අනුපමේය නායකත්වය
The Supreme Leadership of the Universe
(Based on the Noble Triple Gem)

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

සාධු දැක්ම ~ 10

{The Excellent View}

විශ්වීය අනුපමේය නායකත්වය

The Supreme Leadership of the Universe

(Based on the Noble Triple Gem)

IN

PALI

SINHALA

&

ENGLISH

LANGUAGES

BY

Kiriwattuduwage Seetha Nandanie Goonetilleke
(Director of Parents Memorial Scholarship Foundation)
011 2 877950

(වෙසක් පුර පසළොස්වක පෝය නිමිත්තෙනි)

© කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

ISBN -978-955-50082-7-3

පළමුවන මුද්‍රණය 2023

බුද්ධ වර්ෂ 2567

විශ්වීය අනුපමේය නායකත්වය The Spreme Leader of the Unive
සාධු දැක්ම The Excellent View

පිටු සැකසුම සහ මුද්‍රණය

NEO

නියෝ ග්‍රැෆික්ස් පුද්. සමාගම,
44, උඩහමුල්ල දුම්රියපළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථන: 011 2890733, 011 2820220

කර්තෘගේ වෙනත් පොත්

1. මා පිය ගුණ සමර
2. සාධු දැක්ම
3. දරිද්‍රතාව හඹා යයි
4. සුවදායක මාවතක් *A Blissful Path*
5. ප්‍රීතිමත් ජීවිතයකට මඟ
6. තුදුස් වසරක සහන් එළියක් A Moon Light of 14 years
7. සාධු දැක්ම The Excellent View②
කරණීය මෙත්ත සූත්‍රය ඇසුරෙනි
8. සාධු දැක්ම The Exczellent View③
රතන සූත්‍රය ඇසුරෙනි
9. සාධු දැක්ම The Excellent View④
ජිනපඤ්ජර සූත්‍රය ඇසුරෙනි
10. සාධු දැක්ම The Excellent View⑤
මහා මඞ්ගල සූත්‍රය ඇසුරෙනි
11. සාධු දැක්ම The Excellent View ⑥
සංහිඳියාවට මඟක් ත්‍රිවිධ රත්නය ඇසුරෙනි
12. සාධු දැක්ම The Excellent View⑦
ගිරිමානන්ද සූත්‍රය ඇසුරෙනි
13. සාධු දැක්ම The Excellent View⑧
සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙනි
14. සාධු දැක්ම The Excellent View⑨
ජය පිරිත ඇසුරෙනි

පටුන

- උත්තම පූජා 8
- ගෞරවණීය පූජා 9
- පිදුම 10
- පෙරවදන 11-12
- හැඳින්වීම 13-14
- Introduction– English 15-17
- සාධු දැක්ම – 10 18-19
- Preface 20
- කර්තෘගෙන් 21-22
- Salutation 23
- Aspiration of the Author 24
- Acknowledgement 25-26

PART 1

1.Biography of Prince Siddhartha (In Brief) 29-32

2.The treasure of the Universe 33-37
(විශ්වීය නිධානය සිංහල සාරාංශය සමඟින්)

3. How Bodhisatva Practiced 10 Perfection 38-70
(පාරමිතා 10 පිරූ අයුරු)

4. Unique Birth of Prince Siddhartha 71-75
(සිදුහත් උපත)

5. Childhood of Prince Siddhartha (සිදුහත් කුමරුගේ ළමා අවධ) 76-81

6. Renunciation (අභිනිෂ්ක්‍රමණය) 82-89

7. Enlightenment (උතුම් සම්මා සම්බුදු පදවිය) 90-99

8. Spending the 1st Seven Weeks (සත් සතිය ගත කිරීම) 100-109

9. Preaching Buddha Dhamma (බුද්ධ ධර්මය දේශනා කිරීම) 110-144

10. The vision and perceptive of Buddha (බුදු පියාගේ දැක්ම සහ අවබෝධය) 145-183

PART 2

11. බුදු පියාණන් වහන්සේගේ අපරිමිත ගුණ (Immeasurable virtuous of Buddha) 186-223

12. විනිවිද දැකිය හැකි ධර්මස්කන්ධනය (Visible Dhamma) 224-262

13. අනුගාමික සංඝ රත්න (Subsequent Disciples) 263-270

PART 3

14. සූවිසි ගුණ බලය (24 Supremacies of Triple Gem) 273-278

15. ත්‍රිවිධ රත්නයේ සත්‍ය බලය තහවුරු කරන රතනසූත්‍රය (The Jewel Discoours) 279-280

16. සඟ ගුණ බලය රතන සූත්‍රය තුළින් (Power of Sangha) 281-297

17. ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණස්කන්ධය ජීවමානයි. (Triple Gem is perceptible) 298-302

18. රත්නමාලී ගාථාත්‍රය (3 Stanzas of Rathnamaee) 303-306

19. සම්බුද්ධ පරිනිර්වාණය (The Passing away of the Buddha) 307-318

20. සම්බුදු පරිනිර්වාණයේ ත්‍රිවිධ අවස්ථා සහ ධාතු ස්ථාපනය (Three stages of Expiring & Insersion of Relics) 319-322

21. මහානිශංසය ගෙන දෙන ත්‍රිවිධ චෛත්‍ය වන්දනා සහ පූජා (Miraclous Triple Chethiya Pooja) 323-333

22. සතර අවිජහිත ස්ථාන 334-336

23. ශ්‍රී සද්ධර්මය රැකගත් අයුරු 337-341

PART 4

24. උත්තරීතර නායකත්වය (The Greatest Leadership) 344-372

- BLESSINGS to the WORLD 373
- මිනිසත් භවයේ - නිසි ඵල ලබමු. 374
- පුණ්‍යානුමෝදනා 375

උත්තම පූජා

සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා පාරමී දම් පුරමින්,
නියත විවරණ ලබා ගනිමින්, බුද්ධ රාජ්‍යයේ කිරුළු පැළඳීමේ
ඒකායන අධිෂ්ඨානයෙන් යුතුව,
සියළු රජ සැප සම්පත් අතහැර දා වනගතව,
පුරා සය වසරක්, අත්තකිලමතානු යෝගයෙන් වීර්යය වඩවා ගනිමින්,
ආර්ය පර්යේෂණයක නිරත වූ සිද්ධාර්ථ ගෞතම බෝසතාණෝ
මැදුම් පිළිවෙතට පිවිස,
ස්ව ශක්තියෙන් පහළ කොට ගත් මහා ප්‍රඥාවෙන් යුතුව,
මීට වසර 2607 කට පෙරදී දඹදිව් තලයේ බුද්ධගයාවේ දී
උත්තරීතර සම්මා සම්බුදු පදවියට පත් වීමෙන් අනතුරුව
සංසාර සාගරයේ අතරමංවී දුක් විඳිනා ලෝ සතුන් කෙරෙහි
පතළ වූ මහා කරුණාවෙන් යුතුව,
තමන් වහන්සේ විසින් අවබෝධ කර ගත්,
පරම රමණීය අමෘත මහා නිර්වාණ සුවය සාක්ෂාත් කරන්නා වූ,
නිර්මල ශ්‍රී සද්ධර්මය ඉතාමත් පැහැදිලිව දේශනා කර වදාරා
එම ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස,
සැරියුත් මුගලන් හිමියන් ප්‍රමුඛ මහා සංඝ රත්නය බිහි කළ,
තුන් ලෝකාග්‍ර වූ අසම සම වූ සම්මා සම්බුදු බුදුරාජාණන් වහන්සේගේ
ශ්‍රී නාමයට
මාගේ මෙම වෑයම පුෂ්පෝපහාරයක්ම වේවා !!!
මාගේ ස්වාමී වූ, ත්‍රිලෝක නාථ, ලොව්තුරු ගෞතම බුදු පියාණෙනි !
ගෞරව භක්ත්‍යාදරය පෙරදැරිව, ශීර්ෂප්‍රණාමයෙන් යුතුව,
බුද්ධාලම්භන ප්‍රීතියෙන්
ඔබ වහන්සේට මෙම පොත පූජා කරමි. පූජා වේවා !!!

ගෞරවණීය පූජා

මල්වතු පාර්ශවයේ, සියම් නිකායේ අනුනායක ධූරංධර,

විශ්ව කීර්ති, ශාසන ශෝභන, අති පූජනීය, ගෞරවාර්හ

නියංගොඩ විජිතසිරි ස්වාමීන් වහන්ස,

සංඝ රත්නයේ අනන්ත වූ ගුණස්කන්ධයෙන් ශෝභමානව

මුළු මහත් සමාජය ගුණ සුවඳින් බබළවන,

පරිනත බුද්ධියෙන් සමන්නාගතව තරුණ ජීවිත යහ මඟට යොමු කරවන,

ලෙළදෙන ප්‍රඥාවේ නිම්වළලු ඔස්සේ

මංමුලාවේ සිටින ලෝක ප්‍රජාවට යායුතු නිසි මග පෙන්වා දෙන,

සංඝරත්නයේ චිරස්තිථිය පිණිස දැවැන්ත කාර්ය භාරයක නියැලෙමින්

ගුණ ගරුක, සාර ධර්මවලින් පරිපෝෂණය වූ

ධර්මිෂ්ඨ, යහපත් සමාජයක් ගොඩ නැඟීමේ

සුවිශාල ශාසනික මෙහෙවරකට පූර්ණ දායකත්වයක් ලබා දෙන

ඔබ වහන්සේට,

මවිසින් සම්පාදනය කෙරෙන "සාදු දැක්ම" ග්‍රන්ථ මාලාවේ 10 වන කලඹ වූ,
සිංහල, ඉංග්‍රීසි සහ පාලි භාෂා ත්‍රිත්වයම අනුසාරයෙන් සම්පාදිත,

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ අනුපමේය නායකත්වය යථා පරිදි විදහා දැක්වෙන,

The Supreme Leadership of the Universe
විශ්වීය අනුපමේය නායකත්වය

නම් වූ මෙම සදහම් ග්‍රන්ථය

බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව පූජා කරමි.

පූජා වේවා!!!

*

පිදුම

සංසාර භව කතරේ අතරමංව සිටි මා විසින්
රැස්කර ගත්තා වූ පුණ්‍ය බල මහිමයෙන්,
මෙවන් බුද්ධෝත්පාද කාලයක
මිනිස් භවයක් ලැබීම පිණිස
මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට
අසීමිත සෙනහසකින් යුතුව
බොදු හැඟුම් මහද තුළ ජනිත කරවමින්,
මෙළොව ඉපදීමට
මා ලද භාග්‍යය සුරක්ෂිත කර දී
ලේ කිරි කර පොවා මා හදා වඩා
ගුණ නැණ බෙලෙන්ද පෝෂණය කළ
දයාබර මෑණියන් වූ විශ්‍රාමලත් විදුහල්පතිනි
ලෝරා හෙට්ටිආරච්චි මැතිණියට
සහ පඤ්චශීල ප්‍රතිපත්තීන් දිවිහිමියෙන් සුරකිමින්
ආදර්ශයෙන්ම යායුතු මඟ පෙන්වා දී, තමා තමාටම පහනක් වන සේ
ජීවත්වීමේ ක්‍රමවේදය මහද තුළ ස්ථාපිත කර
නිර්භයව යායුතු නිසි මාවත ඔස්සේ
පා නැඟීමට හැකි පෞරුෂයක්
මහද තුළ වර්ධනය කරමින්,
උපන් බිමට ණය නැති මිනිස් රත්නයක් ලෙසින්,
සමාජයට ඵලදායී සේවාවක් සාර්ථකව ඉටුකිරීමට හැකි ස්ථාවරයකට
මා ඔසවා තැබූ
දයාබර පියාණන් වූ විශ්‍රාමලත් විදුහල්පති
විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට
බැතිබර සෙනෙහසින් පිදේ.

*

පෙරවදන

විශ්වයේ අපූර්වතම නිර්මාණයක් වූ කලී මිනිසාය. ඒ මිනිසා උතුම් ජීවියෙකු වනුයේ සිය දැක්ම හා අනුරූපී ක්‍රියාකාරකම් තුළ ය. සිය දැක්ම යහපත් හෝ අයහපත් වනුයේ ඔහුගේ හෝ ඇයගේ ඥාණ පරිපථය හෙවත් විචාරශීලී බුද්ධිය තුළිනි. එකී බුද්ධිය අවදි වීම සඳහා ශ්‍රවණය, දහම, අත්දැකීම්, ක්‍රියාකාරකම් වැනි නිවැරදි භාවිතයෙන් හා ස්වයං ප්‍රතිභානය ඇවැසි වේ. එසේ හෙයින් නිවැරදි දැක්මක් (සාධු දැක්මක්) සහිත පුරවැසියෙකු නිර්මාණය කිරීමෙහි ලා අප උත්සුක විය යුතුය.

1. ධර්ම ශ්‍රවණය
2. කල්‍යාණ මිත්‍ර සේවනය
3. යෝනිසෝ මනසිකාරය
4. ධම්මානුධම්ම ප්‍රතිපදාව

යන කරුණු 04 න් පරමිත ත්‍රිහේතුක ප්‍රතිසන්ධ විඥ්ඥාණ සහිත පුද්ගලයෙකුට නිවැරදි දැක්ම (සාධු දැක්මෙහි) නිෂ්ඨාවට (නිවනට) සමීප විය හැකි බව බුදු දහම අවධාරිත කෙරේ. එකී දැක්ම සමාජගත කිරීමෙහි ලා සිය ලේඛන කුසලතාව මෙන්ම සිය වෘත්තීමය පරිනත භාවයෙන් කැපවෙන කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක නම් ලේඛිකාවිය සුවිශේෂ කාර්යයක නිරත වන්නීය.

සිය ලේඛන තුළ 10 වෙනි සාධු දැක්ම, **"අනුපමේය විශ්වීය නායකත්වය"** තේමා කරගත් සාර සර්භ කෘතියකි. එහි පළමුවන කොටස පරිච්ජේද දහයකින් සමන්විතය.

1. සිදුහත් චරිතය ලුහුඬින්
2. විශ්වීය නිධානය
3. දස පාරමී දම් පිරීම
4. ඓශ්චර්යාත්මක සිදුහත් උපත

5. සිදුහත් කුමරාගේ ළමාවිය
6. අභිනිෂ්ක්‍රමණය
7. උතුම් සම්මා සම්බුදු පදවිය
8. සත් සතිය ගත කිරීම
9. ප්‍රථම ධර්ම දේශනාව
10. බුදුන් වහන්සේගේ දැක්ම සහ අවබෝධය

දෙවන කොටස තුළ බුදු පියාණන් වහන්සේගේ අපරිමිත බුදුගුණ, විවරණය නෛර්යානික ශ්‍රී සද්ධර්මය හා එකී භාවිතයෙන් සමාජගත පුද්ගලයා කෙරෙහි ඇති කරවන බලපෑම මෙන්ම සාදු දැක්මෙන් පිරිපුන් ආර්ය මහා සංඝ රත්නය හා උන් වහන්සේලාගේ ගුණ විවරණය ද, කතුවරියගේ නිවැරදි දැක්ම නිරූපණය කරන්නකි.

"ධම්මෝ විවටෝ විරොචති න පටිච්ඡනෙනා" යන උදෘතයට අනුව ධර්මය විවෘත වූයේ බබළනු ලැබේ. වැසුනේ නොම බබලයි. එසේ හෙයින් විවිධ ධර්ම කරුණු බාල, මහලු, යෞවන කාටත් පහසුවෙන් අවබෝධකර ගැනීමෙහිලා මෙම කෘතිපෙළ තුලින් ලැබෙන අනුබලය සුවිශාලය. කතුවරියගේ අපරිමිත රත්නත්‍රය මාමකත්වයෙන් ගන්නා අවංක උත්සාහය එක පෙළට කෘති පරිශීලනය කිරීමෙන් කදිමට නිරූපණය වේ.

මේ සඳහා කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක නම් වූ ප්‍රතිභා සම්පන්න කතුවරියට මෙම ධර්ම සංනිවේදනය සාර්ථකව ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය ශක්තිය, නිදුක් නිරෝගී සුව, ධෛර්යය, ධර්ම ඥානය දියුණු වේවා! දහම් ඇස (ධම්ම චක්ඛු) පහළ වේවා! යි පතන අතරම මෙම සසර ගමන ගෙවන් කර ගනිමින් උතුම් නිර්වාණ අවබෝධයම වේවා! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

සතං සමාගමෝ හෝතු යාව නිබ්බාණ පත්තියා

අම්පාර බුද්ධංගල ආරණ්‍ය සේනාසනාධිපති
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ කාරක සංඝ සභික
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
පූජ්‍යපාද දීඝවාපියේ සුසීම නායක මහා ස්ථවිර වමහ.

බුද්ධංගල ආරණ්‍යව සේනාසනය
අම්පාර

හැඳින්වීම

සාදු දැක්ම 10 : විශ්වීය අනුපමේය නායකත්වය

"**සාදු දැක්ම**" යනු සම්මා දිට්ඨිය යි. සම්මා දිට්ඨිය යනු නිර්වාණගාමී ප්‍රතිපදාවේ පළමු පියවරයි. සම්මා දිට්ඨියට පැමිණීම යනු නිවන් මගෙහි ආපස්සට නොයන ලෙස ස්ථිර ලෙස පිහිටා සිටීමයි. ස්ථාවරත්වයට පත්වීමයි. හෙවත් සෝතාපත්ති ඵලයට පත්වීමයි.

"**විශ්වීය අනුපමේය නායකත්වය**" යනු පින්වත් සීතා නන්දනී උවැසියගේ "**සාධු දැක්ම**" ගමන් මගෙහි දහ වැනි පියවරයි.

ලෝකයේ කලින් කල, වරින් වර පහළ වූ ශ්‍රේෂ්ඨ නායකයෝ ඇත්තාහ. ඔවුන්ගේ එම නායකත්වයන්හි ප්‍රභාව ගලා ගියේ ඒ ඒ කාල වකවානුවල, ඒ ඒ රටවලට, ඒ ඒ ජාතිවලට සහ ඒ ඒ ආගම්වලට පමණි. එම නිසා එම ශ්‍රේෂ්ඨ නායකයන්ගේ එකී නායකත්වයන් **විශ්වීය** හෝ **අනුපමය** යන පදවලින් විශේෂණය කළ නොහැකි ය.

මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ නායකයන් අතර "**විශ්වීය**" සහ "**අනුපමේය**" යන උත්කෘෂ්ඨ වචනවලින් වෙසෙසා හැඳින්විය හැක්කේ ක්‍රි.පූ හයවැනි සියවසේ භාරතයෙහි පහළ වූ එකම එක නායකයෙක් පමණි. ඒ වනාහි අන් කිසිවෙකු නොව තිලෝගුරු බුදු රජාණන් වහන්සේය.

උන් වහන්සේ අවි අමෝරා ගැනීමකින් තොරව, කිසිම ආකාරයේ හිංසනික ක්‍රියාවකින් තොරව, පීඩාකාරී ආක්‍රමණ වලින් තොරව, බොරුවෙන්, කපටිකමින් හෝ වංචාවකින් තොරව, මහා කරුණාවෙන්, දයානුකම්පාවෙන් සහ සත්‍යවාදී අවංක ප්‍රතිපදාවකින් යුතු ව මුළු මහත් විශ්වයම තම වසඟයට ගත් සේක. අනන්ත සක්වල ආඥා චක්‍රය පැතිර වූ සේක. සමස්ත ලෝක ධාතුව තුළ ධර්ම චක්‍රය ප්‍රවර්තනය කළ සේක. එබැවින් උන් වහන්සේ මෙතෙක් විශ්වයේ පහළ වූ විශ්වීය අනුපමේය නායකත්වයෙන් හෙබි මහා පුරුෂයාණන් වන සේක;

පින්වත් සීතා නන්දනී ගුණතිලක සැදැහැබර උවැසියගේ "**සාධු දක්ම**" 10 සදහම් ග්‍රන්ථය, බුදු රාජාණන් වහන්සේගේ එකී විශ්වීය අනුපමේය නායකත්වයේ මහිමය කියාපාන්නකි. මේ කෘතිය සත් සිතින් සේවනය කරන්නෝ, සාධු දක්ම කරා ගමන් කරන භාග්‍යවන්ත ආර්ය ශ්‍රාවකයින් බවට පත්වනු ඇත යන්න අපගේ විශ්වාසය යි.

"**සාධු දක්ම**" කරා සැහැදවතුන් මෙහෙය වන්නට පින්වත් කිරිවත්තුඩුවේ සීතා නන්දනී ගුණතිලක මහත්මියට තව තවත් දිරි බල ලැබේවා! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

ගෝණදෙණියේ විමලජෝති හිමි
කුකුළුවා විහාරය කුකුරම්පොළ ඌව පැල්වත්ත
2022.12.12

INTRODUCTION

Not only as a devout Buddhist lady but as an experienced teacher of English: a mother who cares for children and also the Director of "parents Memorial Scholarship Foundation" the author of this book has targeted the younger generation of the society. This work also has enhanced its value. As her previous publications this book also will receive a wider acceptance and a great honor. The author's literary skills can be explained by the following simple example.

The 'ocean' is huge and deep. But it can be explained in a certain way even a child or a student could understand its immensity and deepness at least to a certain extent. Similarly the qualities of Buddha are enormous. It is immeasurable and no scale or instruments has been invented hitherto by any scientist or any other leader of the world. But devotees can imagine the qualities of Buddha at least a bit according to the degree of faith.

The Buddha himself has professed that even Arhanth Sariputta Thera could not understand the true qualities of Buddha. He Himself has admitted that the words of a language are insufficient to explain the great qualities. Therefore the authoress deserves commendation for her attempt to introduce the great qualities of Buddha as categorized into nine and the 'teaching' of **"Buddha-Dhamma"**as categorized into six, as far as possible simply to enable the younger generation at least to grasp a bit to fortify their faith in Buddhism.

"The Buddha can be seen through his Dhamma" once Buddha preached to Vakkali Thera. This statement has a deep meaning **"Dhamma"** is shapeless and colourless. It is an abstract noun. It can't be seen with **naked eyes.** It can only be experienced by the wisdom through mind. This book is written to help the younger generation to open their **eyes of wisdom** and achieve the value of Buddhism during their existing life.

I hope that the reader response for this book will encourage Mrs Seetha Goonetilleke to write more and more books of this kind, so that mankind will thereby reap a rich harvest of wisdom and understanding.

I had an opportunity of reading the contents of her book "සාධු දැක්ම" **The Excellent View – 10"** in advance and I would like to set down my views on the arrangements of the book briefly.

The book is edited in four parts. The first part consisted with the following chapters.

1. Biography of Lord Buddha (In brief)
2. The leadership of the founder of Buddhism is described by the author as the "Treasure of the Universe"
3. The manner how Bodhisatva practiced 10 perfection
4. The unique birth of Prince Siddhartha
5. Childhood of Prince Siddhartha and the 4 Omens
6. Renunciation
7. Enlightenment
8. How the first seven week of Lord Buddha was spent.
9. Preaching 'Buddha Dhamma' through Dhamma Chakka and Anathma Lakhana Suttas
10. The vision and perceptives of Buddha: The manifestation of the 73 wisdom.

Part II of the book consists with Immeasurable Virtues of Buddha , Visible Dhamma, and the Subsequent Disciples.

Part III reveals The Blessings of the Noble Triple Gem and in the Final Part the Supreme Leadership is exposed vividly.

I wish her all successes in her said endeavor.

Date :3rd March 2023 *Justice N E Dissanayaka*

392/3,Perera Mawatha,
Kotuwegoda,
Rajagiriya.

සාධු දැක්ම 10

සාධු දැක්ම 9 දක්වා පැමිණි ග්‍රන්ථකරණ ගමන් මඟෙහි නවමු පියවර සඳහා පෙරවදනක් සම්පාදනය කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

අර්ධ ශත වර්ෂයක් පුරා සුවහසක් දරු දැරියන්ගේ මනස දැනුමෙන් සහ ගුණ දහමෙන් පෝෂණය කළ විශ්‍රාමලත් ගුරුමාතාවක් ලෙස එතුමිය තම සමාජ මෙහෙවර, යහ ගුණ දම් සපිරි ධර්මිෂ්ඨ සමාජයක් ගොඩ නැංවීමේ ඒකායන අරමුණෙන් ඉදිරියටත් දියත් කරන්නීය. ශ්‍රී සද්ධර්මය පෙරටු කොට ගත් මෙම ග්‍රන්ථකරණය සද්භාවයෙන්නම ඉටු කරනු ලබන ප්‍රශංසණීය සමාජ මෙහෙවරකි. අගය කළ යුතු සත්කාරයකි.

දයාබර මවක් සහ මිත්තණියක් සේ ම ඉංග්‍රිසි භාෂාව ඉගැන්වීමේ ප්‍රවීණ ගුරු මාතාවක් වූ එතුමිය එතැනින් නො නැවතී ආර්ථික අපහසුතා හේතුවෙන් උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීම සිහිනයක් වූ දරු දැරියන් වෙනුවෙන් **"මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** ආරම්භ කරමින් දහසකට ආසන්න සිසුන් පිරිසකගේ නැණ පාදාලීමට අත හිත දෙන්නේ දරුවන් වෙනුවෙන්ම උපන් මෛත්‍රී සහගත සිතිවිලි පෙරදැරිව මෙන්ම තම දෙමාපියන් හට කෘත ගුණ සැළකීමක් වශයෙනි.

මෙවැනි සද්කාර්යයන් සඳහා සිතුවිලි පහළවීමටත්, තමා ද තෘප්තිමත් භාවයට පත් වෙමින්, සමාජයක් සුවපත් කිරීමටත් සසරේ පින් මහිමය බලවත් විය යුතුමය. එතුමියගේ ජීවන පැවැත්ම එය මොනවට පැහැදිලි කරයි.

යහ ගුණ දම් සපිරි ධර්මිෂ්ඨ සමාජයක් උදෙසා මෙවන් ග්‍රන්ථ එළිදැක්වීම අත්‍යවශ්‍යම මොහොතක ඇයගේ මෙම ප්‍රයත්නය ඉතාමත් අගය කොට සලකමි. තවදුරටත් සැදැහැ සිතින් සමාජය සුවපත් කිරීමේ අභිමතාර්ථය සාර්ථකව සිදුකරගෙන යෑමට අවශ්‍ය ශක්තිය මෙන්ම

ධෛර්යය ද ඇය සතු බව මාගේ විශ්වාසයයි. මෙම උත්කෘෂ්ඨ සමාජ මෙහෙවර ඉදිරියට කරගෙන යෑමට ඇවැසි කායික මානසික සුවය සහ දීර්ඝායුෂ, ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් එතුමියට ලැබේවා ! යි ප්‍රාර්ථනා කරමි.

වෛද්‍ය කුමුදුනී කංකානම්ගේ
Medical Officer Ayurveda Hospital. Malwatta, Kithulgala
B. A.M.S. (University of Colombo)
P.G.D. Buddhist Ayurvedic Counseling (University of Kelaniya)
M.A Buddhist Counseling (University of Kelaniya)

Preface

Today, in the world the younger generation is in need to study Buddhism. Many of them are very keen to quench their thirst. Specially, the University students who engage in various researches are enthusiastic on this theme but, the books written simply in English or Sinhala are not easy to find as the originals are written in Pali. The recipients of **"Parents Memorial Scholarship Foundation"** have already proved how far the **"Saadhu Dekma"** series of books have been beneficial for them to reach their target.

Buddha had pointed out the true and appropriate method to be followed to achieve the eternal bliss, with accurate medicine. This technique had been declared to the world before more than 2600 years ago. It is still prevailed in the universe vividly, lively and brightly, making it possible to understand by anyone who strive to achieve the goal of the human life.

This book **"Saadhu Dekma- 10"** which reveals the "Greatest Leader of the Universe" , based on the eternal truth: universally accepted phenomenon will be beneficial to achieve the aspiration of younger generation, improving their wisdom vividly.

"Wisdom defeat the knowledge. Wisdom arise through inner power. Knowledge can be gathered from outside through books and day to day experiences. Wisdom originate through intellect; 'Ultimate truth' is within oneself and it cannot be transferred from one to another"

කර්තෘගෙන්

ලෝක නායකයින් යැයි විරුදාවලී ලැබූ විවිධ පුද්ගලයන්ගේ නාම ලේඛන තුළින් සහ ඔවුන් පිළිබඳව ලියැවෙන ග්‍රන්ථ තුළින් විශ්වීය අනුපමේය නායකත්වයක් පිළිබඳව සනිටුහන් වන්නේ නම් ඒ ඉතා අල්ප වශයෙනි. උත්තරීතර නායකත්වයක සුලමුල සෙවීම පවා පාරලෞකික සන්සිද්ධීන් ය. එය පියවි නෙතට ගෝචර නොවන අතර ප්‍රඥා ඇස විවර වීමත් සමඟ දෘශ්‍යමාන වන සුවිශේෂී දැක්මයි.

මෙවන් ග්‍රන්ථයක් පළකිරීමට මාසිත් පහළවූයේ මීට වසර දහයකට පෙරය. එදා ලුම්බිණියේදී මාගේ කුළුදුල් ග්‍රන්ථය වූ **"මා පිය ගුණ සමර"** එනම් අප දයාබර පියතුමාණන්ගේ චරිතාපදානය ඇතුළත් ග්‍රන්ථය බුදු පියාණන් වහන්සේට බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව පුද කළ අවස්ථාවේදී ය.

වසරකට පමණ පසු මාගේ දෙවන ග්‍රන්ථය වූ **"සාදු දැක්ම 1"** ග්‍රන්ථය ද දඹදිව්තලයේ කුසිනාරා නුවරදී බුදු පියාණන් වහන්සේට පූජා කිරීමේදී ඇතිවූ පහන් සංවේගය, මෙවන් පොතක් සම්පාදනය කිරීම පිළිබඳව මා සිත තුළ තිබූ අරමුණ වඩාත් ප්‍රබල වීමට හේතු විය. එබැවින් මා ඒ සඳහා අතරක් නැර වඩාත් කරුණු සොයන්නට වීමි.

දීප ව්‍යාප්ත ශිෂ්‍යත්ව පදනමක අධීක්ෂණ කාර්ය භාරය හමුමේ අනතුරුව **"දරිද්‍රතාව හඹායයි"** නමැති ග්‍රන්ථය අප්‍රමාදීව රචනා කරන්නට වූයේ එම වසරේ ශිෂ්‍යත්වලාභී විශ්ව විද්‍යාල සිසු දරුවන් අතර, ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී බෙදා දීමේ අවශ්‍යතාවය පැන නැගුණ හෙයිණි. කෙසේ වුවද, දඹදිව් තලයේ ඉසිපතන මිගදායේ දී එම ග්‍රන්ථය ද, පෙර අවස්ථා දෙකෙහි මෙන්ම දෝතින් පූජා කර ගැනීමේ භාග්‍යය උදාකර ගතිමි. එම උත්තම පූජාව පවත්වන සෑම අවස්ථාවකම, මෙම ග්‍රන්ථය පිළිබඳව මසිත තුළ ගැඹුරෙන් තැන්පත් වී තිබූ අවශ්‍යතාවය වඩාත් උද්දීපනය වන්නට විය.

කෙසේ වුවද ග්‍රන්ථ 14 ක් රචනා කිරීමෙන් පසු මෙම ග්‍රන්ථය සඳහා පූර්ණ අවධානය යොමු කිරීමේ භාග්‍යය මා ලදිමි. **"සාදු දැක්ම"** නමින් ග්‍රන්ථ මාලාවක් රචනා කිරීමෙන් අනතුරුව මෙම ශ්‍රේෂ්ඨ දැකීම (Excellent View) තේමාව කර ගෙනම මෙම ග්‍රන්ථය තුළින් මාගේ අරමුණ වූ **The Supreme Leadership of the Universe** නමැති ග්‍රන්ථය සම්පාදනයට සුදුසු වපසරය සැකසිණි. අද මෙම ග්‍රන්ථය ඔබ අතට පත්වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

*(භාෂා භේදයකින් තොරව සියලු පාඨකයින්ට සාධාරණයක් ඉෂ්ඨ කිරීමේ අරමුණෙන්, **නිවැරදි උච්ඡාරණයට පහසු වන සේ** පාලි පාඨයන් **ඉංග්‍රීසි සහ සිංහල අක්ෂර මගින්** ද රචිත අතර ඇතැම් පරිච්ඡේද ඉංග්‍රිසි භාෂාවෙන් ද රචිතය.)*

මාගේ මෙම වෑයම තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අනන්ත බුදු ගුණස්කන්ධයට අලෝකෝපහාරයක්ම වේවා!

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක
392/2, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය
0112877950

SALUTATION

To my beloved Parents in eternal gratitude.

I offer this book,**"The Excellent View – 10"**
as a floral tribute, at the feet of my parents

Late Mr Wijayasena Kiriwattuduwa and
Late Mrs Laura Hettiarachchi,

Who inspired me to lead a harmonious life
dedicated to the service of mankind.

You, my dear Father and my dear Mother,
embodied the ideal fatherhood and Motherhood
and
brought me up, with boundless love and care,
guiding me towards
what is good, virtuous & wholesome.

MAY YOU ATTAIN EVERLASTING

BLISS of NIBBANA !

(Kiriwattuduwage Seetha Nandanie Goonetilleke)

Aspiration of the Author

The **“Supreme leader of the Universe”:** the most precious Gem, can be seen vividly only through the wisdom eyes of human. There is no other one to compare with His multi-farious knowledge, shrewd wisdom and deep intellect.

At the age of 35 years the Prince Siddhartha Enlightened. He is Supreme in comprehending everything in the world and making others also to be understood the reality of existence according to the doctrine HE found it after making amazing sacrifices, striving alone without having any guidance from any other leader or teacher of the world. He is not only the greatest Leader of the world but also the most competent and efficient Doctor. HE treated for physical ailments as well as mental diseases of the living beings.

In this universe there is no other leader to compare with His great qualities and the enormous service He rendered to the mankind as well as to the **Gods, Brahmas** and all other living beings in all realms. HIS research and its benefit **outshined** the duty of all other leaders in this world. The great qualities of such a leader cannot be summed-up in sentences into a small booklet like this.

Actually my attempt would be similar to the squirrel that attempted to evaporate the gigantic ocean in hoping to save the lives of its kids. But I anticipate my effort would be beneficial to the future generation at least to a certain extent.

That is my aspiration.

ACKNOWLEDGEMENT

First of all I take this opportunity to express my deepest gratitude and thanks to the Most Venerable **Niyangoda Vijithasiri Anunayaka Thero** for all the blessings bestowed upon me for the completion of this book at the time I was little frustrated due to my poor eye sight. I was about to stop after writing the 1st Part of this book and I offered it to Anunayaka Thero, inserting to a Pen-drive explaining the real physical feeble situation that I had had at that moment.

After accepting it I was encouraged by He-thero and gave me more strength and determination to continue it, up to the end as revealed in the content page. Actually it was a miracle that He could thoroughly understand what my **vision** and **mission** both accurately and blessed me from the bottom of His heart for the successful completion of this book too. Due to that encouragement and the blessings flown through the **Noble Triple Gem** I could complete this book within four months although it was a dream for me.

My deepest gratefulness and thanks center to **Ven Mirisse Dhammika Thero** who made me to write books on moral virtuous to distribute among the scholarship recipients and sponsors of **Sri Lanka-Canada Scholarship foundation** and the P**arents Memorial Scholarship foundation** which were advised by He-thero since the conception of them. While I was writing my 1st book: the biography of my father **"Må Piya Guna Samara"** I was guided by him to make it success.

I deem it a pleasure to express my sincere thanks to Ven Deeghawapiye Suseema Thero and Ven Gonadeniye Wimalajothi Himi for sending me 'Prefaces' in time, introducing this book with messages of blessings.

It gives me a great pleasure to record here my profound gratitude to Justice **N.E. Dissanayake** who provided a creditable introduction with blessings.

Further up I must record here my sincere thanks to Dr. Kumuduni Kankanamge for sending me a message with blessings, after going through all the steps of **'Saadhu Dekma'** previously issued. Also I admire the help given by Mr Subhash Dulshan who dedicatedly prop up for the purpose of publishing.

I wish to recollect and thanks to Mrs Sunethra Hettiarachchi and Miss Anoma Denipitiya who helped me for proof reading. Also I admire the assist given by my students Tarinya, Melani Nayanthi and Chathurika in various ways when I was in need of support to make this meritorious task a success. I take this opportunity to express my thanks to my husband, sons and daughter-in-laws for extending me their helping hands giving a dedicated support in one way or another specially for my religious and social activities.

Finally my gratitude is extended to all who genuinely appreciated this worthwhile task and wished me at least by a single word.

May you all be able to open the eyes of Wisdom !!!

Mrs K.S.N.Goonetileke
392/2, Perera Mawatha,
Kotuwegoda, Rajagiriya.
011 2 877950

ප්‍රවේශය

පළමු කොටස
PART - I

1

BIOGRAPHY OF PRINCE SIDDHARTHA
(In Brief)

This Greatest Leader: Noble Founder of the reality - Gauthama Buddha lived in India for 80 years. (563- 483 B.C)

In the 6th century B.C, the Buddha, also known by the personal name "Siddhartha" and the family name "Gauthama" lived in the North India. His father was the King Suddhodana who ruled the 'Sakya' in Kapilawasthupura Napal and mother was queen Mahamaya..

According to the customs of the era, he was married at the age of sixteen to a beautiful young princess named Yashodara. There were 3 palaces for them to spend a luxurious life. They lived happily. Also they were very good with the citizens and helped them a lot. But suddenly, confronted with the reality of life, and the suffering of mankind HE determined to find the solution: to be released from these universal sufferings. At the age of 29, soon after the birth of his only child, Rahula he left his kingdom and became an ascetic in search of "Truth":the reality

For 6 years the ascetic Gouthama wandered about the valley of the rivers, meeting learned religious teachers. He engaged in studies and followed their routines, submitting himself to ascetic practices thoroughly. But, later he understood that it was not the right path. So he gave up them and went his own way.

After facing with many hardships physically, one evening he approached to the Bo –Tree and seated under it having a firm determination, not to get up without achieving his target. At the age of 35 Gouthama attained Enlightenment.

The enlightened vision of the Buddha is the vision of reality. It is the dawn of an inner light of insight (Aloko Udapadi) that enables him to see through the light of supreme wisdom, the real nature of things hidden in the darkness of ignorance (moha). It is also called as the opening of the 3rd eye. That Supreme wisdom endowed with several aspects inclusive of insight (cakkum), cognition (ññanam),wisdom (pa**ññā**), realizing the truth(vijj**ā**) and boundless self illumination (aloko),**In the Buddha it's an eternal process.**

After his Enlightenment, He delivered his 1st sermon to a group of 5 ascetics, his old colleagues. in the deer park at Isipathana in Benaris. From that day for 45 years, He taught all classes of men and women i.e rich and poor, holy and robbers, Brahmins and outcasts, without making the slightest difference between them, considering all as who suffer in this Sansaric Journey. He recognized no difference of cast or social stratum. 'Dhamma' he preached was open to all who were ready to understand and follow it, on behalf of own liberation. The Budha was the best mind reader. He was the greatest adviser not only for the humans and deities, but also to the entire world including all realms..

At the age of 80, The Buddha passed away at Kusinara. Today, Buddhism is found in Sri Lanka, Burma, Thailand, Cambodia, Laos, Viatnam, Tibet China, Japan, Mongolia, Korea, In Some parts of India, Pakistan and Nepal, and also in the Soviet Union. The Buddhist population in the world is over 500 million.

සිදුහත් කුමරාගේ ජීවිත කථාව (සාරාංශගතව) සිංහල බසින්

නේපාලයේ, කපිල වස්තුපුර, ශාක්‍ය ජනපදයෙහි රාජ්‍යය උරුමව සිටි සුද්ධෝදන මහ රජ තුමාටත්, මහාමායා දේවියටත් දාව, ක්‍රි.පු 6 වන සියවසේදී, සිදුහත් කුමරාණෝ ලුම්බිණි සල්උයනේ දී මෙළොව උපත ලදහ.

එදා මහා භාරතයේ පැවැති චාරිත්‍ර සහ සම්ප්‍රදායන්ට අනුව සොළොස් වියේදී සිදුහත් කුමරා යසෝදරා සමඟ සරණ බන්ධනයට පා තබද්දී, සුද්ධෝදන පිය මහ රජ විසින් ඔවුනට සුවසේ වාසය කිරීමට, සියලු සැපසම්පත් සහිතව, එක් එක් ඍතුවලට ගැළපෙන පරිදි මාළිගා තුනක් (රම්‍ය, සුරම්‍ය, සුභ) ඉදිකරවා ඉතාමත් සුඛෝපභෝගී දිවි පැවැත්මක් ගෙනයාමට අවශ්‍ය පසුබිම සකස්කර දුන්හ. සියලු සැපසම්පත් වලින් ආඪ්‍යව සිටිය ද, උපන් සත්ත්වයා විඳින දුක අවබෝධ කරගැනීමට සිදුහත් කුමරුට දීර්ඝ කාලයක් ගතවූයේ නැත.

වයස අවුරුදු 29 දී තම රාහුල කුමරුගේ උප්පත්තියත් සමඟම සිදුහත් කුමරු සත්‍යය සෙවීම පිණිස රජ මැදුරෙන් බැහැරව තවුස් වෙස් ගෙන මහා දුෂ්කර සටනකට පිළිපන්නේය. එදා විවිධ මත දරමින් විමුක්තිය සෙවීමට අවතීර්ණව සිටි විවිධ තවුසන් සොයා යමින් ඔවුන්ගෙන් කරුණු දැනගත්තේ වුවද, එය විමුක්තිය සඳහා වන නිසි මඟ නොවන බව අවබෝධ වීම නිසා ස්වයං වීර්යයෙන් සත්‍ය ගවේෂණය කිරීමේ අරමුණෙන්, අධිෂ්ඨාන පූර්වකව ඔවුන් ද හැර දමා ගියේය. **දැඩි වීර්යයකින් යුතුව භාවනා යෝගීව සිත සමඟ මහා සටනක** යෙදුණ සිදුහත් තවුසාණෝ වයස අවුරුදු 35 දී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක.

උන් වහන්සේ ගේ දැක්ම සහ අවබෝධය තුළින් විශාල ආලෝක කදම්භයක් විහිදුණි. මෝහාන්ධකාරය සම්පූර්ණයෙන්ම වනසා දැමූ උන් වහන්සේ **චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි** ආදී වශයෙන් එම ආලෝකය හඳුනා ගත් සේක.

සම්මා සම්බුද්ධත්වයට පත් වූ උන් වහන්සේ, පසවග මහණුන් සොයා ගොස් බරණැස ඉසිපතනාරාමයේ දී ප්‍රථම ධර්ම දේශනාව ඔවුන්ට පවත්වා, එතැන් සිට පුරා වසර 45 ක්, සමාජයේ විවිධ තලයන්හි පසුවන, ධර්මාවබෝධය ලැබීමට භාග්‍ය සම්පන්න වූ සැම දෙනා වෙත වැඩම කරමින් ධර්මය දේශනා කරන්නට වූ අතර අන් අයගේ සිත් කියවීමේ ඤාණය බුදුන් වහන්සේට පහළ වී තිබුණෙන් දෙවි, බඹුන් සහිත මුළු මහත් සක්වල ලෝ සතුන්ට ද ඒ ඒ අවස්ථාවට ගැළපෙන පරිදි ධර්මය දේශනා කරන්නට වූ සේක.

මෙසේ ස්වකීය බුදු කිස අවසන් කළ බුදු පියාණන් වහන්සේ වයස අවුරුදු 80 දී, කුසිනාරාවේ උපවත්තන නම් සල් උයනේදී පිරිනිවන් පා වදාළහ.

***

2

(විශ්වීය නිධානය - සිංහල සාරාංශය සමඟින්)
THE TREASURE OF THE UNIVERSE

Everything in the universe is subjected to change. It is transformed so rapidly that cannot be seen through the naked eyes of the human. It is oscillated on the truth. **'Truth'** is prevailed in the world forever. It is an eternal phenomenon. It is everlasting and perpetual but covered with the darkness of the ignorance. It does not come out to the existing world automatically to be visualized.

This noble **"Truth"** is found by a virtuous: honourable extra ordinary human being, from time to time. It is not a simple task. To fulfill this mission one should have continuously dedicated in different stratum for a long period; sometimes for number of aeons. Sacrificing lives too, in thousands of previous births. It has been proved in history how much effort had to be taken by a human being to fulfill this goal. It is not an easy task that anyone can merely achieve. It needs the utmost spiritual and mental power as well as the physical strength.

Having a strong determination, performing numerous meritorious acts and deeds for the wellfare of others with tireless efforts, and courage in thousands of previous births, the virtues good features should be practiced continuously in search of this truth. The noble person who found the **'Truth'**, is called **"Buddha". ** He is **Enlightened.** That is the most precious treasure as almost all beings can have the benefit of it. That is the **treasure:** the greatest leader of the universe. The supremacy and radiance of the Buddha reflects extensively for ten thousand universes. **What a majesty?**

Until the supreme Buddha appears, the truth remains veiled. This truth is not something 'the Buddha' invented, it is a discovery, It is the natural law that exist in this world. It should be found through self- realization with a great effort dedicating tremendously.

During the period of Bodhisatva one **should** have extra-ordinary effort to complete the 10 perfection :**'Paramitha'** in 3 levels to accomplish this target.**(Dana Paramith/ Dana Upa Paramitha-dana Paramatta Paramitha)**.**'Paramitha'** means the noblest, highest and most excellent. So, the paramithas are the exceptional acts of excellent virtues; noblest qualities of the Bodhisatva. These TEN perfection are as follows.

Dana	- Charity	- දානය
Seela	- Morality	- සීලය
Nekkhamma	- Renunciation	- නෛෂ්ක්‍රම්‍යඃඅතහැරීම
Pañña	- Wisdom	- ප්‍රඥාව
Viriya	- Perseverance	- වීරිය
Khānti	- Patience	- ක්ෂාන්ති
Sacca	- Truthfullness	- සත්‍යය
Adhitthāna	- Determinattion	- අධිෂ්ඨාන
Mettā	- Loving – kindness	- මෛත්‍රී
Upekkhā	- Equanimity	- උපේක්ෂා

It takes countless long period i.e thousands of previous births to complete these 'Paramitha' in 3 different phases, as **intensely, tremendously. and exceptionally.** (Dana Paramith/ Dana Upa Paramitha- dana Paramatta Paramitha) to have a complete perfection. It is the routine of conduct or the fundamentals of **Enlightenment.** Not only for the *"samma Sambuddhahood",* but *"Pacceka Buddhahood"* and also to get the *"Arhanthship"* anyone has to practice these 10 perfctions.

The Buddha realized the real nature of the nature. It is consisted with 3 basic features (**Anicchā – Dukkhā - Anathmā**). Dynamism of the universal energy, constantly faces with transformation and finally destroys. So that nothing is constant. This is the eternal **truth** that Buddha comprehended.

With the unveiling of the 4 **Noble Truth** (Dukkha ; suffering, **Samudaya:** cause of suffering, **Nirodha:**cessaion of suffering, **Magga:** The path leading to the goal)… an extra ordinary bright light was dawned in this world. The brightness of the very pure heart reflects very much brighter than the brightness of thousand shining suns, dispelling the darkness of ignorance all over the universe. Over 2600 years ago, the supreme light of wisdom, dawned illuminating the planet earth. That is the Greatness of the Buddha : **treasure of the universe.**

After achieving this vast; enormous and deep knowledge through wisdom covering the whole universe, the 'Buddha' became the greatest and the worthiest treasure of all living beings. The value of it cannot be compared with any other treasure that we have ever got. HE found the Noble truth of the existence and preached for the sake of all beings with utmost kindness and compassion.

"Not like other leaders, it is only 'The Buddha' who pointed out all his realization and achievement to human endeavour and human intelligence. A man and only a man can become a Buddha. Everyman has within himself the qualities of becoming a Buddha, if he wills and endeavors. As the dedication should be enormous, 'The Buddha' was so perfect in his human qualities that he came to be regarded later in popular religion almost as 'super – human'."

The Buddha on His own, got to know everything what had to be known with nothing less, and with the greatest compassion preached everything without retaining a bit as secret teaching, All these great qualities named him as the Samma Sambuddha.

How much we owe to the Buddha?

One and only way of paying the debt is, to adjust our day to day lives according to the principles of Dhamma: preached by the Buddha which leads to the supreme Nibbana directly. That is nothing else other than the **"Noble Eight Fold Path"** The path is categorized in to 3 parts: **Seela, Samadhi and Panna.**

Seela: Morality- It can be improved by practicing

Right Speech, Right Action and Right Livelihood **Samadhi: Concentration-** It can be improved by practicing Right Effort. Right Mindfulness and Right Contemplation. **Panna : Wisdom**-can improved by practicing Right View and Right thoughts.

The One who practice this properly, will reach to his destination "Nibbana" to be free from all mental and physical ailments. There is no other ways or short cuts to escape from suffering and find the liberation.

As a teacher, by example, the Buddha radiated his infinite compassion towards all suffering living beings to lead their deluded minds to enlightenment. The Buddha has shown that the holy ones regardless of religious persuasion could **only be found within the 8 Fold-Path** and not outside it. With mind as the forerunner of the world, the Buddha had demonstrated by His own human effort that the holy life could be lived independent of any divine inspiration.

"The savior of the world, Lord Buddha - Prince Siddhartha styled on the earth- In Earth and Heavens and hells incomparable, All-honoured, wisest, Best, most Pitiful, The Teacher of Nirvana and the Law" (Extract- Light of Asia)

සත්‍යය යන්න ලොව නිරුතුරුවම පවතින්නකි. එහෙත් එය මෝහන්ධකාරයෙන් වැසී පවතී. එය සොයා ගැනීමට බුදුවරයෙක් ලොව පහළ විය යුතුම ය. එය ලෝක ධර්මතාවයයි. එහෙත් බුදුවරයෙකු ලොව පහළවීම දුර්ලභ ගණයේ සංසිද්ධියකි. සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂ ගණනක් පෙරුම් පුරා පාරමිතා **දහයක්, පාරමිතා - උප පාරමිතා- පරමත්ත පාරමිතා** වශයෙන් අදියර තුනකින් පූර්ණය කොට උතුම් සම්මා සම්බුද්ධත්වයට පත්වීම, මුළු විශ්වයම කම්පා කරවන්නකි. **"සත්‍යය"** අවබෝධ කරගෙන, ලොව දුක් විඳින සත්ත්වයන් දුකින් එතෙර කොට නිර්වාණ සම්පත්තිය අවබෝධ කර ගැනීමට මඟ පෙන්වන **උතුම් බුද්ධ රත්නය** යනු **විශ්වීය නිධානයයි.** එවන් යුගයක මිනිසත් බව ලැබීමද ඉතාමත් දුර්ලභය.

කලකිනි බුදුවරයෙකු උපදින්නේ - දුකෙකිනි මිනිසත් බව ලැබ ගන්නේ

මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ - සුදණෙනි, කිම වීරිය නොකරන්නේ
(ලෝ.වැ.ස)

කිච්ඡෝ මනුස්ස පටිලාභෝ - කිච්ඡං මච්ජාන ජීවිතං

කිච්ඡං සද්ධම්ම සවනං - කිච්ඡෝ බුද්ධානං උත්පාදෝ (ධ.ප)

සියල්ල **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** යන ත්‍රිලක්ෂණයට යටත් බව අවබෝධ කරගත් බුදු පියාණන් වහන්සේ උපන් සත්ත්වයා නිරතුරුවම සසර දුකට හිමිකම් කියන බව දැන සත්‍ය හතර අවබෝධ කළහ. එනම් **දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය සහ දුක්ඛ නිරෝධය මාර්ග පටිපදා ආර්ය සත්‍යය යි.**

මෙම මාර්ග පටිපදා ආර්යය සත්‍යය ආර්ය අෂ්ඨාංගික මාර්ග යයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග අටෙන් සමන්විත මාර්ගයයි. එය **සීල, සමාධි, පඤ්ඤා** යනුවෙන් වර්ගීකරණය කර ඇති අතර, මෙම මාර්ගය නිසි ලෙස වඩන්නෙකුට සුගතිය උරුම බවටත්, නිර්වාණය සාක්ෂාත් කළ හැකි බවටත් **සද්ධර්මය** සපථ වෙයි. වෙනත් කිසිවකට සමකළ නොහැකි මෙම **විශ්වීය නිධානය "සම්මා සම්බුද්ධත්වය"** නමින් හැඳින්වේ.

***

3

(බෝසතාණෝ පාරමිතා පිරූ අයුරු - සිංහල සාරාංශය සමඟින්)
HOW BODHISATVA PRACTICED 10 PERFECTION

බෝධි සත්ත්ව අවධියේ පටන් ආත්ම භව ගණනාවක් පුරා පාරමිතා සපුරාලමින්, සම්මා සම්බුද්ධත්වය ඉලක්ක කර ගනිමින් පැමිණි ගමන් මග විටෙක ඉතාමත් විශ්මය ජනකය, විටෙක ඛේදජනකය. විටෙක ත්‍රාසජනකය. මෙය පාරමිතා, උප පාරමිතා සහ පරමත්ත පාරමිතා වශයෙන් අදියර තුනකින් සපුරාගත් මෙම අනුවේදනීය කථා පුවත් පන්සිය පනස් ජාතක පොත් වහන්සේ තුළ විද්‍යමාන වෙයි. එය පරිශීලනය කරන්නෙකුට එම ජීවමාන සංසිද්ධීන් ඔස්සේ ලද හැකි ඇත්දැකීම් සම්භාරය අපරිමිතය. බුද්ධත්වය ලැබීමෙන් පසු පුබ්බේ නිවාසානුස්මෘති ඤානය ඔස්සේ පෙර භවයන් විනිවිද දුටු බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ ආ දුෂ්කර වූත්, කටුක වූත්, අධිෂ්ඨාන පූර්වකවූත් ගමන් මග ලොවට හෙළි කළ සේක.

1. දාන පාරමිතාව පුරණ එක්තරා භවයක Charity

බෝසතාණන් වහන්සේ එක්තර භවයක රජ පෙළවතක වෙස්සන්තර නමින් ඉපිද කුඩා කළ සිටම දන් දීමට පුරුදු වී සිටියහ. රජකමට පත්වූවද, නිසිකල මන්ත්‍රී දේවිය සමග සරණමංගල්‍යයට පත්ව දරු දෙදෙනෙකු ලැබුවේ වුවද, දාන පාරමිතාව සපුරා ගැනීමේ අරමුණෙන්, දානශාලා ගොඩනඟමින් දුගී මගී යාචකාදී සැමට මහා පරිමාණයෙන් දන් දුන්හ.

මේ අතර කළිඟු රට ඇති වූ දුර්භික්ෂයක් නිසා එරට වැසියනට යහපත සැලසුම පිණිස, වෙස්සන්තර රජුට අයිති භාග්‍ය සම්පන්න සුදු ඇතා ද, එරට රජු ඉල්ලා සිටි කල්හි, ඉතා සතුටින් තමා සතු සුදු ඇතා ද දන් දුන්හ. පිය රජතුමාගේද අවසරය ඇතිව රට වැසියන් වෙනුවෙන් සප්ත සතික දානයක් ද්‍රව්‍ය 700 ක් එක් අයෙකුට ලැබෙන සේ සුදානම් කර මාළිගාවේ ඇති භාණ්ඩ වස්තු සියල්ලම පාහේ දන්

දුන්හ. අනතුරුව දේවිය සහ දරු දෙදෙන සමඟ හිමාලයේ වංකගිරිය බලා පිටත් විය. එහි ළඟා වීමට පෙර අතරමඟදී බමුණෙකු විසින් අශ්ව කරත්තය ද ඉල්ලා සිටියෙන් එය ද අශ්වයින් සමඟ දන් දී ගමනේ ඉතිරි කොටස පා ගමනින් යන්නට විය. මෙය දුටු සක්දෙව් රජ මොවුන් වෙනුවෙන් තාපසාරාමයක් මවා දුනි. එහි නවාතැන් ගත් මොහු තවුස් දම් පුරද්දී මන්ත්‍රී දේවිය එල වැල නෙළාගෙන ඒම පිණිස වනයට ගියාය. ඒ අතර ජූතක බමුණා පැමිණ දරුවන් ඉල්ලූ කල්හි, දෙනෙතේ කඳුළු වෙනුවට රුධිරය ගලා යද්දී, **ජාලිය** සහ **ක්‍රිෂ්ණජිනා** යන තම දරු දෙදෙනා පවා ජූතක බමුණාට දන් දුනි, බුද්ධත්වය ලබා සකල ලෝ සතුන් සසර සයුරෙන් එතෙර කරවීමේ පරම අදිටනින් යුතුව දාන පාරමිතාව සපුරා ගැනීමට වෙර දරන මෙම අදියරේ, අවසානයේදී ශක්‍ර දේවේනද්‍රයා පැමිණ මන්ත්‍රී දේවිය ඉල්ලා සිටි විට එයට ද සූදානම් වූ අයුරුත් **කෙතරම් සංවේගජනකද?**

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඥාණයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් වෙස්සන්තර ජාතකය තුළින් දේශනා කර වදාළහ.

Charity (දාන පාරමිතාව)

DANA PARAMITA
(THE STORY OF KING VESSANTARA)

Once our Bodhisatta was conceived in the womb of Queen Phusati, the chief consort { spous} of King Sanjaya. During her pregnancy, Queen Phusati had a strong desire to do charity. Accordingly, the king ordered six alms- halls { Dana Shala} to be built and everyday the Queen gave alms to monks, the poor and beggars spending six hundred thousand gold coins {kahavanu} .

After 10 months the queen gave birth to a son and he was named Vessantara and wonderful things happened on that day. When the infant Prince asked for gifts to practice charity the Queen handed over to him a purse containing one thousand gold coins. At the same time a female elephant brought a white baby elephant to the palace. And left it in the Royal stable.This was considered a good indication.

The king appointed 60 nurses to look after the Prince and he made a necklace worth of thousand gold coins for the Prince who was then only 5 years old. The prince who had a strong desire to practice charity,gave his valuable neckless to a nurse.Inthis way the king made 9 necklaces and each time he gave it away.

At the age of 16, Price Vessantara having mastered all Sciences, married a beautiful princess Manthri Devi. When he was proclaimed {state publicity} King of SIVI, he practiced charity to the highest state of perfection. He also built six alms- halls {Dana Shala} and spent six hundred thousand gold coins as charity a day. They led a happy married life and later had a son- Jaliya and daughter Krishnajina.

In the kingdom of Kalinga there was a great famine and severe drought, The citizens requested that the white elephant of king Vessantara considered as a good omen, be brought to Kalinga Vessantara readily agreed nd presented the elephant to the citizens of kalinga when they approached to request it.

Vessantara requested his father's permission to perform" Satta Satika Dana" { offering of material things each to a limit of 700 } After the grand celebration, King Vessantara together with his consort and 2 children left the city for mount Vamka { Vankagiriya} in the Himalayas where the **Skka Deva Raja** built a hermitage for them to stay. Before reaching there destination, he willingly dispensed { gave out/ handed over}with his four horses and a chariot to a Brahmin who asked for them. So they had a walk for the rest of their journey to the hermitage. They reached their and lived on wild fruit and roots gathered by Queen Maddi for seven months.

Eventually, King Vessantara whose whole intention was to do charity, had to give away his 2 children to an old **Brahmin-Juthaka** who wanted them to assist his wife in the house hold duties. Sakka finally tested his degree of charity in Vessantara by disguising himself as a Brahmin and asked for his wife." The queen accordingly {in view of that }replied " From maidenhood I was your wife and you are my master still. Let you to whom you so desire give or sell or kill" . Vessantara was strengthened to give his wife also to the Brahmin, but latter SAKKA gracefully returned the Queen to Vessantara.What he wanted was to test Vessanthara of his degree of Perfection.

In this story our Bodhisatva Praticed Dana Paramitha to the Highest degree of perfection. Budda preached this after becoming the Buddhahood.

**

2. සීල පාරමිතාව පුරණ එක්තරා භවයක (Morality)

බෝසාතාණන් වහන්සේ එක්භවයක නා ලොව නාගරාජයෙක්ව ඉපිද, සිල් පද ආරක්‍ෂා කිරීම සඳහා මනුලොවට පැමිණියහ. පුර පසළොස්වක පෝ දිනයන්හිදී අඛණ්ඩව අටසිල් සමාදන්ව සිට පසු දින නා ලොව කරා යාම සිරිතක්ව පැවතුණි. එක් පොහොය දිනක, ගසක් අසල බෙනයක් මත දරණ ගසා තැන්පත්ව මෙසේ සිතන්නට විය. අවශ්‍ය ඕනෑම කෙනෙකු අද දින මාගේ සම්, ඇට සහ මස් අනුභව කරත්වා මා කිසිවෙකුට කරදරයක් නොකරමි. මම ශික්‍ෂා පදය දිවි පරදුවට තබා රකිමි. කෙතරම් ශ්‍රේෂ්ඨද? දඩයක්කරුවන්ගේ ග්‍රහණයට හසු වී දරුණු වේදනාවලට පාත්‍ර වුවද, වෛර සිතක් නො ඉපදිණි. අවසානයේදී ගැල් 500 ක් රැගෙන යන ආලාර නම් වෙළෙඳ නායකයෙකු දඩයම් කරුවන්ට මුදල් ලබා දී නාග රාජයා නිදහස් කරවීය. (Morality **සීල පාරමිතාව සංඛපාල ජාතකය)**

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඥාණයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් සංඛපාල ජාතකය තුළින් දේශනා කර වදාළහ.

(Morality - සීල පාරමිතාව)

SEELA PARAMITA
(THE STORY OF THE KING SNAKE-SANKAPALA)

The Bodhisattva was once born as a snake.- Sankapala. He lived in the realm of snakes (Nagaloka). As he was not satisfied with his state of life, he used to come to this world to observe the precepts. On Full Moon Days he observed the Eight Precepts regularly and went back to his realm on the following day.

One holy day he changing himself into a large snake he coiled round an ant hll by the path-side and thought like this – " Today I'm observing Sil. I do not allow the precepts to be broken . If anyone like to make use of my skin, flesh or bones, Iwill let them as they wish. I do not harm them. "

On that day some tired hunters were returning without having any flesh. Seeing the serpent king they thought of killing it for flesh as they were in hungry. They went up to him slowly to kill him and eat flesh.

At first they weakened the snake by beating it with their stakes and weapons. The serpent did not get angry. He could have killed them all easily. But he did not want to break his precepts even at the risk of his life. He gladly bore all those sufferings without having any evil thought towards them.

Having weekend the reptile they tied it with ropes and carried it to their shelters. As the head was dropping down they pierce (cut) the nostril and pass a string through it to hung the head up and carried him causing much pain. But he was on his precepts. At least he did not look at them angrily.

A rich merchant passing by with about 500 carts saw this pitiful state of the poor reptile and approached them with compassion. He gave money and other food items for them and saved the life of serpent king.

After becoming the Buddhahood (Enlightenment) the Buddha preached "the story of snake" and declared how he practiced the perfection of Morality in a previous birth being a king of Naga.

**

3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පුරණ එක්තරා භවයක

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක රජ පෙළපතක මඛාදේව නමින් ඉපිද, රජුගේ ඇවෑමෙන් රජකමට පත්ව ඉතා සාධාරණව ලෙස ධර්මිෂ්ඨ ලෙස රාජ්‍ය පාලනය කරගෙන ගියහ. එහෙත් කල් යාමේදී රජ සැප අතහැර වනගත වී භාවනා කිරීමට ඔහුට සිත් පහළ වූයෙන් කරණවෑමියා අමතා, කුමන අවස්ථාවක හෝ මාගේ හිසෙහි පැසුණු කෙස් දුටු විගස අප්‍රමාදීව සැල කර එය ගලවා මා අතට දෙව යි කීහ. කරණවෑමියා අණ පරිදි එසේ කළ දිනයේම, රාජ්‍යය, බිරිඳ සහ දරුවන් සියල්ලෝම කැඳවා තමා වයසට පත්ව ඇති බව සාක්ෂි සමඟින් පෙන්වා සියළු සැප සම්පත් අතහැර තවුස් දිවිය සඳහා හිමාලය වනයට ගියහ.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඥාණයෙන් (පෙර විසූ කඳ පිළිවෙල දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් **මඛාදේව ජාතකය** තුළින් දේශනා කර වදාළහ. ඔවුන්නට පවා තණ්හාවක් නොමැතිව, රජ සැප නිසි කළ නිර්ලෝභීව අත හැර දැමූ අයුරු මෙයින් පිළිඹිබු වෙයි.

(Nekkahamma - නෙක්කම්ම පාරමිතා මඛාදේව ජාතකය)

NEKKHAMMA PARAMITA - (THE STORY OF THE KING MAKADEVA)

Once the Bodhisatva was born as the Eldest son of a great king and named as Makadeva. After the death of his father he ascended the throne and ruled the kindom righteously. He became wiser and had not attached to royal treasure as he had realized the realty of all component things.So he did not crave them.He wanted to leave from the palace and go to the forest to meditate.

One day he asked his barber to tell him whenever he sees a grey hair in his head. The king grew older and his black chair changed its colour. When the barber told it to the King, he asked to pull it up and give. The barber removed the gray hair and gave it to the king. The wise king thought that it was time for him to fullfil his idea as he is getting old.

He called his ministers, family members, younger brothers and people and said, “Oh! dear people. Now I’m getting older. My hair is gray in colour.So I decided to leave this mundane life and go to the forest to meditate. While his queen, chilgren and people were weping he left the palace, and went to Himalayas with no attachment to anything.

After becoming the Buddhahood (Enlightenment) the Buddha preached “The story of Makadeva” and declared how he practiced the perfection of renunciation in a previous birth though he was inherited to the throne.

* *

4. ප්‍රඥා පාරමිතා පුරණ එක්තරා භවයක

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක බමුණු කුලයක සේනක නමින් ඉපිද, බුද්ධිමත් ලෙස ජනතාවට අවවාද අනුශාසනා කරමින්, ඔවුන්ගේ භෞතික හා අධ්‍යාත්මික යහපත වෙනුවෙන්ම කටයුතු කළහ. දිනක් බියටපත් එක් වයස්ගත බමුණෙක් බෝසතාණන් වහන්සේ හමුවට පැමිණියහ.

ඔහු අවශ්‍ය කෑම බීම මල්ලක දමාගෙන ඇවදිගෙන යන ගමන් මගියෙකි. අතරමගදී වෘක්ෂ දේවත්වෙකු ඔහු අමතා **"මග සිටියොත් තෝ නසී ගෙදර ගියොත් අඹු නසී"** යනුවෙන් පවසා ඇත. බියපත් වූ බමුණා මෙය තේරුම්ගත නොහැකිව ගමන් කරන අතර මගදී බෝසතාණන් වහන්සේ **(පණ්ඩිත් සේනක)** ගම් වැසියන්ට අවවාද අනුශාසනා දෙන ශාලාවක් හමුවිය. ඒ අසළට හඬවමින් පැමිණෙන බමුණා තමා බියට පත් හේතුව සැළකළේය. සේනක පණ්ඩිතයන්ට සියල්ල අවබෝධ විය. මල්ල බිම තියන ලෙස අණ කළ සේනක පණ්ඩිතයන් දිග පොල්ලක් ගෙන එන ලෙස අණ කළේය. එය ආධාරයෙන් මල්ල ලිහා දමූ විට, නයා පොල්ල දිගේ එළියට පැමිණ කැලය දෙනට බඩ ගා යන්නට විය. බෝධිසත්ව සේනක පඬිතුමාගේ නුවණින් සර්පයාගේ ජීවිතයත් මිනිස් ජීවිතත් ආරක්ෂා විය. **(Panna පඤ්ඤා පාරමිතාව - සේනක ජාතකය)**

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඥාණයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මගෙහි එක්තරා භවයක් සේනක ජාතකය තුළින් දේශනා කර වදාළහ.

(Panna පඤ්ඤා පාරමිතාව)



Pañña (WISDOM) PARAMITA - (THE STORY OF PANDITH SENAKA)

While the Bodhisatva was wandering in Sansara he was born in a Brahmin family as Senaka. He was very wise and advised people constantly with regards to their material and spiritual welfare.

At that time there was an old Brahmin who had carried a thousand gold coins. He gave his money to a certain family for safe custody. Unfortunately the whole amount had to be spent by them for their day to day family needs. Finally they gave a young maiden in marrage to him. The old Brahamin was very pleased with the exchange.The couple lived happily for some times. Later the wicked woman, wishing to live as she liked forced her old husband to go and fetch a servant girl. She gave some meals as provisions for the journey.

The poor old man putting them inside a bag and left his home and wandered from place to place to collect some money or find a servant girl. One day as he was tired and hungry he sat under a shady tree. He filled up with his meal and leaving the bag opened he walked up to the near by stream to drink some water. Meanwhile a snake crept into the bag. The Brahamin returned and unaware of the snake, closed the bag and carried it.

A certain tree deity, in order to make known the wisdom of the Bodhisatva said, **"Oh ! Brahamin if you go home your wife will die. If on the way you remain, you wll die"**

The frightened Brahamin did not know what to do, He could not understand the meaning of those words. Luckily it happeed to be a full moon day. People had gathered in large number to listen to the teaching of Pandith Senaka. The worried Brahamin went to the preaching hole and sat crying in a corner.

Pandith Senaka inquired the reason for crying As if he saw everything in his Devine Eye, He understood what actually had happened. He ordered a person to bring a long pole and open the bag, just then the hiding snake slowly crept out. People let it go without harming and the poor Brahamin was safed by the wisdom of the Bodisathva.

After the Enlightenment the Buddha said," Investigating by Wisdom: I then saved the Brahamin, in wisdom there is no equal to me. ***This is my perfection of Wisdom"***

******

5. වීර්ය පාරමිතා පුරණ එක්තරා භවයක

අප මහ බෝසතාණන් වහන්සේ එක්තරා භවයක ජනක නමින් ඉපිද වීර්යවන්තව සාධාරණ ලෙස වෙළඳාමෙහි යෙදෙමින් ජීවනෝපාය කරගෙන ගියහ. විශාල නැව්වලින් බඩු ප්‍රවාහනය කරමින් සිටියදී දිනක් නැව මහා සාගරයේ මැද කුණාටුවකට හසුවී මුහුදුබත් විය. ඇතැම්හු තම තමාගේ ආගම් සිහි කරගනිමින් මුහුදට බිලිවූහ. මුහුදුබත් වූ නැව වටා රැස් වූ මාළු ඔවුන්ගේ මාංශ ආහාරයට ගන්නට විය. වීර්ය වන්ත බෝසාතාණන් වහන්සේ සිය සිරුර පුරා තෙල් ගල්වා ගෙන, විය ගහ මතට නැගී දැඩි වීර්යකින් යුතුව නැවේ සිට හැකිතාක් දුරට මහ මුහුදට පැන දින හතක් නිරාහාරව පිහිනා ගොඩබිමක සේයාවක්වත් නොමැතිව දිරිමත් සිතෙන් අෂ්ඨාංග ශීලය සමාදන් වූහ. මෙම වීර්ය දුටු දේවතාවියක්, ඔහුට එදින රාත්‍රියෙහි ආහාර පිළිගැන්වුවද, එය ප්‍රතික්ෂේප කර ආරක්ෂා කරන සීලය රැක ගත්හ. මොහුගේ උත්සාහය නිෂ්ඵල බව කියමින් අධෛර්යයට පත් කිරීමට උත්සාහ කළ ද බෝසාතාණන් වහන්සේගේ පිළිතුර වූයේ අවසාන මොහොත දක්වා වීර්යය වඩවා අසමත් වුවද කම් නැත බවයි. උත්සාහ නොකිරීම අවමානයක් බවයි. ඔහුගේ ප්‍රතිපත්ති පිළිබඳව වඩා පැහැදුණු දේවතාවිය ගොඩබිමක් මවා නිරුපද්‍රිතව සේන්දු වීමට මඟ පාදාදුනි. (viriya **වීරිය පාරමිතා වීර්ය පාරමිතා** - මහා ජනක ජාතකය)

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මාති ඥානයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් මහා ජනක ජාතකය තුළින් දේශනා කර වදාළහ. (viriya **වීරිය පාරමිතා**)

(VIRIYA - වීර්ය පාරමිතා)

VIRIYA PARAMITA - (THE STORY OF JANAKA)

Long ago the Bodhisatva was born as an courageous merchant named Janaka, voyaged high seas in search of wealth. One day, unfortunately in the mid-sea the ship was wrecked. Some who attempted to swim perished, and a few implored gods for help. But the energetic Bodhisatva, relying on himself besmeared his body with oil and climbing the mast jumped far out into the sea beyond the reach of the fish that had collected near the wrecked boat to eat the flesh of drowning men. For seven days he courageously swam though no shores on both sides were visible to him. On the 8th day, as usual,even in mid ocead, he resolved to observe the 8 precepts.

A goddess seing him thus struggling for life, appeared before him and offered him some food. It was after mid-day, According to the precepts, he thanked the goddess and refused the offer though he was fasting for 7 days. To test him the goddess spoke discouraging words to him and said that he was only making a foolish attempt in thus swimming with no shore in sight.

The Bodhisatva replied that there was no disgrace in making an attempt though he would fail, disgrace lay in making no effort at all, through laziness.

The goddess was pleased with his loafty principles and perseverance. She saved him from a watery grave and safely led him home.

He was rewarded for his self- reliance and indomitable energy, whilst those who merely prayed perished miserably.

After the Enlightenment, the Buddha said, "In mid ocean was I, not seen both shores ; All the the people too perished. Still my mind vacillated not. This my perfection of energy"

**

6. ක්ෂාන්ති පාරමිතා පුරණ එක්තරා භවයක

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක ක්ෂාන්තිවාදී නමින් ඉපිද, වනගතව, තවුස්දම් පුරමින් සිටියහ. දිනක් මහ ඇමතිගේ ආරාධනා පරිදි රාජකීය උද්‍යානයක කෙළවර විශාල ගසක් පාමුල භාවනා යෝගීව වැඩ සිටියහ, රජතුමා අන්තඃපුර ස්ත්‍රීන් සමඟ උයන් කෙළි පිණිස පැමිණ සිය ප්‍රියතම කාන්තාවගේ උකුල මත හිස තබා නිදන්නට විය. අනිකුත් සියළුම ස්ත්‍රීහු ක්ෂාන්තිවාදී තාපසයාණන් දැක එතනට රොක් වී ධර්මය අසන්නට වූවාය.

ටික වේලාවකින් අවදි වූ රජතුමා, තමා කැටුව ආ ස්ත්‍රීන් පිළිබඳව විමසු කල්හි, ඔවුන් තවුසාණන්ගේ බණ දේශනාවට සවන්දෙන බව අසනා කෝපාවිෂ්ඨව එහි ගොස්, ඔබ කුමක් දේශනා කරන්නේද ය

විචාළහ. ඉවසීම, දේවයන්වහන්ස යනුවෙන් පිළිවදන් දුන් කල්හි, වඩාත් කෝපයට පත් රජ ඉවසීම යනු කුමක්දැය විචාළහ. දේවයන්වහන්ස, කවරෙකු හෝ ගැසුවත්, බැන්නත් කේන්ති නොගෙන, කෝප නොවී සිටීම යනුවෙන් පිළිතුරු දුන්හ. වඩාත් කෝප වූ රජ ඔබගේ ඉවසීම මම පරීක්ෂා කරන්නෙමි යි කියා අතවැසියන් ගෙන්වා ඔහුට පහර දෙන ලෙස අණ කළේය. සම පුපුරා රුධිරය ගලා ගියද, බෝසතාණන් වහන්සේ වේදනා ඉවසූහ. රජතුමා ඔබ තවමත් ඉවසීම පුරුදු කරන්නේ දැයි ඇසූ කල්හි, එසේය. ස්වාමිනී යනුවෙන් පිළිවදන් දුන්හ. කෝපය උසුලා ගත නොහැකි වූ රජ අත පය කපා දැමීමට අණ කළේය. ඉන්පසුව ද රජුගේ පැනයට පෙර ලෙසම පිළිතුරු ලැබිණි. අනතුරුව රජු නාසය සහ කන් කපා දැමීමට නියෝග කළේය. අවසානයේදී බෝසතාණන් වහන්සේ රජු අමතා, දේවයන් වහන්ස, මාගේ ඉවසීම, සමෙහි නැත. අත් පා වලද නැත. කන සහ නාසය තුළ ද නැත. එය ඇත්තේ මාගේ හදවත තුළයි. ඔබගේ බලය යොදා මාගේ දුර්වල සිරුර විනාශ කළ හැක. නමුත් දේවයන් වහන්ස මාගේ මනස සෙළවිය නොහැක. එය ඇසූ බල සම්පන්න රජ සිය පාදය ඔසවා විළුඹෙන් පපුව මැදට අනිනවාත් සමඟම රුධිරය ගංගාවක් මුඛයෙන් ගලා යන්නට විය. අවසාන මොහොතේද අප වැන්නවුන් වෛර නොකරන බව ප්‍රකාශ කරමින්, රජතුමා ඇතුළු සැමට සුවපත් වේවා යැයි ආශිර්වාද කළහ.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඤානයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් ක්ෂාන්තිවාදී ජාතකය තුළින් දේශනා කර වදාළහ.

(Khanthi **- ක්ෂාන්ති පාරමිතා)**

KHANTHI PARAMITA
(THE STORY OF SHANTHIVADI ASCETIC

Once upon a time the Bodhisatva leading the life of an ascetic was meditating at a foot of a tree in the King's royal park on an invitation of the King's Genaral. One day the king went to the park with the ladies of the court to relax. In a drunken state , he slept keeping his head on the lap of a favourite lady. As he was asleep the other ladies wandered around, By seeing the ascetic, they went to listen his teaching

On waking up, the king found that the ladies missing. Hearing that they had gone to the ascetic to hear his preachings, the king was annoyed and furious. Burning with Anger he went up to the innocent ascetics and questioned him in harsh tone " What do you preach , You Ascetic?

I preach PATIENCE, Your Majesty. Replied the ascetic calmly.

What is PATIENCE?

PATIENCE is not getting angry. Though you are abused or beaten.

"Well, I'll then test your patience , said the king and summoning the executioner, ordered him to throw the ascetic on the ground and beat him with a thorny whip. The innocent ascetic was whipped mercillessly. The ascetics skin burst. The whole body was smeared with blood. But the ascetic was true to his teaching and endured the pain patiently.

Do you still practice patience, Ascetic ? YES , Still I do Majesty.

The king then ordered his hands and feet to be cut off and questioned him again. Do you still practice patience, Ascetic ? YES , Still I do Majesty The same calm reply issued from his lips.

Full of wrath the King ordered his nose and ears to be cut off.

Mercilessly the excetioner chopped off his nose and ears.

With mutilated limbs, this innocent ascetic lay on a pool of blood. The kng asked him again..

Do you still practice patience, Ascetic ? YES , Still I do Majesty. Please do not think that my patence lies in my skin or in my hands and feet or in my nose or ears. My PATIENCE lies within my heart. With your superior strength you can over power my weak body. But Your Majesty my mind can never been changed, cooly replied the ascetics. He harboured no ill will towards the king Not did he look at him with any anger. The king's anger knew no bounds . Deeply enraged ***HE RAISED HIS FOOT AND STAMPED THE CHEST OF THE ASCETIC WITH HIS HEEL.*** Immediately blood gushed out of his mouth.

The General who had invited him heard of his pitiful state and at once he hurried to his presence . Quickly he applied some ointment and begged him not to curse the kingdom

The merciful ascetic, instead of cursing the king, blessed him saying , ***"He who caused my hands and feet , nose and ears to be cut off, May that king live long! Men like us never get angry"***

After his Enlightenment the Buddha said , Though hacked by a sharp axe as if I was inanimate, I did not get angry with the King. This is my PERFECTION of PATIENCE

**

7. සත්‍ය පාරමිතාව පුරණ එක්තරා භවයක (සුතසෝම ජාතකය)

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක සුතසෝම නමින් ඉපිද, සත්‍ය ගරුකව ඉතා සාධාරණ ලෙස රාජ්‍ය පාලනය කරන්නට වූහ. එකල්හි මිනිස් මාංශ අනුභව කරන පෝරිසාද නැමැත්තෙක් රාජ්‍යයෙන් පලවා හරිනු ලදුව වන වැදී, සිතේ හැටියට මාංශ අනුභව කරමින් කල්ගත කළහ.

දිනක් සිය පාදයේ කටුවක් ඇනීම නිසා ඉවසාගත නොහැකි වේදනාවෙන් වනයේ වෘක්ෂ දේවතාවෙකුට මෙසේ බාරයක් විය. "මෙම කටුව ඉවත් කර දමා සුවපත් කරන්නේ නම් රජවරු සියයකගේ මස් වලින් බිලි පූජාවක් කරමි." ටික දිනකින් වේදනාව සුවවිය. අන්ධබාල පෝරිසාද, බාරය නිසා වේදනාව සුව වුවායැයි සිතා බිලි පූජාවට රජවරු එක්රැස් කරන්නට විය. අප්‍රසාදයට පත් දේවතාවිය මෙම ක්‍රියාව නතර කරවීමේ අරමුණෙන් සුතසෝම රජ ද බිලි පූජාවට යොදා ගන්නා ලෙස අණ කළාය. රජතුමා ස්නානය කරන තැන සැඟවී සිටි පෝරිසාද, සුතසෝම රජ ජීවග්‍රහයෙන් අල්ලා ගත්තේය. පෝරිසාදගෙන් කාරුණිකව ඉල්ලීමක් කළ සුතසෝම රජ කියා සිටියේ, පොරොන්දු වූ වැඩ කොටසක් තිබෙන හෙයින් එය ඉටු කර දී ආපසු පැමිණීමට තමා නිදහස් කරන ලෙසයි. අකමැත්තෙන් වුවද පෝරිසාද, සුතසෝම නිදහස් කරන්නට වුයේ නැවත පැමිණෙතැයි අපේක්ෂාවෙන් නොවේ. එහෙත් යෝජිත වැඩ කොටස අවසන් කළ සුතසෝම රජ නැවත පෝරිසාද හමුවට ස්ව කැමැත්තෙන්ම පැමිණියේ පොරොන්දු වූ පරිදිමය. රජතුමාගේ සත්‍ය ගරුක බව කෙරෙහි පැහැදුණු පෝරිසාද, රජතුමාගෙන් ධර්මය අසා පැහැදී රඳවාගත් සියළුම රජවරු නිදහස් කර යැවීය.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මෘති ඥානයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මඟෙහි එක්තරා භවයක් මහා **සුතසෝම ජාතකය** තුළින් දේශනා කර වදාළහ.

(Sacca -සත්‍ය පාරමිතා)

SACCA PARAMITA - (THE STORY OF MAHASUTHASOMA)

The bodisatva: by the name of King Sothasoma once ruled the kingdom righteously. He did not break his promises any day. At that time there was a man eater named Porisada. He was also formerly a king, but due to the habit of eating human flesh he was forced to leave his kindom. In a forest under a banyan tree he lived feasting on human flesh as he liked.

One day a thorn pricked his foot and he suffered long acute pain from the wound. Thus in this state of agony, he made a vow to the tree-deity that if his wound would heel, he would pay back by making a grand sacrifies of a hundred kings. Due to his fasting and resting , the wound heeled in a very short time. Foolshly he thought that his cure was due to the kindness of the tree deity.

In accidence with his vow, he succeeded in seizing a hundred and one kings and made all arrangements for the great sacrifice. The daity resented this human sacrifiece, and in order to prevent it, he appeared before Porisada and asked him to get King Suthasoma also as a sacrifies. Porisada lost no time in capturing the wanted king. He went to the pond where the king bathed and hid himself. As the king had finished his bath Porisada rushed forth wirling a sword above his head and proclaiming his name. At once he carried away the king on his shoulders .

At this moment, the king was not frightened at all but he felt sorry indeed for not been able to keep his appointment with a Brahamin who desired to recite him four advisory verses. As the king was going to have his bath in the park , he send the learned Brahamin to the city and promised that he would come and hear him, after his bath.

So King Suthasoma told Porisada of his promise made to the Brahamin and begged him that he would return ready for the sacrifice. Porisada had no desire to kill him because they both had

been fellow students in their childhood and he had every reason to be grateful to him. He allowed him to go without expecting his return.

King Suthasoma returned to the palace. Heard the words of counsel from the Brahmin and gave him presents. Then the noble king summoned all his courtiers and mentioned about his promise to Porisada.They advised him not to go as he would surely be killed. But the Bodhisatta was ***a man of principles***. He handed over his kingdom and left the palace to keep his promise in spite of weeping and lamenting of his relatives and others.

As porisada was preparing a fire to offer his human sacrifice, king Suthasoma arrived on the scene and stood before him. Porisada was surprised to see him. He told him **"How foolish are you? I released you thinking that you would not come. You know well that you would be killed. Why did you come back ?"**

Oh! Porisada, in your opinion I may have done a foolish act. But I value my word. I promised to come and I have come now. I honour my promise even more than my life. You may sacrifice me.

Porisada was very much pleased on hearing the speech of his friend. He yearned to hear more from him and he sat at his feet listening to the advice of the Bodhisatva . The Bodisatva preached to him. His inner goodness came to the surface and he became a changed person after the preaching Porisada gave up his proposed sacrifice and released all the hundred and one kings and sent them to their respected kingdoms.He himself returned to his kingdom as a reformed king to lead a righteous life.

After his enlightenment the Buddha said, "fulfilling my truthful word I sacrificed my life and saved one hundred and one warrior kings, This is my perfection of truthfulness."

**

8. අධිෂ්ඨාන පාරමිතා පුරණ එක්තරා භවයක - තේමිය ජාතකය

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක රජ කුලයක තේමිය නමින් ඉපිද, කුඩා කල සිටම පිය රජ තුමාගේ රාජ්‍ය නියෝග හා තීන්දු තීරණ කෙරෙහි කළකිරෙන්නට විය. රාජ්‍ය බලය ඔස්සේ රැස් කර ගන්නා පාප කර්ම පිළිබඳවත්, ඒ වෙනුවෙන් පෙර භවයන්හිදී තමාට අත් විඳින්නට සිදු වූ දුක් පීඩා පිළිබඳවත්, කුමරුගේ ජාතිස්මරණ ඥානය තුළින් සිහිපත් වන්නට විය. තමාට උරුම වීමට නියමිත රජකමෙන් කෙසේ හෝ බේරී සිටීමට තේමිය කුමරාට සිත් පහළ විය.

දිනක් රාජකීය තොටිල්ලක සැතපී සිටි කුමරුට, පෙර ආත්ම භවයක සිය මෑණියන් වූ දේවතාවියක් පෙනී සිටිමින් මෙසේ ප්‍රකාශ කළාය. පුතේ, ඔබගේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට නම්, ඔබ කොරෙකකු නොවුනද, කොරෙකු ලෙස ද බිහිරෙකු නොවුනද, බිහිරෙකු ලෙස ද, ගොළුවෙකු නොවුනද, ගොළුවෙකු ලෙස ද හැසිරිය යුතුය. දේවතාවිය ගේ අවවාදය පිළිගත් කුමරු එසේ තම චර්යාව පවත්වා ගැනීමට දැඩි සේ අධිෂ්ඨාන කර ගත්තේය.

ඒ අනුව පුරා වසර 16 ක්ම රජකම ප්‍රතික්ෂේප කර ගැනීම පිණිස තේමිය කුමරු, අධිෂ්ඨාන පූර්වකව මහත් වූ වෑයමක යෙදෙන්න විය. කුමන තත්ත්වයක් හමුවේ වුවද කුමරු සිය අධිෂ්ඨානය මතම පිහිටා කටයුතු කළේය. රජතුමා සහ දේවිය නොයෙකුත් වෛද්‍ය ප්‍රතිකාර සහ වෙනත් ප්‍රතිකාර කළ ද සියල්ලක් නිෂ්ඵල විය. ආබාධිත තත්ත්වයක් නොවන බව වෛද්‍ය මත වූයෙන්, අවසානයේදී දේවියගේ බලවත් ඉල්ලීම උඩ දින 7 කට රජකම පවරා දීමට තීරණය කළ ද, එය ද නිෂ්ඵල විය. කුමරුගේ මෙම චර්යාවන් පිළිබඳව දැඩිසේ කෝපාවිෂ්ඨ වූ මහ රජ, සේවකයෙකු අමතා, මෙසේ කීය. මෙම තේමිය කුමරු මාළිගාවේ පසුපස දොරෙන් එළියට ගෙන කරත්තයක පටවාගෙන කනත්තට ගෙන ගොස් වලක් කපා පණ පිටින් ම මිහිදන් කරව මෙම නියෝගය සවන් ගැටුන විගස දේවිය මහත් කම්පාවට පැමිණ, තේමිය කුමරු ඉදිරියේ හඬා වැළපෙන්නට විය. ඔබ ආබාධිත නොවන බව අපගේ විශ්වාසයයි. මෙලෙසින් අපහට මෙන්ම රජ පෙළපතට අවමන් නොකරන්න යනුවෙන් ඇවිටිලි කළාය. ඒ වන විට රාජ නියෝගය සවන් ගැටී සිටි තේමිය ඒ පිළිබඳව සතුටු සිතින් පසු වුයේ සිය අධිෂ්ඨානය මල්ඵල ගැන්වෙන බවට නිමිති පහළව

ඇති හෙයිනි. මව් දේවියගේ ආන්දෝලනාත්මක වැළපීම හදවත පැලී යන්නාක් සේ වුවද, මෙම තීරණාත්මක මොහොතටද, කුමරු සිය අධිෂ්ඨානය යටපත් වන්නට ඉඩ නොදුණි. තමාගේ මෙම වෑයම සකල ලෝ සතුන්ගේ යහපත වෙනුවෙන් බව සිතා ඔහු මව කෙරෙහි ප්‍රතිචාර දක්වීමෙන් වැළකුණි. කුමරා මෙසේ සිතන්නට විය. මා, මව සැනසීමට පිළිතුරු දුනහොත් මාගේ 16 වසරක උත්සාහය, ව්‍යාර්ථ වනු ඇත. මා නිහඬව සිටීමෙන් කවදා හෝ මව්පියන් හට සදාකාලික සතුට ලබා දිය හැක. මෙසේ ස්වයං තීරණයක් ගත් තේමිය කුමරු මෙතෙක් කල් සිටි ඉරියව්වෙන්ම කනත්ත දක්වාම කරත්තයෙන් ගමන් කළේය. කරත්තය පසෙක නවතා උදැල්ල ද රැගෙන සේවකයා වළක් කැපීම පිණිස තරමක් ඔබ්බට ගිය කල්හි, කුමරා රථයෙන් බැස අත පය දිග හැර බලන්නට වූයේ ඒවා සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කළ හැකිද යන්නයි. පෙර පින් බලයෙන් කිසිදු අපහසුතාවයකින් තොරව අත්පා චලනය කිරීමට හැකි බව අවබෝධ විණි. වළ කපන සේවකයා ළඟට ගිය ඔහු ඔබ කුමක් කරන්නේදැයි විචාළේය. රාජ නියෝගය පරිදි මහ රජතුමාගේ ආබාධිත තේමිය කුමරු මිහිදන් කිරීම පිණිස වළක් කපන්නෙමි. එම කාර්යය නවතා ආපසු යන ලෙස අණ කළ තේමිය කුමරා වනගත විය. පුදුමයට පත් රථාචාර්ය (සේවකයා) ආපසු මාළිගාවට ගොස් සියල්ල සැළ කළේය. පසුව මාළිගාවේ අන් අය ද මේ මාවතටම බැස තවුස් දම් පුරන්නට වූහ.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ එම ආත්මභවය පිළිබඳව විස්තර කරමින් තේමිය ජාතකය දේශනා කරන්නට වූහ. තමන් වහන්සේට පිය මහ රජුට හෝ රජ පෙළපතට අවනම්බුවක් කිරීමේ අදහසක් හෝ මෑණියන් වහන්සේ අපහසුතාවයට පත්කිරීමේ චේතනාවක් හෝ නොතිබුණු බවත් අවශ්‍ය වූයේ සම්මා සම්බුද්ධත්වයට පත් වී සසර දුක් විඳින සියල්ලෝම සසර දුකින් මුදවා ගැනීම බවත් දේශනා කර වදාළහ. (Determination -අධිෂ්ඨාන පාරමිතාව)

මෙලෙස නෙක්කම්ම සුවය විඳීමට, ගිහි ගෙයින් නික්මීම සඳහා දරුවා වූ ප්‍රයත්නය **කෙතරම් අසීරු ද? කෙතරම් විශ්මයජනකද? අධිෂ්ඨා බල පිහිටුවා ගත් කල්හි මිනිහාට කළ නොහැක්කක් නැත.**



ADHISHTHANA PARAMITA-
(THE STORY OF PRINCE THEMIYA)

Once upon a time our Bodhisatta was born in a royal family. He was named Themiya. While he was only one month old, lying on the lap of the father he noticed how the king ordered 4 thieves to be punished. Though he was an infant he thought that his father was acquiring evil Kamma by his kingship. On the following day as he was sleeping under the royal canopy, he remembered his past life. He recalled how he was suffering in his previous birth owing to his evil kamma, done as a king. He therefore resolved to get away from that ' Royal Prison'

A goddess, who was guarding the canopy and who had been his mother in a previous birth, advised him thus, " Dear Son, If you so wish, **behave like a cripple though not a cripple, a dumb though not dumb, behave like a deaf though not deaf."** He accepted the advice of the goddess and made a firm determination

to do likewise. He suffered much in pretending daily reactions, but he did not change his resolution. For 16 years he acted as advised.

The kind parents then approached him and said; "Dear son Themiya, we know that you are not a cripple, not deaf or dumb. Their faces, ears and limbs are not like yours. We longed for you and we got you. Please do not disgrace us. Save our good name, Son"

But the iron willed Themiya was silent. He remained as he did not hear a word. The king could no longer bear this insult. He grew his annoyed and made an order that the prince should be taken in a hearse through the back door and buried alive. The sorrowful mother queen who received a favour from the king on the birth day of the Prince, approached the king and remembered him of the favour and begged him to grant an excuse for her son for 7 days. With difficulty she got the consent of the king and implored the son again and again for seven days to change his attitude but her attempt was no success.

On the 7th day the king summoned the charioteer and said, " Tomorrow you should take this wretched child to the cemetery. Dig a grave there, smash his head and bury him" The queen could not bear the fateful order. She came and told her son about it. Prince Themiya was delighted to hear this seemingly news. He was happy because he knew that his determination should be crowned with success after 16 years.

But the poor mother's tender heart was almost to breakthrough grief. As ordered the charioteer went to the chamber of the prince and carried him out of the palace while the mother queen was weeping and lamenting. It was a critical moment for the noble prince. He looked at the mother and thought "If I do not speak now my mother will be deeply grieved {mourned}. If I do speak, then my resolution for 16 years will be useless. By my silence then I will be bring eternal happiness to al1 parents."

In this instance, the Bodhisatta cared more for his determination than for the grief of his mother. His devotion to his superior principle made him firm to follow his perfection.

The charioteer took him in a hearse and sopped it near the cemetery. Leaving the prince in the hearse he started digging a grave. Meanwhile the prince rose up and went to the charioteer. To his great dismay he found out that the prince was healthy and in peak condition. As the prince decided to remain in the forest meditating, the charioteer returned to the palace and reported the whole matter The prince lived as an ascetic and later on others also followed his foot step.

After the Enlightment: the Buddha said…" I did not despise my father and mother, nor my great glory, but I preferred ' Omniscience '. Therefore did I make that vow'

* *

9. මෙත්තා පාරමිතා පුරණ එක්තරා භවයක චූල ධර්මපාල ජාතකය

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක රජ කුලයක ධර්මපාල නමින් ඉපිද සත් මස් වයසට එනතුරු මව් දේවියගේ උණුසුම ලබමින් පෝෂණය වුහ. දිනක් මව් දේවිය දරුවා උකුලේ හොවාගෙන මාළිගාව අසළ එළි මහනේ ගල් තලාවක් මත විවේකීව සිටියදී රජතුමාණෝ එතනට පැමිණියහ. දරුවා උකුලේ අඬ නින්දේ පසු වූ හෙයින් රජතුමාට ගෞරව දැක්වීමට දේවියට නොහැකි විය. කෝපයට පත් රජ මාළිගාවෙහි උඩු මහලට ගොස්, අලුගෝසුවා අමතා, **"අර මාගේ හතුරා ධර්මපාලගේ පාදයෙන් බිම ඇදගෙන මෙහාට ගෙන එව"යි"** අණ කළේය. දේවියගෙන් කුමරා ලබාගෙන නියෝගය ක්‍රියාත්මක වන විට මැණියන් වහන්සේ ද දරාගත නොහැකි වේදනාවෙන් යුතුව මාළිගාව දුව ගොස් දරුවාට දඬුවම් නොදෙන ලෙස බැගෑපත් ලෙස ආයාචනය කළ ද, කෝපාවිෂ්ඨ රජු ඔහුගේ තීරණය වෙනස් නොකළේය. ධර්මපාලගේ අත්පා කපා සතර මං සන්දියකට ගෙන ගොස් හිස ගසා මාංශ සතර අතට විසිකර දැමීමට අණ දුන් කල්හි මැණියන් වහන්සේ මෙසේ කියා සිටියහ. මහ රජ ඔබ වහන්සේට ගෞරව දැක්වීමට නොහැකි වීම වෙනුවෙන් මගේ

හිස ගසා දමන්න. මට දඬුවම් දෙන්න. අසරණ දරු සිඟිත්තාට දඬුවම් නොකරන්න. දරු දුක මවකට ඉවසා ගත නොහැකියි. දේවයන් වහන්ස මෙසේ ආයාචන කරමින් හඬා වැළපුණ ද රජ අණ ක්‍රියාත්මක විය.

කැපී ගිය බාහු, ළය මැද හොවාගෙන වියරුවෙන මෙන් රාජ නියෝගය ක්‍රියාත්මක කරන සේවකයා පසුපස විලාප නඟමින් දේවිය ද මහ මඟ පිස්සියක මෙන් දුවන්නට වුවාය. ධර්මපාල කුමරු කුඩා වුවද සසර පුරා ගෙන ආ ප්‍රාඥා බලය නිසා වෛරී සිතක් ඇති කර නොගත්තේය. ඔහු මෙසේ සිතන්නට විය. මාගේ පිය රජතුමා සුවපත් වේවා කිසිම ලෙඩක්, දුකක් වේදනාවක් ඔහුට ඇති නොවේවා රාජ්‍ය නියෝගය අනුව මගේ අත් පා කපා දමා මා මරණයට පත් කරන ඝාතකයාද නිදුක් වේවා සැම දෙනාම මේ දුක්ඛිත සසර සයුරින් එතෙර වෙත්වා මාගේ මෙම උතුම් ප්‍රාර්ථනය මට බුද්ධත්වය පිණිසම හේතු වේවා යි සිත්හි ධාරණය කරගෙන ධර්මපාල කුමරු නිර්භයව මරණයට මුහුණ දුන්නේය. කෝපයෙන් වියරු වැටී සිටි රජතුමාටත්, ශෝකයෙන් මුසපත් වී සිටි මැණියන් වහන්සේටත්, ත්‍රාසයෙන් බියපත්ව සිටි ඝාතකයාටත් එකලෙසින් මෙත් සිත පතුරා ධර්මපාල කුමරු අවසන් හුස්ම හෙලුවේය.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මාති ඥානයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මගෙහි එක්තරා භවයක් චූල ධර්මපාල ජාතකය තුළින් දේශනා කර වදාළහ. (Loving Kindness මෙත්තා පාරමිතා) සැමට එකලෙස මෛත්‍රිය පතුරුවා හැරීමෙන් ජයග්‍රහණය කරා ලඟා වියහැකිය.

METTA PARAMITA
(THE STORY OF PRINCE DHARMAPALA)

Long ago there was a king named Maha Pratapa. His queen was Chandra Devi. They had a cute loveable son named Dharmapala .He was our Bodhisatva. People were rejoiced over the birth of the charming prince. The king also was happy but he was proud ,jealous and selfish. His wickekness knew no bounds.

One day the happy queen was fondling the Prince keepimg him on her laps in the outside of the palace. The king happened to pass by. Seeing the king, the queen could not rise to salute him as the baby Prince was on her lap. At once the king was upset by this seemingly disrespectful attitude. Furious king returned to the

upper storey and summond the executioner. He came quickly with an axe in his hand and stood before the king awaiting his order ." My enemy in this palace is that fellow, **"Dharmapala! Seize him by his feet & drag him before me"** ordered the king angrily.

The executioner went up to the queen. Begged her parden, grasped the baby by the feet and mercilessly dragged the 7 month old baby prince along the ground. Overcome with grief, the queen came crying and begged the king to punish her for the disrespect instead of the helpess, innocent child. But the heartless king was not moved by such pleading and crying. In fact he was dominated by anger and jealousy. So he ordered the executioner to cut off the hands and feet of little Dharmapala . With no mercy the executioner chopped off the limbs of the infant Prince. The affectionate mother clasping those severed limbs of her son,said **"Your Majesty, A mother's love for her children is very deep. Please Your Majesty allow me to have even this maimed body of my child"**

The hard hearted king was not moved by such soft words." Take the child to a Fourway junction and execute him. Pierce his heart with a sward , Cut off his flesh and throw to the four direction" was the cruel order of the valiant father.

Young Dharmapala was only seven months old. Though he was sucking infant he was an advanced being . He was a Buddha to be: Bodhisatva. He had no malice in his tender heart, instead radiate his thoughts of **Loving -Kindness towards all.**

Some thoughts struck into his mind as someone says to himself *"Dharmapala, Here is a golden opportunity for you to practice your Loving Kindness.In front of you is your father who has ordered You to be killed ruthlessly. On your side is the executioner; who is about to kill you. On other side is your grieving mother whose heart is about to burst. In the center is your helpless self. You may surely love your dear mother. But your love for your father should be greater. Your beloved*

mother just cry for you. But it is your beloved father that has given you this rare opportunity to practice patience and Loving kindness equally towars all the four."

He started to think like this

" May no misfortune befall my father !

" May he not be subjected to any suffering! " May he be free from all diseases & calamities !

" May all these people ever be well and happy !

May I be a Buddha in future by the mighty of this great deed!

With these thoughts the noble minded Dharmapala was killed but his bounded love triumphed

After the Enlightment: the Buddha preached..." I did not angry with my father. As well as to mymother I blessed him and also to the executer ***with Loving Kindness.*** *At that moment too, I preferred ' Omniscience '. Therefore I faced with that challenge and got the benefit of the chance I had".*

10. උපේක්ෂා පාරමිතාව පුරණ එක්තරා භවයක (ලෝමහංස ජාතකය)

බෝසතාණන් වහන්සේ එක්තරා භවයක උසස්, ධනවත් කුලයක ලෝමහංස නමින් ඉපිද, වයසින් මෝරායන කල්හි, සැමටම නොලැබෙන ලෞකික සැපසම්පත් වල ඇති නිස්සාරභාවය අවබෝධ කොටගෙන තවුස් දම් පිරීමට අදහස් කළහ. ඒ සඳහා සුපුරුදු පරිසරය යොදාගත හොත්, තමා දන්නා හඳුණන අසල් වැසි සැම තමා වෙත ගෞරව දැක්වීමටත්, විවිධ දේ කිරීමටත් සුදානම් වෙතැයි සිතා, නිවසින් බැහැරව ගොස් සමබර මානසිකත්වයකින් යුතුව ලැබෙන දෙයකින්, උපේක්ෂාවෙන් ජීවත් වීමේ අදහසින් ගිහි ගෙයින් නික්මුණහ.

තවුස් වෙස් දරමින් අට ලෝ දහමින් අකම්පිතව සරල දිවිපෙවතක් ගත කරන්නට වූ මොහු, කුමන තත්ත්වයක් හමුවේ වුවද, උපේක්ෂා සහගතව ජීවිතයේ යථාර්ථයයට මුහුණු දෙමින් එය අවබෝධ කරගැනීමට වෙහෙසෙන්නට විය. ඇණුම්, බැණුම්, දෝෂාරෝපණ ගැටළු ආදියෙන් ඔහු පළා නොගියේය.

දිනක් දඟකාර ළමයි පිරිසක් සෙල්ලකම් කරන ඉසව්වකට පැමිණි මොහු, ළමයින්ගේ සරදමට ලක්විය. ඔවුහු මෙම ලෝමහංස තවුසාට නොයෙක් අන්දමේ තාඩන, පීඩන කරන්නට වූහ. කිසිඳු ප්‍රතිචාරයක් නොමැතිව සියල්ල උපේක්ෂාවෙන් ඉවසා සිටි තවුසා වෙහෙස නිසා ඒ අසල තිබූ කනත්තකට ගොස් ඇට කටු ටිකක් එක් තැන් කොට කොට්ටක් සේ උසට සකස් කර තබා විවේක ගන්නට සැරසුණි. මොහොතකින් වයෝවෘද්ධ යුවලක් එම ස්ථානයට පැමිණ, ලෝහමංහස තවුසා සියල්ල ඉවසා සිටින ආකාරය දැක ඔහුට ගෞරව දක්වන්නට වූහ. මේ වන විට නින්දා, ප්‍රශංසා එක ලෙස දරාගැනීමට තරම් උසස් මනෝභාවයකින් හෙබි තවුස් තෙම කිසිදු ප්‍රතිචාරයක් නොමැතිව එම ගෞරව අභිමාන සියල්ල ද උපේක්ෂාවෙන් දරා සිටියේය.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදු පියාණන් වහන්සේ පූර්වේ නිවාසානුස්මාති ඤානයෙන් (පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ) තමන් වහන්සේ ආ මගෙහි එක්තරා භවයක, බුද්ධත්වය ලැබීම සඳහා අනිවාර්ය වන උපේක්ෂා පාරමිතාව ද මනාසේ පුරමින්, ලාභ අලාභ, යස අයස, නින්දා ප්‍රශංසා, සැපදුක ආදී වූ අටලෝ දහම හමුවේ අකම්පිත මානසිකත්වයක් තමන් වහනසේ ගොඩනඟා ගත් ආකාරය ලෝමහංස ජාතකය තුළින් දේශනා කර වදාළහ.

(Equanimity - උපේක්ෂා පාරමිතා)



UPEKKHA PARAMITA- (THE STORY OF LOMAHANSA)

Once in the Sansaric journey Bodhisatva was born in a worthy and noble family. He was named as Lomahansa. While he was getting into the prime of his life he realized the unassuming nature of worldly pleasure. He thought to become an ascetic and decided to leave his village as he wanted to avoid the offering of neighbours and relatives. He knew surely if he stay in the same locality he may get great respect and various gifts. So he left home and wander from place to place pratising equanimity.

Having only a cloth to cover his body, he left home and wandered as an ascetic seeking opportunities to practice equanimity. He preferred to stay long in those places where he was likely to be ridiculed and abused. His object was to maintain a balanced mind amidst gain and loss, praise and blame, honour and dshonour, happiness and pain. He succeeded in his noble effort.

In this course of his wandering he came to a place where there were mischievous children, who found pleasure in abusing, teasing and making fun of others specially old people. The Bodhisatva thought it was the place for him to practice equanimity.

The children were delighted as they met a suitable person for their amusement. So they made jokes and fun for him. Lomahansa pretended to be displeased with their mischievous and playful act. As a result these naughty children ridiculed him more and more. As he was greatly insulted and hurt he went to a cemetery close by and made a place to relax there, keeping some bones as a pillow. Taking full advantage of his difference these rascals surrounded him and subjected him to all kinds of insults. An elderly man and a women who came there appreciated the equanimity of Bodhisatva and paid him great respect.

Under all circumstances the Bodhisatva practiced perfect equanimity without any change of mind what so ever. “ Equally balanced was I at all times amids pain and happiness, Praise or Blame, Ths is my perfection of equanimity”

After the Enlightment: the Buddha preached…” I did not angry with the boys who teased me. I did notchanged my attitude when I was praised by villagers At that moment too, I preferred ‘Omniscience’. Therefore I faced with that challenge and got the benefit of the chance I had ”.

* *

“For the salvation of all beings the Buddha suffered a lot anomously in His previous birth. His one and only ambition was to be enlightened”

බුදු පියාණන් වහන්සේ සාර අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂ ගණනක් විවිධ භවයන්හි ඉපිද, සම්මා සම්බුද්ධත්වය සඳහාම ඒකායන අරමුණෙන් යුතුව අප්‍රමාණ වද හිංසාවන්ට පාත්‍ර වෙමින් වැඩි ගමන් මඟ කෙතරම් කටුක ද? එවන් දුෂ්කර වූ ගමන් මඟක අධිෂ්ඨාන පූර්වකව ඉදිරියටම පා නගද්දී මුහුණ පෑමට සිදු වූ ඇතැම් සංසිද්ධීන් මිනිස් හදවත් කම්පා කරවන සුළුය. එවන් අභියෝග ජයගනිමින් සිදුහත් බෝසතාණෝ වැඩි ගමන් මඟ කෙතරම් සංවේග ජනකද? කෙතරම් ආශ්වාද ජනකද? කෙතරම් ආදර්ශමත් ද?

අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂ හතරක් පුරා විවිධ ආත්ම භවයන් හි ඉපදෙමින් මෙම පාරමිතා දහය **පාරමිතා** වශයෙනුත්, **උප පාරමිතා** වශයෙනුත්, **පරමත්ත පාරමිතා** වශයෙනුත් සම්පූර්ණ කිරීමට සිදුහත් බෝසතාණන් වහන්සේ වැඩි ගමන් මඟ කෙතරම් කටුකද? සසර දුක් විඳින ලෝ සතුන් සසර කතරින් එතෙර කරවීමේ පරම අධිෂ්ඨානයෙන් යුතුව මෙලෙස පෙරුම් දම් පුරා, ලෝකයේ පවත්නා **සත්‍යය** අවබෝධ කර ගත්, වෙනත් නායකයෙකු, ශ්‍රේෂ්ඨයෙකු, විද්‍යාඥයෙකු හෝ ගාන්ධර්වයෙකු පිළිබඳව මෙතෙක් විශ්වය තුළ **විද්‍යමාන වී නැත. මෙම බල පරාක්‍රමය විනිවිද දැකිය හැකි, එමෙන්ම විදහා දැක්විය හැකි ශක්තියක් මේ දක්වා ලොව කිසිවෙකු විසින් සොයාගෙන නැත.** ඇතැම්හු උත්සහා

කරති. කල්පිත ගොඩනගති. එහෙත් පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන හමුවේ එම කල්පිත බිඳී යයි. බුදු පියාණන් වහන්සේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා ආර්ය පර්යේෂණයක යෙදෙමින් ලොවට හෙළිකළ මෙම චතුරාර්ය සත්‍යය කෙතරම් විස්මිත ද?

එය සාවද්‍ය යැයි ලොවට හෙළි කළ හැක්කෙක් මේ දක්වා ලොව පහළ වී නැත. සත්‍යය වටා ලෝකය දෝලනය වෙයි. අපට ඇත්තේ බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් මඟ ඔස්සේ ගමන් කර, එම **චතුරාර්ය සත්‍යය** අවබෝධ කරගෙන, පරම සුව දෙන අමෘත මහා නිර්වාණය සුවය ළඟා කර ගැනීම පමණි. ඉන් මෙපිට උපන් සත්ත්වයාට දුක උරුම වනු විනා අන් සරණක් නැත්තේමය. අප කාටත් අටලෝ දහම පොදුය. ලාභ - අලාභ, යස- අයස, නින්දා- ප්‍රශංසා, සැප-දුක ආදී වූ ධර්මතා හමුවේ එක ලෙස උපේක්ෂාවෙන් කටයුතු කර ජීවිතය ජයග්‍රහණය ළඟා කර ගැනීමට වෙහෙස විය යුතුය.

ධර්මය දැකීමට අපොහොසත් වන්නෝද, ලද මිනිසත් භවයෙන් නිසි එල නොලැබුවෝ වෙති. මෙම දුර්ලභ මිනිස් භවයෙන් මෙවන් බුද්ධොත්පාද කාලයක එල ලැබ ගත නොහැක්කේ නම් එය විශාල අභාග ්‍යයකි. නැවතත් මිනිස් භවයක් පිළිබඳව කාට නම් කිව හැකි ද.

***

4

සිදුහත් කුමරාගේ ඓශ්වර්යමත් උපත
Unique Birth of Prince Sidddhartha

පාරමිතා සපුරා තුසිත දෙව්ලොව උපන් බෝසතාණන් වහන්සේ එම පාරමී දම් බෙලෙන් පස් මහා බැලුම් බලා මෙළොව ඉපදීම පිණිස මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත්හ. ඒ ඇසළ පුර සඳ බැබලෙන අසිරිමත් රාත්‍රියේ මහාමායා දේවිය දුටු සිහිනය ද මනස්කාන්ත ය. සුදු ඇත් පැටවෙකු, සුදු පිවිතුරු නෙළුම් මලක් සොඬෙහි දරාගෙන, මහාමායා දේවිය නිදි දෙව්දුව වැළඳ ගෙන සිටි සිරි යහන් ගැබට පිවිස, තෙවරක් දේවිය නිදා සිටි යහන වටා ප්‍රදක්ෂිනා කොට දකුණු ඇලයෙන් කුස තුළට පිවිසි බවත් අනතුරුව මහාමායා දේවිය සමගින්ම එම සිරි යහන සතර වරම් දෙවිවරුන් විසින් අනෝතප්ප විල අසලට ඔසවාගෙන යාමත් කෙතරම් විචිත්‍රවත්ද? මෙතරම් සුන්දර සිහිනයකින් සනිටුහන් වූයේ උතුම් සම්මා සම්බුදුවරයෙකු වීමට සමත් පින්වත් පුත් රුවනක් මහාමායා දේවියගේ කුස පිළිසිඳගෙන ඇති බවත්, නොබෝ දිනකින් මිනිස් ලොව පහළවන බවත්ය. එය යථාර්ථයක් නොවන්නට අදත් අපි භව අඳුරේ ගමනාන්තයක් නොදැක අතරමං වූවෝ වෙමු.

නිසි කල් ඇවෑමෙන් මහාමායා දේවිය දෙව්දහනුවර සිය දෙමාපියන් සමීපයට යවන ලද්දේ එදා පැවති චාරිත්‍රානුකූලව ය. ඒ අවශ්‍ය පිරිවර ද සමඟිනි. අතරමඟ ලුම්බිණි සල් උයනෙහි පහස ලබමින් සිටි මහාමායා දේවිය පින්වත් පුත් රුවනකට ජන්ම ලාභය ලබා දුන්නාය. සතර වරම් දෙවිවරු පැමිණ කුමරාහට සියලු ආරක්‍ෂාව ලබාදුන්හ. ඒ පින්වත් සිඟිති දෙපා පිළිගැනීමට නෙළුම් මල් 7 ක් පිපුණි. දකින්නවුන් විශ්මයට පත් කරවමින් ඒ මත පියවර 7 ක් ගමන් කළ පින්වත් කුමරාණෝ මෙසේ ලොවට උදම් අනන්නට වූහ.

මම ලොවට අග්‍ර වෙමි, දෙටු වෙමි, මම ශ්‍රේෂ්ඨ වෙමි

මේ මාගේ අන්තිම උපතයි. නැවත මම කිසි දින නූපදින්නෙමි.

*

After completing 10 perfections Bodhisattva was born in the **realm of Thusitha.** Then He looked at the universe to select a suitable place of abode considering 5 important factors to be born to fulfill his aspiration. He could trace a **suitable era, proper country, appropriate prefecture, cast** and **suitable womb**.

After considering all these fundamental facts He confined in the womb of queen Mahamaya: the lady shed in Kshathriya cast: the queen of the king Suddhodana of Magadha kingdom in India, who lived in Kapilawasthupura

On the day the Bodisatta baby was conceived in the womb of the Queen Mahamaya, she saw a nice dream. In an Esala Full Moon Day.

Mahamaya the queen
Saw a nice dream
It's marvelous and serene
But really it has been.....

Having a lotus Pure and smoothly
White elephant baby slowly
Enters the body of Noble Lady
At the hill-top higher and coolly...

Four beautiful deities around
show the powerful mighty bound
Blow-up the bed with tiny sound
Drew us all to see the CROWN.

According to the dream readers "The queen shall bear a male baby, a holy child of wondrous wisdom"

When 9 months passed her days of confinement got closer. According to the prevailing customs, she thought of visiting her parents at Devudaha for the delivery of the baby. The king Suddhodana arranged a nicely decorated, comfortable palanquin for her and send her in a attractive procession with hundreds of maids for her to support. On the way there was beautiful park with full of 'Sal- Flowers'. The queen decided to rest there for a while. It was full of blossomed flowers, fragrant spread everywhere. Singing birds, humming bees, happy squirrels, colourful butterflies, serene deer, attractive rabbits were moving here and there freely. The queen Mahamaya's mind was filled with serenity. A delightful smell spread everywhere. She walked for a long time here and there, enjoying the beauty of the environment. On the wesak Full Moon Poya day the queen gave birth to a lovely Prince at the "Lumbini Sal- Park"

Making astonished all of them, the baby Prince took seven steps forward and with each step. a beautiful Lotus jut out and blossomed. The baby prince recited 4 lines in melodious voice. " **I'm superior to the world ... I'm greatest to the world. This is my last birth. I never be born again** "

The queen and her newly born Prince returned to Kapilawasthu. King Suddhodana was very happy to see the Prince and his loving queen. He thought of celebrating the event in grand manner specially giving food, clothes and other essential materials for the poor and needy.

Before arranging that, the teacher of the king Suddhodana gave an appointment for his teacher: Kaladevala (Asitha sage), to see the Prince. When he visited the king presented the Prince to the sage Kaladevala. He was astonished by seeing the auspicious and sacred marks of the body of the Prince. Miraculously, the feet of the infant placed themselves on the sage's head. The sage foretold that the infant prince will definitely become the Buddha. After forecasting it, the sage was grieved as he would not live to see the Buddha. At this moment the King Suddhodana paid his 1st homage to the Prince

When other sages assembled at the palace they also examined the blessed marks of the body and thought of a suitable name. Some sages said that the prince will become either a Universal king or the Buddha. One sage named Konndannnna, raising One finger, firmly said that "he will become the Buddha.". By these shrewd and wise men the prince was named as **"Siddhartha"** which means **"wish fulfilled"**

***

5

සිදුහත් කුමරුගේ ළමා අවධිය
CHILHOOD OF PRINCE SIDDHARTHA

It was full of resources and happy at the first glance. But queen Mahamaya died after 7 days. Her sister, Maha Prajapathi Gothmi cared for the prince lovingly. Though Prince Siddhartha was a cute little baby he was very kind, obedient, wise, and friendly with all, clever and understanding. He was In India. Ploughing festival is a grand celebration. That is the first stage of getting ready for the harvest of rice. The king Suddhodana was invited to plough the field first. So the Royal-family participates in this event enthusiastically. This year the king took the Prince Siddhartha also with him. Attendants were also taken there to take care of the baby Prince. They made a comfortable place little higher, under a shady trees for the prince to sleep while the king was working in the field.

It was started. The people cheered with joy. The applauding noise made the prince wake-up. The Prince was unhappy to see what was happening there. The oxen were beaten up with hard whips that hurt them. The tear flows down their eyes. But they are not allowed to stop and relax at least for a moment. They had to pull the heavy ploughs continuously. **How much they suffer?** The Prince was sad. While the earth was loosened worms and other creatures come to the top. Crows and vultures eat them. **How much suffer** the small creatures and helpless insects. Although the people were happy the Prince was sad and unhappy. He closed his eyes and stared

to meditate. He concentrated on his breathing. When the King saw this he was surprised. By seeing this miracle at the early stage of the Prince, the king worshiped the Prince at this moment too. This is the 2nd homage of the King to Prince Siddhartha.

The king sent the Prince to a teacher called Sarvamithra to learn arts and crafts that a Royal prince should achieve. Sarvamithra was very pleased with his good qualities. Prince studied well helping others always. He was very good at riding horses. He was very kind to animals too. He immediately caught the art of sward fighting too. The teacher was very happy about this prince as he learned everything cleverly in a short period. The King was very pleased to see the Prince with his talents and unbeatable skills.

The king built up three palaces; **Ramya, Suramya, Subha** for the Prnce to live in comfortably in different seasons in India. Then, arranged everything for him to select a suitable queen too. Finally queen Yasodhara was selected as his bride. Prince Siddhartha and Princess Yasodara were good frieands to others. They helped the others always in various ways. They were very kind and generous. People of the city loved them for their good qualities. Princess Yasodhara and Prince Sddhartha lived happily.

***

සතර පෙර නිමිති
FOUR OMENS

At times Prince Siddhartha decided to go to the park in his chariot with his favourite horse Kanthaka and loyal charioteer, Channa. On the first day he saw a sick man. He was seated by the side of the road. He seemed to be alone, He was left behind. No supporter to help him around. Throughout his body there were badly smell wounds. Flies fly and perch on them- A helpless person. Such a seen had never been traced by the Prince earlier. He inquired about him from Channa.

On the 2nd day when he goes to the park he saw **an old man.** -with wrinkled skin- no teeth in the mouth-white hair appeared as locks -feeble and old but having a walking -stick hardly managed walking with his shivering hand, bending down. He seemed to be blind. Such a seen had not been traced by the Prince earlier. He inquired about him from Channa.

On the 3rd day when he goes to the park, The prince saw a **dead body** Carrying by people. Some people walk after them crying. This also very weird and wonderful scene for him. The Prince was puzzeled. And inquired about them from Channa. The Prnce had not come across these woeful sights earlier. He was unhappy by seeing the way that people suffer. The Prince realized that he also would suffer like this anyday. **"That destiny may come to all. All beings born. Face with various ailments and diseases, Get into dotage, finally die" …. Oh ! .. Puzzled. He disgusted.**

On the 4th day when the prince goes to the park, The prince **saw a monk** walking ahead in a calm manner wearing a yellow robe. He seemed to be in a happy mood. T**hat serene sight could change the mind of the Prince**

FOUR OMEN

The Prince was on his way to enjoy
Saw a **weary sick man** on the way
Being stuck in his mind **WHY?**
Wanted to see the reason **right away**

The Prince was on his way to enjoy
Saw a **lonely old man** on the way
Being stuck in his mind **WHY?**
Wanted to see the reason **right away**

The Prince was on his way to enjoy
Saw a **dead body** carrying on the way
Being stuck in his mind **WHY?**
Wanted to see the reason **right away**

The Prince was on his way to enjoy
Saw a **serene monk** walks on the way
Seeing the path clearly to walk ahead
Left the Palace **without any delay.**

*

සිදුහත් කුමරාගේ ළමා අවධිය (සිංහල සාරාංශය)

බාහිර ලෝකයට සාපේක්ෂව සිදුහත් කුමරු සුඛෝපභෝගී ලෙසින් ළමා අවධිය ගත කළේ වුවද, ඔහුගේ මනස තුළින් ජාතිස්මරණ ශක්තිය දිදුලන්නට විය. සාක්ෂාත් කරගත යුතු කුමක්දෝ අරමුණක් මනස තුළ බලපවත්වන්නට විය. ජීවිතයේ කිසිම ආකාරයේ දුකක් පීඩාවක් ඇති බවට සේයාවක්වත් සුදෝවුන් මාළිගාව තුළ නොවීය.

රම්‍ය, සුරම්‍ය, සුභ ආදී වූ එක් එක් සෘතුවට ගැළපෙන අයුරින් ඉදිකරවන ලද මාළිගා 3 ක සියලු සැපසම්පත්වලින් ආඪ්‍යව දිවි ගෙවූ සිදුහත් කුමරු යශෝදරා දේවිය සමඟ ගතකළ යුග දිවිය ද ඉතාමත් සාර්ථකය, ආදර්ශමත්ය.

උයන් කෙළි පිණිස මාළිගාවෙන් බැහැරව යන සෑම මොහොතකම සිදුහත් කුමරුගේ පින්වත් දෙනතට අරමුණු වූයේ බාහිර ලෝකයා ගත කරන ශෝචනීය ජීවන රටාවයි. දුක්ඛිත තත්ත්වයට පත්ව සිටින අසරණ වූ ලෙඩෙක්, අත පය වාරු නැති මහ මඟ වැතිර සිටින මහල්ලෙක්, මිනිසුන් සතර දෙනෙකු විසින් උර මත ලී පෙට්ටියක දමා ඔසවාගෙන යනු ලැබූ මළ මිනියක්, මේ සියලුම දර්ශන සිදුහත් කුමරුගේ හද තුළ ඇති කළේ මහා විප්ලවයක මූල බීජයකි. අනතුරුව මහ මඟ ශාන්තව වඩින පැවිදි රුව දැකීමෙන් කිසියම් මඟක සේයාවක් දෘෂ්‍යමාන වන්නට විය.

උපන් සෑම සත්ත්වයෙකුගේම ඉරණම මෙලෙෂ වී ද? මෙසේ වන්නේ ඇයි? මෙයට හේතුව කුමක්ද? උයන් කෙළි පිණිස මාළිගාවෙන් නික්මුණ ද, සිදුහත් කුමරා සිත රුඳෙන්නට වූයේ මිනිසා විඳින දුක අබියසය. මෙයට හේතුව ගවේෂණය කිරීමට සිදුහත් කුමරාණෝ ඉටා ගත්හ.

එය, රජ සැප විඳිමින්, සාකච්ඡා මාර්ගයෙන් කළ හැක්කක් නොවන බව අවබෝධ කරගත් සිදුහත් කුමරාණෝ ඒ සඳහා සුදුසු, නිවැරදි, එඩිතර කාලෝචිත ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීම පිණිස සියලු කටයුතු ඉතාමත් දූර දර්ශී ලෙසින් සැළසුම් කළහ. රාහුල කුමරු උපන් දිනම, සිය සැළසුම ක්‍රියාත්මක කරන්නට වූයේ මහ පොළව කම්පා කරවමිනි. සක් දෙවිඳුන් සියලු ආරක්ෂාව සලසන්නට වූයේ උත්තරීතර විශ්වීය නායකත්වයට පත්වන මෙම අසහාය වීරයාණන්ගේ එඩිතර පියවරට ආශීර්වාද කරමිනි.

6

අභිනිෂ්ක්‍රමණය
RENUNCIATION

සතර පෙර නිමිති දැක මහත් කළකිරීමෙන් යුතුව මාළිගාවට පැමිණි සිදුහත් කුමරාගේ සවන් ගැටුණේ යශෝදරා දේවියට පුත් රුවනක් ලැබුණු බවයි. පීතෘ ස්නේහය හදවතේ ජනිත වීමත් සමඟම ඉපදීම, වයසට යාම, රෝගාතුර වීම හා මරණයේ අඳුරු සේයා පටල එකිනෙක මැවී පෙනෙන්නට විය. ගැඹුරු චින්තනයක් සහිත මනෝ භාවයකින් පසු වූ සිදුහත් කුමරාණෝ මාළිගාවට පැමිණ, බන්ධනයක් ඇති වුනා රාහුලයෙක් ඉපදුණා යැයි ගැඹුරු අදහසකින් යුතුව ප්‍රකාශ කළහ. ඒ අනුව, උපන් කුමරු හට රාහුල යනුවෙන් නම් තැබිණි.

එදින රාත්‍රි රජ මැදුරේ අසිරිය කපිලවස්තුපුර සිසාරා පැතිරෙන්නට විය. රම්‍ය, සුරම්‍ය, සුභ මාළිගාවල දහතුන් වසරක් රජ සැප සම්පත් විඳිමින් යසෝධරා දේවිය සමඟ ගතකළ රාජකීය දිවිපෙවෙතෙහි උත්තරීතර සන්ධිස්ථානයකට පත් මෙම මොහොතේදී, රජ මාළිගාවේ සැම එක්වී, ජය කෙහෙළි නංවමින් රාජ්‍ය උත්සවය පවත්වන්නට වූහ. ආරාධිත, ප්‍රවීණ, නාටක නාටිකාවන්ගේ විවිධ නැටුම්, ගැයුම්, රැඟුම් හමුවේ මනස ඔද්දල් වී සිටින රසික රසිකාවියන් අතර ජීවිතයට සැබෑ අරුතක් සොයන ශ්‍රේෂ්ඨ උත්තම පුරුෂ රත්නයක් සිටි බව කිසිවෙකු මොහොතකටවත් නොසිතන්නට ඇත.

කොතෙක් වෙහෙසුණ ද, එදින රාත්‍රියේ රජ මැදුරේ ගායක ගායිකාවනට, නළු නිළියන්ට ඔහුගේ සිත ඇදගැනීමට නොහැකි විය. වෙහෙසට පත් වූ ඔවුහු ගැයූ, රැඟූ තැන්වලම වැටී නිදන්නට වන්හ. මැදියම් රැයේ පිබිදුණු සිදුහත් කුමරුහට දක්නට ලැබුණේ පැය කීපයකට පෙර සුරූපීව සිටි කතුන් විරූපීව තැන් තැන්වල වැටී නිදන පිළිකුල් සහගත දර්ශනයන්මය. ගිහිගෙයි පිළිබඳ වූ කලකිරීම වඩාත් තීව්‍ර විය.

අප්‍රමාදීව ගිහි ගෙයින් නික්මීමට තීරණය කළ සිදුහත් කුමරු, ඡන්න ඇමති අවදිකරවා කන්ථක අසු සූදානම් කරන ලෙස දන්වා සිය පුතු දැකීමට යශෝධරා දේවියගේ නිදියහන් ගැබ දෙසට පා නඟන්නට විය. දොර තිරය මෑත් කොට සුව නින්දේ පසුවන පුතු සහ මව දෙස සානුකම්පිතව බලා ඔවුන් අවදි නොවන සේ ඉතාමත් නිහඬව දොර තිරය තිබූ සේ සකසා මාළිගාවෙන් පිටත්ව ගියේය. ඡන්න ඇමති සමඟ කන්ථක අසුපිට නැග රජ මාළිගාවෙන් පිටත්ව අනෝමා ගං තෙරින් ද එතෙර වූ සිදුහත් කුමරු, ගිහිගෙයින් ද එතෙරව, සසර සයුරෙන් ද එතෙර වීමට මං සොයන්නට විය.

29 වසරක ගිහි ජීවිතයට අධිෂ්ඨාන පූර්වකව සමුදුන් සිදුහත් වීරයාණෝ, තම සුරතින් තම කෙස්වැටිය කපා, රාජාභරණ සියල්ල ඉවතලා, තවුස් වෙස් ගෙන උරුවෙල් දනව්වට සක්මන් කළහ. තවුස් දම් පුරමින්, කටුක ජීවිත ගතකරමින් ජීවිතයේ විමුක්තිය සොයන ආලාරකලාම, උද්දකාරාමපුත්ත වැනි තවුසන් හමුවී ඔවුන්ගේ ගුරු උපදේශද ලබා, ඒ අනුව ශරීරයට දුක් දෙමින් වීර්ය වඩවමින් කල්

ගත කළද, ඔවුන්ගෙන් උගත හැකි වූයේ ආකිඤ්චඤ්ඤා සමාධිය සහ නේවසඤ්ඤානාසඤ්ඤා සමාධිය දක්වා පමණි. එය විමුක්ති මඟ නොවන බව අවබෝධ කරගත් සිදුහත් තවුසාණෝ ඔවුන්හට ස්තුති කර එතනින් ඉවත්ව ගියහ.

අනතුරුව **නේරංජනා** ගඟ අසල රමණීය කඳු ගැටයක පිහිටි වන ලැහැබකට පිවිසි සිදුහත් තවුසාණෝ තම අරමුණ සාක්‍ෂාත් කර ගැනීම සඳහා එහි භාවනායෝගීව වීර්ය වඩමින් වසන්නට වූහ. එහිදි **කොන්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි** යන පස්වග තවුසන් හමුවිය. සිදුහත් තවුසාණෝ ද එම ප්‍රාග් බෝධි කන්දෙහි වූ වර්ග අඩි 5 ක පමණ ඉඩ ප්‍රමාණයකින් යුතු කුඩා ගල් ගුහාවක් තුළ භාවනායෝගීව තම කුසල් සිතින් අකුසල් සිත පෙළීමට දැඩි වීර්යයක් ගත්හ. සිත ප්‍රභාශ්වරය. එහෙත් ගත දුර්වල වන්නට විය. ආශ්වාස ප්‍රාශ්වාස නවතාගෙන අප්‍රාණික ධ්‍යානය වඩන්නට විය. කයට මහත් පීඩාවක් දැණිනි. එහෙත් සිත යටපත් කළ නොහැකි විය. සිත ප්‍රභාෂ්වරය. උද්යෝගීමත්ය. ආශ්වාස, ප්‍රාශ්වාස පවා නවතා අප්‍රාණික ධ්‍යානයේ තව දුරටත් වෙසෙද්දී, ඇතැම් දෙවිවරු ඔහු මිය ගිහින් දැයි සිතන්නට වූහ. එහෙත් එය රහතුන්ගේ සමාධියක් බව පසුව අවබෝධ කර ගත්හ. තව දුරටත් වීර්යය වඩමින් ආහාර ගැනීම සම්පූර්ණයෙන්ම නතර කිරීමට සිදුහත් තවුසාට සිත්විය. දෙවිවරු මෙම තීරණයට එරෙහි වෙමින් ආහාර වර්ජනය කළහොත් රෝම කූප ඔස්සේ ආහාර ශරීරගත කරන බව දැනුම් දුන්හ. සිදුහත් තවුසාණෝ අඩුවෙන් ආහාර ගැනීමට තීරණය කළහ.

සිරුර වැහැරී ගොස් ඇට පෑදී ඇත. පපුව ප්‍රදේශය දිරූ වහළයක පරාල මෙන් දිස් විය. දෑස ගිලී ඇත. ගැඹුරු ළිඳක් තුළ ඇති දිය බිඳුවක් සේ දිස් විය. හිස මැළවුණ ලබු ගෙඩියක් බඳු විය. හම රැළි වැටී ඇත. කුසෙහි හත කොඳු ඇට පෙළ සමඟ එකට ඇලී ඇත්තාක් මෙන් විය. මළ පහ කරන විට එතනම ඇද වැටුණි, ගොපලු කොල්ලන්ගේ නිරන්තර හාස්‍යයට හා ගැරහුමට පාත්‍ර විය.

මෙම ස්ථානයට කෙතරම් දුෂ්කරද යන්න අද පවා පියවි නෙතින් දැකිය හැක. එදා කෙලෙසින් පවතින්නට ඇත්ද? බැතිමතුන් එම කඳු ගැටයට නගින අතර මඟ සිය දහස් ගණනක් යාචකයෝ සිඟ මන් යදිති. අඳ, ගොළු, බිහිරි මෙන්ම ශාරීරක ඉන්ද්‍රියයන් පවා අහිමි

මෙවන් තරුණ ජීවිත බුදු පියාණන් වහන්සේට එදා උසුළු විසුළු කරමින් ගහරහමින් අවමන් කළ ගොපළු දරුවන්ගේ දිට්ඨ ධම්ම වේදනීය කර්ම ඵල බව මට පසක් වීමට ගත වූයේ නිමේෂයකි. මොවුන් පෙර ආත්ම භව ගණනාවකම සිදු කර ගත්තා වූ පාප කර්මයන් මෙලෙස වන්දි ගෙවනවා විය හැකියි.

දුකෙන් මිදීමේ මඟ මෙය විය නොහැක. සිදුහත් තවුසාට සිතුණි. මෙතරම් දුෂ්කර දිවියක් ගත කළ ද, දුකින් මිදීමේ මඟ නොපෙණුනි. අතීතයට මනස යොමු විය. එදා පියාගේ වප් මගුල් දින, තුරු සෙවනේ සිට ලද සුන්දර අත්දැකීම සිහිපත් වන්නට විය. අකුසලයෙන් සහ කෙලෙස් වලින් වෙන්වී විතක්ක විචාර, ප්‍රීති, සුඛ, ඒකග්ගතාව සහිත ප්‍රථම ධ්‍යානයට පිවිසි ඒ මොහොත කෙතරම් සුවදායී ද? යා යුතු මාර්ගය එයමයි. අධිෂ්ඨාන පූර්වකව මනස අවදි විය. එහෙත් ඒ සඳහා අවශ්‍ය කායික ශක්තිය පළා ගොස්ය. අප්‍රමාදීව ආහාර වැළඳීම ඇරඹූහ. ඒ පිළිබඳව කලකිරුණු පස්වග තවුසෝ සිදුහත් තවුසා අතහැර දමා ගියහ. සිදුහත් තවුසාණෝ එහි තවත් දින කිහිපයක් ගත කළහ.

මෙම ගල් ගුහාව සියැසින් දුටුවෙක් වේ නම් ඔවුන් සංවේදී වනු නොඅනුමානය.

කාමසුඛල්ලිකානුයෝගයත් (ශරීරයට වැඩි සැප දීම) සහ අත්ථකිලමතානුයෝගයත් (ශරීරයට වැඩි දුක් දීම) යන අන්ත දෙකම විමුක්ති මාර්ගය නොවන බව පසක් වීමෙන් පසු සිදුහත් තවුසාණෝ නේරංජනා ගමට මදක් නුදුරින් පිහිටි **සේනානි** ගමට පැමිණියහ. එහි පිඬුසිඟා පැමිණ සෙවන සහිත නුග ගසක් අසල විවේක සුවයෙන් වැඩ සිටියහ. මහභිනික්මනෙන් වසර 6 ක් ගතවී ඇති මෙදින වෙසක් සඳ පායා එද්දී බෝසතාණන් වහන්සේ සිහින 5ක් දුටුවහ. අළුයම අවදි වී අර්ථය සිහිපත් කරමින් කරුණු විමසා බැලීමේ දී නිසැකවම ඒ සියල්ල බුදු වන බවට පෙර නිමිති බව අවබෝධ විණි.

මුව දෝවනය කරගෙන පැමිණි බෝසතාණෝ නැවතත් එම ස්ථානයේම භාවනායෝගීව වැඩ සිටියහ. මේ අවස්ථාවේදී සුජාතා නම් සිටු දියණිය, පෙර සිදුකරනු ලැබූ බාරයක් ඔප්පු කිරීම සඳහා නුග ගස අසළට, රන් බඳුනක කිරිබත් ද රැගෙන පැමිණියේ, එම නුග ගස අධිගෘහිත වෘක්ෂ දේවතාණන් වහන්සේට පිදීම සඳහාය. වෘක්ෂ දේවතාණන් වහන්සේ ගස මුල වැඩ සිටින බව සිතා අති මහත් සතුටකින් යුතුව, සිදුහත් බෝසතාණන් වහන්සේට කිරිබත් පූජා කරන්නට වූයේ, මාගේ බලාපොරොත්තුව ඉටු වූවාසේම, ඔබ වහන්සේගේ බලාපොරොත්තු ද එලෙසින්ම සාක්ෂාත් වේවා යි ප්‍රාර්ථනා කරමිනි.

*

When the Prince came back to the palace after seeing 4 omens, started to think deeply to find a way to end the grief, sadness and sorrow of all beings. While he was travelling back to the Palace a messenger came and said that Princess Yashodara had given birth to a baby prince. He was happy to hear the news and delighted to see his newly born son. He was named Prince 'Rahula' by the prince Siddhartha having a deep hidden meaning.

They thought of celebrating the event. The best musicians and dancers were brought for entertaining the event. There was a grand celebration gracefully. All the people in the palace, enjoyed very much. Dancing girls entertained the audience in various ways. Some sang. Some others played musical instruments to make the prince happy. All the others enjoyed, but not the Prince Siddhartha. He was not interested in any of the entertainment. He was looking

on, thinking of the 3 sorrowful sights he saw.

What he wanted was to find the proper way to bring peace and happiness to all beings. He loved his wife Yashodara and his son: Prince Rahula very much. But he loved all other beings too as much as he loved to his own wife and son. He made up his mind to leave the palace and find a way to end sadness and give a light to all beings who suffer in various ways.

Having the strong Determination, on that Esala Full Moon Poya Day night, the Prince Siddhartha called Channa and asked to saddle his favourite Horse Kanthaka. Channa faithfully did it immediately according to the instructions given by the Prince.

Prince Siddhartha slightly pushed the curtain of the bed-room of Yashodara and had a look at the prince Rahula and the loving queen Yasodhara. Then, silently kept the curtains as it was, without making a tiny sound for them to be awakened.

His mind was filled with a strong determination. Having an utmost power in his heart, immediately, the Prince Siddhartha left the Palace searching for liberation. He was accompanied with Channa and Kanthaka. They rode all the way to River Anoma.

On the bank of River Anoma, the Prince Siddhartha cut off his hair with his sword by himself. He removed the Royal dress and valuable jewelaries. He donned himself with yellow robes which were offered by Ghatikara Bhramin. Then, as an ascetic He carried a simple bowl too for alms. Now he is ascetic Siddhartha not the Prince Siddhartha.

He walked far and far into the forest in Uruweldanawwa, searching for learned ascetics, who could teach him the way to liberation. In the cause of these travels he met Alarakalama and Uddakaramaputta who practice ascetic life in hoping to find freedom. Ascetic Siddhartha learnt from them as much as they have understood. But realizing that it is not the target that he wanted to achieve ascetic Siddhartha thanked and left them.

Then he came to the Senani village at Uruwella. It was a rocky hill. There were caves in the rocks. Good for meditation. At the foot of the hill the forest extended up to the boundary of river Neranjana and stayed there meditating.

As many other ascetics he decided to practice austerities as he had heard this theory many times. They believed that is the only way to stop the cycle of birth, death and rebirth. Ascetic Siddhartha decided to try this method too, following a difficult routine and searching for wisdom.

HE completely stopped visiting door to door for alms. HE managed with only fruits and leaves that fell near him and continued meditation.

There HE met 5 other ascetics. **Kondanna, Vappa, Bhaddiya, Mahanama** and **Assaji.** They were very impressed with the severe austerities that Siddhartha Gauthama practiced.

For six years ascetic Siddhartha practiced austerities alone. He suffered immensely subjecting his body to extreme pain and torment. Not a single human to be found in this world, who had undergone such sufferings,. His body withered like a skeleton and once he was fell to the earth in deadly swoon. But he recovered. While he severely practiced austerities, death (mara) kept close. He expected that the Ascetic Siddhartha would die before attaining Supreme Enlightment.

Ascetic Siddhartha gave up his austerities after realizing that painful, unsuccessful suffering produced no results as much as he thought. He was fully convinced through personal experience that by undergoing extreme suffering or enjoying extreme worldly pleasure, So, he decided to avoid both extremes and decided to get into middle path. Five ascetics who were devoted to him changed their minds too.. They left Ascetic Sddhartha and went away to seek

truth in their own way. HE waited there for few more days and left that place and went to **'Senanigama'** ;only half a mile from the river "Neranjana'

Ascetic Sddhartha sat under Ajapala Banyan Tree giving up austerities, contemplating the world he sees. A maiden by the name of **Sujatha** offered him milk rice. After having this meal He went up to the river bank and made an aspiration." If I become Buddhahood this bowl should go up side of the river" With such hope He floated the empty bowl in the river. It floated upside as He wished. HE spent there leisurely for few hours and thought of walking up to **Gaya.**

7

උතුම් සම්මා සම්බුදු පදවිය
ENLIGHTENMENT

On the way to Gaya a Brahmin named **Soththiya** offered the Ascetic Siddhartha a **sheaf of Kusa Grass.** He walked up to the Bo tree at Gaya and sat under it, spreading the Kusa Grass having a firm determination not to get up without attaining the Buddhahood even though his body decayed and dried up The area was tranquil and calm.

He concentrated there are no TWO truths. There is just only ONE truth. Having tireless determination, he finally decided to follow a more moderate course. **Avoiding the both extremes he discovered the middle path** (Majjima- Patipada). After tireless determination, incredible will power, effort and exertion treading along the Middle Path, He finally realized the real way of reaching his goal.

The knowledge of life is boundless. That knowledge covered everything that happened in the past, the things happening at present, and the things that will happen in future. **This enlightened vision of the Buddha is the vision of reality.** It is the dawn of an inner light. (**ā**loko Udap**ā**di). It is the light of supreme wisdom, the real nature of thngs hidden in the darkness of ignorance (moha).

While striving to achieve this **'wisdom eye'** again **'Mara'** assembled with his armies to assail Him as he was seated under the Bodhi Tree. HE could see and hear some fearful sights and sounds which seemed to distract him from the purpose. It's due

to the Mara's plan. Mara sent his three beautiful daughters **desire (Thanha), aversion (Rati) and attachmen (Raga)** to Siddharta to seduce him and bind him to the world. They danced and sang with their voluptuous bodies and beautiful voices. But Siddharta remained completely untouched due to his concentration, separated from sensory desires and unwholesome mental qualities.

When he continued meditation, more intense, impurities like hate, lust for fame, lust of life, pride, self righteousness and ignorance tried to wrap his mind But Siddhartha Gauthama was able to free his mind from all theses contaminations.

According to legend, Mara, the evil one, the seducer, the personification of death, challenged Siddharta during the whole night.

He sent his army to Siddharta to frighten him. Mara's horrible and terrifying forces screamed and made a roar and fire arrows at Siddharta, but Siddharta's infinite loving kindness turned the arrows into flowers upon reaching him.

At this time 'Mara' appeared as a friendly way and said ' You are getting weak.. losing your handsome look. You may die soon – You should live by doing many meritorious acts. What is the use of suffering like this. The way you have chosen is too long. There is no destination in it. You will never attain your goal; Nibbana you try to reach"

Hearing these words Siddhartha Gauthama spoke to **'Mara'** " oh! evil 'Mara'. I shall never step back without reaching to Nibbana; Which I determind to attain. You and your armies of **Desire, Lust, Craving, and Fear** cannot defeat me or turn my effort back. *With His supreme spiritual power, the Buddha vanquished 'mara horde' and continued the attempt. " Mara Deva Puthra" went away hoping to make another serious plan.*

With great strength of mind Siddhartha Gauthama crushed out all desires, sights and sounds, his virtue was like an unassailable fortress, His mind became pure and serene and he began to use all mental powers he had developed through meditation not only in this life but also in the past lives. During the first few hours of that night He developed the powers of recalling all the past lives he had existed. And he developed inside into the **Death** and **Rebirth of Beings.**

At this time too, Mara appeared again with thousands of hoards to defeat Siddhartha Gauthama.—He said that Seat (Vajrasanaya) belongs to him (Mara). Not to Siddhartha Gauthama and ask for evidence.. He had a gang of thousands Maras with weapons for evidence, but Siddhartha Gauthama had no one and nothing other than HIS self confidence. So, without moving a bit from the seat and HIS physical posture Siddharta touched the earth with the fingertips of his right hand and called upon the universe as a witness to the effort HE has made in all his countless lifetimes, during all those endless eons. with the sole goal of attaining liberation.

The universe trembled grumbling and rumbling in acknowledging the truth and Mara was defeated. The gang of Mara started to flee away and never approached again .

Then Siddharta Gautama, developed the highest mental power, the super natural knowledge of destroying all impurities and passions using his utmost mental power. HE comprehended in all their fullness the Great Dhamma of the Four Noble Truth and the Noble Eight Fold Path and became the Supreme enlightened One. It is the absolute Universal Enlightenment of a Buddha.

* * *

Human Brain is consisted with neurons over 100 billion. An ordinary person normally uses a minute percentage of these neurons. Einstein *was a mastermind as popularized among the scientists, But he had used merely a ten percent of capacity of his brain.* ***Siddhartha however had developed his mental competence to such a degree that he used almost hundred percent of his mental*** *capacity.*

The duration that Buddha had developed his mind to a very high degree is not only in this life time but also in many previous life spans, in thousands or millions of years which cannot be summed – up into numbers.

As the result of developing the 10 perfection which opened and cleared the mind, at last it resembled ***finely tuned antenna*** *that receive magnificent signals from astral bodies in the furthest edge of the Universe.* ***This is the highest stranded of a human mind.***

On Wesak Full Moon Poya day He attained **"Samma Sambuddha"**:Supreme Enlightment under the Bodhi Tree at the age of 35. His mind became **tranquil, calm and serene.** A brilliant radiance illuminated our world and Tens of thousands world system trembled that day. Thousands of Deities and Brahmas paid homage worshipping Buddha. It was a very beautiful day. The flowers blossomed and emitted fragrance everywhere.

The word **"Buddha"** means **"enlightened."** It is the title given to Gautama Siddhartha, the religious teacher and founder of Buddhism.The path to enlightenment is attained by utilizing morality, meditation and wisdom. ***There is no such a leader in this universe who reached the goal sacrificing enormously, for the benefit of mankind, deities and all other beings.***

The joyous of Victory.

The happiness he felt was sparkle and brilliant within him. It spread through his all being. His determination to reach this goal which made him to strive was incredible. It is not only in this existence but also in many millions of past lives had reaped result. In the voice of a victorious joy HE declared ….

Aneka jathi Sansaram - Sandavissam anibbisam
Gahakaraka Gavesantho - Dukkhajati Punappunam
Gahakaraka Ditthsi - Punagehanna Kahasi
Sabba te phasuka Bhagga - ahakutam visankihitam
Visankhara gatam chittam - Thanhanamkhaya majjhaga

"*Many a house of life…*
hath held me- seeking ever him who wrought
these prison of the senses,sorrow-fraught,
sore was my ceaseless strife!
But now..
thou builder of this tabernacle thou!
I know thee! Never shall thou build again
these walls of pain
nor raise the roof-tree of deceit, nor lay
fresh rafters on the clay,
broken thy house, and the ridge=pole split!
Dilusion fashioned it
safe pass I thence – deliverance to obtain

(Extract from the light of Asia-By Sir Edwin Arnold)

This poem reveals the joyous of Victory. Having attain Nibbana a great tranquility seemed to descend on HIS mind. HE felt as though he had laid down a very heavy burden that he had been carrying on his back through a long and very rough journey over a long period. In contentment HE continued to say near the Bodhi tree in which the Englightenment was fulfilled . With the serene mind the Buddha spent the next 7 weeks iin the vicinity of the Bhodi -tree fasting and enjoying the quiet tranquility of the place.

***

උත්තරීතර සම්මා සම්බුදු පදවි ප්‍රාප්තිය, දස දහස් සක්වළ කම්පා කරවන සුළු අති ශ්‍රේෂ්ඨ වෑයමක ප්‍රතිඵලයකි. පූර්ණය කළයුතු ප්‍රතිපදාව ඔස්සේ දැඩි වීර්යයකින් චිත්ත සන්තානය තුළ උපදවා ගත යුතු අධි මානසික ස්ථාවරයකි. වෙර දරන්නා වූ යුගය බෝධි සත්ත්ව අවධියයි. ඒ සඳහා ද, පෙර භවයකදී බුදුවරයෙකුගෙන්ම නියත විවරණ ලැබිය යුතුමයි.

සාර අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂ ගණනක් පුරා, විවිධාකාර භවයන්හි ඉපිද පැමිණි ගමන් මඟක අවසානය සනිටුහන් කිරීම පිණිස සිදුහත් තවුසාණන් විසින් දැරුවා වූ වීර්යය මිනිස් හදවත් කම්පා කරවන සුළුය.

පස්වස් වියේදී වප් මඟුල් දා, ප්‍රථම ධ්‍යානයට සිත ගෙන ගිය ඒ ආනාපානසති භාවනාව සිදුහත් තවුසාට සිහිවිය. ඉහළට පහළට ගමන් කරන ස්වකීය හුස්ම ධාරාවේ සිහිය පිහිටු වූ කල්හි (ආනාපනසති භාවනාව) සිත සන්සුන්ව, ශාන්තව පවතින අයුරු දුටී ප්‍රීතියෙන්, සුඛයෙන් ඒකාග්‍රතාවයෙන් සිත පිරිණි. සිදුහත් තවුසාණෝ ප්‍රථම ධ්‍යානයට පැමිණියහ.

තව දුරටත් හුස්ම ධාරාවේම සිහිය පිහිටුවාගෙන සිටි සිදුහත් තවුසාණන්හට විතක්ක, විචාර නැති ප්‍රීති, සුඛ, ඒකාග්‍රතාවය සහිත දෙවන ධ්‍යානයට පිවිසීමට හැකි විය. තවදුරටත් සිහිය හුස්ම ධාරාවේම විය. තෙවන සහ සිව්වන ධ්‍යානවලට ද පැමිණි සිදුහත් තවුසාණන්ගේ සිත වඩාත් ප්‍රභාෂ්වර විය. තීව්‍ර විය. ලද ප්‍රඥාලෝකය ඔස්සේ සිත

අතීතයට ගමන් කරවීය. ළදරු වියට, තමා මහාමායා දේවියගේ කුසෙහි සිටි අයුරු, තුසිත දෙව්ලොව සිට එහි පැමිණි ආකාරයද, දෘශ්‍යමාන වන්නට විය. කල්ප ලක්ෂ ගණන් ඈත භවයන්ට සිත යොමු කරමින්, අම්බලමක් ගානේ නතර වෙවී එන මගියෙකු සේ කල්ප ගණනක් සංසාරයේ ආ ගමන් මඟ සිදුහත් තවුසාණන්හට දිස්වන්නට විය. අතීත කඳ පිළිවෙල දකින් **පූර්වේ නිවානුස්මෘති ඥානය** සිදුහත් තවුසාණන්හට පහළ විය.

අනතුරුව ද, මැදියම් රැයේ යළිත් අනාපානසති භාවනාවේම යෙදෙමින් **චුතුපපාත ඥාණය** අවබෝධ කළහ. එතුළින් සත්ත්වයන් ගේ සසර උත්පත්තිය, මරණය සිදුවන ආකාරයත්, මරණින් පසු ඇතැමෙක් සුගතිගාමී වන අයුරුත් තව පිරිසක් දුගතිගාමී වන අයුරුත් අවබෝධ කළහ. සත්ත්වයා කළ කී දේ අනුව කර්මය විසින් භවය සකසන ආකාරයද, සිදුහත් තවුසාණන්හට පෙනිණ. මෙම සසර ගමන මහා දුකක් බව අවෙබෝධ කළහ.

යළි ආනාපානසති භාවනාවේ යෙදුණ සිදුහත් තවුසාණන් අදියරෙන් අදියර ධ්‍යාන හතරම ලබා ගනිමින්, සිය ඉලක්කය පරම නිෂ්ඨාව වූ උත්තම ඥානය පහළ කරගැනීමට උත්සුක වූහ. රාග, ද්වේෂ, මෝහ ක්ලේශයන් හොඳින් හඳුනාගත් සිදුහත් තවුසාණෝ ඒවා සමඟ මහා සටනක් අරඹමින් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ආදී පංච උපාදානස්කන්ධම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් මෙනෙහි කරමින්, දුක පිරිසිඳ දැක, මෙම සසර දුකට හේතුව තණ්හාව බව අවබෝධ කළහ. තණ්හාව ඉවත් කිරීමෙන් ලැබෙන සැනසිල්ල හෙවත් දුක්ඛ නිරෝධය අවබෝධ කළහ. එය සාක්ෂාත් කිරීමට ඇති එකම මඟ ලෙස ආර්ය අෂ්ඨාංගික මාර්ගය බව අවබෝධ කළහ. ඒ සමඟම කෙලෙස් ආශ්‍රවයන් ප්‍රහාණය කිරීමේ මඟ ද පැහැදිලිව දෘෂ්‍යමාන විය. මෙලෙස පටිච්ච සමුප්පාදය පදනම් කොට ගෙන විදර්ශනා වඩා සියළු කෙලෙස් නසන නුවණ හෙවත් **ආසවක්ඛය ඥානය** උපදවා ගත්හ. ත්‍රිවිද්‍යා ඥාන පහළ විය.

කල්ප ලක්ෂගණනක අපරිමිත වෑයමක ඵලය ලැබීමට ආසන්න මෙම මොහොතේදීද, පවිටු මාරයා පෙනී සිටිමින් විවිධ බාධා පමුණුවන්නට විය. මාර දූවරුන්ගේ උත්සාහය ව්‍යාර්ථ විය. අවසානයේ දී බෝමුල වජ්‍රාසනය මාරයාට අයිති බව පවසමින් සිදුහත් තවුසා එලවා

හැරීමට මාර සේනාවක් එවීය. සියල්ල අධිෂ්ඨාන බලයෙන් පාලනය විය. අවසානයේදී කෝපාවිෂ්ඨ වූ පවිටු මාරයා වජ්‍රාසනයට අයිතියක් ඇත්නම් එය සනාථ කරන ලෙස ප්‍රකාශ කළහ. හෘද සාක්ෂියට අමතරව කිසිඳු සාක්ෂියක් බුදුපියාණන් සතු නොවුයෙන්, සිය බුද්ධ හස්තයෙන් පෘථිවිය ස්පර්ශ කරමින් මෙම මුළු මහත් විශ්වයම සාක්ෂි දරණ බව ප්‍රකාශ කරත්ම මහ පොළව ගුගුරායන්නට විය. පවිටු මාරයා සහ සේනාව හිස ලු ලු අත දුවමින් නැවත නොඑන ලෙස පලායන්නට වූහ.

පුර්වේ නිවානුස්මෘති ඤානය, චුතුපපාත ඤානය, ආසවක්ඛ ඤානය ආදී වූ ත්‍රිවිද්‍යා ඤාන පහළ වීමත් සමග සිදුහත් බෝසතාණන් චතුරාර්ය සත්‍ය අවබෝධ කොට ගෙන සම්මා සම්බුද්ධත්වයට පත් වූහ. දස දහසක් සක්වල කම්පා කරවමින් ආලෝකය විහිදෙන්නට විය. **සාරාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පුරා දැරුවා වූ අප්‍රමාණ වෙහෙසක විජයග්‍රහණය සනිටුහන් විය. මුළු විශ්වයම ඒකාලෝක විය. මනස කෙතරම් ප්‍රභාෂ්වරද? මෙවන් ශ්‍රේෂ්ඨත්වයක් ලද වෙනත් කිසිම නායකයෙකු ලොව පහළ වී නැත.**

සම්මා සම්බුදු පදවිප්‍රාප්ත බුදු පියාණන් වහන්සේ, **අනේක ජාති සංසාරං** යන උදාන ගාථාවෙන් ලද **විජයග්‍රහණයේ** සතුට ලොවට ප්‍රකාශ කළ සේක.

අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේ සන්තො - දුක්ඛා ජාති පුන්පුනං
ගහකාරක දිට්ඨෝසි - පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ජගා

"දීර්ඝ සංසාර ගමනක යෙදෙමින්, භවය නමැති නිවස තනන ඔබ සොයා මම වෙහෙසුනෙමි. සත්ත්වයාට භව දුක උරුම කරමින් නැවත, නැවත භවය තනන වඩුව, මා ඔබ සොයා ගතිමි. ඔබ නැවත එම නිවස ඉදි නොකරනු ඇත. එහි පරාල සියල්ල සුණු විසුණු කොට, කැණි මඩල මවිසින් සිඳ දමන ලදී. මාගේ මනස ප්‍රභාෂ්වරය, තෘෂ්ණාව මම ජය ගතිමි."

*දැඩි වීර්යයකින් සහ නොබිඳිය හැකි වජ්‍ර සමාධියකින් යුතුව, මනුෂ්‍යත්වයේ අග්‍ර ඵලය හෙවත් උතුම් සම්බුද්ධත්වයට පත් වූ ස්ථානය, හෙවත් ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ බුද්ධගයාවේ පිහිටාඇති උතුම් බෝධි වෘක්ෂ රාජයාගේ නැගෙනහිර පස භූමිය, **වජ්‍රාසනය** නමින් හැඳින්වේ. බෞද්ධයෙකු විසින් අත් නොහළ යුතු සතර අවිජහිත ස්ථානවලින් එකක් බවට බුදු පියාණන් වහන්සේ **මහා පරිනිබ්බාන සූත්‍රයේ** දේශනාකර වදාළ සේක.*

***

8

පළමු සති හත (සත් සතිය) ගත කිරීම.
SPENDING THE FIRST SEVEN WEEKS

After the Enlightment, the Buddha spent 7 weeks close to the BO - Tree. The "truth" He comprehended and the wisdom he acquired is enormous, profound, multifarious and subtle

1st week = **Contemplating the supreme wisdom he achieved.**

He sat under the Bodhi tree in the same posture as He was at his Enlightenment. At 1st he enjoyed the serenity of Nibbana. Next HE reviewed the Paticcasamuppada, dependent in rising order (Anuloma) and in the reversing order (patiloma) (Vipassana Gnanaya) At this place He perfomed **"Yama Maha Pelahara"** to remove the doubt of deities.

උත්තරීතර සම්මා සම්බුද්ධත්වයට පත් බුදුපියාණන් වහන්සේ ඒ බෝ සෙවණේ වජ්‍රාසනය මත විමුක්ති සුවයෙන් සතියක් වැඩ සිටිමින් පටිච්චසමුප්පාදය මුල සිට අගටත්, අග සිට මුලටත් මෙනෙහි කළහ. වජ්‍රාසනයේ නොමිදී එකම ඉරියව්වෙන් වැඩි සිටින බුදු හිමියන් දුටු දෙවිවරු, සිදුහත් තවුසාණන් තවමත් බුදු වී නැතැයි සිතන්නට වූහ. එය බුදු නුවණින් දුටු බුදු පියාණන් වහන්සේ දෙවියන්ගේ සැකය දුරු කිරීම පිණිස පළමු වරට යමක මහා ප්‍රාතිහාර්ය පාන්නට වූහ.

කුමන ජයග්‍රහණයක් හමුවේ වුවද, අනවශ්‍ය උද්දාමයකින් තොරව සංවරව නිහතමානීව තමා ආ මඟ සිහිකිරීම කෙතරම් ශ්‍රේෂ්ඨද? බුදුපියාණන් වහන්සේ එය ආදාර්ශයෙන්ම ලොවට පෙන්වා දුන්නේ බුදු වී පළමුවන සතියේදීමය.

2nd week = <u>Gazing at the Bodhi Tree in gratitude.</u>

The Buddha is supreme in paying gratitude. Only the Bo tree was there to give Him shelter to achieve the goal, giving shade and cool breeze. So He spent the 2nd week gazing at the Bo-tree without blinking in deep meditation as gratefulness. *This is called Animisalocana Poojawa (Dibbacakku)*

දින හතක් එකම ඉරියව්වෙන් වැඩසිටි බුදුපියාණන් වහන්සේ 8 වන දින සූර්ය උදාවත් සමඟ බෝධි මූලයෙන් ඊසාන දෙසට අඩි 30ක් පමණ වැඩම කොට නතර වූ සේක. එම ස්ථානයේ සිට දින 7ක්, තමන් වහනසේට බුදුබව ලැබීමට සෙවණ සැලසූ බෝධි රාජයාණන් වහන්සේ දෙස සත් දිනක්ම ඇසිපිය නොහෙළා බලා සිටි සේක. (මෙම ස්ථානයේ ඉදිකර ඇති අනිමිස චෛත්‍යයෙහි ද බුද්ධගයා විහාරයේ බඳු කොත් කැරැල්ලක් දෘශ්‍යමාන වෙයි.)

ඒ උත්තම වෘක්ෂ රාජයාණන් වහන්සේ පවා එලෙසින්ම සතියක් පුරා, කෘතගුණ දැක්වූ බුදුපියාණන් වහන්සේ මුළු මහත් මිනිස් ප්‍රජාවට ලබාදුන් ආදර්ශය කෙතරම් අගනේද?

3rd week= <u>Creating a golden figure similar to the Buddha.</u>

The Buddha was able to create another person identical to him. It was like taking out some from the inside a receptacle-container. This Creating ambulatory was through his psychic power, Then He walked facing each other and facing up and down. The Buddha during this 3rd week, walked up and down between the place where he had stood in meditation and the Foot of the tree. *(Manomaya Iddhi)*



දෙසතියක් පුරා හිඳගෙන සිටි බුදුපියාණන් වහන්සේ තෙවන සතිය අඛණ්ඩව සක්මනෙහි යෙදුණි. ඒ ශ්‍රී මහාබෝධියත්, අනිමිස

චෛත්‍යයත් අතරය. බුදුන් වහන්සේ තම රුව හා සමාන රුවක් මවා මුහුණට මුහුණ ලා සක්මනෙහි යෙදුණ එම සක්මන් මළුවෙහි නෙළුම් මල් දහ අටක් පිපුණ බව ප්‍රකටය.

එම බිමෙහි අද තාප්පයක් ඇත. එහි ශෛලමය නෙළුම් මල් 18 ක් ද නිර්මිතය. ඒ අසල බිම පැරණි ශෛලමය නෙළුම් මල් කිහිපයක් ද දක්නට තිබේ. එම නිර්මාණ ධර්මාශෝක රජතුමා විසින් කරවනු ලැබ ඇත.

4th week = <u>Contemplating the minutiaes of higher teaching Abhidamma (Dibbasotha)/ Idhividha)</u>

The Buddha was in a little hut (now call as golden chamber) close to the Bo tree. During this 4th week, HE spent in meditating on the various aspects of **Abhidamma** or the deep philosophy. At this time the ***'aura'*** or light which radiated from the Buddha increased and became very broad.

බුදු පියාණන් 4 වන සතිය රතනාඝර හෙවත් රුවන් ගෙය නම් වූ කුටිය තුළ ගැඹුරු දහම් කොටස් නැවත ආවර්ජනය කරමින් භාවනායෝගීව ගත කර ඇත. තමන් වහන්සේ අවබෝධ කර ගත් ධර්මයෙහි ගැඹුර දුටු උන් වහන්සේගේ සිරුරෙන් ආලෝක රැස් ධාරාවක් නිකුත් වී ඇත්තේ ද මෙම ස්ථානයේ දීය.

ජය ශ්‍රී මහ බෝධියට උතුරු පසින් එම ස්ථානයෙහිම ගඩොල් බිත්ති සහිත කුඩා කුටියක් නටඹුන් පවා දැකිය හැකිය. එතුළ අද දක්නට ඇත්තේ නවීන බුදු රුවකි. එම කුටිය වටා කුඩා චෛත්‍ය රැසක් ද දක්නට තිබේ.

5th week = <u>Defeating the 3 daughters of 'Mara', Thanha, Rath, Raga (Paracitta Vijanana)</u>

The Buddha was at the foot of a Banyan tree during this week, meditating on Dhamma that HE had discovered. While HE was there a Brahimin, who was proud of his Brahmin lineage and ancestry came up to him and started to ask questions about the Buddha's ancestry and lineage. Then he directly asked "How does one become a Brahmin? " The Buddha replied " He who is free of all evil who has no lust or pride of him. Who has a contented mind and lives a virtuous life is worthy of being called a Brahmin"

The Buddha realizing that everyone should have a teacher to show the way, then resolved to regard the Dhamma as his teacher.

During this week, the 3 daughters of Mara named Thanha, Rathi, Raga reached again and tried to tempt the Buddha. "They were determind that Buddha who conquered their father should in return be defeated."



මෙම පස්වන සතිය ගත කරන්නට වූයේ අජපාල නුග සෑක මූලය. එම ස්ථානයේ අද දක්නට ඇත්තේ ධර්මාශෝක රජතුමා පිහිට වූ ස්ථම්භයකි. බුද්ධගයා විහාරය ඉදිරිපිට පිය ගැට පෙළ මැද ඉදිකර ඇති මෙම ස්ථම්භය, එදා අජපල් නුග රැක එම ස්ථානයේ තිබූ බවට සාක්ෂි දරයි.

තණ්හා, රති, රගා යන මාර දූවරු තිදෙන බුදු හිමියන් අසළට පැමිණ, රඟුම් දක්වා උන්වහන්සේගේ සිතට රාග කෙලෙස් නැවතත් ඉපදවීමට මහත් උත්සාහයක් දරා පැරදී පලාගියේ මෙම ස්ථානයේදීය.

මා ගුරු කොට ගත යුත්තේ කවුරුන්ද යන පැනය බුදු සිතට පහළ වූයෙන්, එයට සුදුසු වන්නේ ද තමන් වහනසේ සොයාගත් ධර්මය ම බව පසක් ව එම තීරණයට බුදු පියාණන් වහන්සේ එළඹියහ.

මෙම ස්ථානයට පැමිණි එක්තරා බමුණෙකු, බ්‍රාහ්මණයෙකු වීමට අවශ්‍ය කරුණු බුදුපියාණන්ගෙන් විමසන්නට විය.

යො බ්‍රාහ්මණො බාහිත පාප ධම්මො
නිහුංක කො තික්කසාවො යතන්තො
ධම්මේන සො බ්‍රහ්ම වාදං වදෙය්‍ය
සස්සුස්ස දා නත්ථි කුහිංච ලොකෙ (විනය මහා වග්ග)

(පාපයෙන් දුරු වූ, කිසිම අරමුණක් රාග, ද්වේෂ, මෝහ, මාන දෘෂ්ඨි වශයෙන් අල්ලා නොගන්නා, උඩඟුකම් නැති, අනුන් හෙළා නොදකින, කෙලෙස් කහට සියල්ල නැති කලා වූ, සිත රැක ගත්, සතර මඟ නුවණින් නිවන කරා පැමිණ, මාර්ග බ්‍රහ්මචර්යාවේ වැඩ නිම වූ යමෙක් වේද? ඔහු සැබෑ බ්‍රාහ්මණයෙකු බව බුදුපියාණන් වහන්සේ පෙන්වා වදාළහ.)

6th week = <u>In the tremendous rain storm, when the serpent (The king of Muchalinda) sheltered the Buddha from rain spreading his hood over the head of the Buddha</u>

The Buddha was spending the 6th week meditating under a Midella tree near the lake known as Muchalinda, it rained heavily. A large King Cobra coming up from the lake and wrapped his coil around the seated Buddha, Expanded his great hood over the head of the Buddha and sheltered Him from the lashing rain. As the rain was lasted for 7 days, throughout the week the king cobra remained still as a shelter to the Buddha.

ජය ශ්‍රී මහ බෝධිය අසල මුචලින්ද නමැති ග්‍රාමයක සය වන සතිය ගත කරද්දී තද වැසි ඇති විය. බුදුන් වහන්සේ සන්සුන්ව භාවනායෝගීව වැඩ වසනු දුටු මුචලින්ද නම් නාග රාජයා, බුදු සිරුර නාග දරණයෙන් ආවරණය කොට සිය නාග පෙනයව හැකි තාක් පුළුල් කොට ඔසවා හිස ආවරණය වනසේ පිහිටුවා තබා, අධික වර්ෂාව අවසන් වන තුරුම බුදු සිරුර වැසි ජලයෙන් ආරක්ෂා වන සේ ආවරණය කර ඇත.

ඒ නාග දරණය තුළ භාවනායෝගීව වැඩ සිටින බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිමාව, අදත් මුචලින්ද විල තුළ දර්ශනීයාකාර ලෙස නිර්මිතව ඇත. අදත් බැතිමතුන්ගේ හදවත් ත්‍රාසයට පත්කරවන සුළු මෙම පිළිරුව අවුරුදු දහස් ගණනක පෞරාණික නිර්මාණයකි.

7th week - <u>The Buddha had His 1st meal after the Enlightenment.</u>

The Buddha spent the 7th week near a Banyan tree known as 'Kiripalu Nuga Ruka' about half a mile away from the Sri Maha bodhiya, Two vendors **'Thapassu and Bhalluka"** passing by this place saw the Buddha and pleased with the serene sight. They Stopped there and offered some 'flour and honeycombs'. The Buddha did not have at least a bowl to accept the offerings at that moment. The deities who were watching, realized this and provided a bowl.

The Buddha gave Blessing to these venders. They were the 1st to find refuge in the **Buddha** and the **Dhamma.** They were the 1st Two lay devotees who accepted the Two-Fold formula. . They received few strands of hair from the Buddha.

It was the 1st meal that Buddha had after achieving the Boddhahood. During the past 6 weeks the Buddha had been fasting and had not taken any food. The milk rice offered by Sujatha had been finished before he had attained the buddhahood.

සත්වන සතිය ගත කිරීමට බුදුපියාණන් වහන්සේ පැමිණියේ කිරිපලු රුක මුලටය. එය ශ්‍රී මහා බෝධියට ගිණිකොණ දෙසින් සැතපුම් භාගයක් පමණ ඔබ්බෙන් පිහිටා ඇත. වෙළඳාම ජීවනෝපාය කරගත් තපස්සු හා භල්ලුක සහෝදරයින් දෙදෙනා වෙළඳ කටයුතු සඳහා යන අතර මඟ කිරිපලු නුගරුක අසලදී ශාන්ත සුවයෙන් වැඩ සිටින බුදු පියාණන් වහන්සේ දැක පහන් වු සිතැතිව එහි මඳක් නතර වූහ. එහිදී ඔවුන් විසින් පිළිගැන්වූ විළඳ මීපැණී වැළඳු බුදු පියාණන් වහන්සේ ඔවුන් දෙදෙන ධර්මයෙහි පිහිට වූ සේක.

බුද්ධං සරණං ගච්ඡාමි ධම්මං සරණං ගච්ඡාමි ආදි වශයෙන් පළමුවෙන්ම බුදුන්, දහම් සරණ ගිය මොවුන් දෙදෙන ප්‍රථම ද්වේවාචික උපාසකයින් ලෙසට බෞද්ධ ඉතිහාසයක් සනිටුහන් විය.

***

9

බුද්ධ ධර්මය දේශනා කිරීම
PREACHING BAUDDHA DHAMMA

Completely for 7 weeks the Buddha meditated reminding Dhamma, Paying gratitude to the Bo Tree. He checked His wisdom Power vividly. Dhamma he had realized started to reflect. It was bottomless; cannot be seen on surface only. It is multifarious; cannot be expressed simply. It is subtle; carefully to be taken to the mind, Difficult to understand merely, without getting into the correct route and follow, And it is different from all other teaching that prevailed in the then society.

The Buddha felt that the **'Buddha Dhamma'** would not be able to grasp by the people as they were submerged in searching for worldly pleasure fame and fortune and indulging into 5 senses. This 'Buddha Dhamma' would not appeal to such people who were not aware of the **'grief'** that exists in the world. The Buddha thought that no one would listen or wish to understand and no one would be able to get any profit. So the Buddha was reluctant to proclaim the **'Buddha Dhamma'**

By seeing the thought of the Buddha through the divine sense **Sahampathi Brahma Raja** appeared and encouraged the Buddha to proclaim the Dhamma. Deva Raja pointed out the need of publishing what the Enlightened One had grasped. He said that there were some, who like to see the 'Truth' by hearing and understanding. Further up Sahampathi Deva declared "If the True Dhamma of the Enlightened one is not proclaimed there will be a

possibility of a false Dhamma to be spread as happened in ancient time" Further up Sahampathi Deva said that the people would be wandered as they cannot identify the correct path to follow up. **Sahampathi Brahma's appeal began to echoed, not only once, but twice and also Thrice.**

At this juncture, Gauthama Buddha surveyed the world using the powers that He had developed. HE saw the people of different capabilities. Some people have low intelligence. Some acquires high. Some people see the danger of evil acts. Some are not. Some are intoxicated and don't know what is good and what is bad. Few see the danger of leading evil life which could be effected even after the death.

By seeing the different stratum of the mental capacities of human beings the Buddha accepted the invitation which was made earnestly by the Sahampathi Deva Raja. He was so delighted that he was responsible for the exposure of the Dhamma to the world. Then Sahampathi Deva returned to the abode after making respectful obeisance to the Enlightened Buddha.

'Dhamma' of the Enlightened one has 6 great qualitie

1. It is well expounded from the beginning to the end; (ස්වක්ඛාතො)
2. It is exist and can be seen; (සන්දිට්ඨිකො)
3. It is not limited for a certain period (අකාලිකො)
4. It has its' own invitation for anyone to come and see (ඒහිපස්සිකො)
5. It is leading onwards with the degree of perceptive (ඕපනයිකො)
6 It is to be realized by the shrewdness of each individuals (පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහිති)

Gauthama Buddha next considered to whom he should teach this deep, grave, and enormous Dhamma. He looked for someone who could understand it quickly. Again he surveyed the

world and looked for **Alarakalama; his 1st teacher.** But he had passed away by that time. Next he searched for **Uddakaramaputta.** He also had passed away the night before. Then HE remembered the 5 ascetics who had helped him at Uruvela, during the time he practiced extreme austerities. HE looked for them and saw that they were at Isipathana in Benaris. HE decided that they would be HIS first disciples'. With no delay the Buddha set off for the Deer-Park at Isipathana where the 5 ascetics were yet practicing their austerities.

On the way he met Upaka. He asked Buddha whether HE was an Arahanth: an all conqueror. The Buddha replied that he had destroyed all defilements and impurities and conquered. Without believing that Upaka went away, saying " I suppose what you say may be ………." .

Despite of the 1st mistrust of Upaka, who met 1st , the Buddha went onward to proclaim Dhamma, without taking at least a step back. HE thought "there are some lotus buds waiting to be blossomed, but still under water, Some buds have come up to a certain level, but not to the surface, Some buds are blossoming just came up to the surface, Some Lotus come up exceeding the water level and blossom spreading its fragrance to all directions". The Buddha went onwards to fulfill His aspiration.

The Buddha approached to the deer –park at Isipathana for the benefit of 5 ascetics. Seeing HIM aproaching, five ascetics decided not to greet HIM and did not take any notice. They thought, "Siddhartha, who did not have courage to continue his austerities, is now coming back to us. We have no more to do with him. Once we looked after him, we need not do so again." and they engaged in their activities, resolved not to acknowledge HIS presence. Seeing all these thoughts of ascetics, through the Power of Buddha HE approached them. When the Buddha was coming closer, they could not remain still as they thought. They felt duty-bound to look up, went up to Him to greet, brought water to wash His feet, prepared a seat for Him, and made him to relax.

But still, without being able to understand the Buddha properly they address the Buddha with such words like **"Avuso** (Friend) "At that moment Gouthama Buddha advised them not to address a **"Thathagath"** in that way. But without believing, they continued to address as same as they used.

The Buddha advised them 3 times and at last HE inquired, "Have I before told like this?" When the ascetics replied that he had not, the Buddha expressed that the 'Thathagath' is an Exalted One as he is fully Enlightened One.

The Buddha explained further up .When he gave up austerities it was not to assume a life of wealth and luxury. He did it to walk on the correct path. Following that way, he was succeeded in advancing the insight that he sought."I shall now proclaim the Dhamma that I have found, If you follow my teaching, you too may comprehend through your own wisdom which I realized for myself through my own wisdom"

Believing the splendid utterance of the Buddha they thought that HE had really attained to the Buddhahood. Five ascetics agreed and declared that they were willing to let them be the spiritual guide.

The place was Isipathana Migadaya; not far from Benaris. The Buddha sat and preached HIS First sermon. It was the **"Dhammacakka Pavattana Sutta"**(The discourse on the setting in motion of the Dhamma Chkkra- The wheel of Dhamma: the truth) At the end of the long sermon, Kondanna attain the First stage of Sainthood: Sothapanna and soon after all five monks gain the "Arhanth ship" final stage of saintly.

*

*(In the following section from the original canon the repetitions are rendered in full only in some places in order to give the reader an idea of their style. In other places, they are indicated by dots. I have tried to render the original Pali as closely as possible to English without harming either the sense or the tone of the Buddha's words. Further up, the pronoun **'he'** is used as **'HE'** (in capital letters) when it is used for the **dignified Buddha** as an esteem)*



THE FIRST SERMON OF THE BUDDHA
(SETING IN MOTION THE WHEEL OF TRUTH)
ප්‍රථම ධර්ම දේශනාව ධම්මචක්කපවත්වන සූත්‍රය

I have heard that on one occasion the Blessed One was staying at Varanasi in the Game Refuge at Isipatana. There He addressed the group of five monks:

''Monks, these two extremes ought not to be practiced by one who has gone forth form the household life. **(What are the two?)** There is **addiction to pleasure** of sense-pleasures, which is low, coarse, the way of ordinary people, unworthy, and unprofitable; and there is **addiction to self-mortification,** which is painful, unworthy, and, unprofitable.

''Avoding both these extremes, the Tathagata (The perfect One has relized the Middle path; it gives vision, gives knowledge, and leads to calm, to insight, to enlightenment and to Nibbana. **And what is that Middle Path realized by the Tathagata....?** It is the Noble eightfold path, and nothing else, namely: right understanding, right thousht, right speech, right action, right livelihood, right effort, right mindfulness and right concentration, **This is the Middle Path realized by the Tathagata which gives vision, which gives knowledge, and leads to calm, to insight, to enlightenment, and to Nibbana.**

"Now this, monks, is the noble truth of stress:[1] Birth is stressful, aging is stressful, death is stressful; sorrow, lamentation, pain, distress, & despair are stressful; association with the unbeloved is stressful, separation from the loved is stressful, not getting what is wanted is stressful. **In short, all the five clinging-aggregates are stressful.**

"And this, monks, is the noble truth of the origination of stress: the craving that makes for further becoming .... accompanied by passion & delight, relishing now here & now there .... i.e., craving for sensual pleasure, craving for becoming, craving for non-becoming.

"And this, monks, is the noble truth of the cessation of stress: the remainderless fading & cessation, renunciation, relinquishment, release, & letting go of that very craving.

"And this, monks, is the noble truth of the way of practice leading to the cessation of stress: precisely this Noble Eightfold Path — **right view, right resolve, right speech, right action, right livelihood, right effort, right mindfulness, right concentration.**

"Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before: 'This is the noble truth of stress.' Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before: 'This noble truth of stress is to be comprehended.' Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before:' This noble truth of stress has been comprehended.'

"Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before: 'This is the noble truth of the origination of stress'... 'This noble truth of the origination of stress is to be abandoned' [2] ... **'This noble truth of the origination of stress has been abandoned.'**

"Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before: 'This is the noble truth of the cessation of stress'... 'This noble truth of the cessation of stress is to be directly experienced'...

.**'This noble truth of the cessation of stress has been directly experienced.'**

"Vision arose, insight arose, discernment arose, knowledge arose, illumination arose within me with regard to things never heard before: 'This is the noble truth of the way of practice leading to the cessation of stress'..'This noble truth of the way of practice leading to the cessation of stress is to be developed' This noble truth of the way of practice leading to the cessation of stress has been developed. [3] '

"And, monks, as long as this — my three-round, twelve-permutation knowledge & vision concerning these four noble truths as they have come to be — was not pure, I did not claim to have directly awakened to the right self-awakening unexcelled in the cosmos with its deities, Maras, & Brahmas, with its contemplatives & brahmans, its royalty & commonfolk. But as soon as this — my three-round, twelve-permutation knowledge & vision concerning these four noble truths as they have come to be — was truly pure, then I did claim to have directly awakened to the right self-awakening unexcelled in the cosmos with its deities, Maras & Brahmas, with its contemplatives & brahmans, its royalty & commonfolk. Knowledge & vision arose in me: 'Unprovoked is my release. This is the last birth. There is now no further becoming.'"

That is what the Blessed One said. Gratified, the group of five monks delighted at his words. And while this explanation was being given, there arose to Ven. Kondañña the dustless, stainless Dhamma eye: Whatever is subject to origination is all subject to cessation.

And when the Blessed One had set the Wheel of Dhamma in motion, the earth devas cried out: "At Varanasi, in the Game Refuge at Isipatana, the Blessed One has set in motion the unexcelled Wheel of Dhamma that cannot be stopped by brahman or contemplative, deva, Mara or God or anyone in the cosmos." On hearing the earth

devas' cry, the devas of the Four Kings' Heaven took up the cry... the devas of the Thirty-three... the Yama devas... the Tusita devas... the Nimmanarati devas... the Paranimmita-vasavatti devas... the devas of Brahma's retinue took up the cry: **"At Varanasi, in the Game Refuge at Isipatana, the Blessed One has set in motion the unexcelled Wheel of Dhamma that cannot be stopped by brahman or contemplative, deva, Mara, or God or anyone at all in the cosmos."**

So in that moment, that instant, the cry shot right up to the Brahma worlds. And this ten-thousand fold cosmos shivered & quivered & quaked, while a great, measureless radiance appeared in the cosmos, surpassing the effulgence of the devas.

Then the Blessed One exclaimed: "So you really know, Kondañña? So you really know?" And that is how Ven. Kondañña acquired the name Añña-Kondañña —. and soon after, all the 5 monks got into the arhanthship.

*

බුදු පියාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව

DHAMMA CAKKA SUTTA –PALI (in Sinhala Letters for recitation)

(සිංහල අරුත් සමඟින්)

ඒවං මේ සුතං ඒකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනේ මිගදායේ, තත්‍ර ඛෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛු ආමන්තේසි.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවත් බුදුරාජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් අමතා මෙම ධම්මචක්ක දේශනය වදාළ සේක.

ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යෝචා යං කාමෙසු කාමසුඛල්ලිකානුයෝගෝ, හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ. යෝචා යං අත්තකිලමථානුයෝගෝ, දුක්ඛෝ අනරිඅයෝ අනත්ථසංහිතෝ.

පින්වත් මහණෙනි, පැවිද්දන් විසින් සේවනය නො කළ යුතු වූ මේ අන්ත දෙකකි. යම්යම් කාමයන්හි කාම සුඛයේ ඇලී ගැලී වාසය කිරීමක් ඇද්ද මෙය හීන වූ දෙයකි, ලාමක වූ දෙයකි. පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි, උත්තම මිනිසුන් විසින් සේවනය නොකරන දෙයකි, අනර්ථ සහිත දෙයකි.

ඒතේ තේ භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

තමා ව පීඩාවට පත් කරවන වැඩ පිළිවෙලක් ඇද්ද, එය දුක් සහිත දෙයකි, උත්තම මිනිසුන් විසින් සේවනය නොකරන දෙයකි, අනර්ථ දෙයකි.

කතමා ච සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාන නිබ්බානාය සංවත්තති?

පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදී. මේ මධ්‍යම ප්‍රතිපදාවට දහම් ඇස ලබා දෙයි. නුවණ උදා කරයි. සංසිඳීම ඇති කරයි. විශේෂ ඥානය ඇති කරයි. අවබෝධය ඇති කරයි. නිවන පිණිස පවතින්නේ ය.

අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඤානය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක් ද? ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකප්පය ද, සම්මා වාචා ද, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද, සම්මා සමාධියද යන මෙයයි.

අයං ඛෝ සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඤාණය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙය යි.

ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛං අරියසච්චං. ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛෝ මරණම්පදුක්ඛං අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තීන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

> පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි. ඉපදීම ද දුකකි. ජරාවට පත් වීම ද දුකකි. රෝග පීඩා වැළඳීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයන් හා අප්‍රිය වස්තූන් සමඟ එක්වීම ද දුකකි. ප්‍රිය පුද්ගලයන් හා ප්‍රිය වස්තූන් ගෙන් වෙන්වීම ද දුකකි. කැමති වන්නා වූ යම් දෙයක් ඇද්ද, එය නොලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත් පංච උපාදානස්කන්ධයෝ ම දුකකි.

ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛසමුදයං අරියසච්චං. යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී. සෙය්‍යථීදංඃ කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.

> පින්වත් මහණෙනි, මෙය වනාහී දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. පුනර්භවය ඇති කරන, ආශ්වාදයෙන් ඇලෙන්නා වූ, ඒ ඒ තැන සතුටින් පිළිගන්නා වූ යම් ඒ තණ්හාවක් ඇද්ද, එය යි. එනම්, කාම තණ්හාව ය, භව තණ්හාව ය, විභව තණ්හාව ය.

ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං. යෝ තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.

> පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. ඒ තණ්හාවේ ම ඉතිරි නැතිව නො ඇල්මෙන් නිරුද්ධ වීමක් වේ ද, අත් හැරීමක් වේද, දුරු වීමක් වේද, තණ්හාවෙන් මිදීමක් වේද, ආලය නැතිවීමක් වේ ද එය යි.

ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි. ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ය. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා ද, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද, සම්මා සමාධිය ද යන මෙය යි.

ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරන ලදි යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීණන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය වූයේ යයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය සාක්ෂාත් කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛංසමුදයං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි අලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යයයි. කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යය සාක්ෂාත් කරන ලදි යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේදු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නැතිවීම නම් වූ අර්ය සත්‍යය සාක්ෂාත් කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛනිරෝධගගාමිනී පටිපදා අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යයයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං භාවිතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කරන ලදි යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන් හී දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

යාවකීවඤ්ච මේ භික්ඛවේ, ඉමේසු චතුසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි. නේවතාවීහං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.

පින්වත් මහණෙනි, මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසකින් යුතුව සැබෑ තත්ත්වය නම් වූ ඤාණ දර්ශනය සුවිශුද්ධ ලෙස මා හට යම් තාක් අවබෝධ නො වූයේ වේ ද, ඒ තාක් කල් ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයේ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි යි ප්‍රතිඥා නො දුන්නෙමි.

යතෝ ච ඛෝ භික්ඛවේ, ඉමේසු චතුසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි. අථාහං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.

යම් කලෙක පින්වත් මහණෙනි, මා හට මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසකින් යුතුව සැබෑ තත්වය නම් වූ ඤාණ දර්ශනය සුවිශුද්ධ ලෙසට ම අවබෝධ වූයේ වේ ද, එකල්හී පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයේ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි යි ප්‍රතිඥා දුන්නෙමි.

ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි, අකුප්පා මේ චේතෝ විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝති. ඉදමවෝච භගවා. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛු භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

මා හට ඤාණ දර්ශනය පහළ විය. මාගේ චේතෝ විමුක්තිය වෙනස් නොවන්නේ ය. මෙය වනාහී අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ක දේශනය වදාළ සේක. අතිශයින් ම සතුටට පත් වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද මේ ශ්‍රී සද්ධර්මය මහත් සොම්නසින් යුතුව පිළිගත්තාහු ය.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මන්ති.

මේ ධම්මචක්ක දේශනය වදාරණ කල්හී ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා වූ යම් දෙයක් ඇද්ද, හේතුන් නිරුද්ධ වීමෙන් ඒ සියල්ල ම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්ත යයි කියා කෙලෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ භුම්මා දේවා සද්දමනුස්සාවේසුං. ඒතං භගවතා බාරානසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රාහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කිසිවෙකුට හෝ වෙනස් කළ නොහැක්කේ ම යැයි කියා පොළොවවාසී දෙවියෝ දහම් සෝෂා පැවැත්වුවාහු ය.

භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං ..

පොළොවවාසී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

චාතුම්මහාරාජිකානං දේවානං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං

චාතුම්මහාරාජික දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා තාවතිංස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුහාහු ය.

තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං

තාවතිංස දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා යාම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං ..

යාම දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා තුසිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං ..

තුසිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා නිම්මාණරතී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තිනෝ දේවා සද්දමනුස්සාවේසුං ..

නිම්මාණරතී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා පරනිම්මිතවසවත්තී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං ..

පරනිම්මිතවසවත්තී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්මපාරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං ..

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දේවා සද්දමනුස්සාවේසුං ..

බ්‍රහ්ම පුරෝහිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා මහා බ්‍රහ්ම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

මහාබ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා පරිත්තාභා දේවා සද්දමනුස්සාවේසුං ..

මහා බ්‍රහ්ම දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය.

පරිත්තාභානං දේවානං සද්දං සුත්වා අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං ..

පරිත්තාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා අප්පමාණාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය..

අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං ..

අප්පමාණාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා ආභස්සර දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය..

ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං ..

ආභස්සර දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා පරිත්තසුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වුවාහු ය..

පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං ..

පරිත්තසුභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා අප්පමාණසුභ දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං ..

අප්පමාණසුභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා සුභකිණ්හ දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං ..

සුභකිණ්හ දෙවියන් ගේ දහම් සෝෂාව අසා වේහප්ඵල දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

වේහප්ඵලානං දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං ..

වේහප්ඵල දෙවියන් ගේ දහම් සෝෂාව අසා අවිහ දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං ..

අවිහ දෙවියන් ගේ දහම් සෝෂාව අසා අතප්ප දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං ..

අතප්ප දෙවියන් ගේ දහම් සෝෂාව අසා සුදස්ස දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං ..

සුදස්ස දෙවියන් ගේ දහම් සෝෂාව අසා සුදස්සී දෙවියෝ දහම් සෝෂා පැවැත්වූවාහු ය..

සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං. ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

> සුදස්සී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස් ඉසිපතන මිගදායෙහි දී අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කිසිවෙකුට හෝ වෙනස් කළ නොහැක්කේ ම යැයි කියා අකනිට්ඨ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගඤ්ජි. අයඤ්ච දස්සහස්සී ලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි.

> ඒ ක්ෂණයෙහි ම, ඒ මොහොතෙහි ම, බ්‍රහ්ම ලෝක යම් තාක් වේ ද, ඒ තාක් ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේ ය. දස දහසක් ලෝක ධාතුව ම කම්පා විය. තදින් ම කම්පා විය. බලවත් ව කම්පා විය.

අප්පමාණෝ ච උළාරෝ ඕභාසෝ ලෝකේ පාතුරහෝසි අතික්කම්ම දේවානං දේවානුභාවන්ති.

> දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණ වූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේ ය.

අථ ඛෝ භගවා උදානං උදානේසි.

> එකල්හී භග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළාහු ය.

අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝති.

භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා. භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා.

ඉතිහිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤාත්වේ ව නාමං අහෝසිති.

මේ ආකාරයෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට අඤ්ඤාකොණ්ඩඤ්ඤ යන මේ නාමය ඇති වූයේ ය.

ඒතේන සච්චේන සුවත්ථි හෝතු!

මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!

*

ධම්මචක්කපවත්වන සූත්‍රය සරල සිංහල බසින්

බරණැස ඉසිපතන මිගදායට පා ගමණින් වැඩමකළ බුදුපියාණන් වහන්සේ පස්වග මහණුන් අමතා දේශනය ඇරඹූහ.

මහණෙනි, පැවිද්දෙකු විසින් අත්හළ යුතු අන්ත දෙකකි, එනම් **කාමසුකල්ලිකානු යෝගය** සහ **අත්ථකිලමතානුයෝගයයි.** කාම සුඛල්ලිකානු යෝගය නම් හීන වූ, ග්‍රාම්‍ය වූ, පහත්වූ අවැඩට හේතු වූ පෘතග්ජන ගතියක් වූ කාම සැපයෙහි ඇලීමයි. අත්ථකිලමතානු යෝගය නම් දුක් උපදවන ආර්ය නොවූ, අවැඩ පිණිස පවතින, ශරීරයට අනවශ්‍ය ලෙස වෙහෙස දීමයි.

මහණෙනි, මෙම අන්ත දෙකට නොපැමිණ මැදුම් මගක් හෙවත් මධ්‍යම ප්‍රතිපදාවක් මම සොයා ගතිමි. එය නුවණැස පිරිසිදු කිරීමට, ඥානය පහළ කිරීමට, කෙලෙස් දුරු කිරීමට, සත්‍යය දැනගැනීමට, සම්බෝධිය ලැබීමට, නිවන් අවබෝධයට හේතු වෙනවා.

මහණෙනි, මධ්‍යම ප්‍රතිපදාව යනු කුමක් ද? ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. ඒ අංක 8 මෙසේය.

සම්මා දිට්ඨි (ලෝකය නිවැරදි ලෙස දැකීම හෙවත් චතුරාර්ය සත්‍යය අවබෝධය) **සම්මා සංකප්ප** (යහපත් කල්පනාව) **සම්මා වාචා** (වාග් දුෂ්චරිතයෙන් මිදීම) **සම්මා කම්මන්ත** (කාය දුශ්චරිතයෙන් වැළකීම) **සම්මා ආජීව** (යහපත් දිවි පෙවෙත) **සම්මා වායාම** (යහපත් උත්සාහය) **සම්මා සතිය** (යහපත් සිහිය) **සම්මා සමාධි** (යහපත් සමාධිය)

මහණෙනි, මවිසින් දැන දැක අවබෝධ කරගත් මෙම මධ්‍යම ප්‍රතිපදාව නුවණ පහළවීමට, නිවන ප්‍රත්‍යක්ෂ වීමට හේතු වෙනවා. මහණෙනි, ඉපදීම, ජරාව, මරණය, ලෙඩ වීම ආදී සියල්ල දුක් උපදවනවා. අප්‍රියයන් හා එක්වීමෙන් ප්‍රියයන්ගෙන් වෙන්වීම,

කැමති දේ නොලැබීම මේ සියල්ලම දුක් කෙටියෙන්ම කියනවා නම් පඤ්චඋපාදානස්කන්ධයට දුකකි. **මෙය දුක්ඛ ආර්ය සත්‍යය යි.**

මහණෙනි, නැවත ඉපදීමක් ඇති කරවන **නන්දිරාගය** මෙන්ම උපදින භවයන්හි ඇලීම ඇතිකරවන **තෘෂ්ණාව** තෙවැදෑරුම් වේ. එනසම් කාම තණ්හා, භව තණ්හා සහ විභව තණ්හාවයි. මෙම තෘෂ්ණාව **දුක්ඛ සමුදායාර්ය සත්‍යය යි.**

මහණෙනි, ඒ තෘෂ්ණාව මුලිනුපුටා දැමීමක් වේද, දුරු කිරීමක් හෝ බැහැර කිරීමක් වේද, ඇල්මක් නොවේද, නිරෝධයට හේතු වූයේද, එය **දුක්ඛ නිරෝධාර්ය** සත්‍යය යි.

මහණෙනි, මෙම දුක් නැතිකර ක්ෂාන්තිය ලබා ගැනීමට ඇති එකම මඟ ආර්ය ආෂ්ඨාංගික මාර්ගයයි. ඒ **දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යය යි.**

**

මහණෙනි, දුක නම් වූ ආර්ය සත්‍යය යි කියා පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළ විය. ඒ කෘත්‍ය ඥානය යි.

මහණෙනි, ඒ දුක්ඛාර්යය සත්‍යය පිරිසිඳ දුටුවා නොවේද යි පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඥාණය පහළ විය. ආලෝකය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ඒ කෘත ඥානය යි.

මහණෙනි, ඒ දුක්ඛ සමුදයාර්ථ සත්‍යය යි කියා පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළ විය. විද්‍යාව පහළ විය. ඒ සමුදය සත්‍යයේ සත්‍ය ඥානය යි.

මහණෙනි, ඒ දුක්ඛ සමුදයාර්ථ සත්‍යය හෙවත් තෘෂ්ණාව පහ කළ යුතු යැයි පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය.

මහණෙනි, මේ දුක්ඛ සමුදයාර්ථ සත්‍යය හෙවත් තෘෂ්ණාව, මා විසින් නසන ලදැයි පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ඒ සමුදය සත්‍යයේ කෘත ඤානය යි.

මහණෙනි, ඒ දුක්ඛ නිරෝධාර්ය සත්‍ය (නිවන) යන්න මේ යැයි පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය. ඒ නිරෝධ සත්‍යයේ සත්‍ය ඤානය යි.

මහණෙනි, ඒ දුක්ඛ නිරෝධාර්ය සත්‍ය ප්‍රත්‍යක්‍ෂ ආලෝකය පහළ විය. පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය. ඒ නිරෝධ සත්‍යයේ සත්‍ය ඤානය යි.

මහණෙනි, පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඒ දුක්ඛ නිරෝධ පටිපදා ආර්ය සත්‍ය මා විසින් වැඩිය යුතු යැයි ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය. ඒ මාර්ග සත්‍යයේ කෘත්‍ය ඤානය යි.

**

මහණෙනි, යම්තාක් කල් මෙසේ සත්‍ය ඤාන, කෘත්‍ය ඤාන, කෘත ඤානක වශයෙන් එක් එක් ආර්ය සත්‍යයයන් තුන් ආකාරයකට වේද, සත්‍ය හතරම දොළොස් ආකාරයක් වේ. ඒ සත්‍ය හතර පිළිබඳව නිසි පරිදි දන්නා නුවණ හෙවත් දැක්ම, එනම් **යථා භූත ඤාන දර්ශනය** මට යම්තාක් කල් පිරිසිදුව දක්නට නොලැබිණිද, ඒ තාක් කල් මම දෙව්, බඹුන් සහිත මේ ලෝකයෙහි මහණ බඹුන්, දෙවි, මිනිසුන් ආදී සත්ත්ව වර්ගයාහට මම **අනුත්තර වූ සම්‍යක් සම්බෝධි ලැබුවෙම් යැයි ප්‍රතිඥා නොකළෙමි.**

මහණෙනි, යම් කළෙක තුන් පැවැත්මක් ඇති ආකාර දෙළොසක් ඇති යම් සතර ආර්ය සත්‍යයන් කෙරෙහි තතු පරිදි දන්නා නුවණ නම් වූ දර්ශනය මට ඉතා පැහැදිලි වූයේද, මම එකළ උතුම් වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කළෙමි යි ප්‍රතිඥා කළෙමි.

මා තුළ දර්ශන ඥානය පහළ විය. මාගේ චිත්ත විමුක්තිය හෙවත් අර්හත් ඵලය සෙලවිය නොහැකි ය. මේ මාගේ අන්තිම ජාතියයි. නැවත ඉපදීමක් නැත.

බුදු රාජාණන් වහන්සේ මෙසේ ධම්ම චක්ක පවත්වන සූත්‍රය වදාරා අවසන්වත්ම කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් විය. දහම් ඇස පහලවිය. ධර්මය දුටු අයෙක් බවට පත්විය.

සූත්‍රයේ අවසන් වැකියත් සමඟම එනම් නැවත ඉපදීමක් නැතැයි ප්‍රකාශ වීමත් සමඟම, කිසිදු මහණෙකුට, බමුණෙකුට, දෙවියෙකුට, මාරයෙකුට හෝ බඹෙකුට පැවැත්විය නොහැකි උතුම් ධර්ම චක්‍රය බරණැස ඉසිපතන මිගදායේදී ගුවනට මුසුවිය. වැස්ස වළාහක දෙවිවරු මල් වැසි වස්සමින් සාධු සාධු හඬ නගන්නට විය.

ඒ සාධු සාධු ඔල්වරසන් හඬින් කුල්මත් වූ චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණරති, පරනිම්මිත වසවර්ති ආදී දෙව්ලොව වාසී දෙව්වරුද, බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම, පරිත්තාභ, ඇප්පමානාභ, ආභස්සර, පරිත්ත සුබ, අප්පමාණ සුභ, සුභ කින්හක, වේගප්ඵල, අවිහා, අතප්පා, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මයෝ ද සාධු නාද දුන්හ.

මේ සාධු හඬින් දස දහසක් ලෝක ධාතු කම්පනයට, ප්‍රකම්පනයට පත්වෙමින් වෙවුලන්නට වූයේ සියලුම ලෝක තල පුරා මහත් වූ ආලෝකයක් විහිදුවමිනි. කෙතරම් ආශ්චර්යයක් ද?

(ධම්මචක්ක පවත්වන සූත්‍රයේ සිංහල සාරාංශය නිමි)

*

දස දහසක් සක්වල පැතිරී ගිය මෙම සුමධුර දහම් හඬ අසා මූලගන්ධි කුටියේ වැඩසිටි බුදු රජාණන් වහන්සේ හමුවට පැමිණි සාතාගිරි, හේමවත යක් සෙනවියෝ ද බණ අසා දහසක් යක් සෙනඟ සමඟ සෝවාන් වූහ.

ඇසළ පුරපසළොස්වක පොහොය ගෙවී දින දෙකකට පසු බුදු රජාණන් වහන්සේ වප්ප තවුසා හැර අනෙක් සිව් දෙනා පිඬු සිඟා යැවූහ. බුදු රජාණන් වහන්සේ වප්ප තවුසාට දහම් දෙසූහ. කමටහන් ලබා, භාවනා කොට සෝවාන් වී, පැවිදි උපසම්පදාව ලැබීය.

පසුදින භද්දිය තවුසා හැර අනෙක් සිව් දෙනා පිඬු සිඟා යැවූහ. බුදු රජාණන් වහන්සේ භද්දිය තවුසාට දහම් දෙසූහ. කමටහන් ලබා භාවනා කොට සෝවාන් වී පැවිදි උපසම්පදාව ලැබීය.

මෙලෙස මහානාම සහ අස්සජි තවුසෝ ද සෝවාන් වී පැවිදි උපසම්පදාව ලැබූහ.

උරුවෙල් දනව්වේ දුෂ්කර ක්‍රියා කරන සමයේදී තමාට කළ සත්කාර වෙනුවෙන් බුදු රජාණන් වහන්සේ, ඔවුන් සොයා ගොස් කළගුණ දැක්වූයේ මෙලෙස ලොව්තුරු අමා මහා නිවනට මඟ පාදා දෙමිනි.

අනතුරුව බුදු රජාණන් වහන්සේ, භික්ෂූන් පස් නම සමඟින් මූලගන්ධි කුටියේ මීටර් 40ක් පමණ ඔබ්බෙහි පිහිටි එළිමහන් පිටියට වැඩම කළහ. එම ස්ථානයේ අද ධම්මික චෛත්‍යය පිහිටා ඇත. ඒ අසල මීටර් 33 ක් පමණ උස ධම්මරාජික විහාරය ද වෙයි. එය මෞර්ය රාජ වංශ සමයේ ඉදිවූවකි.

පසුකාලීන අන්‍ය ආගමික ප්‍රහාරයන් එල්ල වීම නිසා මෙහි ඇතැම් කොටස්වලට හානි සිදු වී ඇත. එහෙත් භූමි ස්පර්ශ පහළ කොටස තනි ගලින් නිර්මාණය වී ඇති හෙයින් එම කොටස පොළවට සමතලා කිරීමට ඔවුන් අපොහොසත් වී ඇත. මෙම චෛත්‍යය වටා ගමන් කරන්නෙකුට චෛත්‍ය බඳෙහි ඇති ගල් කැටයම් වලින් එහි උසස් නිර්මාණය පිළිබිඹු වෙයි. බුදු රජාණන් වහන්සේ භික්ෂු පිරිස අමතා "අනාත්ම ලක්ෂණ සූත්‍රය" මෙහිදී දේශනා කර වදාළහ.

**

අනාත්ම ලක්ෂණ සූත්‍ර දේශනාව - සංක්ෂිප්ත අදහස

මහණෙනි, රූපය තමාගේ හෝ තමාගේ ආත්මය වශයෙන් ගත නොහැක. රූපය තමාගේ නම්, රූපය ආත්මය වේ නම්, ආබාධ පිණිස පවතින්නේ ද නැත. මගේ රූපය මට අවශ්‍ය ලෙස නොපවතී. එය මෙසේ වේවා මෙසේ නොවේවා! යි කිසිවෙකුට කිව නොහැක. එසේ තමාට අවශ්‍ය පරිදි නොපවතින රූපය ආත්මීය නොවේ.

රූපය මෙන්ම සංඥා, සංඛාර, විඥ්ඥාණය ද තමාගේ යැයි ගත නොහැක. එබැවින් ඒවාද ආත්ම නොවෙයි.

හොඳයි මහණෙනි, මේ රූපය නිත්‍ය ද?

අනිත්‍යයි ස්වාමීනි, පස්වග මහණුන් පිළිවදන් දුන්හ.

හොඳයි මහණෙනි, යමක් අනිත්‍ය වේ නම් එය සැපද? දුකද?

දුකයි, ස්වාමීනි,

හොඳයි, මහණෙනි, යමක් අනිත්‍ය වේ නම් එය දුක පිණිස පවතින්නේ නම්, වෙනස්වන සුළු නම්, එය මමය, මාගේය කීම සුදුසුද?

"නුසුදුසුයි ස්වාමීනි"

අනතුරුව වේදනා, සංඥා, සංඛාර සහ විඥ්ඥාන පිළිබඳව ද බුදු රජාණන් වහන්සේ මෙලෙසින් ම ප්‍රශ්න කළහ. පස්වග මහණුන් ද පෙරසේ ම පිළිවදන් දුන්හ.

බුදු රජාණන් වහන්සේ අනතුරුව මෙසේ වදාළහ.

"එසේ හෙයින් මහණෙනි, අතීතයේ හෝ අනාගතයේ හෝ වර්තමානයේ හෝ ආධ්‍යාත්මික හෝ බාහිර වූ, නොඑසේ නම් ගොරෝසු වූ හෝ සියුම් වූ හෝ, හීන වූ හෝ ප්‍රණීත වූ හෝ, දුරස්ථ

වූ හෝ සමීප වූ හෝ යම් රූපයක් වේද, ඒ සියලු රූප මම නොවේ. මාගේ නොවේ. මගේ ආත්මය නොවේ. කියා යථා පරිද්දෙන්, සම්‍යක් ප්‍රඥාවෙන් දැකිය යුතුය."

"මහණෙනි, මේ ආකාරයට දක්නා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා රූපය කෙරෙහි කළකිරෙනවා. වේදනාව කෙරෙහි කළකිරෙනවා. සංඥාව කෙරෙහි කළකිරෙනවා. සංඛාර කෙරෙහි කළකිරෙනවා. විඤ්ඤාණය කෙරෙහි කළකිරෙනවා. කළකිරීමත් සමඟ ම ඒ පිළිබඳව ඇති ඇලීම දුරු කරනවා. ඇල්ම දුරු වීමෙන් සියලු කෙලෙසුන්ගෙන් මිදෙනවා. කෙලෙසුන්ගෙන් මිදුණු කළ මා සිත මිදුණේය යි දැනගන්නවා. යළි ඉපදීමක් නැත. රහත් බවට පත්වූයෙමි. දුකෙන් මිදීමට මවිසින් කළ යුතු සියලු දේ කරන ලද්දේය. රහත් ඵලය සඳහා කළයුතු කිසිවක් නැතැයි දැනගත්තේය."

අනාත්ම ලක්ෂණ සූත්‍ර දේශනාව නිමි

*

මේ සූත්‍ර දේශනාව ඇසූ පස් වග මහණුන් රහත් බවට පත් වූහ. ඒ බව දුටු බුදු රජාණන් වහන්සේ සාධුකාර දුන්හ. බුදු හිමියන්ගේ ධර්මය අසා ලොව පහළ වූ මෙම රහතන් වහන්සේ පස්නම මාර්ගෝපදේශකයාණන් වහන්සේගේ දෙපා නමැඳ මහත් ශ්‍රද්ධාවෙන් යුතුව බුදු පියාණන් වහන්සේ සමීපයෙහිම ගරු බුහුමන් දක්වමින් වැඩ වසන්නට වූහ. වැසි සමය එළඹිණි. මෙම පළමු වස් සමය බරණැස ඉසිපතන මිගදායෙහිම ගත කරන්නෙමි යි බුදුහු වදාළහ.

ධම්මික චෛත්‍යය දෙස සිට මූලන්ධි කුටි විහරය දෙසට පැමිණීමේ දී චතුරශ්‍රාකාර ගොඩනැගිල්ලක් දිස්විය. එය කොන්ක්‍රීට් කණු මත ඉදිවී ඇත. ඒ තුළ පැරණි ගඩොලින් බැඳි වේදිකාවකි. එම ධර්මාසනයේ ආරක්ෂාව පිණිස පසුකාලීනව වහලයක් ද සකස් කර ඇත. අද දඹදිව වන්දනා කරන බැතිමතෙකුට පවා බරණැස පිහිටි මෙම දම් සභා මණ්ඩපය පියවි ඇසින් දැක ගත හැක.

අධික සැපසම්පත් වලට නොඇලී සිටි යස කුල පුත්‍රයා නිවෙසින් බැහැරව යාමේදී බුදු පියාණන් වහන්සේට හමු වී ඇත්තේ ද මෙම ස්ථානයේදීය. සසර රැස් කර තිබූ පින් බලයෙන්, ඔහු බුදු පියාණන් වහන්සෙගෙන් ධර්මය අසා පැහැදී, පැවිදි බවට පත් වූයේද

මෙම ස්ථානයේදීමය. යස කුල පුත්‍රයා සොයා පැමිණි සිය පියාණන් දුටු විට, යස කුල පුත්‍රයා සිවුරට මුවා වී සිටි අයුරු මට සිහිපත් වන්නට විය. මහත් කම්පනයකින් හා ආවේගශීලීව යස පුතු සොයා පැමිණි ඔහුගේ පියාණෝ ද බුදු රජාණන් වහන්සේ අබියසට පැමිණ, යස පිළිබඳව තොරතුරු විචාළේ වුවද, එහිදී බුදු පියාණන් වහන්සේගේ ධර්මය අසා තෙරුවන් සරණ ගියහ. තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසකයා වුයේ මොහුය. යස කුල පුත්‍රයාගේ මෑණියන්ද ධර්මාවබෝධය ලැබුවේ භාරතයේ උත්තර ප්‍රාන්තයේ සාරානාත්හි පිහිටි මෙම බරණැස ඉසිපතන මිගදා පින් බිමේහිදීමය.

බුදු පියාණන් වහන්සේගේ පාද ස්පර්ශය ලද එමෙන්ම ප්‍රථම තේවාචික උපසාක උපාසිකවන් බිහි වූ මෙම පින් බිමෙහි සිල් සුවඳ දසත සිසාරා ගොස් ඇත. තෙවරක් එම පින් බිමෙහි පහස ලැබීමට මා ද පුණ්‍යවන්ත වී ඇතැයි මට සිතුණි. සාධු!!! හඬෙහි දෝංකාරය මහ ද පුරා ඔල්වරසන් හඬ පැතිරයන්නාක් මෙන් දැනෙන්නට විය.

අනතුරුව යසකුල පුත්‍රයා තමා සමඟ ගිහි කල සෙල්ලම් කරමින් සිටි මිතුරුන් 54 දෙනාද බුදුපියාණන් අබියසට පමුණුවා ධර්ම මාර්ගයට යොමු කිරීමෙන් අනතුරුව ඔවුන්ද ධර්මයෙහි පිහිටා පැවිදිව ව නිවන මඟ පසක් කළහ. බුදු සසුනට මේ වන විට අලුතෙන් රහතන් වහන්සේලා පනස් පස් නමක් වූහ. පස් වග මහණුන් සමඟ මේ වන විට රහතුන් සැට නමකි.

සකල ලෝ සතුන් මෙම දුක්ඛිත සෝර සංසාරයෙන් එතෙර කරවීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව බදු පියාණන් වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතු මෙතැන් සිට අරඹන්නට වූහ. රහත් සැට නම ඇමතු බුදු පියාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ. **"මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස, යහපත පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙවි මිනිසුන්ගේ දියුණුව පිණිස, සැප පිණිස ගම් නියම් ගම්හි හැසිරෙව් දෙදෙනෙක් එක මඟ නොයව්. මුල මැද අග යහපත් අරුත් සහිත ව්‍යඤ්ජන සහිත සියලු කරුණු සපිරුණු පිරිසිදු ධර්මය දේශනා කරව්. පිරිසිදු බඹසර ප්‍රකාශ කරව් කෙලෙස් අඩු සත්ත්වයෝ වෙති. ඔවුන්හට ධර්මය අසන්නට නොලැබුණ හොත් උසස් ගුණ දම් නොලැබෙයි. ධර්මය වටහාගත හැකි අය වෙති. එහෙයින් අප්‍රමාදීව දහම් දෙසීමට පිටත්වව්. මම ද උරුවෙල්**

දනව්ව බලා වැඩම කරමි.” ඒ අසහාය නායකයාණන්ගේ, එඩිතර මාර්ගෝපදේශකයාණන්ගේ: උත්තරීතර ශාස්තෘවරයාණන්ගේ හද මඩලෙහි උපන් සුපිරිසිදු නිර්මල ධර්මස්කන්ධය, එතැන් පටන් සිසිල් දිය දහරාවක් මෙන් දෙව් මිනිස් සැමගේ සිත් සතන් පුබුදුවාලමින් ගලා බස්නට විය.

මුළු විශ්වය පුරාම සිසාරා යන්නට වූ ඒ මහා චින්තන විප්ලවය හදවත් සුවපත් කරමින්. විමුක්ති සුවය ස්ථාපිත කරමින්, වසර 2600ක් ඉක්මවා ගියද තවමත් නැවුම් ලෙස එලෙසින්ම ගලා බසී.

එම උත්තරීතර නිර්මල වූ සද්ධර්මයේ අන්තර්ගතයෙහි ඇති කිසිදු කරුණක් මේ දක්වා කිසිම චින්තකයෙකුට, කිසිම විද්‍යාඥයෙකුට, කිසිම ගාන්ධර්වයෙකුට හෝ කිසිම නායකයෙකුට අසත්‍ය යැයි සනාථ කිරීමට නොහැකි වී ඇත. එම ගම්භීර ශ්‍රී සද්ධර්මයේ අඩු වැඩි පෙන්වා දෙමින් සංශෝධනය කිරීමට හෝ යල් පැනපු අදහස් යැයි හුවා දක්වමින් යාවත්කාලීන කිරීමකට හෝ කිසිඳු අවශ්‍යතාවයක් මේ දක්වා පැන නැගී නැත. මුල සිට අග දක්වා ම ඉතාමත් යහපත් හා නිවැරදි ලෙසට සැළසුම් කර ඇති **(well expounded)** මෙම ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික අකාලිකය **(not limited for a certain period)** එහි පස්සිකය **(inviting anyone to come and see).** ඕපනයිකය **(leading onwards).** පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤුහීති **(to be personally realized by the degree of wisdom).**

අනන්ත ඥාන සම්භාරයකින් සමන්නාගත නව අරහාදී බුදු ගුණස්කන්ධයකින් උපලංකෘත වූ අසම සම ශ්‍රේෂ්ඨයාණන් වූ තිලෝගුරු බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශිත ශ්‍රී සද්ධර්මස්කන්ධයේ කිසිවෙකුට උපුටා දක්වය හැකි කිසිදු ආකාරයේ වරදක් හෝ අඩුපාඩුවක් නැත්තේමය. ශ්‍රී සද්ධර්මය එතරම්ම පිවිතුරුය. නිර්මලය. ගාම්භීරය. කේවල පරිපූර්ණය.

මහා සාගරය පරදවන මෙම ධර්මස්කන්ධය ඉතාමත් ක්‍රමවත්ව, මුල මැද අග යහපත් ලෙස ගලපා, කාටත් අවබෝධ කරගත හැකි සරල ධර්ම පර්යායන්ගෙන් අරඹා, අවබෝධයත් සමග ගැඹුරටම ගමන් කළ හැකි සුවිශේෂි යාන්ත්‍රණයකින් ජීවය ලබා ඇත. මෙම ශ්‍රී සද්ධර්මය අතීත, වර්තමාන, අනාගතය යන කාලත්‍රය තුළ සංශෝධන වලින්

තොරව එක ලෙස බලපවත්වයි. තම තමාගේ ප්‍රඥාවට සාපේක්ෂව විනිවිද දැකිය හැකිය. එබැවින් ඒ සඳහා ධර්මය තුළම සැමදෙනාටම පොදුවේ කෙරෙන කාරුණික ආරාධනයකි. **ඒහි පස්සිකෝ.**

මෙවන් වූ ශ්‍රේෂ්ඨ ධර්මයක්, ඥාන සාගරයක් අවබෝධ කරගත් ගෞතම බුදු පියාණන් වහන්සේ, එහි උපරිම ඵල නෙළා ගැනීමට ඔබ අප කාටත් මඟ හසර පාදා, එය අවිච්ජින්නව වසර පනස් දහසක් ඉදිරියට පවතින පරිදි ස්ථාපිත කර තුන් ලොවෙහිම ශ්‍රේෂ්ඨත්වයට සහ ගෞරවාභිමානයට පත්ව ඇත්තාහ. බුද්ධ රාජ්‍යයේ කිරුළ දරූ මෙවන් අසහාය ජන නායකයන්, අතිකුත් විවිධ සොයා ගැනීම් හමුවේ ලොව මවිත කළා යැයි කියන ජන නායකයින්, දාර්ශනිකයන් සහ විද්‍යාඥයින් අතරේ තරු කැල අතර බැබලෙන පූර්ණ චන්ද්‍රයා මෙනි. කලික් කලට විද්‍යාඥයින්, දාර්ශනිකයින් විසින් පර්යේෂණ ඔස්සේ සොයාගනු ලබන කරුණු මත ගොඩනගන විවිධ කල්පිතයන් බොහෝ විට පසුකාලීන සොයාගැනීම් හමුවේ අභියෝගයට ලක්වී සාවද්‍ය බවට පත්වන අවස්ථා ඇත.

බුදු පියාණනන් වහන්සේ විසින් පර්යේෂණ, ගවේෂණ, විශ්ලේෂණ සියල්ල තත්ත්වාකාරයෙන් අවබෝධ කොට විශ්වයට මුදාහළ මේ ශ්‍රී සද්ධර්මය වසර 2660 පුරා ඵල දරමින් ඵල ලබමින්, නැවුම් ගුණ සුවඳ දස අතර විහිදවමින් මේ දක්වා සුන්දරව ගලා බසින අයුරු කෙතරම් ආශ්චර්යමත් ද? සවනට අමා බිඳු වැනි වූ, දේශනා කෞශල්‍යයේ මිහිර සවන් පිනවමින් හදවත් පුබුදුවාලයි. මෙවන් ශ්‍රේෂ්ඨ ජන නායකයෙක්, දාර්ශනිකයෙක්, ගවේෂකයෙක්, ගාන්ධර්වයෙක්, මාර්ගෝපදේශකයෙක් පමණක් නොව සකල රෝගාබාධයන් සඳහා ප්‍රතිකාර සොයාගත් ආශ්චර්යමත් වෙද ඇදුරෙක් එසේත් නැත්නම් දෙවියෙක් බ්‍රහ්මයෙක් මෙලොව පහළ වී නැත.

බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය, ගුණස්කන්ධය ලේඛකයෙකුට ලියා අවසන් කළ හැක්කක් නොවේ. දේශකයෙකුට දෙසා අවසන් කළ හැක්කක් නොවේ. ගායකයෙකුට ගයා අවසන් කළ හැක්කක් නොවේ. එම ශ්‍රේෂ්ඨත්වය කිසිවෙකුට කිසි කලෙක සමකළ හැක්කක්ද නොවේ. ධර්මයේ සඳහන් පරිදි මෙම ගුණ වරුණ සඳහා තවත් බුදු කෙනෙකු කල්ප ගණනක් වෙර දැරුවේ වුවද, කල්ප ගණන අවසන් වනු විනා බුදු

ගුණ කඳ, දම් ගුණ කඳ, අවසන් නොවනු ඇත. මෙවන් යථාර්තයක් හමුවේ බුදු පියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය උත්තරීතර නොවන්නේ ද? **ශ්‍රේෂ්ඨතම නායකත්වය එයයි.** සමකළ හැක්කක් හෝ සකකළ හැක්කෙක් නැත. සම කිරීමට තබා, එම ගුණ කඳ ලඝු කිරීමට කවරෙකු හෝ වෙර දරන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක් ද? **අන්ධබාලයින් මෙන්ම මන්දබුද්ධිකයින් ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ විකෘති මෙන්ම පටු දෘෂ්ඨි කෝණ ඔස්සේ කලින් කලට බුදු පියාණන් වහන්සේගේ උත්තරීත්වය අවතක්සේරු කිරීමට අසාර්ථක උත්සාහයන්හි යෙදෙයි. එහෙත් එය පිපාසය සංසිඳුවා ගැනීමට මිරිඟුව පසු පස හඹායාමක් පමණි.**

පරතෙරක් නොපෙනෙන සංසාර ගමනේ විවිධ භවයන්හි ඉපදෙමින් මැරෙමින් දුක් විඳිමින් යන මේ ගමන් මඟෙහි මාර්ග බාධකයක්වත් ඔවුන්ට නොපෙනෙයි. ගමනාන්තයක්ද නැත. ඉරණම කුමක්වේද? ඔවුන් කෙලෙසින් කෙදිනක ධර්මය දකින්නද? මිනිස් භවයක් ලැබුවේ වුවද එයින් ඵල ලැබීමට ධර්මය නොදකින හැටි.....?

"පඤ්ඤාවන්තස්සායං ධම්මො නාය ධම්මො දුප්පඤ්ඤස්ස"

මෙම උතුම් දහම නුවණ ඇත්තන්ට ය. නුවණ නැත්තන්ට නොවේ. ඒ බුද්ධ වචනයයි.

ජීවමානය දැකිය හැකි උතුම් ධර්ම ලාභය ලද මෙවන් මොහොතක, එය අපට දායාද කරදුන් විශ්වීය අනුපමේය නායකත්වය අප දෙනෙත් අබියස තවමත් දිදුලන මෙවන් යුගයක, අප විසින් කළ යුත්තේ අප්‍රමාදීව **ධර්මය දැකීම පිණිස ප්‍රඥාව අවදි කර ගැනීමයි.** එහෙත් මෝහයෙන් හිස උදුමවාගත් ඇතැම් අන්ධබාල පිරිස් **කළයුත්ත පසෙකළා,** එම ශ්‍රේෂ්ඨ නායකයාණන් වහන්සේගේ නිජ බිම සොයන්නට වෙහෙසෙති. ඇතැම් දුෂ්ප්‍රාඥයෝ තර්ක විතර්ක හමුවේ වාද විවාද කරමින්, **එවකට මහාමායා දේවිය ශ්‍රී ලංකාවේ සිටි බවට මවා පාමින් හර ශූන්‍ය තර්ක ඉදිරිපත් කරති.**

සියලුම බුදුවරුන්ගේ උපත සිදුවන්නේ දඹදිව් තලයේ බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි. ඇතැම් පිරිස් එම ඓතිහාසික තොරතුරු පවා විවේචනය කරමින්, කළ යුත්ත පසෙකළා **අන්ධ දාර්ශනිකයින් ඇතා පරීක්ෂා කළ අයුරින්** තම තමාගේ පටු දෘෂ්ඨි කෝණයන්ට අනුව

මත වාද ඉදිරිපත් කරති. එය ඔවුන්ගේ පටු දැනුම් පුඤ්ජයට සාපේක්ෂව කෙරෙන දොඩමළු වීමක් විනා හරවත් තර්ක විතර්ක නොවන බව බුද්ධිමතුන්ගේ ප්‍රඥාවට සාපේක්ෂව පැහැදිලිය.

ඇතැම් දුෂ්ප්‍රාඥයින් තම වාග්චාතුර්ය එළි දැක්වීමට හොඳම මාධ්‍ය ලෙස ධර්මය අල්ලා ගනී. **එය සර්පයා වලිගයෙන් අල්ලාගත්තා සේය.** එයින්ම තමාගේ විනාශය සිදුවන බව දුෂ්ප්‍රඥයා නොදනී. සෙවිය යුත්තේ තමා පිළිබඳව විනා අන් අය පිළිබඳව නොවන බව බුදු පියාණන් වහන්සේ සර්වඥතා ඥානයෙන් මීට වසර 2606 ට පෙර ලොවට හෙළි කර වදාළහ. එබැවින් අන්ධබාලයින්ගේ දුෂ්ප්‍රාඥ මත ඉවත ලා බුද්ධිමත් ශ්‍රාවකයින් ධර්මය දැකීමට ප්‍රඥාව අවදි කරගත යුතුය. ඒ සඳහා අප්‍රමාදී වීම අත්‍යවශ්‍යමය. ඇතැම්හු බුදු පියාණන් වහන්සේගේ නිජ බිම ශ්‍රී ලංකාව යැයි කියමින්, අන්ධ භක්තියෙන් යුතුව විවිධ මත පලකරමින්, සමාජය ද නොමඟ යවමින් අඳුරෙන් අඳුරටම යති. මෙය ධර්මය දැකීමට සහ ප්‍රඥාව අවදි කර ගැනීමට කිසි සේත් ඉවහල් නොවනු ඇත.

සංසාරික වශයෙන් අප්‍රමාදීව ලද හැකි අමිල දායාදය, ධර්ම ලාභය, ඔබ අප සැමගේ දෙනෙත් අබියස ජීවමානව දිදුලද්දී, එය නොලබා අවසනාවන්ත ලෙස මිරිඟුව පසුපස දිවයන මුව රැළක් සේ දුවමින් සංසාර සාගරයේ අතරමං වන්නන්ට කාගේ නම් හව් හරණක්ද?

***

10

බුදුපියාණන් වහන්සේගේ දැක්ම සහ අවබෝධය
THE VISION AND PERCEPTIVES OF BUDDHA

In His first sermon **(Dhamma cakka Pavatvana Sutta)** the Buddha referred to the opening up of the eye of insight **(Cakkhuṁ Udapadi)** at His enlightment. When this eye of insight got open up in the ascetic Kondañña after listening to the **(Dhamma cakka Pavatvana Sutta)** the Bddha uttered that the **"eye of Dhamma"** got open up (Dhamma Cakkhum Udapadi) enabling him to realize the Buddha's teaching.

The eye of Dhamma that got opened up in Kondañña was defined by the Buddha himself as the realization of the universal truth that everything which arises is destined to pass away **(yam kińci samudaya dhamma sabba tam nirodha dhammanti)**. This is the basic truth of the triple nature **(tilakkana)** of the universe upon which the **Buddha vision** is based. Anyone who realizes completely this fundamental triple- truth of the nature loses all attachments to the body and mind called oneself and also no other things that have no permanent entry **(anitta)** thereby getting enlightened as said in the **"Tatiya Hetu sutta"** Thus the realization of soullessness or selflessness (anattata) is the fundamental basis of enlightenment that awakens the Buddha vision.

In the '**Yadanicca Sutta",** the Buddha said that whatever that is dynamic in constant transformation making it impossible to retain an external or permanent identity of a soul or self **(yadaniccam tam dukkham. Yam dadukkham tadanattaá.** Thus the absence of an eternally retainable permanent identity **(anatta)** in everything or any beings the outcome of the dynamism **(aniccata)** of the universal energy, that leads to constant transformation **(dukkata)** of that energy **(thitassa aññatattā bhavissati).**

This transformation is identified by the Buddha as suffering (Dukkha) in birth decay, sickness, death, sorrow, lamenting etc given as examples to illustrate the first of the 4 Noble Truth **(Dukka, samudaya.Nirodha, Magga)** realized by enlightenment.

The supreme wisdom endowed with several facts or features inclusive of insight (cakkhuṁ), cognition (ñānm), wisdom **(paññā)**, realizing the truth **(vijja)**, and boundless self illumination or enlightenment (aloko). All of which got awakened at one and the same time in the Buddha as a timeless process of enlightenment, where cakkhum' and 'ñānm' literally preceded 'paññā' followed by **'vijja'** and **'Aloko'** as recorded in the **Dhamma cakka Pavatvana Sutta.** This wisdom itself is insight while insight itself is wisdom, because there cannot be one without the other

In this Sutta **Dhamma cakka Pavatvana Sutta:** the first sermon, the Buddha pointed out in short that all the mental suffering we experience in our life is nothing but thinking (**sańkhiccena pańcaupadanakkhandā dukkhā**), because we cannot suffer mentally without thinking of pains and pleasure.

Though the enlightened are aware of bodily pain, they do not suffer mentally by such pains because they do not identify with the body thinking that it is **"mine and I myself"** (**netaā mama nesohamasmi - Yadanicca Sutta).**

The unenlightened suffer mentally by bodily pain because they think that **"I am the body..and it is mine"**due to the wrong view of oneself called **'sakkayaditthi' that gets eradicated at the very 1st stage of enlightenment (sotāpatti phala)**

This wrong view is eradicated not by thinking based on knowledge but by the insight of wisdom inherent in us.. and covered up by the prejudices conclusions or opinions called the knowledge acquired in the past by the experience of our sense organs with limited capacities making us unable to experience things as they really are.

Wisdom is the inherent ability of all beings to be blissful by avoiding pains of mind. The word Buddha means an embodiment of wisdom, a wise One, or an awakened one, whose supra mundane

wisdom is fully awakened. This perfect awakening is capable of seeing things as they really are **(yathabhutha ñañadassana)** to be blissful with anything whatsoever , and taking things as they really are **(yatalabha santhutti)**

With the perfect illumination of wisdom at the enlightment the Buddha could experience a phenomenon He had never heard of before (**pubbesu ananussetusu dhammesu aloko Udapadi).** It is the perfect bliss beyond all mundane and transitory delight. What a **magnificent sight ?**

Accoding to Buddha, our thinking of someone or some thing is based on our likes **(bhava tanha)** leading to craving **(lobha)**, dislike **(vibhava Tanha)** leading to hatred **(dosa)**, and ignoramce **(moha)** leading to confusion of mind.

Based on this truth, it is clear we are the creators of our happiness or grief by means of our thinking. Whenever we are greedy, angry or cruel we are unhappy, While we can be happy when we are compassionate loving or kind. Our own selfishness makes us unhappy without being able to fulfill all our requirements while self-sacrifice bring peace of mind.

If we look at a situation kindly and lovingly we do not see the faults or shortcomings thickly. This is a common fact that anyone can experience in everyday life by giving a reality to the proverb " Faults are thick where love is thin)

"THE VISION AND CONCEPTION OF BUDDHA CANNOT BE SUMMED UP INTO A SMALL BOOKLET LIKE THIS,

*

බුදු පියාණන් වහන්සේගේ අවබෝධය
The Wisdom of the Buddha

ගැඹුරු අර්ථ විග්‍රහ කොතෙක් තිබුණ ද, බුද්ධ යන වචනයේ සරල පැහැදිලිවම අදහස ලෙස ගැනෙනුයේ **"අවබෝධයයි"** මෙම අවබෝධය වූ කලී **චතුරාර්ය සත්‍යය පිළිබඳව වන පරිපූර්ණ අවබෝධයයි.** ජීවිතය හා ලෝකය පිළිබඳව සැබෑ ස්වභාවය, එය හටගන්නා ආකාරය සහ පැවතී නැතිව යන ආකාරය පරිපූර්ණ වශනේම **නුවණින් දැකීම අවබෝධ කර ගැනීම බුද්ධත්වයයි.** මෙය සුළු පටු වෑයමක ප්‍රතිඵලයක් නොවේ.

සිදුහත් කුමරු උපන් ක්‍රි. පු හයවන සිය වසේදී ද භාරතයේ බොහෝ දාර්ශනිකයින් චින්තකයින් හා අධ්‍යාත්මගවේෂීන් ජීවිතය හා ලෝකය පිළිබඳව සැබෑ තතු සෙවීමට වෙහෙස වී ඇත. පවත්නා විෂම සමාජය තුළින් අත්දුටු **ජරා, ව්‍යාධි, මරණ** මෙන්ම දෛනික ජීවිතයට බලපාන කුසගින්න, බලවතුන්ට ඇති බිය, පීඩා නිසා ජීවිත පැවැත්ම සෝ සුසුම් මැද දුක් දොම්නස් වලින් පිරී පැවතිණි. මේවාට විසඳුම් සෙවීමේ අරමුණෙන් ඇතැම් දිරිමතුන්ගේ කැප වීමෙන් සමාජය පුරා විවිධ ආගමික නායකයින් සාන්තුවරුන් බිහිව තිබුණි. ඔවුන් **තාපස, ජටිල, ශ්‍රමණ, ආජීවක සහ පරිබ්‍රාජක** ආදී නම් වලින් හැඳින්විණි.

සුද්ධෝදන රජතුමා එවකට පැවති පීඩිත සමාජ දර්ශන සිදුහත් කුමරාට දෘෂ්‍යමාන නොවන ලෙසට කොතෙක් වාරණ පනවා තිබුණණේ වුවද, **ලෙඩෙක්, මහල්ලෙක්, මළ කඳක් සහ ශ්‍රමණ රුවක්** නෙත ගැටුණ මොහොතේ සිටම, භාග්‍යවන්ත දිරිමත් සිදුහත් කුමරාට ජීවිතය හා ලෝකය පිළිබඳව යථා තතු අවබෝධ විණි. මෙයට සත්‍ය හේතුව සෙවීමේ අරමුණෙන් ඔහුගේ තියුණු සංවේදී සිත අභිනිෂ්ක්‍රමණයට පෙළඹිණි.

වසර හයක අඛණ්ඩ ආර්ය පර්යේෂණයක යෙදෙමින් සත්‍යය ගවේෂණය කරමින් අවසානයේදී ලබාගත් අවබෝධඥානය තුළින් දුකට හේතුවන සත්‍ය පසුබිම පිරිසිදුව දකින්නට වූයේ, **ස්ථිර විමුක්තියත්, එය සාක්ෂාත් කරගැනීමේ නොවරදින එකම මාර්ගයත් අවබෝධ කර ගනිමිනි. එවන් අවබෝධයක් ලැබීමට බුදු පියාණන් අවබෝධ කරගත් ඥාන සම්භාරය තුන් ලොවම මවිත කරනවන සුළුය. විශ්මිතය.**

නිර්වාණ මාර්ගය පරිපූර්ණයෙන් වඩන්නෙකු තුළ පහළ වන, පහළ කරගත යුතු අවබෝධඥාණයේ විවිධ අදියරයන් **සත්තිස් බෝධිපාක්ෂික ධර්ම** ලෙසින් දැක්වෙන නමුත් ඒ සියල්ල අවබෝධ කරගැනීමට **ඉවහල්වන පාදක වූ ඥාන 73 කි.** මෙම තෙසැත්තෑ ඥාන (73) අතරෙන් අවසාන ඥාන හය බුදුවරුන් තුළ පමණක් පහළ වන ඥානයන් බවට ධර්මයේ සඳහන්ය. ඒවා **ෂඩ් අසාධාරණ** ඥාන ලෙස සැලකේ. අනිකුත් ඥාන 67 **ශ්‍රාවක සාධාරණ ඥාන** ලෙස සැලකේ. මෙම ඥාන බල හැකි පමණින් ස්ව සන්තානයෙහි උපදවා ගැනීම මාර්ග ඵල සාක්ෂාත් කර ගැනීමට මහත් සේ බලපායි.

තෙසැත්තෑ ඥාන විවරණයක් මෙවැනි ග්‍රන්ථයකින් පැහැදිලි කිරීම ඉතා අසීරුය. මෙහි ශ්‍රාවක සාධාරණ ඥාන 67 ලුහුඬින් සඳහන් වන අතර අවසාන ෂඩ් අසාධාරණ ඥාන 6 පිළිබඳව යම් පමණක් පැහැදිලි කිරීමක් ද වෙයි. නිවැරදි උච්ඡාරණයට සහ අවබෝධයට පහසු වන සේ, එක් එක් ඥානය පිළිබඳව දී ඇති කෙටි විස්තරයද, පාඨක භවතුන්ගේ පහසුව පිණිස සිංහල ඉංග්‍රිසි භාෂා ද්විත්වයෙන්ම පැහැදිලි කෙරෙයි.

1. සුතමය ඥාණය

සවන් දීමෙන් ලබාගන්නා ප්‍රඥාව සුතමය ඥානය යි.

(සෝතා වදානේ පඤ්ඤා සුතමයේ ඤාණං
Sotāvadhāne paññā, sutamaye ñānaṁ)

The wisdom, gain through listening being attentive is **the knowledge of listening**

2. සීලමය ඥාණය

ධර්මය අසා සංවරවීම පිළිබඳ ඥානය සීලමය ඥානය යි.

(සුත්වාන සංවරේ පඤ්ඤා සීලමයේ ඤාණං
sutvāna sanvare paññā, sīlamaye ñānaṁ)
The wisdom, gain through restraint after listening to Dhamma , is **the knowledge from virtue**

3. සමාධිභාවනාමය ඤාණය

සංවරයේ පිහිටා සිත එක් තැන් කරන ඥානයයි.

සංවරිත්වා සමාදහනේ පඤ්ඤා සමාධි භාවනාමයේඤාණං
samvaritvā samādahane paññā, samādhibhāvanāmaye ñānaṁ}
The wisdom arises by concentrating after restraint, **knowledge of cultivating meditation**,

4. ධම්මට්ඨිති ඤාණය

එකිනෙකට හේතු ප්‍රත්‍ය වී ඇති ආකාරය පිරිසිඳ දැකීමේ ඥාණයයි.

පච්චය පරිග්ගහේ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං
paccayapariggahe paññā, dhammaṭṭhitiñānaṁ}.

The wisdom arises by acquiring (the right) conditions, is **knowledge of understanding the relationship of things,**

5. සම්මස්සන ඤාණය

කාලත්‍රයට අයිති ධර්මයන් නුවණින් මෙනෙහි කර නිශ්චය කිරීමේ ඥාණයයි.

අතීතානුගත පච්චුපානානං ධම්මානං සඞ්ඛිපිත්‍වා වවත්‍ථානේ පඤ්ඤාසම්මසනේ ඤාණං

(atītānāgatapaccuppannānaṁ dhammānaṁ sankhipitvā vavatthāne paññā-, sammasaneñānaṁ,)

The wisdom arises by defining after abbreviating things in the past, future and present is **knowledge of comprehension.**

6. උදයබ්බය ඤාණය

හටගැනීම සහ නැතිවීම දන්නා, දක්නා ඤාණයයි.

පච්චුප්පනං ධම්මානං විපරිමානානුපස්සනේ පඤ්ඤා උදයබ්බයානුපස්සනේ ඤාණං

paccuppannānam dhammānaṁ viparim āmānupassane paññā, udayabbayānupassane ñānaṁ)

The wisdom arises by contemplating the changes of existing things is **the knowledge of contemplation of their rise and fall**

7. භඞ්ගානුපස්සනා ඤාණය

ගතවන මොහොතක් පාසා අරමුණුවල බිඳීයන ස්වභාවය නුවණින් දැකීමේ ඥාණයයි.

ආරම්මනං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනේ පඤ්ඤා විපස්සනේ ඤාණං

ārammanaṁ paṭisaṅkhā bhaṅgānupassane paññā, vipassane ñāṇaṁ, bhaṅgānupassane paññā,)

The wisdom arises by contemplating dissolution from reflecting on an object is **knowledge of insight,**

8. ආදීනව ඤාණය

යමක නරක විපාක දැක ඒ කෙරෙහි බියක් ඇති කරනව අවබෝධ ඥානය යි. මෙය භයතුපට්ඨාන ඤානය ලෙසද හැඳින්වේ.

භයතුපට්ඨානයේ පඤ්ඤා ආදීනවේ ඤාණං bhayatupaṭṭhāne paññā, ādīnave ñāṇaṁ).

The wisdom arises by fear after seeing the evil result of actions is **knowledge of danger.**

9. මුඤ්චිතුකම්‍යතා ඤාණය

නිදහස්වීමේ මිදීමේ අවශ්‍යතාවය දකීමේ ඤාණයයි.

මුඤ්චිතුකම්‍යතොපටිසඞ්ඛාසන්තිට්ඨනාපඤ්ඤා
muñcitukamyatā paṭisaṅkhā santiṭṭhanā paññā, saṅkhārupekkhāsu ñāṇaṁ,)

The wisdom arises being steady in reflection and desiring freedom is **knowledge of equanimity of conditions,**

10. ගෝත්‍රභූ ඤාණය

පෘතග්ජන භාවය ඉක්මවා යෑම හෙවත් භව චක්‍රය පෙරළා දැමීම සිදුකරන ඥාණයයි.

බහිද්ධා වුට්ඨාන විවට්ටනේ පඤ්ඤා ගෝත්‍රභූ ඤාණං
bahiddhā vuṭṭhāna vivaṭṭane paññā, gotrabhuñāṇaṁ}

The wisdom arises by emerging and turning away from the external, is **knowledge of the change of lineage.**

11. මග්ග ඤාණය

ෂංස්කාර නිමිති වලින් සහ සියලු කෙලෙස්වලින් මිදී සිත හදවත දෙසටම පෙරළා තබන යොමුකරවන ප්‍රඥාව මග්ග ඥානයයි.

දූභතෝ වුට්ඨාන විවට්ටනේ පඤ්ඤා මග්ගේ ඤාණං
dubhato vuṭṭhāna vivaṭṭane paññā, magge ñāṇaṁ}

The wisdom arises by emerging and turning away from both: the internal and the external, is **knowledge of the path,**

12. ඵල ඤාණය

ආර්ය ප්‍රතිපදාවේ යෙදී එහි ප්‍රතිඵලයක් ලෙස හටගන්නා සන්සිඳීම සමඟ හටගන්නා වූ ප්‍රඥාව ඵල ඤාණයයි.

පයෝගපටිප්පස්සද්ධි පඤ්ඤා ඵලේ ඤාණං
payogappaṭippassaddhi paññā}
payogappaṭippassaddhi paññā, phale ñāṇaṁ, }

The wisdom arises by the calming of undertakings, is **knowledge of fruition,**

13. විමුක්ති ඤාණය

ඵල ඤාණයෙන් කෙලෙස් ප්‍රහාණය වීමෙන් පසු, නිකෙලෙස් බව දක්නා, දන්නා නුවණ විමුක්ති ඥානයයි.

ඡින්නවට්ටමනුපස්සනේපඤ්ඤා විමුක්ති ඤාණං
hinnavaṭumānupassane paññā, vimuttiñāṇaṁ,

The wisdom arises by contemplating the road cutting off defilements, is **the knowledge of freedom,**

14. පච්චවෙක්ඛන ඤාණය

තමන් මාර්ග ඵලයකට පත්වූ බව පසක් කොට දැකිය හැක්කේ මේ ඥානය පහළ වීමෙනි.

තදා සමුදාගතේ ධම්මේ පස්සනේ පඤ්ඤා
පච්චවෙක්ඛනේ ඤාණං

tadā samudāgate dhamme passane paññā,
paccavekkhaṇe ñāṇaṁ,}

The wisdom arises by seeing things that arose at that (time), is **the knowledge of reflection,**

15. වත්ථු නානත්ථ ඤාණය

ඇස, කන, නායස, දිව, කය සහ මනස යන අභ්‍යන්තරික වස්තූන් නොයෙක් ආකාරයෙන් විභාග කොට, විනිශ්චය කිරීමේ (ව්‍යවත්ථාන) නුවණ වත්ථු නානත්ථ ඥානයයි.

අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථු නානත්තෙ ඤාණං
ajjhattavavatthāne paññā, vatthunānatte ñāṇaṁ,)

The wisdom arises by defining the internal (sense-spheres), is **the knowledge of various internal (sense-spheres)**

16. ගෝචරනානත්ත ඤාණය

පස් ඉඳුරන්ට යොමුවන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශය සහ ධර්ම යන බාහිර වස්තු නොයෙක් ආකාරයෙන් විභාග කොට, විනිශ්චය කොට, විනිශ්චය කිරීමේ නුවණ ගෝචරනානත්ත ඥානයයි.

බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගෝචර නානත්තෙ ඤාණං
bahiddhāvavatthāne paññā, gocaranānatte ñāṇaṁ,}

The wisdom arises by defining the external (sense-spheres), is **the knowledge of various external (sense-spheres),**

17. චරියානානත්ත ඤාණය

හිත අරමුණයෙහි හැසිරෙන ආකාරය විඤ්ඤාණචරියා, අඤ්ඤාණ චරියා, ඤාණ චරියා ආදී වශයෙන් බෙදා නුවණින් විමසා නිශ්චය කිරීමේ ඥානයයි.

චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං
cariyāvavatthāne paññā, cariyānānatte ñāṇaṁ,.

The wisdom arises by defining conduct, is t**he knowledge of various conduct,**

18. භූමිනානත්ත ඤාණය

කුසලාකුසල කර්මයන් අනුව සත්ත්වයාගේ මානසික සිව්වැදෑරුම් භූමි ලෙස සැලකෙන කාම භූමි, රූප භූමි, අරූපී භූමි, ආර්ය භූමි නම් වූ සිව් වැදෑරුම් භූමින්ගෙන් නානත්වය බෙදා නුවණින් විමසා නිශ්චය කිරීමේ ප්‍රඥාව භූමිනානත්ත ඤාණයයි.

චතුධම්මවවත්‍ථානේ පඤ්ඤො භූමිනානත්තෙ ඤාණං
catudhammavavatthāne paññā, bhūminānatte ñāṇaṁ,

The wisdom arises by defining the four states (of existence), is the knowledge of various surfaces (of existence),

19. ධම්මනානත්ත ඤාණය

පටිසම්භිදා දේශනාවෙහි අදියර තුනකින් විග්‍රහ කොට ඇති නව වැදෑරුම් ධර්මයන් පිළිබඳව නුවණින් බෙදා විනිශ්චය කිරීමේ ප්‍රඥාව ධම්මනානත්ත ඤාණයයි.

නවධම්ම වවත්‍ථානේ පඤ්ඤා ධනම්ම නානත්තෙ ඤාණං
navadhammavavatthāne paññā, dhammanānatte ñāṇaṁ}

The wisdom arises by defining the nine states, is **the knowledge of various states,**

20-24 ඤාණ පඤ්ඤකය

සුතමය ඤාණය තව දුරටත් විග්‍රහ කොට බෙදා දක්වෙන ඤාණයන් 5 කි. 1. ඤාතට්ඨේ ඤාණං 2. තීරණට්ඨේ ඤාණං 3. පරිච්චාගට්ඨේ ඤාණං 4. ඒක රසට්ටියේ ඤාණං 5. ඵසනට්ඨේ ඤාණං

1. abhiññāpaññā, ñātaṭṭhe ñāṇaṁ,. the wisdom arises through deep knowledge, is **the knowledge of the state of being known.**

2. pariññāpaññā, tīraahe ñāa,. the wisdom arises through full knowledge, is **the knowledge of the state of being decided.**
3. pahāne paññā, pariccāgaṭṭhe ñāṇaṁ, the wisdom arises by giving up, is **the knowledge of the state of being abandoned.**
4. bhāvanāpaññā, ekarasaṭṭhe ñāṇaṁ, the wisdom arises through cultivation, is t**he knowledge of the state of having one taste.**
5. sacchikiriyāpaññā, phassanaṭṭhe ñāṇaṁ,. the wisdom arises through realisation, is **the knowledge of the state of having contact.**

25-28 පටිසම්භිදා ඤාණ

හතර සිව්පිළිසිඹියාපත් යන අදහස මෙහි අන්තර්ගතය. අධිගම ලාභයට හෙවත් මගඵල ලාභයට, නවලෝකෝත්තර ධර්මයට, ආර්ය සත්‍යාවබෝධයට පවත්නා මාර්ගය යන අදහසින් මෙම සිව් වැදෑරුම් ඤාණයන් පටිසම්භිදා ඤාණ ලෙස හැඳින්වෙයි. පටිසම්භිදා යනු වෙන් කිරීම, ප්‍රභේදකරණය හෙවත් විශ්ලේෂණයයි.

අත්ථ නානත්තේ පඤ්ඤා අත්ථ පටිසම්භිදේ ඤාණං
ධම්ම නානත්තේ පඤ්ඤා ධම්ම පටිසම්භිදේ ඤාණං
නිරුත්ති නානත්තේ පඤ්ඤා නිරුත්ති පටිසම්භිදේ ඤාණං
පටිභාන නානත්තේ පඤ්ඤා පටිභාන පටිසම්භිදේ ඤාණං

1 Atthanānatte paññā, atthapaṭisambhide ñāṇaṁ,. the wisdom arises through various meanings, is the knowledge of **the analytic knowledge of meaning,**

2. Dhammanānatte paññā, dhammapaṭisambhide ñāṇaṁ, the wisdom there is from various truths, is the knowledge of **the analytical knowledge of truth,**

3. Niruttinānattepaññā, niruttipaṭisambhide ñāṇaṁ, the wisdom arises through various language usages, is **the knowledge of the analytical knowledge of language,**

4. paṭibhānanānatte paññā, paṭibhānapaṭisambhide ñāṇaṁ,. the wisdom there is from various inspired speeches, is **the knowledge of the analytical knowledge of inspired speech.**

29-31 ඤාණත්‍රය (ඤාණ තුන)

විහාර නානත්තේ පඤ්ඤා විහාරට්ඨේ ඤාණං
(විහාරට්ඨ ඤාණං)
සමාපත්ති නානත්තේ පඤ්ඤා සමාපත්ට්ඨේ ඤාණං
(සමාපත්තට්ඨ ඤාණං)
විහාර සමාපත්ති නානත්තේ පඤ්ඤා විහාර සමාපත්තට්ඨේ ඤාණං
(විහාර සමාපත්තට්ඨ ඤාණං)
මෙම ඤාණ තුන නිවන සඳහාම වන බැවිනි අනිමිත්ත (අනිත්‍යතා ඤාණදර්ශනය ලෙසද) අප්පණිහිත (දුක්ඛතා ඤාණදර්ශනය) ලෙස ද සුඤ්ඤත අනාත්ම දර්ශනය වශයෙන් හැඳින්වේ.

1 Vihāranānatte paññā, vihāraṭṭhe ñāṇaṁ,

the wisdom arises through various dwellings, is **the knowledge of the state of having dwellings,**

2 . Samāpattinānatte paññā, samāpattaṭṭhe ñāṇaṁ

the wisdom arises through various attainments, is **the knowledge of the state of attainment,**

3. vihārasamāpattinānatte paññā, vihārasamāpattaṭṭhe ñāṇaṁ,

   the wisdom there is from various dwellings in attainments, is **the knowledge of the state of dwelling in attainment.**

32. ආනන්තරික සමාධි ඥාණය

අවික්ඛේපපරික සුද්ධත්තා ආසව සමුච්ඡෙදේ පඤ්ඤා ආනත්තරික සමාධිස්මිං ඤාණං

අතරමැද බිඳී නොයන, ආපස්සට නොඑන ස්ථාවර වූ සමාධිය ආනන්තරික සමාධියයි. විවිධ අරමුණුවල නොවිසිරෙන, සුපිරිසිදු වූ සියලු ආශ්‍රවයන් මුළුමනින්ම සිඳලනු ලබන මෙම ප්‍රඥාව ආනන්තරික සමාධි ඥාණයයි. මෙය ජීවිතය හා ලෝකය පිළිබඳ විදසුන් වැඩීමෙන් පහළවන්නකි. දම්සක් පැවතුම් සූත්‍රයේදී බුදු පියාණන් වහන්සේ "අකුප්පා මේ චේතෝවිමුක්ති" මාගේ චිත්ත සමධිය කිසිවිටකත් වෙනස් නොවන්නේ යැයි වදාළේ මෙම ආනන්තරික සමාධියයි.

Avikkhepaparisuddhattā āsavasamucchede paññā, ānantarikasamādhimhi,ñāṇaṁ,

the wisdom arises by cutting off the pollutants with balance and purity, **is the knowledge of the meditation having immediate result,**

33. අරණ විහාර ඥාණය

දස්සනාධි පතෙය්‍යං සන්තෝච විහාරාධිගමෝ පණීතාදිමුත්තතා පඤ්ඤා අරණ විහාර ඥාණය, මෙසේ විදර්ශනාත්මක දකීමෙන් උපදනා බලයෙන් යුතු (දස්සනාධිපතෙය්‍ය) ශාන්ත විහරණයෙන් යුතුව, උතුම් නිෂ්ඨාවන්ගෙන් යුතුව නිකෙලෙස් සිතින් වාසය කිරීමේ ප්‍රඥාව අරණ විහාර ඥාණය යි.

Dassanādhipateyyaṁ santo ca vihārādhigamo paṇītādhimuttatā paññā, araṇavihāre ñāṇaṁ,

the wisdom. Arises through a predominance of insight, the achievement of dwelling in peace, and excellent intent is **the knowledge of dwelling in peacefulness,**

34. නිරෝධ සමාපත්ති ඤාණය

ද්විහි බලේහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සෝළසහි ඤාණ චරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා පඤ්ඤා නිරෝධ සමාපත්තිය ඤාණං බල දෙකකින් සමන්විතව තුන් වැදෑරුම් සංස්කාරයන්ගේ සංසිඳීයෑම සමගින් දහ සය වැදෑරුම් ඤාන චර්යාවන්හි සහ නව වැදෑරුම් සමාධි චර්යාවන්හි වසීකෘත භාවය යන කරුණුවලින් සමන්විත ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණයයි.

(මෙහි වසීකෘත භාවය යනු අභිමතය පරිදි කැමති කාලයක්, කැමති සමාධියකට සමවැදී කැමති විටක එයින් නැගී සිටීමේ හැකියාවයි.)

Dvīhi balehi samannāgatattā tayo ca saṅkhārānaṁ paṭippassaddhiyā, vasibhāvatā paññā,

The wisdom arises through wielding control by possessing two strengths, three allayments of conditions,soḷasahi ñāṇacariyāhi, navahi samādhicariyāhi, sixteen types of conduct and nine types of one centration nirodhasamāpattiyā

35. පරිනිබ්බාන ඤාණය

ධම්මජානස්ස පවත්තපරියාදානේ පඤ්ඤා පරිනිබ්බානේ ඤාණං

සම්මා සම්බුද්ධත්වය සඳහා වූ ක්ලේෂ ස්කන්ධ පරිනිර්වාණයත් (ජය ශ්‍රී මහා බෝ මුලදී) පඤ්චස්කන්ධ පරිනිර්වාණයත් (කුසිනාරාවේදී) සාක්‍ෂාත් කිරීමට උපකාර වූ ඥානය පරිනිබ්බානේ ඤාණයයි.

Sampajānassa pavattapariyādāne paññā, parinibbāne ñāṇaṁ,

the wisdom arises through completing the round for one with full **knowledge, is the knowledge of final emancipation,**

36. සමසීසට්ඨ ඤාණය

සබ්බධම්මානං සම්මා සමුච්ඡේදේ නිරෝධේච
අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨේ ඤාණං

අරහත් ඵල දක්වා ක්‍රමයෙන් සිහි නුවණින් කෙලෙස් ශීර්ෂයන් මඬලමින් සංහිඳවමින් වඩාත් උසස් ස්ථරයකට ඔසවා තැබීමේ ඥාණය **සමසීසට්ඨ ඤාණයයි.** (මෙහි **සීස** යනු **ශීර්ෂ** හෙවත් **මූලික** යන අදහසයි. එය 13 ආකාරයකි.)

1. පලිබෝධ ඇති කරන ශීර්ෂය **තෘෂ්ණාවයි.**
2. සසරට බැඳ දමන ශීර්ෂය **මානයයි.**
3. සසර ස්පර්ශ කරන ශීර්ෂය **දෘෂ්ඨියයි.**
4. නොසන්සුන් කරවන ශීර්ෂය **උද්ධච්චයයි.**
5. කෙලෙස් උපදවන ශීර්ෂය **අවිද්‍යාවයි.**
6. සිත නොසෙල්වන ශීර්ෂය **ශ්‍රද්ධාවයි.**
7. සිත ප්‍රයත්න කරවන ශීර්ෂය **විරියයි.**
8. කුසලය සිහිපත් කරවන ශීර්ෂය **සතියයි.**
9. සිත එක්තැන් කරවන ශීර්ෂය **සමාධියයි.**
10. යථාභූත ඤාණදර්ශනය ඇති කරවන ශිර්ෂය **ප්‍රඥාවයි.**
11. පැවැත්ම සිදුකරන ශීර්ෂය **ජීවිතින්ද්‍රියයි.**
12. අරමුණු කරන ශීර්ෂය **විමෝක්ෂයයි.**
13. සංස්කාර ශීර්ෂය නිරෝධය යි. මෙම කෙලෙස් ශීර්ෂයන් සමනය කරන නුවණ **සමසීසට්ඨ ඤාණය** නම් වේ.

Sabbadhammānaṁ sammā samucchede nirodhe ca anupaṭṭhānatā paññā,samasīsaṭṭheñāṇaṁ,

The wisdom arises through absence, cessation and the right cutting off of all conditions is **the knowledge of the state of being equal-headed,**

37. සල්ලේඛට්ඨ ඤාණය

පුථුනානත්ත තේජ පරියාදානේ පඤ්ඤා සල්ලේඛට්ඨේ ඤාණං

මෙහි "**පුථු**" සහ "**නානත්ත**" වශයෙන් කෙලෙස් පවත්නා ආකාරයත් "**ඒකත්ත**" සහ "**නානත්ත**" වශයෙන් එම කෙලෙසුන් මැඩලන ආකාරයත් දන්නා නුවණ "**සල්ලේඛට්ඨ ඤාණයි.**" මේ අනුව දියුණු තිබුණු කරන ලද "**වරණ තේජසින්**" දුස්සීල බව නසාලයි. දියුණු තියුණු කරන ලද "**ගුණ තේජසින්**" දුරගුණ නසාලයි. දියුණු තියුණු කරන ලද "**ප්‍රඥාතේජසින් දුෂ්ප්‍රාඥාව**" බව නසාලයි. දියුණු තියුණු කරන ලද පුණ්‍ය තේජසින් පාපී බව නසාලයි. දියුණු තියුණු කරන ලද ධර්ම තේජසින් "**අධර්මවාදී බව**" නසාලයි.

මෙසේ නික්ලේෂී බවට බාධක වන පෘථග්ජන අකුසල ධර්මයන් සිහිනුවණින් විමසා බලා, එම කෙලෙසුන් මැඩලන ආකාරයන් දක්නා නුවණ **සල්ලේඛට්ඨ ඤාණය** නම් වේ.

Puthunānattatejapariyādāne paññā, Sallekhaṭṭhe ñāṇaṁ,

the wisdom arises through the finishing of (unwholesome) power, of variety and separation, is **the knowledge of the state of being austere,**

38. විරියාරම්භ ඤාණය

අසල්ලීනත්ත පහීතත්ත පග්ගහට්ඨේ පඤ්ඤා වීරියාරම්භේ ඤාණං

උදාසීනත්වයෙන් තොරව, නිවන පිණිස සිත දැඩි කොට ගැනීමේ ප්‍රඥාව හෙවත් **සතර සම්‍යක්ප්‍රධාන වීර්ය** ඇරඹීම, විරියාරම්භ

ඤාණයයි. මෙම වීර්ය නූපන් පාපී අකුසල ධර්මයන් හට නොගැනීම පිණිසත්, උපන්නා පාපි වූ අකුසලය ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසත්, නූපන්නා වූ කුසල ධර්මයන් උපදවා ගැනීම පිණිසත්, උපන්නා වූ කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිසත්, වැඩි දියුණු කරගැනීම පිණිසත්, ඒ මත මුලා නොවීම පිණිසත්, විපුලත්වයට පත්ව භාවනාවෙන් පිරිපුන් වීම පිණිසත් වේ. නිවන පිණිසම **සිත දැඩිකොට ගැනීමේ ප්‍රඥාව විරියාරම්භ ඤාණයයි.**

Asallīnattapahitattapaggahaṭṭhe paññā, viriyārambhe ñāṇaṁ,

the wisdom gains from being active, resolute and supportive, is **the knowledge of exerting energy,**

39. අත්ථසන්දස්සන ඤාණය

නානාධම්මපකාසනතා පඤ්ඤා
අත්ථසන්දස්සනෙ ඤාණං

මෙයින් අදහස් වන්නේ **කාමච්ඡන්දය** ප්‍රහාණය කොට නෙක්ඛම්මය පසක් කිරීමයි. **ව්‍යාපාදය** ප්‍රහාණය කොට අව්‍යාපාදය පසක් කොට ගැනීමයි. **ථීනමිද්ධය** ප්‍රහාණය කොට ආලෝක සංඥා අර්ථය පසක් කොට ගැනීමයි. **උද්ධච්චය** ප්‍රහාණය කොට අවික්ඛේප අර්ථය පසක් කොට ගැනීමයි. **අවිද්‍යාව** ප්‍රහාණය කොට ඤානාර්ථය පසක් කොට ගැනීමයි. **අරතිය** ප්‍රහාණය කොට ප්‍රමුදිත අර්ථය පසක් කොට ගැනීමයි. මෙලෙස **සියලු කෙලෙස් ප්‍රහාණය කොට** අර්හත් මාර්ගය මැනවින් පසක් කිරීම **අත්ථසන්දස්සන ඤාණයයි.**

Nānādhammappakāsanatā paññā, Atthasandassane ñāṇaṁ,

the wisdom there is from making clear different states, is **the knowledge of pointing out their meaning**

40. දස්සන විසුද්ධි ඤාණය

සබ්බධම්මානං ඒකසංඝහකතා

නානත්තේකත්ත පටිවේධේ පඤ්ඤා දස්සන විසුද්දි ඤාණං

නිර්වාණ ධාතුව පිළිබඳ දැක්ම පියවරෙන් පියවර පිරිසිදු වීම හෙවත් පරිපූර්ණත්වයට පත්වීම දස්සන විසුද්ධියයි. දැකීමේ තීව්‍රතාවයට සාපේක්ෂව දුක්, දොම්නස්, කෙලෙස් ආදිය තුනී වීයයි. මෙසේ පියවරෙන් පියවර දැක්ම පිරිසිදු වීම, පරිපූර්ණත්වයට පත්වීම **දස්සන විසුද්ධි ඤාණයයි.**

Sabbadhammāna ekasagahatā nānattekatta paivedhe paññā, dassanavisuddhiñāa,

The wisdom there is from inclusivity and penetrating unity and variation in all things; **knowledge of purification of insight,**

41. ඛන්ති ඤාණය

විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං

රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාන යන පංච උපාදානස්කන්ධය අනිත්‍ය, දුක්ඛ අනාත්ම ආදී වශයෙන් ත්‍රිලක්ෂණ තුළින් දැක දැන, යම් පීඩාවක් දුකක් ඇති නොවන පරිද්දෙන් එය ඉවසීම ඛන්ති නම් වෙයි මේ සඳහා උපදනා ඥානය ඛන්ති ඤාණයයි.

Viditattā paññā, Khantiñāṇaṁ,

The wisdom arises through understanding, is **the knowledge of patience.**

42. පරියෝගාහන ඤාණය

පුට්ඨත්තා පඤ්ඤා පරියෝගහනේ ඤාණං

"පරියෝගාහන" යනු **පිවිසීමයි.** විදර්ශනා නුවණින් යුතුව පඤ්චුපාදානස්කන්ධය තුළට පිවිස රූප, වේදනා, සංඥා,

සංඛාර සහ විඤ්ඤාණ එකින් එක අනිත්‍ය වශයෙන් ස්පර්ශ කරයි. දුක්ඛ වශයෙන් ස්පර්ශ කරයි. අනාත්ම වශයෙන් ස්පර්ශ කරයි. මෙසේ ස්කන්ධය තුළට පිවිස ඒ ඒ ආකාරයෙන් දැනීම පරියෝගාහන ඤාණය යි.

Phuṭṭhattā paññā, pariyogāhaṇe ñāṇaṁ,.

the wisdom gains through experiencing, is **the knowledge of scrutiny.**

43. පදේසවිහාර ඤාණය

සමෝදහනේ පඤ්ඤා පදේසවිහාරේ ඤාණං

මිථ්‍යාදෘෂ්ඨිය හේතු කොට ගෙනද විඳීම හටගනි. මිථ්‍යාදෘෂ්ඨිය සංසිඳීම හේතු කොට ගෙනද විඳීම හටගනි. සම්මා දිට්ඨිය හේතු කොට ගෙන ද විඳීම හටගනී. සම්මා දිට්ඨිය සංසිඳීම හේතු කොට ගෙනද විඳීම හටගනී. මෙලෙසින්ම **සම්මා සංකල්ප මිථ්‍යා සංකල්ප** ආදී වශවෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය හේතු ප්‍රත්‍ය සහ වින්දන ස්වභාවයන්, දක්නා දන්නා නුවණ වේදනානුපස්සනාවේ දියුණුම අවස්ථාවයි. මෙසේ අති සංකීර්ණ ලෙස ඒ ඒ ප්‍රත්‍ය මුල්කරගෙන ඒ ඒ ස්ථානයන්හි පවත්නි විඳීම් ස්වභාවයන් දන්නා නුවණ හෙවත් දක්නා **ප්‍රඥාව පදේසවිහාර ඤාණය**

Samodahane paññā, Padesavihāre ñāṇaṁ,.

The wisdom arises through application, is **the knowledge of dwelling within limits,**

44. සංඥා විවට්ට ඤාණය

අධිපත්තා පඤ්ඤා සංඤ්ඤා විවට්ටයේ ඤාණං වීම නිසා කාමච්ඡන්දාදී අකුසලය සංඥාවන්ගෙන සිත ඉවතට පෙරළයි. අව්‍යාපාද, සංඥාව බහුල වීම හේතුවෙන් ව්‍යාපාදයෙන් ද අලෝක සංඥාව තීව්‍ර වීම හේතුවෙන් ථීන මිද්ධයෙන්ද අවික්ෂේපය බලවත් වීම හේතුවෙන් උද්ධච්චයෙන් ද, ධම්මවතවත්ථානය (ධර්මය විස්තර වශයෙන් දැකීම) බලවත්

වීමේ හේතුවෙන් විචිකිච්ඡාවෙන්ද සිත ඉවතට පෙරළේ. මෙම ක්‍රියාවලියට ඉවහල් වන ප්‍රඥාව සංඥා විවට්ට ඥාණයයි.

Adhipatattā paññā, Saññāvivaṭṭe ñāṇaṁ,

the wisdom arises through predominance, is **the knowledge of turning away through perception.**

45. චේතො විවට්ට ඥාණය

නානත්තේ පඤ්ඤා චේතෝ විවට්යේ ඥාණං

"නානත්ත" යනු අකුසල පක්‍ෂයයි. **"ඒකත්ත"** කුසල පක්‍ෂයයි. කුසල් මෙනෙහි කරන විට අකුසල පක්‍ෂයෙන් සිත ඉවතට පෙරළී යයි. මෙසේ **අව්‍යාපාදය** ගැන සිතන විට සිත **ව්‍යාපාදයෙන්ද, ආලෝක සංඥාව** ගැන සිතන විට සිත **ථීන මිද්ධයෙන්ද අවික්ෂේපය** ගැන සිතන විට සිත **උද්ධච්චයෙන්ද ධම්ම වවත්ථානය** ගැන සිතන විට සිත **විචිකිච්ඡාවෙන්ද** සිත ඉවතට පෙරළේ. මෙසේ අකුසල පක්‍ෂය ඉවතට පෙරළීමේ ඥාණය **චේතො විවට්ඨ ඥාණයයි.**

Nānatte paññā, cetovivae ñāa,

the wisdom gains through variety, is **the knowledge of turning away through intention,**

46. චිත්ත විවට්ට ඥාණය

කුසලය අධිෂ්ඨාන කරන විට අකුසලයෙන් සිත ඉවතට පෙරළේ. කාමච්ඡන්දය ප්‍රහාණය කිරීම වශයෙන් **නෙක්ඛම්මය අධිෂ්ඨාන කිරීමේ ප්‍රඥාව ද** ව්‍යාපාදය ප්‍රහාණය කිරීම වශයෙන් **අව්‍යාපාදය අධිෂ්ඨාන කිරීමේ ප්‍රඥාවද** ථීනමිද්ධය ද ප්‍රහාණය කිරීම වශයෙන් **අලෝක සංඥාව අධිෂ්ඨාන කිරීමේ ප්‍රඥාව ද** උද්දධච්චය ප්‍රහාණය කිරීම් වශයෙන් **අවික්ෂේපය අධිෂ්ඨාන කිරීමේ ප්‍රඥාවද** විචිකිච්ඡාව ප්‍රහාණය කිරීම් වශයෙන් **ධම්ම වවත්ථාපනය අධිෂ්ඨානය කිරීමේ ප්‍රඥාව ද** ආදී වශයෙන් එකින් එක පහළවීම **චිත්ත විවට්ට ඥාණය යි.**

Adhihāne paññā, citta vivae ñāa,

The wisdom comes up through determination, is **the knowledge of turning away through thought.**

47. ඤාණ විවට්ට ඤාණය

සුඤ්ඤතේ පඤ්ඤා ඤාණ විවට්ටේ ඤාණං

ශූන්‍යතාව හෙවත් "**අනාත්මතා ඤාණ දර්ශනය**" සාක්ෂාත් කෙරෙන ප්‍රඥාවයි. ඇස, කන, නාසය, දිව සිරුර ආදී පසු ඉඳුරන් තමා වශයෙන් ද, තමාගේ වශයෙන්ද, නිත්‍ය වශයෙන්ද, ස්ථිර වශයෙන්ද, ශාස්වත වශයෙන්ද, විපරිනාමයට හසු නොවන දෙයක් ලෙස ගැනීම ශූන්‍ය බවත්, නිසරු බවත් **තත් වූ පරිද්දෙන් දුන ගන්නා කල්හි** එම ඥානය ශූන්‍යතාව වෙත පෙරළියයි. **මෙය ඤාණ විවට්ය ඤාණයයි.**

Suññate paññā, ñāavivae ñāa,

The wisdom gains through emptiness, is **the knowledge of turning away through knowledge.**

48. විමොක්ඛ විවට්ය ඤාණය

වොස්සග්ගේ පඤ්ඤා විමොක්ඛ විවට්ටේ ඤාණං

අත්හැරීමේ ප්‍රඥාව විමොක්ඛ විවට්යේ ඥානයයි. නෙක්ඛම්මයෙන් කාමච්ඡන්දයෙන්ද, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය ද, ආලෝක සංඥාවෙන් ථීනමිද්ධයද, ප්‍රහාණය කිරීම වශයෙන් ආලෝක සංඥාවද අවික්ෂේපයෙන් උද්ධච්චය ද ධම්ම වවත්ථානයෙන් විචිකිච්ඡාව අත්හරිනු ලැබේ. මෙය **විමොක්ඛ විවට්ය ඤාණයයි.**

Vosagge paññā, vimokkhavivaṭṭe ñāṇaṁ,

The wisdom arises by relinquishing, is **the knowledge of turning away through freedom.**

49. සච්ච විවට්ට ඤාණය

තථට්ඨෙ පඤ්ඤා සච්ච විවට්ටෙ ඤාණං

සත්‍ය දැකීමේ අර්ථයෙන් ප්‍රඥාව, සච්ච විවට්ඨ ඤාණය නම්වේ. "දුකෙහි" පීළන, සංඛත, සන්තාප, විපරිනාම ආදී ස්වභාවයන් දකින විට සිත අවිද්‍යාවෙන් පෙරළී යන්නේය යන යථාර්ථයේ ප්‍රඥාව සච්ච විවට්ඨ ඤාණ නම් වේ. "සමුදයෙහි" ආයුහනාර්ථය, නිදනාර්ථය, සංයෝගාර්ථය, පළිබෝධාර්ථය දකින විට සිත අවිද්‍යාවෙන් පෙරළී යන්නේය යන යථාර්ථයේ ප්‍රඥාව සච්ච විවට්ඨ ඤාණ නම් වේ. නිරෝධයෙහි නිස්සරණාර්ථය, අසංඛ්‍යාර්ථය, අමතාර්ථය සාක්ෂාත් කරන විට සිත අවිද්‍යාවෙන් පෙරළී යන්නේය යන යථාර්ථයේ ප්‍රඥාව සච්ච විවට්ඨ ඤාණ නම් වේ. මාර්ගයෙහි නිර්යානිකාර්ථය, හේතු අර්ථය, දස්සනාර්ථය, ආධිපතෙය්‍යාර්ථය වඩමින් නැගී සිටින්නේය. යන සත්‍යාර්ථයේ ප්‍රඥාව සච්ච විවට්ඨ ඤාණය නම් වේ.

මෙම විවට්ඨ ඤාණ හය (44-49) එක විටම පහළ වන බව ද සඳහන් ය.

Tathaṭṭhe paññā, saccavivaṭṭe ñāṇaṁ

The wisdom turns out from being real, is **the knowledge of turning away through truth.**

50. ඉද්ධිවිධ ඤාණය

කායම්පි, චිත්තම්පි ඒකවවත්ථානතා සුඛ සඤ්ඤඤ්ච ලහු සඤ්ඤඤ්ච අධිට්ඨානවසේන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං

රූප කාය සහ සිත එක්තැන්කොට තැබීමෙන් ඇතිවන සුඛ සංඥාව සහ ලඝු සංඥාව සමුර්ධිමත් කරවන ඤාණය ලෙස මෙම ඤාණය දක්වෙයි. සාමාන්‍ය පුද්ගලයාට කළ නොහැකි අසාමාන්‍ය, ආශ්චර්ය, අද්භූත දේවල් කිරීමේ හැකියාවයි.

අහසින් ගමන් කිරීම, පොළවෙහි කිමිදීම, ජලය මත සක්මන් කිරීම ආදිය මෙම ඤාණය උපදවා ගත් පුද්ගලයාට කළ හැකි බව දක්වේ. එහෙත් නිවන් මග වඩන පුද්ගලයා මෙම ඤාණය ගැන පුදුම වීමක් හෝ ඒවා පසුපස හඹා යාමක් හෝ සිදු නොකරයි. මෙලෙස නොයෙක් ආකාරයෙන් ඉර්ධි ප්‍රාතිහාර්ය පෑමේ ශක්තියට අදාළ ප්‍රඥාව **ඉද්ධිවිධ ඤාණයයි.**

Kāyam-pi cittam-pi ekavavatthānatā, iddhividhe ñāṇaṁ,

is **the knowledge of the kinds of spiritual power**

the wisdom gains through success in defining mind and body,

51. සෝත ධාතු විසුද්ධි ඤාණය

විතක්ක විප්ඵාර වසේන නානත්තේකත්ත සද්ද නිමිත්තානං

පරියෝගාහනේ පඤ්ඤා සෝතධාතු විසුද්ධි ඤාණං

දිව්‍යමය ශ්‍රවණ ඤාණයයි. ඕනෑම ශබ්දයක් ඇසීමට හැකි ඤාණය ලෙස ද සැලකේ. මෙය දිබ්බ සෝත ඤාණය නමින් ද විස්තර වෙයි. විස්තර වශයෙන් නානාවිධ වූ ද, ඒකවිධි වූද, ශබ්දස නිමිතිවලට බැසගැනීමේ ප්‍රඥාව **සෝත ධාතු විසුද්ධි ඤාණය නම් වෙයි.** දූර ශබ්ද ද, ශබ්ද නිමිති ද මෙනෙහි කරයි. ළඟ ශබ්ද ද, ශබ්ද නිමිති මෙනෙහි ද කරයි. රළු ශබ්ද ද, ශබ්ද නිමිති ද මෙනෙහි කරයි. සියුම් ශබ්ද ද, ශබ්ද නිමිති ද මෙනෙහි කරයි. එසේම පෙර දිසාවේද දකුණු දිසාවේද නැගෙනහිර සහ බටහිර දිසාවේද අනු දිසා හතරේ ද උඩ හා යටද සිය ශබ්දය ද ශබ්ද නිමිති ද මෙනෙහි කරයි.

vitakkavipphāravasena nānattekattasaddanimittānaṁ pariyogāhaṇe paññā, sotadhātuvisuddhiñāṇaṁ, is theknowledge of the purification of the ear element,

(The wisdom arises through the scrutiny of the signs of unity and variation in sound through the pervasion of thought)

52. චේතෝපරිය ඤාණය

තිණ්ණං චිත්තානං විප්ඵාරත්වා ඉන්ද්‍රියානං පසාදවසේන නානත්තේ කත්ත විඤ්ඤාණචරියාපරියෝ ගහනේ පඤ්ඤා චේතෝපරිය ඤාණං

මෙය අනුන්ගේ සිත් දන්නා නුවණයි. අන් සිතක් රාග, ද්වේෂ, මෝහ ආදියෙන් පිරී පවතින්නේද, එම කෙලෙස්වලින් තොර සමාහිත ද, අසමාහිත ද, ධර්මාවබෝධයට සුදුසු තත්ත්වයකදී පවතීද, එසේ නොවේද යනාදී වශයෙන් දක්නා නුවණ **චේතෝපරිය ඤාණය** නම් වෙයි. මෙය **පරචිත්තත විජානන ඤාණය** ලෙසද හැඳින්වේ.

"tiṇṇannaṁ cittānaṁ vipphārattā indriyānaṁ pasādavasena, cetopariyañāṇaṁ"
The wisdom arises through the scrutiny of the pervasion of three thoughts through the sensitivity of the faculties, is the **knowledge of mind-reading,**

53. පුබ්බේ නිවාසානුස්සති ඤාණය

පච්චයප්පවත්තානං ධම්මානං නානත්තේ කත්තකම්ම විප්ඵාරවසේන පරියෝගහනේ පඤ්ඤා පුබ්බේ නිවාසානුස්සති ඤාණං

මෙම දේශනා පාඨයට අනුව හේතු ප්‍රත්‍ය ධර්මයන්ගේ නානත්වය සහ ඒකත්ත්වය කර්ම වේග අනුව දැනගන්නා නුවණ පුබ්බේ නිවාසානුස්සති ඤාණය වේ. එනම් සත්ත්වයා කර්මානුරූපීව සසර ගෙවූ ආකාරයයි. මේ සඳහා හේතු ඵල ධර්මය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුමය, මෙම අවබෝධය සඳහා **පුබ්බේ නිවාසානුස්සති ඤාණය** අනිවාර්ය වේ. මෙය වර්ධනය කර ගැනීමෙන් පෙර ජාතිය පමණක් නොව භවයෙන් භවය කල්ප කෝටි ගණන් පෙර විසූ ස්කන්ධ පරම්පරාව නුවණින් දකී. පටිච්ච සමුප්පාදයෙහි පුනර්භවයන්ට සම්බන්ධවන සංධිස්ථාන වන **විඤ්ඤාණ පච්චයා නාම රූපං, උපාදාන පච්චයා භවො භව පච්චයා ජාති ආදී ස්ථාන පැහැදිලිව නිරවුල්ව අවබෝධ වීම මෙම ඤාණාවබෝධයයි.**

paccayappavattānaṁ dhammānaṁ, pubbenivāsānussatiñāṇaṁ,

The wisdom arises from the scrutiny of the rounds of conditioned existence, is **the Knowledge of the recall of previous existences,**

54. දිබ්බචක්ඛු ඤාණය

ඕභාසවසේන නානත්තේකත්ත රූප නිමිත්තානං දස්සනට්ඨේ පඤ්ඤා දිබ්බ චක්ඛු ඤාණං

සත්වයා කර්මානුරූපීව චුත වන ආකාරය සහ උපදින ආකාරය දක්නා නුවණ **දිබ්බචක්ඛු ඤාණය යි.** මෙය චුතුප්පාද ඤාණය යැයි ද කියවේ. මෙම ඥානය ද පටිච්ච සමුප්පාදය අවබෝධ වීමේ ප්‍රතිඵලයක් ලෙසටම පහළ වන ඥානයයි. සත්ත්වයා කර්මානුරූපීව සසර ඉදිරියට ගමන් කරන ආකාරය දැකීම මෙයින් අදහස් කෙරෙයි. **අලෝක වශයෙන් නා නා ස්වභාවය වූද, තත්වාකාරී ස්වභාවය වූ ද රූප නිමිති දැකීමේ ප්‍රඥාව මෙමම දිබ්බචක්ඛු ඤාණය අරහත් ඵල සඳහා අනිවාර්ය ඤාණයකි.**

"obhāsavasena nānattekattarūpanimittānaṁ dassanaṭṭhe paññā", dibbacakkhuñāṇaṁ, ;
The wisdom arises the state of having insight into the signs of variation and unity in forms, through illumination is **the knowledge of the divine eye.**

55. ආසවක්ඛය ඤාණය

චතුසට්ඨියා ආකාරේහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයේ ඤාණං

සියලු ආසවන් හෙවත් කෙලෙස් ස්වකීය සන්තානය තුළින් ප්‍රහාණය කළ කල්හි එසේ ප්‍රහාණය වූ බව දක්නා නුවණ **ආසවක්ඛය ඤාණය** ලෙස හැඳින්වේ. කාම, භව, දිට්ඨි, අවිජ්ජා යනුවෙන් ආශ්‍රව 4 කි. එම කාමයන් කෙරෙහි පවත්නා ඇලෙන, බැඳෙන, ආශක්ත වන ස්වභාවය **කාමාශ්‍රව** නම්වේ. රූපී අරූපී බ්‍රහ්ම ලෝකවල ඇලෙන, බැඳෙන, ආශක්ත වන

ස්වභාවය **භවාශ්‍රව** නම්වේ. යථාභූත ඥාණ දර්ශනයට ප්‍රතිපක්‍ෂ වූ සකලවිධ මිත්‍යාදෘෂ්ඨි සියල්ල **දිට්ඨි** ආශ්‍රව නම් වන අතර ජීවිතය හා ලෝකය පිළිබඳව සැබෑ තත්ත්වය නොදැනීම නම් වූ අවිද්‍යාව ම **අවිද්‍යා ආශ්‍රව** ලෙස හැඳින්වේ.

පාලි පාඨයෙන්හි අදහස අනුව ආකාර 64 කින් යුත්, තුන් වැදෑරුම් ඉන්ද්‍රියන්ගේ වසීභාවය පවත්වන ප්‍රඥාව **ආසවක්ඛය ඥාණය** නම් වෙයි. කාම ශරීරය ඉන්ද්‍රිය ධර්ම 22 කින් සමන්විත වන අතර අවසාන තුන් වැදෑරුම් ඉන්ද්‍රියයන් **ආසවක්ඛය ඥාණය** කෙරෙහි සෘජුවම බලපායි. **ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා, මනින්ද්‍ර, සෝමනස්ස** සහ **ජීවිත ඉන්ද්‍රිය** එකින් එකට පරිවාර වෙයි. මෙම පරිවාර කුසල ධර්ම 8 සෝතාපන්න ඵල අවස්ථාවේදී **අඤ්ඤා ඉන්ද්‍රියට** පරිවාරවීම නිසා 16 කට ද, සකෘදගාමී ඵල අවස්ථාවේ **අඤ්ඤා ඉන්ද්‍රියට** පරිවාරවීම නිසා 32 කට ද, අනාගාමී ඵල අවස්ථාවේදී **අඤ්ඤා ඉන්ද්‍රියට** පරිවාරවීම නිසා 48 කට ද, පරිවාර වී අර්හත් මාර්ග සහ ඵල ලැබීමේදී **අඤ්ඤාතාවී ඉන්ද්‍රියට** පරිවාර වීමේ දී නැවතත් මෙම ධර්ම 8 දෙවරක් ක්‍රියාකාරී වෙයි. පාලි පාඨයෙහි චතුසට්ඨියා ආකාරේහි යනුවෙන් සඳහන්ව ඇත්තේ එබැවිනි. සියලු ආශ්‍රවයන් මෙසේ මාර්ග ඵල ප්‍රාඥාවෙන් ප්‍රහාණය කිරීම **ආසවක්ඛය ඥාණය** නම් වෙයි.

Catusaṭṭhiyā ākārehi tiṇṇannaṁ indriyānaṁ vasībhāvatā paññā, āsavānaṁ khaye ñāṇaṁ.

The wisdom comes up from mastery of the three supermundane) faculties with their sixty-four modes, is t**he knowledge of the destruction of the pollutants,**

56-63 සත්‍ය ඥාණ චතුෂ්කද්වය සත්‍ය ඥාන චතුෂ්කද්වය 01

පරිඤ්ඤට්ඨේ පඤ්ඤා දුක්ඛේ ඥාණං
පහානට්ඨේ පඤ්ඤා සමුදයේ ඥාණං

සච්ජිකිරියට්ඨේ පඤ්ඤා නිරෝධේ ඥාණං
භාවනට්ඨේ පඤ්ඤා මග්ගේ ඥාණං

සත්‍ය ඥාන චතුෂ්කද්වය 02

දුක්ඛේ ඥාණං දුක්ඛ සමුදයේ ඥාණං දුක්ඛ නිරෝධේ ඥාණං දුක්ඛේ ඥාණං දුක්ඛ නිරෝධ ගාමිණියා පටිපදාය ඥාණං

මෙම ඥාන හතරේ කොටස් 2 ක් ඇත. එවිට ඥාන 8 කි. මෙම ඥාන 8 ම චතුරාර්ය සත්‍ය මත ම ගොඩනැගී ඇත. එහෙයින් මෙම ඥානය සච්ච ඥාන චතුෂ්කද්වය ලෙස හැඳින්වේ. මෙම සත්‍ය ඥාන 4 විසි ආකාරයකින් පරිපුර්ණ වශයෙන් අවබෝධ කර ගැනීම මෙහිදී අපේක්‍ෂා කෙරේ. එසේ පරිපූර්ණ වශයෙන් දැනීමේ, දැකීමේ, විමසීමේ මෙනෙහි කිරීමේ ඉසච්ච දැක්වෙන වචන මාලාවක් ත්‍රිපිටකයෙහි අන්තර්ගතය. බුදුන් වහන්සේ අවබෝධ ඥානය හැඳින්වීම සඳහා පද සියල්ලම එක්තැන්කොට එහි දක්වා ඇත.

56. Pariññaṭṭhe paññā, dukkhe ñāṇaṁ,

The wisdom arises by having full knowledge, is **the knowledge of suffering,**

57. Pahānaṭṭhe paññā, samudaye ñāṇaṁ,

The wisdom arises by having given up, is **the knowledge of arising,**

58. Sacchikiriyaṭṭhe paññā, nirodhe ñāṇaṁ,

The wisdom arises having experienced, is **the knowledge of cessation,**

59. bhāvanaṭṭhe paññā, magge ñāṇaṁ,

The wisdom arises by having cultivated, is **the knowledge of path,**

60. dukkhe ñāṇaṁ, knowledge of suffering,

61. dukkhasamudaye ñāṇaṁ,. knowledge of the arising of suffering,

62. dukkhanirodhe ñāṇaṁ, . knowledge of the cessation of suffering

63. dukkhanirodhagāminiyā paṭipadāya ñāṇaṁ,knowledge of the practice leading to the cessation of suffering.

64-67 සුද්ධික පටිසම්භිදා ඤාණය

25-28 දක්වා සඳහන් කළ පටිසම්භිදා ඤාන 4 මෙහිදී විශේෂ ආකාර 10 ක් ඔස්සේ දියුණු තත්ත්වයටකට පත්වෙයි. සුද්ධික යන විශේෂණ පදයෙන් දක්වා ඇත්තේ ද සුවිශේෂී වූත්, දියුණු තියුණු වූත් ප්‍රබලතාවයයි.

64. සුද්ධික අත්ථ පටිසම්භිදා ඤාණය

65. සුද්ධික ධම්ම පටිසම්භිදා ඤාණය

66. සුද්ධික නිරුත්ති පටිසම්භිදා ඤාණය

67. සුද්ධික පටිභාන පටිසම්භිදා ඤාණය

මෙම ඤාණ 4 හි වර්ධනය සාරාංශ ගතව මෙසේ දැක්විය හැකිය. ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්මයන් යමෙකු තුළ වර්ධනය වන්නේ නම්, ඔහු අල්ප වූ කෙලෙස් ඇති, තියුණු ඉන්ද්‍රියන් ඇති, ද්විත්ව චරිත නැති, මනාව හඳුනාගත හැකි, වරදෙහි දක්නා බිය ඇති, පරලොව විශ්වාස කරන පුද්ගලයෙක් බවට පත්ව ඇත. යමෙක් තුළ මෙම ඉන්ද්‍රිය ධර්මයන් වැඩී නොමැති නම් ඔහු මහත් වූ කෙලෙස් ඇති, මුදු ඉඳුරන් ඇති, ද්විත්ව චරිත ඇති, පහසුවෙන් තේරුම් ගත නොහැකි, පරලොව වරදෙහි බිය නොදකින පුද්ගලයෙකි.

64. Atthapaṭisambhide ñāṇaṁ,.is the analytic knowledge of meaning,

65. Dhammapaṭisambhide ñāṇaṁ,.is the analytic knowledge of truth,

66. Niruttipaṭisambhide ñāṇaṁ, is the analytic knowledge of language,

67. Paṭibhānapaṭisambhide ñāṇaṁ, analytic knowledge of inspired speech.

68. ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය

ඉධ තථාගතෝ සත්තේ පස්සති‍ං අප්පරජක්ඛේ මහාරජක්ඛේ තික්ඛින්ද්‍රියේ මුදින්ද්‍රියේ ස්වාකාරේ ද්වාකාරේ සුවිඤ්ඤාපයේ දුවිඤ්ඤාපයේ අප්පේකච්චේ පරලෝක වජ්ජභයදස්සාවිනෝ අප්පේකච්චේ න පරලෝක වජ්ජභයදස්සාවිනෝ

මේ ආකාරයෙන් තථාගතයන් වහන්සේ සත්ත්වයන් දකින්නාහ. කෙසේදයත් අල්ප කෙලෙස් ඇති සත්වයෝය. මහත් වූ කෙලෙස් ඇති සත්වයෝය. තියුණු වූ ඉන්ද්‍රිය ධර්ම ඇති සත්වයෝය. මෘදු වූ ඉන්ද්‍රිය ධර්ම ඇති සත්වයෝය. සුන්දර ආකාර ඇති සත්වයෝය. තුන්සිත තත්වාකාර ඇති සත්වයෝය. පහසුවෙන් අවබෝධ කලහැකි සත්වයෝය. පරලොව වරදෙහි භය දක්නා පුද්ගලයෝය වශයෙනි. **පටිසම්භිදා මග්ගයද මෙහිලා පදයෙන් පදය ආකර්ශණීය ලෙෂ සවිස්තරාත්මකව සඳහන් වෙයි.**

සියලු කරුණු මෙලෙස සාරාංශගත වෙයි. ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයන් යමෙකු තුළ වර්ධනය වී තිබේ නම් ඔහු අල්ප වූ කෙලෙස් ඇති, තියුණු වූ ඉන්ද්‍ර ඇති, ද්විත්ව චරිත නැති, මනාව හඳුනාගත හැකි, වරදෙහි දක්නා බිය ඇති පුද්ගලයාය.

යමෙක් තුළ මෙම ඉන්ද්‍රිය ධර්මයන් වැඩී නොමැති නම් ඔහු මහත් වූ කෙලෙස් ඇති, මුදු ඉඳුරන් ඇති, ද්විත්ව චරිත ඇති, පහසුවෙන් තේරුම් ගත නොහැකි, පරලොව වරදෙහි බිය නොදකින පුද්ගලයෙකි.

බුදුන් වහන්සේ, තමන් වහන්සේ ඉදිරියට එන පුද්ගලයා තුළ පවත්නා මෙම ලක්‍ෂණ මැනවින් දකින සේක. **ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය** යනු එම සුවිශේෂි හැකියාවයි. මෙය **බුදුවරුන් තුළ පමණක් පහළවන ඤාණයකි.**

Sattānaṁ āsayānusaye ñāṇaṁ,. knowledge of the dispositions and underlying tendencies of beings,

69. ආසයානුසය ඥාණය

ඉධ තථාගතෝ සත්තානං ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, භබ්බාභබ්බේ සත්තේ ජානාති.

ධර්මාවබෝධයට බාධාවන ආකාරයෙන් සන්තානයේ නිදන්ගතව ඇති කෙලෙස් ස්වභාවයන් දක්නා නුවණයි. " ආසය" යනු සත්ත්වයාගේ සන්තානයට කියන නමකි. එම සත්ව සන්තානයන්හි නිදන්ගතව පවත්නා අප්‍රකට කෙලෙස් "අනුසය" යනුවෙන් හැඳින්වේ. ඕනෑම සත්ත්වයෙකුගේ එකී නිදන්ගත සන්තානගත කෙලෙසුන් දැකීමේ හැකියාව බුදුපියාණන් වහන්සේ සතුව ඇත. බුදු **රජාණන් වහන්සේ කෙනෙකුට පමණක් පහළ කරගත හැකි** එම ශක්තිය **ආසයානුසය ඥාණය** ලෙස හැඳින්වේ.

ඉහත සඳහන් දේශනා පාඨයෙහි පරිවර්තනය මෙසේය. මෙහිලා තථාගතයන් වහන්සේ සත්ත්වයන්ගේ සන්තානයන්ද දනිති. අනුසයන් ද දනිති. චරිතය ද දනිති. ආසා, රුචි අරුචිකම් ද දනිති. සිතුම් පැතුම් සහ ඒවායේ සුදුසු නුසුදුසු තත්ත්වයන් ද දනිති. **"අධිමුත්තිං"** යනුවෙන් අදහස් වන්නේ හදෙහි පවත්නා ප්‍රාර්ථනාවයි. අභිප්‍රායයි. යමකට නැමුණු ස්වභාවයයි. මේ නයින් ධර්මාවබෝධයට සුදුසු නුසුදුසු සත්ත්වයින් හඳුනා ගැනීමේ **"ආසයානුසය ඥාණය"** ද **බුදුවරුන් තුළ පමණක් පහළවන ඥාණයකි.** සත්ත්වයන් තුළ පවත්නා මෙකී සියලු කරුණු විශාරද ලෙස දැනීමේ හැකියාව බුදුවරුන් තුළපමණක් උපදින සුවිශේෂී ඥානයකි. **"ඉධ තථාගතස්ස සත්තානං ආසයානුසයේ ඥාණං මෙය සත්ත්වයාගේ ආසය, අනුසය දැකීමේ ඥාණයයි."**

Sattānaṁ āsayānusaye ñāṇaṁ,. knowledge of the dispositions and underlying tendencies of beings,

70. යමක මහා පටිහාර ඤාණය

ඉධ තථාගතෝ යමක පාටිහීරං කරෝති අසාධාරණං සාවකේහි, උපරිමකායතෝ අග්ගික්ඛන්ධො පවත්තති, හෙට්ඨිමකායතො උදකධාරා පවත්තී, උපරිමකායතෝ උදකධාරා පවත්තී, හෙට්ඨිමකායතෝ උදකධාරා පවත්තී, හෙට්ඨිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති.

යමක ප්‍රාතිහාර්යය යනු බුදු රජාණන් වහන්සේගේ ස්වකීය ශරීරයේ ඒ ඒ අංග වලින් මාරුවෙන් මාරුවට ඉතා වේගතවත්ව ගින්දර සහ ජලය පිටකරමින් කෙරෙන සුවිශේෂී ප්‍රාතිහාර්යයකි. ඒ අසම සම ප්‍රාතිහාර්යය සිදුකිරීමට තථාගතයන් වහන්සේ සතුව ඇත්තේ අසහාය බලයකි. මෙම සුවිශේෂී ශක්තිය **යමක පටිහාර ඤානය** ලෙස හැඳින්වේ. තථාගථයාණන් වහන්සේ ශ්‍රාවකයින්ට ආසාධාරණ වූ මෙම යමක මහා ප්‍රාතිහාර්යය පවත්වන සේක.

ශරීරයේ උඩු කොටසින් ගිනිකඳ පවත්වයි. ශරීරයේ පසු කොටසින් දිය කඳ පවත්වයි. යළිත් ශරීරයේ උඩු කොටසින් දියකඳ පවත්වයි. ශරීරයේ පසු කොටසින් ගිනි කඳ පවත්වයි.

යළිත් මාරුවෙන් මාරුවට ශරීරයේ දකුණු ඇසින් ගිනි කඳ පවත්වයි. ශරීරයේ වම් ඇසින් දිය කඳ පවත්වයි. යළිත් මාරුවෙන් මාරුවට ශරීරයේ දකුණු කන් සිදුරෙන් දිය කඳ පවත්වයි. වම් කන් සිදුරෙන් ගිනි කඳ පවත්වයි. මෙසේම දකුණු උරහිසෙන් හා වම් **උරහිසෙන් ද, දකුණු හස්තයෙන්** හා **වම් හස්තයෙන් ද** ශරීරයේ දකුණු පසින් හා වම් පසින්ද, ශරීරයේ **දකුණු පාදයෙන්** හා **වම් පාදයෙන් ද,** ගිනිකඳ සහ දිය කඳ මාරුවෙන් මාරුවට පවත්වයි.

තවද, එක් එක් ඇඟිලි **වලින්** ගින කඳ ද, ඇඟිලි **අතරින්** දිය කඳ ද පවත්වයි. මෙය වඩාත් තීව්‍ර ලෙසින් එක් ලොම් ගසකින් ගිනි කඳ ද, තවත් **ලොම් ගසකින්** දිය කඳ ද පවත්වයි.

මේ අතර නිල්, කහ, රතු, සුදු, තැඹිලි සහ මිශ්‍ර වර්ණ වලින් රැස් මාලා ද විහිදවයි.

තවද බුදු රජාණන් වහන්සේ සක්මන් කරයි. මවන ලද බුදු රුව වැඩ හිඳිති. සයනය හෝ රකිති. බුදු රජාණන් වහන්සේ නිසොල්මන්ව සිටිති. මවන ලද බුදු රුව සක්මන් කරති. හිඳිති. සයනය හෝ කරති.

ඉධං තථාගතස්ස යමක පාටිහීරේ ඤාණං

මෙය තථාගතයන් වහන්සේගේ යමක මහා ප්‍රාතිහාර්ය නුවණයි.

යමක මහා පටිහාර ඤාණය යි.

සාධු! සාධු! සාධු!

Yamakapāihīre ñānam - knowledge of the twin miracle, HOW EXCELLENT ?

71. මහා කරුණා සමාපත්ති ඤාණය

ආදිත්තෝ ලෝකසන්නිවාසෝ ති පස්සන්තානං
බුද්ධානං භවන්තානං ෂත්තේසු මහා කරුණා ඔක්කමති.

"ලෝකවාසී සත්ත්වයා රාගාදී ගින්නෙන් ගිනිගන්නා ලද්දේ" යැයි ලොව බලන කල්හි භාග්‍යවත් බුදු රජාණන් වහන්සේලාගේ මහා කරුණාවෙන් සත්ත්වයා වෙත බැසග නී. මෙසේ බොහෝ කරුණු කාරණා පදනම් කර ගෙන බුදු රජාණන් වහන්සේ තුළ මහා කරුණාව හටගන්නා බව දේශනා කරන **පටි සම්භිදා මාර්ගය එම කරුණු 101 ක් පෙන්වා දී ඇත.** සියල්ල මෙහි ඇතුළත් කිරීම අසීරුය. මහා කරුණාව යනු බුදු කෙනෙකුට පමණක් සාධාරණ වූ විශිෂ්ට වූ ඥාන ප්‍රභවයකි. එහි ස්වභාවය පැහැදිලි කිරීම ලෞකික භාෂාවකින් පෘතග්ජන අයෙකු විසින් සාර්ථකව කළ හැක්කක් නොවේ. එහෙත් හැකි උපරිම උත්සාහයකින් ඉහත කරුණු 101 න් කිහිපයක් පමණක් පාඨක අවබෝධය පිණිස මෙහි දක්වේ. ලෝකවාසීන් තුළ පවත්නා විවිධාකාර වූ ව්‍යුහගත චින්තනයන් විශ්ලේෂණය කර විනිවිද දකීමට තරම් ප්‍රබල තියුණු, තීක්ෂණ ඥානයක් බුදු පියාණන් වහන්සේ සතු

නොවන්නට සංසාරගතවී දුක් විඳින ඔබ කවුරුත් කෙතරම් අභාග්‍ය සම්පන්න ද? මහා කරුණා සමාපත්තියට සමවැදී දුක් විඳින ලෝ සතුන් තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට පහළ වූ ඒ මහා කරුණාව මහා ආශ්චර්යයකි. බුදුපියාණන් වහන්සේ එය මෙසේ ද දක්නා ලදහ.

- ලෝකවාසී සත්ත්වයා නොමඟට බැස ගන්නා ලද්දේය
- ලෝකවාසී සත්ත්වයා ආනාරක්ෂිතය. ආරක්ෂා කළ හැක්කෙක් නැත්තේය.
- ලෝකවාසී සත්ත්වයා ඌන, අතෘප්තිමත්, තණ්හාවට දාස වූවෝය
- ලෝකවාසී සත්ත්වයා අසරණ භාවයට පත්ව සිටින්නේය
- ලෝකවාසී සත්ත්වයා රාගාදී ගින්නෙන් ගිනිගන්නා ලද්දේය
- ලෝකවාසී සත්ත්වයා නොසන්සුන් ස්වභවාව ඇත්තේය
- ලෝකවාසී සත්ත්වයා අවිද්‍යාවෙන් ආවරණය කරන ලදුව කෙලෙස් කුඩුවෙහි සිරවී ඇත. ඔහුනට මා හැර ආලෝකයක් සපයන්නෙක් නැත.
- ලෝකවාසී සත්ත්වයා අවිද්‍යාව විෂ දෝෂයෙන් දූඩි සේ තැවරී සිටින්නේ කෙලෙස් මඩ තැවරී ඇත්තේය.
- ලෝකවාසී සත්ත්වයා තෘෂ්ණා සංයෝජනයෙන් බඳනා ලද්දේය.
- ලෝකවාසී සත්ත්වයා දෘෂ්ඨි සංයෝජනයෙන් බඳනා ලද්දේය.
- ලෝකවාසී සත්ත්වයා ඉපදීමට අනුගතව සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා ජරා මරණයෙන් ලුහු බඳිනා ලද්දේය.
- ලෝකවාසී සත්ත්වයා මහත් වූ ප්‍රපාතයකට වැටී ඇත්තේය. එයින් ගොඩනැඟීමට මා හැර අනෙකෙකු නැත්තේය.
- ලෝකවාසී සත්ත්වයා මහත් වූ කාන්තාරයකට වැටී ඇත්තේය. එයින් එතෙර කිරීමට මා හැර අනෙකෙකු නැත්තේය.

- ලෝකවාසී සත්ත්වයා මහා දුර්ගයක කැරකෙමින් සිටින්නේය. එයින් එතෙර කිරීමට මා හැර අනෙකෙකු නැත්තේය.
- ලෝකවාසී සත්ත්වයා විපරිත මඟකට බැස මාර්ගය වරද්දා ගන්නා ලද්දේය. ඔවුනට නිවැරදි ආර්ය මඟ පෙන්වීමට මා හැර කෙනෙක් නැත.
- ලෝකවාසී සත්ත්වයා ත්‍රිවිධ දුසිරිතෙහිම වරදවා බැසගෙන ඇත්තේය.
- ලෝකවාසී සත්ත්වයා සිව් වැදෑරුම් උපාදානයන්හි ග්‍රහණය වී ඇත්තේය.
- ලෝකවාසී සත්ත්වයා නිරය, ප්‍රේත, දේව, තිරිසන්, මිනිස් ආදී වූ පඤ්ච ගතියට සමාරූඪව ඇත්තේය.
- ලෝකවාසී සත්ත්වයා පඤ්ච කාම ආස්වාදයෙන් ඇලී ඇත්තේය.
- ලෝකවාසී සත්ත්වයා නීවරණයන්හි වගුරවන ලද්දේය.
- ලෝකවාසී සත්ත්වයා සවැදෑරුම් විවාද මූලයන් ගෙන් වාදයෙහි යෙදී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා සත් වැදෑරුම් මානයන්හි එල්බී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක ආදී අට වැදෑරුම් ලෝක ධර්මයන්හි කැරකෙමින් සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා අට වැදෑරුම් මිත්‍යාවන්ගෙන් මෙහෙය වෙමින් සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා අට වැදෑරුම් පුරුෂ දෝෂයන්ගෙන් කෙලෙසී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා නව වැදෑරුම් ආඝාත වස්තූන්ගෙන් අඝාතයට පත්ව සිටින්නේය.

- ලෝකවාසී සත්ත්වයා **නව වැදෑරුම් මානයන්ගෙන්** එසවී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා තෘෂ්ණා මූලික වූ නව වැදෑරුම් ධර්මයන්හි ඇලී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා **දස වැදෑරුම් කෙලෙසුන්ගෙන්** කෙලෙසී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා **දස අකුසල කර්ම පථයන්ට** පැමිණි සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා **දස සංයෝජන ධර්මයන්හි** යෙදී සිටින්නේය.
- ලෝකවාසී සත්ත්වයා **දස වස්තුක මිත්‍යා දෘෂ්ඨියෙන්** සමන්විතවන්නේය.
- ලෝකවාසී සත්ත්වයා **108 ක් තෘෂ්ණා ප්‍රපඤ්චයන්ගන්** ගැවසී ගත්තේය.
- බුදු පියාණන් වහන්සේගේ සුපිරිසිදු චිත්ත සන්තානය තුළ පහළ වූ මහා කරුණාව මෙසේය.
- මම වනාහි **සසර සයුර** තරණය කළෙක්මි. ලෝකයා තරණය නොකළේය.
- මම වනාහි **සියලු දුකින් මිදුණෙක්මි.** ලෝකයා එසේ නොමිදුණේය.
- මම වනාහි **ආර්ය මාර්ගයෙහි දමුණෙක්මි.** ලෝකයා එසේ නොදමුණේය.
- මම වනාහි **ශාන්ත බවට පත් වූවෙක්මි.** ලෝකයා එසේ නොවුණේය.
- මම වනාහි **අස් වැසුම් ලැබුවෙක්මි.** ලෝකසා අස් වැසිලි රහිතය.
- මම වනාහි **පිරිනිවුනෙමි.** ලෝකයා නොපිරිනිවුනේය.

සසර සයුර තරණය කළ මම ලෝකයා තරණය කරවීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි. දුකින් නිදහස් වූ මම ලෝකයා දුකින් නිදහස් කරවීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි. ආර්ය මාර්ගයෙහි හික්මුණු මම ලෝකයා හික්මවීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි. සිසිල් බවට පැමිණි මම ලෝකයා සිසිල් කරවීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි. අස්වැසිලි ලැබූ මම ලෝකයා අස්වැසිලීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි. පරිනිබ්බානයට පත්වූ මම ලෝකයා පරිනිබ්බානයට පත්කිරීමට ඒකාන්තයෙන්ම සමත් වෙමි.

ඉධ තථාගතස්ස මහා කරුණා සමාපත්තියා ඤාණං
මේ වනාහි තථාගතයන් වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඤාණයයි.
(මෙහි දක්වා ඇත්තේ සැකෙවිනි.)

Mahākaruṇāsamāpattiyā ñāṇaṁ: Knowledge of the attainment of great kindness.

72-73 සබ්බඤ්ඤුත ඤාණය සහ අනාවරණ ඤාණය

සබ්බං සඞකතමසඞඛතං අනවසේසං ජානාතීති සබ්බඤ්ඤුත ඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණ ඤාණං

සියලු සංඛත අසංඛත ධර්මයන් පරිපුර්ණ වශයෙන් දැකීමේ ඥානය **සබ්බඤ්ඤුත ඤාණයයි.** එහි කිසිදු ආවරණයක් නොමැති බව, ඉතා පැහැදිලිව, පිරිසිදුව දැකීමේ හැකියාව අනාවරණය ඤාණයයි.

පටිසම්භිදා මග්ගයේ විස්තර කර ඇති පරිදි චතුරාර්ය සත්‍ය ධර්මය පරිපුර්ණ වශයෙන් දැනගැනීමේ ඤාණය, **සබ්බඤ්ඤුත ඤාණයයි.** එහි කිසිඳු ආවරණයක් නොමැති බව ඉතා පිරිසිදුව දැකීමේ හැකියාව අනාවරණය ඤාණයයි.

යම්තාක් දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සහිත වූ මේ ලෝකයෙහි යමෙක් යමක් දක්නා ලද්දේ ද, අසනා ලදදේ ද, විඳිනා ලද්දේ ද, මනසින් දැනගන්නා ලද්දේ ද, යමකට පැමිණෙන ලද්දේ ද, යමක්

සොයන ලද්දේ ද, විමසන ලද්දේ ද, ඒ සියල්ල දන්නා බව සබ්බඤ්ඤුත ඤාණයයි. එහි කිසිදු ආවරණයක් නොමැති බව **අනාවරණ ඤාණයයි.**

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ **සබ්බඤ්ඤුත ඤාණයෙහිත් අනාවරණය ඤාණයෙහිත්** සැබෑ අරුත මෙයින් පැහැදිලිය. බුදු පියාණන් වහන්සේ ඤාණ සාගරයකි. විශ්වීය දැනුම් සම්භාරයකි. තුන් ලෝකයම සනසා වදාරන ලද **ප්‍රඥා ප්‍රභවයකි.** එයට දෘශ්‍යමාන නොවූ කිසිවක් අතීත, වර්තමාන අනාගත යන කාලත්‍රයන්හි නොපවතී.

72. Sabbaññutañāṇaṁ: Knowledge of omniscience,
73. Anāvaraṇañāṇaṁ: knowledge of unobstructiveness.

"Imani tesattati ñāñani- These are the 73 knowledge"
Of these 73 knowledges 67 are common to desciples.
The last 6 (68-73) are specially for Buddhas

THE END

ලුහුඬින් සරලව, එහෙත් අරුත් විකෘති නොවන සේ ඉදිරිපත් කරන ලද තෙසැත්තෑ ඤාණානුපස්සනාව නිමි.

සාධු! සාධු! සාධු!

****

දෙවන කොටස
PART - II

11

බුදු පියාණන් වහන්සේගේ අපරිමිත බුදු ගුණ
IMMEASURABLE VIRTUES OF BUDDHA

අනන්ත අප්‍රමාණ බාධක, අභියෝග මැදින් සංසාර ගමනේ ඉපදෙමින් මැරෙමින් අති දීර්ඝ භව ගමනක යෙදුණ සිද්ධාර්ථ ගෞතමයාණන් වහන්සේ, සිය ජයග්‍රාහී ගමනාන්තය සනිටුහන් කරමින් උත්තරීතර සම්මා සම්බුද්ධත්වයට පත්වූයේ මිහිකත පවා කම්පා කරවමිනි. මොහොතකට අපායේ පවා ගිනිදැල්වලට සිසිලස ලබාදුන්, අන්ධයින්ට පෙනීම ලබාදුන්, බිහිරි අයට පවා ශබ්දය අසන්නට සැලසූ, ගොළුවන්ගේ කටහඬ පවා අවදි කරවීමට සමත් වූ, කොරුන් දෙපා මත ශක්තිමත්ව හිටගත් එම ආශ්චර්යමත් මොහොත කෙතරම් විශ්මයජනකද? ඒ බුද්ධ බලයයි.

බුදුගුණ අනන්තයි. අපරිමිතයි. බුද්ධ විෂය අචින්ත්‍යයි. එය මැනිය හැකි මිනුම් දණ්ඩක් සොයා ගත හැක්කෙක් මේ දක්වා ලොව පහළ වී නැත. නික්ලේෂී බවෙහි ප්‍රතිමූර්තියක් වූ බුදු පියාණන් වහන්සේ සියළු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක. රහසින්වත් පව් නොකළ සේක. සියලු පාපයන්ගෙන් මිදුණ සේක. සියලු ලෝ වැසියන්ගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු වන සේක.

බුදුරජාණන් වහන්සේ **ඇසින් රූප දක, කණින් ශබ්ද අසා නාසයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රස විඳ, කයින් පහස ලබා, මනසින් අරමුණු දන ඒ අරමුණ කිසිවක් කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක.** මුලා නොවුන සේක. ආශාව දුරු කළ සේක.

උන්වහන්සේගේ සිත අටලෝ දහම හමුවේ කිසි විටෙකත් සසළ නොවීය. **ලාභ-අලාභ, යස-අයස, කීර්ති-ප්‍රශංසා, නින්දා-අපවාද, දුක-සැප** ආදී කුමන තත්ත්වයක් හමුවේ වුවද, කම්පිත නොවූහ. චංචල නොවූහ. සමතුලිත මානසිකත්වයක් පවත්වා ගැනීමට සමත් වූහ.

ගත කරන සෑම මොහොතක්ම බුදුපියාණන් වහන්සේ මෛත්‍රී සහගත චිත්ත සන්තානය තුළ වැඩ විසූහ. චිත්ත සන්තානය බිඳීයන අවස්ථා උදා වූවද, ඒ කිසිවකින් සසල නොවීය. **සුන්දරී පරිබ්‍රාජිකාවගේ මරණය, චින්චි මානවිකාව** මහ පිරිස් මැද කරනු ලැබූ අභූත චෝදනාව, සුප්‍රබුද්ධ රජතුමා උන් වහන්සෙට එල්ල කළ දෝෂාභියෝග, **දේවදත්ත හිමියන්ගේ** අසත් පුරුෂ ක්‍රියාවන් කිසිවක් හමුවේ මදකුදු කෝපයක්, කළකිරීමක් අප්‍රසාදයක් හට නොගැනීම කෙතරම් උදාර ද? උන් වහන්සේගේ චිත්ත සන්තානය, පුරා උතුරා දෝරගලා යන්නට වූයේ **දයාව, කරුණාව, මෛත්‍රිය හා උපේක්ෂාවයි.**

මාගන්දිය යුවල, සිය දියණියගේ රූ සපුවෙන් ද, කොසොල් රජු, බුදුන් වහන්සේට ඥාතීත්වයක් ඇති කර ගැනීමේ අදහසින් ශාක්‍ය වංශිකයන් සරණපාවා ගැනීමෙන්ද, අභයරාජ කුමාරයා බුදුන් වෙත පැමිණ බුදු වදන්වලින්ම පරාජය කිරීමට දැරුවූ වූ උත්සාහයන් හමුවේ ද බුදු පියාණන් වහන්සේ මුලා නොවූහ. ඔවුන් ගත්තා වූ සියලු අනපේක්ෂිත ලෙස ව්‍යාර්ථ විය. රාග, ද්වේශ, මෝහ වඩවන විසූක දර්ශන රජයන ලොවක, මිනිසෙකුට මෙසේ වික්ෂිප්ත නොවුන මනෝ භාවයකින් යුතුව, අකම්පිතව සිටීමට හැකිවීම කෙතරම් **ආශ්චර්යාත්මක කුසලතාවක් ද?**

මෙවන් අසිරිමත් කුසලතාවයක් බුදුන් වහන්සේට උරුම වූයේත්, වසර 45 ක් පුරා බාධක අභියෝග ශමුවේ අභීතව ශාසනික මෙහෙවර ඉටු කිරීමට අයෝමය ශක්තියක් ලැබුවේත්, උන් වහන්සේ සියලු කෙලෙස් ප්‍රහාණය කළ බැවිනි. අටලෝ දහමින් කම්පා නොවී, වික්ෂිප්ත, විපරිත සමාජයක වාසය කළ හැක්කේ ද මෙවන් උත්තමයෙකුට පමණි. බුදු පියාණන් වහන්සේගේ මෙම විශිෂ්ඨ ගුණය පෙළ දහමෙහි දක්වා ඇත්තේ **අරහං ගුණය** ලෙසයි.

1. අරහං බුදු ගුණය

බුදු රජාණන් වහන්සේගේ **අරහං ගුණය** සංක්ෂිප්ත වශයෙන් සළකා බලන කළ පහත සඳහන් කරුණු ඔස්සේ දෘෂ්‍යමාන වෙයි. ප්‍රඥාවන්තයින්ට එය විනිවිද දැකීම අසීරු නොවනු ඇත.

- බුදු රජාණන් වහන්සේ රාග, ද්වේශ, මෝහ පදනම් කොට ඇති සියලු කෙලෙසුන් ප්‍රහාණය කළ හෙයින්ද,
- නිර්වාණාවබෝධයට පරම සතුරු වූ දස බිම්බරක් මාර සේනාව පරාජය කළ හෙයින්ද, සංසාරය ගොඩනගන තෘෂ්ණාව නමැති වඩුවාගේ අවිද්‍යාව, සංස්කාර, විඥාන, නාම රූප ආදී වූ සියලු මෙවලම් බිඳ දැමූ හෙයින්ද,
- රහසින්වත් පව් නොකිරීමෙන් සියලු දෙව් මිනිසුන්ට විවෘතව, අවංකව, ඍජුව වැඩ සිටි හෙයින් ද,
- මනුලොව මිනිසාගේ සිට අකනිට්ඨක බඹලොව මහ බඹුන් දක්වා, සියලු දෙවි මිනිසුන්ගේ ආමිස, ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට මෙන්ම එම පූජාවන් මහත් ඵල මහානිශංස කිරීමට අතිශයින්ම සමත්වූ හෙයින්ද, ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වන සේක.

***

2. සම්මා සම්බුද්ධ බුදු ගුණය

බුදු පියාණන්වහන්සේ ජීවිතය හා ලෝකය පිළිබඳව සැබෑ තතු අවබෝධ කර ගැනීම සඳහා කැප නොකළ සම්පතක් නැත. ඇට, ලේ, මස්, නහර සහ ජීවිතය මෙන්ම ඔටුනු පැළඳී රාජ්‍ය පවා කැප කරමින් ඉදිරියටම ආ මෙම ගමන් මග විටෙක **ශෝචනීයය.** විටෙක **ත්‍රාසජනකය.** විටෙක **තුන් ලොවම කම්පා කරවන සුළුය.** වෙස්සන්තර ආත්ම භවයේදී අඹු දරුවන් දන්දීම, දහම් සොඬ ජාතකයේදී එක් බණ පදයක් ඇසීම සඳහා ජීවිත පූජා කිරීමේ අරමුණනේ යක්ෂයාගේ කටට පැනීම, **සත්‍ය පාරමිතාව** පුරන අවධියේදී මිනීමස් කන පෝරිසාදගේ බිලි පූජාව සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත් වීම. **ක්ෂාන්ති වාදී ජාතකයේ** භාවනායෝගීව සිටියදී රජ අණ පරිදි ලද

දරුණු වදහිංසා හමුවේ වුවද, අකම්පිතව මරණයට මුහුණ දීම, මෙත්ත පාරමිතාව වැඩීමේදී, චූල ධර්මපාල ලෙසින් රජ කුමරෙකු ලෙස ඉපිද සත් මස් වියේදීම මරණයට මුහුණ දීමේ දී, මරණයට අණ දුන් පිය මහ රජුටත්, දරු සෙනෙහසින් වැළපෙන මෑණියන් වහන්සේටත්, ගෙල සිඳීමට තමා අබියසට කඩුව අතැතිව පැමිණ සිටින වධකයාටත් එක ලෙස මෙත් සිත පැතිරවීම **ආදී සිදුවීම් කෙතරම් සංවේදී ද?** සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ අතට පත් සක්විති රාජ්‍ය පදවිය පවා ගෙල වැකුණ සර්ප කුණක් සේ ඉවත ලා **මහාභිනිෂ්ක්‍රමණය** කළ අයුරු **කෙතරම් ශ්‍රේෂ්ඨ ද?**

එකල චින්තන ශක්තිය දියුණු කර තිබූ දහස් ගණන් සිසුන්ට ආචාර්ය වූ, එමෙන්ම ආචාර්යවරුන්ට ප්‍රාචාර්ය වූ **ආලාර කාලාම, උද්දකාරාම පුත්ත** වැන්නවුන් පවා මවිත කරවීමට සමත් **අවබෝධයක්, නුවණක්, චින්තන ශක්තියක් අප්‍රතිහත ධෛර්යයත්** සිදුහත් තවුසාණන් සතුවීම **කෙතරම් සුවිශේෂී ද?**

එදා විමුක්තිය සොයා යන පිරිස් ශරීරයට දුක් දෙමින් අත්තකිලමතානු යෝගය අනුගමනය කළද, තමන් වහන්සේ සොයා යන **"සත්‍යය"** නොමැති බව අවබෝධ වීමෙන්, තමන් වහන්සේ හුදකලාවේම සත්‍ය ගවේෂණය කරන බවට තමාටම ප්‍රතිඥා දී, නේරංජනා ගඟ අසලට පැමිණීම **කෙතරම් අධිෂ්ඨාන පූර්වකද?**

එහිදි සුජාතා දේවිය විසින් පිළිගැන්වූ කිරි ආහාර වළඳා, සොත්තිය බමුණා විසින් පිළිගැන්වූ කුස තණ අට මිටද රැගෙන ඇසතු බෝමුල අසලට පැමිණි සිදුහත් තවුසාණෝ චතුරංග සමන්නාගත වීර්ය අධිෂ්ඨාන කොට යුධ පිටියට පිළිපන්හ. **එතැන් සිට තම හුස්ම (ආශ්වාස ප්‍රාශ්වාස) කෙරෙහි සිත ඒකාග්‍ර කළ උන්වහන්සේ ඒ ඔස්සේම ගොස් සකලවිධ ඥාන බල සාක්ෂාත් කරමින් සමස්ත කෙලෙස් මාර සේනාව බිඳ හැර, කිසිවෙකුගේ උපදේශයකින් තොරව, පසුවදා හිරු උදාවනවාත් සමඟ ජීවිතය සහ ලෝකය පිළිබඳව සියලු තතු අවබෝධ කළ සේක. එම තතු ජනනය කරන හේතු ප්‍රත්‍යන්ද, ඒවා ඉක්මවා යාමේ ක්‍රමවේදයද පසක් කරමින් "සම්මා සම්බුද්ධත්වයට" පත්වූ සේක.**

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අවබෝධ කළයුතු **"දුක නම් වූ ආර්ය සත්‍යය"** ගුරු උපදේශ නැතිවම අවබෝධ කොට වදාළ සේක. ප්‍රහාණය කළ යුතු **"දුක හටගැනීම"** නම් වූ **ආර්ය සත්‍යය** ගුරු

උපදේශ නැතිවම ප්‍රහාණය කොට වදාළ සේක. සාක්ෂාත් කළ යුතු **"දුක නැතිවීම" නම් වූ ආර්ය සත්‍යය** ගුරු උපදේශ නැතිවම ප්‍රහාණය කොට වදාළ සේක. ප්‍රගුණ කළ යුතු **"දුක නැතිවීමේ මඟ" නම් වූ ආර්ය සත්‍යය,** ගුරු උපදේශ නැතිවම ප්‍රගුණ කොට වදාළ සේක. මෙම චතුරාර්ය සත්‍ය ධර්මයන් **සත්‍ය ඥාණ, කෘත්‍ය ඥාණ, කෘත** ඥාණ වශයෙන්ද, පරිවර්තන 3 කින් යුතුව ආකාර දොළසකින් යුතුව ගුරු උපදේශන නැතිවම අවබෝධ කොට වදාළ නිසා **සම්මා සම්බුද්ධ වන සේක.**

මෙසේ ගුරු උපදේශ රහිතව කිසිදු බාහිර සහායක් නොමැතිව ලොව සැබෑ තත්ත්වය පරිපූර්ණ වශයෙන් පසක්කොට, එම තතු ඉක්මවා උත්තරීතර විමුක්තිය කරා යෑමේ **සෘජු එකම මඟ** හෙළි කර ගැනීමට ද බුදු පියාණන් වහන්සේ සමත් වූ සේක. පෙළ දහමෙහි මෙම අද්විතීය කුසලතාවය හුවා දක්වා ඇත්තේ **"සම්මා සම්බුද්ධ"** යනුවෙනි.

බුදු රජාණන් වහන්සේගේ මෙම **"සම්මා සම්බුද්ධ"** ගුණ සංක්ෂිප්ත වශයෙන් සළකා බලන කළ පහත සඳහන් කරුණු ඔස්සේ දෘෂ්‍යමාන වෙයි. ප්‍රඥාවන්තයෙකුට මෙම කරුණු ඔස්සේ **"සම්මා සම්බුද්ධ ගුණය"** ද විනිවිද දැකීම අසීරු නොවනු ඇත. එම උතුම් ගුණය ද සංක්ෂිප්තව මෙසේ දැක්වේ.

- අවබෝධ කළයුතු සියලුම ඥානයන් ගුරු උපදේශ රහිතව ස්වයම්භූ ඥානයෙන් පරිපූර්ණ වශයෙන් අවබෝධ කළ හෙයින් ද
- විදර්ශනා ප්‍රඥාවෙන් විනිවිද දතයුතු සියල්ල ස්වකීය පරිඥා ප්‍රඥාවෙන්ම පිරිසිදු අවබෝධ කළ හෙයින් ද,
- සීල, භාවනා, මාර්ගයෙන් ප්‍රහාණය කළ යුතු ධර්ම පරිපූර්ණ ලෙස ප්‍රහාණය කිරීමෙන්ද,
- තමා තුළින් සාක්ෂාත් කළ යුතු ධර්ම, තමන් වහන්සේ තුළින්ම සාක්ෂාත් කිරීමෙන්ද,
- සිය සන්තානය තුළ වැඩිය යුතු ධර්ම පූර්ණ වශයෙන් ප්‍රගුණ කිරීමෙන් ද,
- සංසාරය තුළ පවතින දුකත්, දුක හටගන්නා ආකාරයත්, දුක නැතිවන ආකාරයත්, දුක නැති කිරීමේ පිළිවෙතත් පරිපූර්ණ වශයෙන් අවබෝධ කිරීමෙන් ද,

- **දුක් නම් වූ ආර්ය සත්‍ය පරිපූර්ණ වශයෙන්ම අවබෝධ කිරීමෙන් ද,**
- **දුක්ඛ සමුදය නම් වූ ආර්ය සත්‍යය සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කළ හෙයින්ද,**
- **දුක්ඛ නිරෝධ නම් වූ ආර්ය සත්‍යය සම්පූර්ණ වශයෙන්ම සාක්ෂාත් කළ හෙයින්ද,**
- **දුක්ඛ නිරෝධ පටිපදා නම් වූ ආර්ය සත්‍යය** සම්පූර්ණ වශයෙන්ම ප්‍රගුණ කිරීමෙන් ද, භාග්‍යවතුන් වහන්සේ "**සම්මා සම්බුද්ධ**" නම් වන සේක.

***

3. විජ්ජාචරණ සම්පන්න බුදු ගුණය

මෙසේ සම්මා සම්බුද්ධත්වයට පත්වීමේදී ප්‍රගුණ කර සාක්ෂාත් කරගත් කුසලතා සම්භාරය ආධ්‍යාත්මික මෙන්ම, භෞතික, විද්‍යාත්මක සහ තාක්ෂණික න්‍යායයන් සියල්ල අභිබවා ගොස් ඇත. මිනිස් සිත මෝහනය කරමින්, තාක්ෂණ උපකරණ භාවිතයෙන් විද්‍යාඥයින් විසින් පරීක්ෂණ, නිරීක්ෂණ ඔස්සේ ගොඩනගනු ලබන කල්පිත, බුදු පියාණන් වහන්සේ සාක්ෂාත් කොට වදාළ විද්‍යාව හා තාක්ෂණය හමුවේ අද නිශ්ප්‍රභා වෙමින් පවතී.

බුදු රජාණන් වහන්සේ නිතරම තමන් වහන්සේගේ අවබෝධයට අනුකූලව ජීවතය ගත කළ සේක. උන් වහන්සේ නිරන්තරයෙන් ම **උතුම් සීලයෙන්ද, උතුම් වූ සමාධියෙන්ද, උතුම් වූ ප්‍රඥාවෙන්ද සමන්විතව වැඩ සිටි සේක.** මනා සිහි නුවණින් තොරව ගතකෙරෙන එක් මොහොතක් හෝ බුදු පියාණන් වහන්ස්ගේ ජීවන රටාව තුළ නොවීය. සූත්‍ර දේශනාවන්හි "චරණ" යනුවෙන් පෙන්වා වදාරන ලද්දේ මෙම උතුම් විහරණයයි.

ඒ අනුව අනුපමේය විද්‍යා ඥාණයත්, ඊට අනුකූල විහරණයත් නිසා උන් වහන්සේ "**විජ්ජාචරණ සම්පන්න**" වන සේක. මෙහිදී බුදු පියාණන් වහන්සේ අවබෝධ කරගත් අට වැදෑරුම් විද්‍යා **(අෂ්ඨ=විද්‍යා) සම්පත්තියත් පසළොස්** වැදෑරුම් චරණ ධර්ම සම්පත්තියත් සංක්ෂිප්තව මෙසේ දක්විය හැක.

1. විදර්ශනා ඥාණ දර්ශනය
2. මනෝමය ඉද්ධි ඥාණය
3. ඉද්ධිවිධ ඥාණය
4. දිබ්බසෝත ඥාණය
5. පරචිත්ත විජානන ඥාණය
6. පුබ්බේනිවාසානුස්සති ඥාණය
7. චුතුපපාද ඥාණය
8. ආසවක්ඛය ඥාණය

ධ්‍යාන උපදවා ගැනීමේ පිළිවෙත ලෙස බුදුන් වහන්සේ පෙන්වා වදාළ චරණ ධර්ම 15 සංක්ෂිප්තව මෙසේය.

- කල්‍යාණ මිත්‍ර බුදු පියාණන් වහන්සේ හමුවීම.
- උන් වහන්සේගේ ධර්මය අසන්නට ලැබීම.
- ශ්‍රද්ධාවට පැමිණීම.
- කාම සම්පත් අත්හැරීමේ නෙක්ඛම්ම සංකල්පනාව
- පැවිද්ද සහ උපසම්පදාව
- ආර්ය වූ සීලය
- ආර්ය වූ ඉන්ද්‍රිය සංවරය
- ආර්ය වූ සති සම්පජඤ්ඤය
- ආර්ය වූ සන්තුෂ්ඨිය
- භෝජන මාත්‍රඥතාව
- සමථය වැඩීම (නීවරණ ප්‍රහාණය)
- 12-15 ධ්‍යාන 4 උපදවා ගැනීම

බුදු රජාණන් වහන්සේ මෙම සියලුම චරණ ධර්ම පාදක කොට ගනිමින් ම සියලු ලෝක සත්ත්වයන්ගේ අතීත ජීවිත දැකීමේ හැකියාව වූ **පුබ්බේනිවාසානුස්සති ඥානය ද**, සියලු ලෝක සත්ත්වයන් උපදින ආකාරයද, කර්මානුරූපිව චුතවන ආකාරයද දැනීමේ හැකියාව වූ **චුතූපපාද ඥානය** ද ලබාගත් සේක. දුර තිබෙන රූපයන්ද ළඟ තිබෙන රූපයන්ද දැකීමේ හැකියාව වූ **දිබ්බචක්ඛු ඥානය ද**, දුර තිබෙන ශබ්දයන්ද ළඟ තිබෙන ශබ්දයන්ද ඇසීමේ හැකියාව වූ **දිබ්බ සෝත ඥානය** ද ලබාගත් සේක. අහසින් ගමන් කිරීම ද පොළොවෙන් කිමිදී වෙනත් ස්ථානයකින් මතුවීම ද ජලය මතුපිට සක්මන් කිරීම ද විනිවිද නොපෙනී ගමන් කිරීම ආදී අනන්ත ප්‍රාතිහාර්යයන්ගෙන් යුතු **සෘද්ධිවිද ඤාණය** ලබාගත් සේක. සියලු ආශ්‍රවයන් මුළුමනින්ම නැතිකොට ඥානලෝකය උපදවාගෙන **ආසවක්ඛය ඤාණය** ලබාගත් සේක. මෙසේ අනන්ත ඤාණයෙන්ද අනන්ත සීලයෙන් ද අනන්ත සමාධියෙන් ද අනන්ත ගුණයෙන් ද සමන්විත නිසා බුදුරජාණන් වහන්සේ "**විජ්ජාචරණ සම්පන්න**" වන සේක.

මෙවන් ඥාන සාගරයකින් සමන්නාගත තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අසීමිත අවබෝධය, කෝටි ලක්ෂයක් සක්වල විභූතියට පත් කරවමින් වසර දස දහසකට අධික කාලයක් විශ්වය තුළ ජීවමානව පවතී. එම කාල පරාසයේ මධ්‍ය භාගයේදී ඔබ අප කවුරුත් අනිකුත් සත්ත්වයින්ට නැති වාසනා බල ලබමින් මිනිසත් භවයක් උරුම කරගත්තෝ වෙමු. මෙවන් භාග්‍යයක් හමුවේ අපගේ දෙනෙත් අභියස දිදුලන **ශ්‍රී සද්ධර්මය** දැකීමට **ඔබ අප වීර්ය නොගන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක් ද?**

***

4. සුගත බුදු ගුණය

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ සුන්දර වූ නිවන් මඟ සොයාගෙන ඒ ඔස්සේ පැහැදිලි ගමනාන්තය දැක සුන්දර නිවනට වැඩම කළ නිසා "**සුගත**" වන සේක. ඒ මඟ සකළ ලෝ සතුනට පෙන්වා වදාළහ. මෙම සුගත ගුණය ද පරිපූර්ණ ලෙස විග්‍රහ කිරීම අසීරු වුවද, සංක්ෂිප්තව මෙසේ දැක්විය හැකිය.

බුදුන් වහන්සේ **මිථ්‍යා මාර්ග** වලින් ඉවත් වී යහපත් වූ නිර්භය වූ ඍජු මාර්ගයක සුන්දර වූ ගමනාන්තය දකිමින් සන්සුන්ව වැඩම කළ හෙයින් "**සුගත**" නම් වන සේක.

මෙහි මිථ්‍යා මාර්ග යනුවෙන් සඳහන් වූ අත්තකිලමතානුයෝගයත්, කාමසුකල්ලිකානු යෝගයත් මෙන්ම ශාස්වත දෘෂ්ඨිය සහ උච්ජේද දෘෂ්ඨිය ද අතහැර ඇත, නැත යන කිසිවක මුලා නොවී සුන්දර වූ මඟ ඔස්සේම සසර ගමනේ ගමනාත්තයටම ළඟා වූ හෙයින්ද "**සුගත**" නම් වන සේක.

මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය මෙම නිවැරදි මාවතයි. ඉහත සඳහන් මිත්‍යා මාර්ගවලට නොඑළඹී මෙම මැදුම් පිළිවෙතෙහි ගමන් කළ හෙයින් "**සුගත**" නම් වන සේක.

මෙහි යහපත් වූ නිර්භය වූ පරිපූර්ණ වූ ගමනාන්තය උතුම් අමා මහ නිවනයි. එහි සෝක නැත. **අසෝකය.** කෙලෙස් රජස් නැත. **විරජය.** බිය රහිත ස්ථානයකි. **ඛේම ය.** මෙවන් වූ නිවනට බුදු පියාණන් වහන්සේ **සංවරව** වැඩම කළ හෙයින් **සුගත** නම් වන සේක.

මෙහි "**සංවරව**" යනුවෙන් අදහස් වන්නේ බුදුරජාණන් වහන්සේ නොපැහැදුණු අය පැහැදෙන ආකාරයටද පැහැදුණු අයගේ පැහැදීම වැඩි වන ආකාරයටද දුටු දුටුවන්ගේ නෙත් සිත් නිවී සැනසී යන ආකාරයටද මිහිකත සනස සනසා සුන්දර ලෙස වඩින ගමන් විලාශයයි. එහෙයින්ද බුදුන් වහන්සේ "**සුගත**" නම් වන සේක.

විවිධ ලෝකයන් අතර වල්මත් වී මිථ්‍යා දෘෂ්ඨි, මිථ්‍යා සංකල්පනා, මිථ්‍යා විශ්වාස ආදී වූ මඩගොහොරින් එතෙර වීමට නොහැකිව සිටින අසරණ ජනතාවට, යා යුතු මග සොයා හෙළි පෙහෙළි කර දීම උන් වහන්සේ සතු වූ සුවිශේෂී කුසලතාවයකි. මෙම කුසලතාවය ද "**සුගත**" නමින් හැඳින්වේ.

***

5. ලෝක විදූ බුදු ගුණය

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, **සියලු බ්‍රහ්ම ලෝකද,** සියලු දිව්‍ය ලෝකද, මිනිස් ලෝකද, සියලු ප්‍රේත ලෝකද, සතර අපායද මේ සියලු ලෝකයන් අවබෝධ කොටගෙන සියලු ලෝකවලින් නිදහස් වූ නිසා "**ලෝක විදූ**" වන සේක.

සියලු ලෝකවල සැබෑ තතු දන්නා, දක්නා උන් වහන්සේ මේ ලෝකයන් හටගන්නා ආකාරයන් මෙන්ම ලෝක විනාශ වන ආකාරයද, මෙම ලෝකයන් නිරුද්ධ කිරීම සඳහා අදාළ ප්‍රතිපදාව ද අවබෝධ කළ හෙයින් "**ලෝක විදූ**" නම් වන සේක.

සත්ත්වයින් මෙම ලෝකවල උපදින ආකාරයද මෙම ලෝකවලින් චුත වන ආකාරයද ඒ සඳහා අදාළ වන ප්‍රතිපදාව ද පරිපූර්ණ වශයෙන් අවබෝධ කළ හෙයින් "**ලෝක විදූ**" නම් වන සේක.

මෙහි සියලු ලෝකයන් යන්න මෙසේ දැක්වෙයි.

1. නාම, රූප
2. පඤ්චුපදානස්කන්ධ
3. ඇස් කන් ආදී බාහිර හා අභ්‍යන්තරික ආයතන දොළස ද
4. පඨවි ආදී ධාතූන් සය ද
5. එකොළොස් වැදෑරුම් කාම භූමීන් ද
6. එකොළොස් වැදෑරුම් රූප භූමීන් ද
7. සිව් වැදෑරුම් අරූප භූමීන් ද ලෝක නම් වෙයි.

මෙම සියලුම භූමී සහ බාහිර, අභ්‍යන්තරික ආයතනද නාම රූප ආදියෙන් සැදුම්ලත් මෙම පංචස්කන්ධයයන් ද බුදු නෙතින් දුන දක ලෝක ලෙසින් හඳුන්වා දී ඇත්තේ මෙම සියලුම ලෝකයන්හි පවත්නා සංකීර්ණ ක්‍රියාවලිය මෙන්ම, එම ලෝකයන්හි ඇති වීම සහ නැතිවීම තත්ත්වාකාරයෙන්ම අවබෝධ කරගැනීමෙන් පසුවය.

මූලික වශයෙන් ප්‍රතිසන්ධි තල 31 අවබෝධ කරගත් බුදුපියාණන් වහන්සේ ඒ ඒ ලෝක ධාතූන්වල සත්ත්වයින් උපදින ආකාරයත්, අනුග මනය කළ යුතු ප්‍රතිපදාවත් සකල ලෝ වැස්සන්ට පෙන්වා දුන් සේක. මෙම ලෝකයන් අතර වල්මත් වී මිථ්‍යා දෘෂ්ඨි ඔස්සේ අඳුරේ අත පත

ගාන අසරණ ජනතාවට යා යුතු මඟ සොයා හෙළි පෙහෙළි කරදීමේ මෙම ශක්‍යතාවය ලැබිය හැක්කේ සම්මා සම්බුදුවරයෙකුට පමණි. මේ බුදු පියාණන් වහන්සේගේ "**ලෝක විදූ ගුණයයි.**"

***

6. අනුත්තර පුරිස ධම්ම සාරථී බුදු ගුණය

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ **සෘද්ධි ප්‍රාතිහාර්යයෙන්** අනුන්ගේ සිත් දකිමින්, දහම් දෙසීම නම් වූ **ආදේශනා ප්‍රාතිහාර්යයෙන්** ද **අනුශාසනා ප්‍රාතිහාර්යයෙන්** ද පින් ඇති දෙව් මිනිසුන්ව දමනය කොට අමා මහ නිවනට පමුණුවා වදාළ නිසා "**අනුත්තර පුරිස ධම්ම සාරථී**" වන සේක.

බුදු පියාණන් වහන්සේ වෙත පැමිණි ඇතැමුන් දමනය වූ ඉඳුරන් ඇත්තන් නොවේ. ඇතැම්හු අකීකරුය. කෝපාවිෂ්ඨය. දෝෂාරෝපණයට හෝ වාදාරෝපණයට සූදානමින්ය. නො එසේ නම් චෝදනා කරමින් අභියෝග කරමින් ආයුධ සන්නද්ධවය. එහෙත් තව කෙනෙක් ආවේ හඬා වැලපෙමිනි. නොඑසේ නම් සිහිසුන්ව උමතුවෙනි. මේ සැම ඉදිරියේ බුදු පියාණන් වහනසේගේ ප්‍රතිචාරය ඉතා සන්සුන් විය.

ඇතැම් විට ඔවුන් දමනය කිරීමට අකුසලයෙහි විපාක දේශනා කරයි. කුසලයෙන් ආනිශංස දේශනා කරයි. ඒ මුදු මොලොක් ක්‍රම දෙකම භාවිතා කරයි. (උදා : අංගුත්තර නිකාය කේසී සූත්‍රය) එහෙත් එය නොගැළපෙන අවස්ථාවලදී බුදුන් වහන්සේ **සෘර්ධි ප්‍රාතිහාර්ය, ආදේශනා ප්‍රාතිහාර්ය, අනුශාසනා ප්‍රාතිහාර්ය** යොදා ගනී. ඒ අනුව විශ්මිත, විචිත්‍ර දෑ කිරීමටත් අන් අයගේ සිත් කිමටත් යහපත අයහපත අනුශානසා කිරීමටත් ඇති ශක්‍යතාව විශ්මිතය. (දීඝ නිකාය- කේවඩ්ඪ සූත්‍රය) එක් එක් අවස්ථාවට ගැළපෙන උපාය මාර්ග අනුගමනය කරමින් ඔවුන් දමනය කරමින් ගැළපෙන සේ ධර්මය දේශනා කරමින් මහා කරුණාවෙන් යුතුව ඉහළම මග ඵලය දක්වා ඔවුන් හික්ම වූහ. මෙය උන් වහන්සේ සතුව තිබු අසහාය ආචාර්යත්වයේ විශිෂ්ඨ කුසලතාවයකි. ඒ අනුත්තරෝ පුරිසධම්ම සාරථී ගුණයයි. **ආලවක,**

අංගුලිමාල, චින්චි මානවිකාව, පටාචාරා කථා පමණක් නොව නාලාගිරි වැනි හස්ති රාජයින්ගේ සහ විෂ සහිත නාගයින් පිළිබඳ කථා පුවත් මෙයට කදිම නිදසුන්ය.

මෙසේ බුදු පියාණන් වහන්සේ නොහික්මුණු සත්වයන් හික්මවා ධර්ම මාර්ගය පෙන්වා දී නිවන වෙත යොමුකරන හෙයින් **"අනුත්තර පුරිස ධම්ම සාරථී"** නම් වන සේක.

***

7. සත්ථා දේව මනුස්සානං බුදු ගුණය

දෙව් මිනිස් දෙපාර්ශවයටම සසර දුකින් නිදහස් වීම පිණිසත්, නිර්වාණාවබෝධය පිණිසත් යා යුතු නියම මඟ පෙන්වන ශ්‍රේෂ්ඨතම ගුරුවරයා යන අදහසින් **ශාස්තෘ** හෙවත් **සත්ථා** නම් වෙයි. සැමට සියලු දුකින් නිදහස් වීම පිණිස නිර්වාණ ධර්මය සාක්ෂාත් කිරීම පිණිස නොවරදින එකම මඟ පෙන්වා වදාළ ශ්‍රේෂ්ඨතම උතුමාණෝ යන අදහසින් බුදු පියාණන් වහන්සේ **"සත්ථා දේව මනුස්සානං"** නම් වන සේක.

ධර්මය අවබෝධ කළ හැකි දෙව් බඹුන් මෙන්ම මිනිසුන් බුදුපියාණන් වහන්සේගේ කරුණා නෙතට හසුවිය. ඔවුනට දෙසූ ධර්මය සූත්‍ර පිටකය පුරා අන්තර්ගතව ඇත. එක් එක් පුද්ගලයාට ගෝචර වන පරිද්දෙන් දහම් කරුණු අවබෝධ කරවීමට බුදුන් වහන්සේ සතු කුසලතාවය අද්විතීයය. ඒ සඳහා බුදුපියාණන් සතුව තිබූ සුවිශේෂී යාන්ත්‍රණය මාහැඟිය. ඒ ඒ පුද්ගලයාගේ දෛනික ජීවන රටාව අවබෝධ කරගත් උන් වහන්සේ එතුළින්ම ධර්ම සාකච්ඡාවට ප්‍රවිශ්ඨ වීම ස්වකීය අභිමතාර්ථ සාධනය පිණිස කෙතරම් දුරට ඉවහල් වූයේ ද යන්න බෞද්ධ ඉතිහාසය දෙස විවෘත මනසකින් බලන කා හට වුවද මනා සේ පැහැදිලි වනු ඇත.

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ පින් ඇති දෙවියන්ට ද නුවණැති මිනිසුන්ට ද සසර කතරින් එතෙර වීම පිණිස මාර්ගය පෙන්වා වදාළ සේක. මෙවැනි අසහාය ශක්තියක් බුදු පියාණන් වහන්සේ සතු වූයෙන් **ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයා ලෙසට සමස්ථ විශ්වීය විරුදාවලියට පාත්‍ර වෙමින් ජය කෙහෙළි නැගුණි.** දුක්

විඳින සකළ ලෝ සතුනට සංසාර ගමනේ ගමනාන්තය පෙන්වා දෙමින් එම ගමනාන්තයට ළඟා වීමට ඇති එකම හා ඍජු මාර්ගය හෙළි පෙහෙළි කර දෙමින් විකල්ප මාර්ග ඔස්සේ ගමන් කරමින් අතරමං වන්නන්ට බිය සැක නොමැතිව ගමන් කිරීමට නිවැරදි මඟ පෙන්වනු ලැබුවේ මෙම මාර්ගෝපදේශකයාණන් වහන්සේමය. මෙලෙසින් බුදු පියාණන් වහන්සේගේ **"සත්ථා දේව මනුස්සානං"** ගුණය සංක්ෂිප්තව දැක්විය හැකි අතර එතුළින් යම් පමණකින් හෝ නිවැරදි අවබෝධයක් පාඨක භවතුන්හට ලැබෙනු ඇත.

***

8. බුද්ධෝ බුදු ගුණය

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අවබෝධ කොට වදාළ චතුරාර්ය සත්‍යය ධර්මයන් අන්‍යයන්ටද අවබෝධ කර ගැනීම පිණිස මහා කරුණාවෙන් දේශනා කොට වදාළ නිසා "බුද්ධ" වන සේක.

අල්ප මාත්‍රික ගුරු මුෂ්ඨියකින් තොරව තමන් වහන්සේ අවබෝධ කරගත් **"සත්‍යය"** ලොවට හෙළි කරමින් දුක් විඳින සකල ලෝක සත්ත්වයින් සුගතිගාමී කරවීමට 45 වසරක් පුරා තම සුඛ විහරණ පසෙකලා කැප වූ ආකාරයත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අනභිභවනීය යි. **මෙවන් උත්තරීතර සේවයකට අවතීර්ණ වෙමින් සියලු ලෝක ධාතු මවිත කළ වෙනත් ශ්‍රේෂ්ඨ ජන නායකයෙකු පිළිබඳව සාක්ෂි දැරීමට ඉතිහාසය අපොහොසත් වී ඇත.**

මෙම සුවිශේෂී ශ්‍රේෂ්ඨත්වය නිසාම බුදු පියාණන් වහන්සේ "බුද්ධ" නම් වන සේක. ඒ බුද්ධ නම් වූ ගුණය වඩාත් සාරාංශ ගතකොට මෙසේ දැකිය හැකිය.

- භාග්‍යවතුන් වහන්සේ ස්වකීය අවබෝධය අනුන්ට අවබෝධ කරවනු පිණිස ධර්මය දෙසා වදාළහ.
- දුකින් නිදහස් වූ භාග්‍යවතුන් වහන්සේ අන් අය දුකින් එතෙර කරවීම පිණිස ධර්මය දෙසා වදාළහ.
- සසරින් එතෙර වූ භාග්‍යවතුන් වහන්සේ අන් අය ද සසරින් එතෙර කරවීම පිණිස ධර්මය දෙසා වදාළහ.

- පිරිනිවනට වැඩි භාග්‍යවතුන් වහන්සේ අන් අයද පිරිනිවන්නාහු පිණිස ධර්මය දෙසා වදාළහ.

සුවිශේෂී නායකත්වයක ඇති මෙම ශ්‍රේෂ්ඨ ගුණාංග **බුද්ධෝ** හෙවත් බුද්ධ නම් වනු ඇත.

***

9. භගවා බුදු ගුණය

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ මේ සියලු සම්බුදු ගුණ දරාගැනීමට තරම් **භාග්‍යවන්ත** වන සේක. මහා කරුණාවෙන් සිසිල් වී ගිය හද මඬලක් දරා ගැනීමට තරම් **භාග්‍යවන්ත** වන සේක. හිරු සඳු පරදවන අනන්ත එළිය විහිදුවන ඥාණාලෝකය ලබා ගැනීමට තරම් **භාග්‍යවන්ත** වන සේක. බුදු රජාණන් වහන්සේ **"භගවා"** වන සේක.

බුදුන් වහන්සේ ලොව සියල්ලන්ට වඩා **පුණ්‍යවන්ත** වන සේක. ලොව සියල්ලන්ට වඩා **වාසනාවන්ත** වන සේක. ලොව සියල්ලන්ට වඩා **භාග්‍යවන්ත** වන සේක. ලොව සියල්ලන්ට වඩා **ධෛර්යවන්ත** වන සේක. සකලවිධ ගුණ ධර්මයන්ගෙන් පිරිපුන් උන් වහන්සේ **ගුණ මහානුභාවයෙන්** පිරිපුන් සේක.

බුදු පියාණන් සතු වූ මෙම සියලු කුසලතා සම්භාරයට පාදක වන වෙනත් සාධකයක් වන්නේ දීර්ඝ කාලීන සංසාර ගමනක ගමන් කරද්දී පූර්ණය කරනු ලැබූ සුචරිත ක්‍රියාවන්හි අනුසස් බලයයි. **පරිත්‍යාගය, පරෝපකාරය** වැනි සාධු ධර්ම නිසා සංතානගතව තිබූ අනුපමේය පුණ්‍ය විපාකයන්හි ප්‍රතිඵලයයි. සාමාන්‍ය ලෝකයේ මෙය **වාසනාව** යනුවෙන් ව්‍යවහාර කළ ද **භාග්‍යවන්ත භාවය** යනුවෙන් ධර්මයේ දක්වෙයි. මහා මංගල සූත්‍රයේද **පුබ්බේච කත පුඤ්ඤතා** පස් වන මංගල කරුණ ලෙස පෙන්වා දී ඇත්තේ ද පෙර කරන ලද පින් ඇති බව **භාග්‍යයක්** යන්නයි. මෙම අනුපමේය භාග්‍යය තුළින් උන් වහන්සේ සතු කුසලතා වඩාත් ඔප් නැගෙන්නට විය.

බුදුන් වහන්සේ සිතන, කරන, කියන සියලුම දේ එලෙසින්ම මල්ඵල ගැනෙන්නට වූයේ දෙවියන්, බ්‍රහ්මයන් පවා මවිත කරවමිනි. තීරණ ගැනීමේත් තීරණ ක්‍රියාත්මක කිරීමේත් අද්විතිය බලයක් බුදු පියාණන් වහන්සේ සතු වූහ. ඒ වාසනා ගුණ මහිමයයි. **උත්තරීතර**

භාග්‍යයි. පුරා වසර 45 ක් බුදු පියාණන් වහන්සේ සිය බුදු කිස නිමවා පිරිනිවන්පානා තෙක් කිසිවෙකුට උන් වහන්සේගේ ගමන් මග වලක්වන්නට නොහැකි විය. **බාධක, අභියෝග පැන නැගුණ ද ඒ සියල්ලක් සූර්යයා ඉදිරිපිට පිනිබිඳු මෙන් සිඳී ගියේ බුදු පියාණන් වහන්සේගේ භාග්‍යවන්ත භාවයේ බල මහිමයෙනි.**

බුදු පියාණන් සතුව පැවති **ඓශ්චර්ය භාග්‍යය, ධර්ම භාග්‍යය, යස භාග්‍යය, ශ්‍රී භාග්‍යය, කාම භාග්‍යය, ප්‍රයත්න භාග්‍යය** අද්වීතිය බව තහවුරු කර ගැනීමට බුද්ධ චරිතය නිසි ලෙස පරිශීලනය කර ඇති කිසිවෙකු අපොහොසත් නොවනු ඇත. බුදු පියාණන් වහන්සේ යනු **භාග්‍යවන්ත භාවයේ අග්‍රඵලයයි.** එවන් භාග්‍යයකට හිමිකම් කියන වෙනත් කිසිම නායකයෙකු ලොව පහළ වී ඇති බවට ඓතිහාසික සාක්ෂි ගෙන හැර පෑමට සමත් කිසිඳු ඉතිහාසඥයෙක්, විද්‍යාඥයෙක් මේ දක්වා ලොව පහළ වී නැත. විශ්වය තුළ කිසිදු දෙවියෙකු හෝ බඹෙකු හෝ පහළ වී ඇති බවට කිසිදු සාක්ෂියක් ද නැත. **බුදු පියාණන් වහන්සේගේ මෙම නායකත්වය විශ්වීය අනූපමේය නායකත්වය බවට මේ වන විට ලොව තහවුරු වී හමාරය.**

***

IMMEASURABLE VIRTUES OF BUDDHA

Immeasurable virtues of Buddha have been summarized into nine great qualities in 'Magadha/Pali' languages. As a recital we too tell them either by understanding the meaning or not. Many people never make an effort to understand its meaning. But at present the younger generation seems to be in thirst to make them understand either in Sinhala language or in English languages. So, I hope to share the meaning of nine qualities of Buddha in English as far as possible.

Even today some disciples use to count nine Great qualities of Buddha using "prayer beads". Only by counting without seizing the meaning no one can have the great blessings of them properly, but can have at least a bit of benefit. It is so powerful that no one gets an unprofitable result. When we remind or recite it, if we could see the meaning of each and every qualities of the Buddha, it gives more and more spiritual profits making us astonished. Though it is not easy to describe completely, my attempt will be useful to the readers to grasp a wider meaning at least to a certain extent. When the meaning comes to our mind it makes us comprehensive and the path we follow may be clearly seen.

The First virtue is **'ARAHAM'**. It's a 'Magadha/Pali' word. When we recite without knowing the meaning we cannot grasp it properly. The following brief description will be helpful to the readers to understand at least a bit. Otherwise only the dialect comes to the mind of the reader but not the meaning.

The nine vital qualities of the Buddha have been preached as follows:-

1. Araham,
2. Samma sambuddho,
3. Vijjacarana-sampanno,
4. Sugato,
5. Lokavidu,
6. Anuttaro Purisa Dhamma Sarathi,
7. Sattha-Deva-manussanam,
8. Buddho,
9. Bhagawathi

1. ARAHAM

Here, innumerable virtues have been summed-up into this great quality. Mainly it means that the Buddha had eradicated all the defilements. Defilement in plain language means bad thoughts, bad reactions like **anger, anxiety, hatred, frustration, stress, depression, ignorance, jealousy, gossip, attachment, dogmatism** and so on; The Buddha had eradicated all these impurities not to trace at least a bit. So He is **'Araham'**

The Buddha had got rid of all these and ended re-birth. He had great divine wisdom. He eradicated all impurities. He realized that all living beings would be reborn because of desire and unsatisfied longing. The Buddha destroyed desire as a tree take out from the earth with all its roots. He attained Nibbana. The Buddha inspires us with His qualities. So He is **'Araham'.**

We are born and we die after becoming old and will be born again. This cycle of rebirth repents for every living being. This phenomenon never ends until we attain 'Nibbana'. Once the Buddha clarified and preached the cause of rebirth. **"Ignorance produces desire and unsatisfied desire cause rebirth - Once they are extinguished , rebirth ceases"** The Buddha illuminated the

mind with wisdom excluding ignorance. Attachments of all sorts were totally destroyed and trod along the path to absolute Nibbana by understanding the Four noble Truth. It is the great quality **"Araham"**

In short **"Araham"** is worthy to have any offerings even from Gods and Brahmans. While repeating the word **"Araham"** you may go on reflecting all these great qualities and get blessings of them.

When we understand these great qualities, we develop confidence. It is called Saddha: the faith.It makes us accept the teaching of Buddha and go along the path He preached. When we practice His noble teaching and lead our lives accordingly, that too becomes an offering **'a pooja'** to the Buddha. This offering is called **"Prathipaththi Pooja"** which is much more valuable than the offering of things **"Amisa Pooja".** It is the leading of a virtuous life developing good moral qualities.

පස්කම් සැපයෙන් වෙන්ව, අකුසලයන්ගෙන් බැහැරව, පංච නීවරණ යටපත් කළ විතක්ක විචාරයෙන් යුතුව, කුසල් අරමුණක සිත පිහිටුවා සතුටු සුවයෙන් <u>ප්‍රථමධ්‍යානයට</u> පත්ව සිටීමත්, විතක්ක විචාරයෙන් තොරව විතත ඒකග්‍රතාවයෙන් යුතුව උපන් සතුට හා සැපය ඇති <u>ද්විතීය ධ්‍යානයට</u> පත්ව සිටීමත්, සිතේ සතුටෙහිත් නොඇලී

මධ්‍යස්ථව මනා සිහි නුවණින් හා කායික සුවයෙන් යුතු **තෘතීය ධ්‍යානයට** පත්ව සිටීමත්, කායික මානසික ප්‍රීති සුවයෙන් මිදී මධ්‍යස්ථ පිරිසිදු චිත්ත ඒකග්‍රතාවයට පැමිණ **චතුර්ථ ධ්‍යානයට** පත්වීමත් **සම්මා සමාධිය** නම් වෙති.

***

ධර්මාවබෝධය ලැබීමට සසර පින් පුරා ඇති අතලොස්සක් පමණ පුද්ගලයින් සොයා බුදු පියාණන් වහන්සේ ඔවුන් කරා පා ගමනින්ම වැඩම කළ අවස්ථා බොහෝය. ස්වකීය චාරිකා **තුරිත, අතුරිත** වශයෙන් වර්ගීකරණය කරගත් බුදුපියාණෝ අප්‍රමාදීව සුදුස්සාහට ධර්මාවබෝධය ලබාදීම පිණිස වැඩම කළ අතර, පුරා වසර 45 ක් දහසකුත් එකක් බාධක, අභියෝග මැදින් හුදී ජනතාවගේ යහපත පිණිස ම කටයුතු කළ ආකාරය බොහෝ විට සංවේදී හදවතකින් දරාගත නොහැක්කේම ය.

මහා රාජ්‍යයන්හි රජවරු, මැති ඇමතිවරුන් මෙන්ම ඈත ගම් නියම් ගම්වල වෙසෙන **සුනිත, සෝපාක** වැනි අසරණයින්ට ද ජීවිතයේ යායුතු මග නොදක ඉබා ගාතේ දුවන **අම්බපාලී, සිරිමා** වැනි වෛශ්‍යාවන්ට ද මහා බලසම්පන්න **ආලවක** වැනි දරුණු යක්ෂයින්ට ද සිහිවිකල් වූ **පටාචාරා, කිසාගෝතමී** වැනි අසරණ වූ කාන්තාවන්ට ද **අංගුලිමාල** වැනි දරුණු මිනීමරුවන්ට ද **නාලාගිරි** වැනි බීමත්ව තමන් වහන්සේ අභිමුවට එන හස්ති රාජයින්ට ද විෂ ඝෝර නාගයින්ට ද කසී භාරද්වාජ වැනි ගොවියන්ට ද විවිධ මත දරණ බමුණන්ට ද මට්ටකුණ්ඩලී වැනි මරණය අබිමුව අසරණ වූ දරුවන්ට ද මහා කරුණාවෙන් යුතුව **එක ලෙස පිහිට වූ ආකාරය කෙතරම් ආශ්චර්යමත් ද?**

දුක් විඳින සකල ලෝ සතුන් කෙරෙහි පතල වූ මහා කරුණාවෙන් යුතුව ඔවුනට චතුරාර්ය සත්‍ය අවබෝධ කරවීමට බුදු පියාණන් වහන්සේ වසර 45 ක් පුරා ගත්තා වූ වෙහෙස මෙන්ම ඒ ඒ ව්‍යවස්ථවික තත්ත්වයට ගැළපෙන පරිදි සකසාගත් සැලැස්ම තුන් ලොවම මවිත කරවන සුළුය. **ඒ, ශාස්තෘ භූමිකාව තුළ ස්ථාපිත වී තිබුණ සුවිශේෂී ක්‍රමවේදයයි.** රජ කෙනෙකු අභියස දී රාජ්‍ය තන්ත්‍රය පිළිබඳ ප්‍රවීණයෙකි. ගොවියෙකු අභියසදී දක්ෂ ගොවියෙකි. ගවයන් පාලනය කරනෙකු ඉදිරියේ දක්ෂ ගව පාලකයෙකි. අශ්වයන් පාලනය කරන්නෙකු ඉදිරියේ දක්ෂ අශ්ව පාලකයෙකි. වරෙක විසකුර නාග

රාජයෙකු සිටින ගිනිහල් ගෙයක පවා ලැගුම් ගත්තේ පෙර පින් ඇති පරිබ්‍රාජකයෙකුට දහම් මග අවබෝධ කරවීමේ ඒකායන අරමුණෙනි. බුදු පියාණන් වහන්සේගේ මහා කරුණාව නිමක් කොනක් නැතිව ගලා බසිනා ගංගාවක් මෙනි. **දුකට පත් වූවන් සංසාර සාගරයෙන් එතෙර කරවීමට බුද්ධ රාජ්‍යයේ කිරුළ පැළඳූ බුදු පියාණන් වහන්සේ තරම් කැපවූ වෙනත් නායකයෙකු මේ විශ්වය තුළ පහළවී නැත.** ස්වකීය දෛනික දින චර්යාව අදියර 5 කට බෙදාගත් බුදුපියාණන් වහන්සේ ස්වකීය නිරෝගී සුඛ විහරණය පිණිස දිනකට වෙන්කර තැබුවේ හෝරා දෙකක් පමණි. රාත්‍රී 12.00 සිට අළුයම 2.00 දක්වා වන කාලය පවා දෙව් බඹුන් වෙනුවෙන් වෙන් කොට තැබූ සේක. ජේතවනාරාමය හාත්පස ඒකාලෝක කරමින් සපැමිණි දෙව්වරුන් ද ඔවුනට උදාවී තිබූ ගැටළු නිරාකරණය කර ගැනීමට බුදු හිමියන් වෙත පැමිණ නමස්කාර කොට එකත්පසව හිඳ ධර්ම සාකච්ඡා පැවැත්වූ බවට බෞද්ධ ඉතිහාස සාක්ෂි දරයි. දෙව්, බඹුන්ගේ පවා උත්තරීතර ශාස්තෘ භාවයට පත් බුදු පියාණන් වහන්සේගේ සුවිශේෂී නායකත්වය, මේ විශ්වය තුළ පහළ වූ කිසිදු නායකයෙකුට දෙවැනි නොවන්නේමය. සමතැන්හි විරාජමාන වන්නෙකුද පහළ වී නැත. **අප ගෞතම බුදු පියාණන් වහන්සේගේ උත්තරීතර නායකත්වය විශ්වීය අනුපමේය නායකත්වය වන්නේ එබැවිනි.**

***

මහානුභාව සම්පන්න පිරිත් සජ්ඣායනා

බුද්ධ ධර්මය තුළ අන්තර්ගත පිරිත් දේශනා **පරිත්ත සුත්ත** දේශනා සහ **සුත්ත දේශනා** යනුවෙන් කොටස් දෙකකින් යුක්තය. දීඝ නිකායේ සාමඤ්ඤ ඵල සූත්‍රයේ සඳහන් පරිදි භය දුරු කිරීම සඳහා බුදුන් වහන්සේ අජාසත් රජුට ධර්මය දේශනා කළේ සීලයෙහි ඇති බලය මවාන පිළිබිඹු කරමිනි. බුද්දක නිකායේ **මහා මඞ්ගල සූත්‍ර** දේශනාවෙන් දෙවියන්ගේ ගැටළු විසඳමින් භව ගමන තුල සමුර්ධිය ළඟා කරගත හැකි මඞ්ගල කරුණු දෙව් මිනිසුන්ගේ යහපත පිණිස දේශනා කර වදාළ සේක.

තවත් අවස්ථාවක වනගතව කමටහන් වඩන භික්ෂූන් වහන්සේ 500 නමකට බාධා පමුණුවමින් බිය ගන්වා රෝගාතුර බවට පත් කළ වෘක්ෂ දේවතාවුන් ගේ බල බිඳ දමා භාවනා යෝගීව එම ස්ථානයේම සිට කමටහන් වැඩීමට සුදුසු වාතාවරණය සැකසීමට **කරණීය මෙත්ත** සූත්‍රය දේශනා කර වදාළහ. එහි මෛත්‍රී බලයෙන් සතුටට පත් වෘක්ෂ දේවතාවුන් වහන්සේලාට දැක්වූ අනුග්‍රහය මාහැඟිය.

විසාලා මහනුවරට ඇති වූ තුන් බිය **(රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂ)** දුරු කිරීමට **රතන සූත්‍රය** දේශනා කර වදාළ සේක. විසාලා මහ නුවරට ඉතාමත් අභාග්‍ය සම්පන්න යුගයක් උදා වූයෙන් පැවතී සෞභාග්‍යය පලා ගියහ. නගරය කුණු වී ගිය මෘත ශරීරවලින් ගහණ විය. කිසිවෙකුට විසඳිය නොහැකි උග්‍ර ගැටලුවකට පාලක, පාලිත දෙපාර්ශවයම මුහුණ දෙන්නට වූහ. බුදු පියාණන්ගේ මහා කරුණා නෙතට යොමු වූ මෙම උග්‍ර ගැටලුවට පිළියම වශයෙන් බුදු පියාණන් වහන්සේ **රතන සූත්‍රය** දේශනා කරන වදාළ සේක. අධික වර්ෂාව ඇති වීමෙන් මළ කුණු සේදී ගියහ. අනතුරුව රෝගීහු සුවපත් වූහ. මුළු රටම සශ්‍රීක විය. (විස්තර සාධු දැක්ම 3 ග්‍රන්ථය තුළ)

දෙවියන් අතර පැන නැගුණ ගැටළුවක් නිරාකරණය කර ගැනීමට පැමිණි දේව සමූහය අමතා දේශනා කර වදාළ **මහා මඞ්ගල සූත්‍රයෙහි ද** පෙන්වා දී ඇත්තේ ජීවිත ජයග්‍රහණය, උපරිම ආශ්වාදය හෙවත් නිර්වාණ සුවය ඉලක්ක කරගෙන ජීවන ගමනේ ඉදිරියට පිය නගන්නන් විසින් අනුගමනය කළ යුතු ආශිර්වාදාත්මක **මඞ්ගල කරුණු 38 කි.** එය ආශිර්වාදයක් කරගෙන ජීවත් වන්නෝ කිසිදිනෙක පරාජය නොවනු ඇත.

මහා මඞ්ගල සූත්‍රය

Discoarse On Blessings

(Anyone can follow these auspicious facts to be undefeated)

1. අසේවනාච බාලානං	බාලයන් ඇසුරු නොකිරීම To avoid the company of foolish
2. පණ්ඩිතානංච සේවනා	පණ්ඩිතයන් ඇසුරු කිරීම To associate with wise

3. පූජාච පූජනීයානං	පිදිය යුත්තන් පිදීම To honour those who are worthy of honor
4. පතිරූපදේස වාසො ච	සුදුසු පෙදෙසක වාසය කිරීම To live in a suitable locality
5. පුබ්බේත කතපුඤ්ඤතා	පෙර කළ පින් ඇති බව To have done good deeds in the past
6. අත්ත සම්මා පනිධීච	සිත මානව පිහිටුවා ගැනීම To be on the right path
7. බාහු සච්චඤ්ච සිප්පඤ්ච	බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව To be erudite
8. සිප්පඤ්ච	ශිල්ප දැනීමෙන් ලද කාර්ය නිපුණත්වය To be proficient at work
9. විනයොච සුසික්ඛිතො	මනා හික්මීම Well –learned moral discipline
10. සුභාසිතා ච යා වාච	සුභාෂිත වචන භාවිතය To practice pleasant speech
11. මාතා පිතු උපට්ඨානං	දෙමාපියන්ට උපස්ථාන කිරීම Giving support to parents
12. පුත්තදාරස්ස සංගහො	අඹු දරුවන්ට සංග්‍රහ කිරීම Cherishing wife and children
13. අනා කුලා ච කම්මන්තා	නිරවුල් නිවැරදි රැකායවක යෙදීම Engaging in right occupation
14. දානං	දන් දීම - To be charitable
15. ධම්ම චරියාච	කුසල ධර්මයෙහි යෙදීම To practice virtuous conduct
16. ඤාතකානඤ්ච සංගහො	ඤාති මිත්‍රාදීන්ට සංග්‍රහ කිරීම Helping relatives and friends
17. අනවජ්ජානි කම්මානි	යහපත් කර්මාන්තයන්හි නියැලීම Engaging in blameless acts

18. ආරති පාපා	පාප කර්මයන්ගෙන් වැළකීම To abstain from shunning evil
19. විරති පාපා	අයහපත් වූ වරද පිටු දැකීම To have no desire for evil activities
20. මජ්ජානා ච සඤ්ඤමො	මත් වතුර මත් ද්‍රව්‍ය ආදිය භාවිතයෙන් වැළකීම Refrain from intoxicant
21. අප්පමාදොච ධම්මෙසු	කුසල් දහමෙහි පමා නොවීම To be diligent in wholesome practice
22. ගාරවොච	ගරු කළ යුත්තන්ට ගරු කිරීම To have reverence
23. නිවාතොච	යටහත් පහත් බව To be humble
24. සන්තුට්ඨී	ලද දෙයින් සතුටු වීම To be content
25. කතඤ්ඤුතා	කළගුණ සැලකීම To be greateful
26. කාලෙන ධම්ම සවනං	සුදුසු කල්හි දහම් ඇසීම To hear the Dhamma at the right time
27. ඛන්ති ච	ඉවසීම To have patience
28. සොවචස්සතා	අවවාදයට කීකරු වීම To listen to advice
29. සමණානඤ්ච දස්සනං	ශ්‍රමණයන් දැකීම To see monks and spiritual teachers
30. කාලෙන ධම්ම සාකච්ඡ	සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවෙහි යෙදීම To discuss Dhamma at due season
31. තපො	තාපස හෙවත් තවුස් දහමෙහි නියැළීම To practice Energetic self –restraint

32. බ්‍රහ්මචරියාච	උතුම් හැසිරීම To live according to the Noble-eight Fold Path
33. අරියසච්චාන දස්සනං	සිවුසස් දැකීම To comprehend the 4 Noble Truth
34. නිබ්බාණ සච්චි කිරියා ච	නිවන් අවබෝධ කර ගැනීම To realize Nibbana
35. ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්සන න කම්පති	අටලෝ දහමින් සිත කම්මා නොවීම A mind unshaken by the ups and downs of life
36. අසොකං	ශෝක රහිත බව To be free from sorrow
37. විරජං	රාගාදී කෙලෙස් දූවිලි නොමැති බව To be free from defilement
38. ඛේමං	බිය රහිත සැනසිලිදායක බව To have lasting peace and security

බුදු පියාණන් වහන්සේගේ සෑම සූත්‍රයකම අවසානය එල්ල වී ඇත්තේ පරම සුඛයට හෙවත් නිවන් මඟටය. ශ්‍රී සද්ධර්මයේ සෑම අංශු මාත්‍රයකම ගැබ්ව ඇත්තේ එලදායී මාර්ගෝපදේශයකි.

**

මෙත්තානිශංස සූත්‍රය

මෙම සූත්‍රය ද දෛනික ජීවිතය තුළදීම ප්‍රතිඵල දහයක් ලැබිය හැකි සූත්‍ර දේශනාවයි. මෙය දෛනික ජීවතය තුළ ඉතාමත් ප්‍රායෝගිකය. බුදු පියාණන් වහන්සේ දේශනා කර ඇත්තේ පියවි නෙතින් දැක එල ලැබිය හැකි උතුම් ධර්මයකි. එයින් එල නොලබන්නේ නම් කෙතරම් අභාග්‍යයක් ද?

මෙත්තානිශංස සූත්‍රය/ This Vivid Metta

1. සුඛං සුපති	සුව නින්දක් ලැබීම A pleasing slumber

2. සුඛං පටිබුජ්ඣති	සුවසේ අවදි වීම A pleasimg wake up
3. න පාපකං සුපිනං පස්සති	භයානක සිහින නොපෙනීම No terrified dream
4. මනුස්සානං පියෝහෝති	මිනිසුන්ට ප්‍රිය වීම Attracts by human beigns.
5. අමනුස්සානං පියෝහෝති	අමුනුෂ්‍යයින්ට ද ප්‍රිය වීම Attracts by non human
6. දේවතා රක්ඛන්ති	දේව ආශිර්වාදය හා ආරක්ෂාව ලැබෙයි Protect by Gods
7. නාස්ස අග්ගි වා විසං වා සත්ථංවා කමති	ජල, ගිනි, වසවිෂ, ආයුධවලින් ආරක්ෂා වේ. No harm from fire, water, poison, weapons
8. තුවටං චිත්තං සමාධියති	සිත සමාධිගත වේ. The virtue of concentration
9. මුඛ වන්නෝ විප්පසීදති	මුහුණ ප්‍රසන්න වීම The face become pleasing and lovely
10. අසම්මුල්හෝ කාලං කරෝති	සිහිවිකල් නොවී මරණයට මුහුණදිම The ability of facing death without being unconscious

මවකගේ රුධිරය සුදෝසුදු කිරි බවට පත්වන්නේ දරුවා කෙරෙහි ඇති වූ මෙත් සිතේ බලයෙන් විනා, **රසායනාගාරයක විද්‍යාඥයෙකු විසින් නිපදවූ ඖෂධයක් ශරීරගත කිරීමෙන් නොවන බව සැවොම අවිවාදයෙන් පිළිගන්නා සත්‍යයකි.** ශරීරය තුළ වුවද මෙවන් සංකීර්ණ ක්‍රියාවලියක් ඇති කිරීමට මනස මූලික වෙද්දී ශරීරගත අනතුත් කායික රෝග නිවාරණය පිණිස මනසට ඖෂයක් බඳු වූ පිරිත් මගින් ඇති කළ හැකි අද්විතීය ධනාත්මක ප්‍රතිචාරය, අන්ධබාලයින්ට නොපෙනුණ ද වත්මන් සමාජයේ ප්‍රඥාවන්ත පුද්ගලයෝ දැක, දැන අත්විඳිති.

**

ගිරිමානන්ද සූත්‍රය

අසාධ්‍ය ලෙස රෝගාතුර වී සිටි ගිරිමානන්ද ස්වාමීන් වහන්සේට මෙලොව, පරලොව උභයාර්ථ සුභ සිද්ධිය සළසා දෙමින් සුවපත් කිරීමට සමත් වූ ගිරිමානන්ද සූත්‍රය තුළින් අදත් දස දහසක් දේශීය, විදේශීය රෝගීහු ශ්‍රවණය කිරීමෙන් සජ්ඣායනා කිරීමෙන් සුවපත් වෙති. **(විස්තර සාධු දැක්ම 7 ග්‍රන්ථය තුළ)**

**

අංගුලිමාල පිරිත

අංගුලිමාල නම ඇසෙන විටම ඇතැම්හු බියපත් වෙති. ඒ 999 ක් මිනීමැරූ අහිංසක නම් වූ සිසුවා සිහිපත් වීමෙනි. එහෙත් බුදු නෙතට ඔහු හසුවූ දා පටන් ඔහුගේ ජවිතය තුළ ඇති වූ සුවිශාල පරිවර්තනය මගින් ලොවට රහතන් වහන්සේ නමක් බිහි වූවා පමණක් නොව දරූ උපතකදී මවට සහ බිළිඳාට සෙත් පැතීමට තරම් මහානුභාව සම්පන්න අංගුලිමාල **පිරිත** සමාජය තුළ ප්‍රචලිත විය. එය සත්‍යක්‍රියා බලයකි. **(විස්තර සාධු දැක්ම 4 ග්‍රන්ථ තුළ)**

**

ජල නන්දන පිරිත

බුදු පියාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීම සඳහා පිරූ පාරමී දම් බලයෙන් සහ අනෝම නදී තීරයෙන් එතෙරට ගොස් සය වසරක් පුරා සිදුකළ දුෂ්කර ක්‍රියාවන්හිත් සත්‍යයේ මහිමයෙන්, ජය ශ්‍රී මහ බෝ මුල අසලදී මාර සේනා එලවා දැමූ ශක්තියෙන් බල ගැන්වී ඇති මෙම පිරිත අද සමාජයට ඉමහත් සෙතක් ශාන්තියක් උදා කරයි. **(විස්තර සාධු දැක්ම 4 ග්‍රන්ථය තුළ)**

අනුන්ගේ යහපත, කීර්තිය, දියුණුව, සෞභාග්‍යය හදවතින් දරාගත නොහැකි දුස්සීල ජනයා අන් අය පහත හෙළීමේ අදහසින් නොයෙක් ගුප්ත ක්‍රියා මාර්ග ඔස්සේ අසාර්ථක වෑයමක යෙදෙයි. කොඩි විණ, අඤ විණ, හූනියම් ආදී විවිධ ගුප්ත ක්‍රියා මාර්ග සාර්ථක වේ යැයි සිතා, තහඩුවල නම් ගම් ලියමින් පුළුස්සයි. මිරිස් අඹරයි. දේවාල හඹාගොස් පොල් ගසයි. නූල් පන්නයි. වස විෂ ශරීරගත කිරීමට විවිධ උපක්‍රම යොදයි. ***එහෙත් ධර්මය ඉදිරියේ මේ සියල්ලක් උඩු සුළඟට දැමූ දූවිලිසේම ය.*** *අන්ධබාලයෝ යමක් සිදු කළේ යැයි සිතා*

ප්‍රතිඵල දකීමේ ඨීන රුචිකත්වයෙයන් යුතුව පසු වුවද සිදු වන්නේ අනෙකකි. වැරදි විදියට යෙදු සිත ඔස්සේ ප්‍රතිඵලය තමා පසු පසම ලුහුබැඳීමයි. මෙම ගුප්ත ක්‍රියාමාර්ගයන්හි සියලු බල බිඳ, සිඳ දැමීමේ අපරිමිත බලයක් මෙම ජලනන්දන පිරිත තුළ ගැබ්ව ඇත. ඒ අන් කිසිවක් නොව සත්‍යයේ බලයයි. එය යටපත් කළ හැකි කිසිඳු බලවේග යක් සොයාගත් අයෙකු මෙම විශ්වය තුළ මෙතෙක් පහළ වී නැත.

ධර්මයෙන් සන්නද්ධ වූවෙකු, දුෂ්ඨ චේතනාවෙන් යුතුව තමාට එරෙහි වන්නන්ට කිසිවිටක වෛර කළ යුතු ද නැත. බිය විය යුතු ද නැත. **ඔවුන්ගේ මානසිකත්වය හඳුනාගෙන අනුකම්පා කළ යුතුයි. මෛත්‍රී කළ යුතුයි. චූල ධර්මපාල ජාතකය මෙයට මා හැඟී නිදසුනකි.**

**

ජින පඤ්ජර පිරිත

ජින පඤ්ජරය යනු සියලු ආරක්ෂාව සපයා ගත හැකි පිරිතකි. ඉංග්‍රිසි භාෂාවෙන් **"Buddha Mansion"** යනුවෙන් හැඳින්වෙන මෙම පිරිත තුල ගැබ්ව ඇත්තේ ද අසීමිත බුද්ධ ශක්තියය. මෙහි අන්තර්ගත ගාථා 22 තුළින් බුද්ධ ශක්තිය මෙන්ම එහි ධර්ම සත්‍යය ද පිළිබිඹු කෙරෙයි. අට විසි බුදුවරුන්ගේ මහා රහතන් වහන්සේලාගේත්, සංඝරත්නයේත් ගුණ බලයෙන් අනූන මෙම ගාථා සජ්ඣායනා කරන්නෙකු වටා මෙම බලය ආරක්ෂක වළල්ලක් මෙන් පිහිටයි.

අනුරුද්ධ, සාරිපුත්ත, කොණ්ඩඤ්ඤ සහ මුගලන් ආදී මහා රහතන් වහන්සේලාගේ ආනුභාවය හදවතට දැනෙයි. ආනන්ද, රාහුල, කාශ්‍යප මහා රහතන් වහන්සේලාගේ ආනුභවය සවනට යොමුවෙයි. සෝභිත මහ රහතන් වහන්සේ හිරුමෙන් බබළන ශ්‍රීයෙන් යුක්තව හිසෙහි කේශාන්ත මත පිහිටයි. ඉමිහිරි වදන් වදාරණ ගුණයට ආකරයක් බඳු වූ කුමාර කස්සප තෙරණුවෝ මුඛයෙහි වැඩ සිටින්නාක් මෙනි. පුණ්ණ, අංගුලිමාල, උපාලි, නන්ද, සීවලි යන තෙරුන් පස් නම නළලයේ තිලකයන් බඳුය. ගතට සිතට පුදුමාකාර ආරක්ෂාවකි. **(විස්තර සාධු දැක්ම 04 ග්‍රන්ථය තුළ අන්තර්ගතය)**

බුද්ධශ්‍රාවක වූ අනෙක් අසූ මහ ශ්‍රාවක තෙරවරු සීල තේජසින් බැබළෙමින් සිරුර වටා පිහිටියාක් මෙනි. මාගේ ඉදිරියෙහි රතන සූත්‍රයත්, දකුණෙහි මෙත්ත සූත්‍රයත්, පිටුපස ධජග්ග සූත්‍රයත්, වම්පස

අංගුලිමාල පිරිතත් ශක්තිමත් ලෙස පවතී. බන්ධ පිරිත, මෝර පිරිත, ආටානාටිය සූත්‍රය අහස් වියනක් මෙනි. අනෙක් පිරිත් පවුරක් මෙනි. බුදු අණ බලයෙන් යුක්ත වූ දහම් පවුරෙන් සැරසුණ සිව් කිසෙන් යුතුව මම හැම කල්හිම බුදු මැදුරෙහිම වසමි. බාහිර උවදුරු හෝ ඇතුළාන්තයේ හටගත් වා, පිත් ආදී උවදුරු අනන්ත ගුණ තේජසින් දුරුවේවා! පොළෝ තලයෙහි බුදු මැඳුරෙහි වසන්නා වූ මා ඒ මහා උත්තමයෝ හැම කල්හිම රකිත්වා.!

මෙසේ අතිශයින් සුරක්‍ෂිත වූයේ, බුදු අනුහසින් උවදුරු දුරුකරන ලද්දේ බුද්ධානුභාවයෙන් සතුරු සමූහයා දුරු කරන ලද්දේ ධර්මයේ අනුහසින් රකින ලද්දේ හැසිරෙමි.

සදහම් පවුරකින් වටකරන ලද්දේ වෙමි. අෂ්ඨ ආර්යයන් අට දිසාවෙහි වෙති, මේ අතර නාථයෝ අට දෙන අනු දිසාවන්හි වෙති. බුදුරජාණන් වහන්සේ මගේ හිස මත වියනක් මෙන් සිටියාහු වෙත්.

බෝධි මූලයෙහි වැඩ සිට මාර සේනාව පැරදූ බුදුරජාණන් වහන්සේ මගේ සිරසෙහි වැඩ සිටිති. මුගලන් තෙරහු වම් උරහිසෙහි ද සැරියුත් තෙරහු දකුණු උරහිසෙහි ද වැඩ සිටිති. ධර්මය හදවතෙහි වෙසෙයි. මයුර ජාතියෙහි ඉපිද හිරු මෙන් ලොවට සෙත කරන බෝසත්හු මාගේ දෙපා මත පිහිටි ආරක්‍ෂක බලයයි.

සියලු විපත්, උවදුරු, දුර්නිමිති, බිය, රෝග, ග්‍රහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින **බුදු අනුහසින් දුරුවේවා!**

සියලු විපත්, උවදුරු, දුර්නිමිති, බිය, රෝග, ග්‍රහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින **දම් අනුහසින් දුරුවේවා!**

සියලු විපත්, උවදුරු, දුර්නිමිති, බිය, රෝග, ග්‍රහදොස්, නින්දා, අනතුරු, භයානක නරක සිහින **සඟ අනුහසින් දුරුවේවා!**

**

සිඟාලෝවාද සූත්‍රය

සිඟාලෝවාද සූත්‍රය ද මිනිසාගේ දෛනික දිවි පැවැත්ම ඉහළට ඔසවා තැබීමට සමත් මහාර්ඝ දේශනාවකි. එදිනෙදා ජීවිතය සාර්ථක ලෙස පවත්වා ගැනීමට මහෝපකාරීවන උපදෙස් රාශියක් මෙම සූත්‍රය තුළින් බුදු පියාණන් වහන්සේ ලොවට වදාළ සේක. පීතෘ මූලික ජන සමාජයක පවුලක භූමිකාව යහපත් සමාජයක් ගොඩනැඟීමෙහි ලා ඉමහත් දායකත්වයක් සපයයි. ලෞකික මෙන්ම ලෝකෝත්තර සැපය වෙනුවෙන් පුද්ගලයා සතු යුතුකම් මෙන්ම වගකීම් පිළිබඳව මෙතරම් විශ්ලේෂනාත්මක ප්‍රායෝගික කරුණු ලොවට හෙළි කළ වෙනත් ශාස්තෘන් වහන්සේ කෙනෙකු ලොව පහළ වී නැත. සමාජයක මූලික ඒකකය වන පවුල මව, පියා සහ දරුවන්ගෙන් සමන්විතය. ඔවුන් අතර අන්‍යොන්‍ය වශයෙන් පවත්වාගත යුතු යුතුකම් සහ වගකීම් පැහැර හරින්නෝ ලෞකික වශයෙන් විශාල පිරිහීමකට පත් වෙන අතර ලද මිනිසත් භවයට පවා නිගා කරගනිති. පඤ්ච ශීලය සහිත ධර්මානුකූලව දිවි පෙවෙතකට අවතීර්ණව තම යුතුකම් හා වගකීම් දන හැඳින ඒ අනුව ජීවිතය පවත්වා ගන්නෝ දෙලොවම ජය ලබන්නෝ වෙති.

සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා දී ඇත්තේ මව්පිය, ගුරුවරු, අඹු දරුවන්, හිත මිතුරන්, පැවිදි උතුමන්, දාසි දාස්සන් ආදී සැමට අන්‍යොන්‍ය වශයෙන් ඉටුවිය යුතු යුතුකම් සහ වගකීම් රැසකි. එනම්,

දරුවන්ගේ දෙමව්පියන්ටත්,

දෙමාපියන්ගෙන් දරුවන්ටත්,

ස්වාමිපුරුෂයාගෙන් බිරිඳටත් බිරිඳගෙන් ස්වාමිපුරුෂයාටත්,

ගුරුවරුන්ගෙන් සිසුන්ටත් සිසුන්ගෙන් ගුරුවරුන්ටත්,

ස්වාමියා සේවකයාටත් සේවකයා ස්වාමියාටත්,

පැවිදි උතුමන් ගිහි අයටත් ගිහි පිරිස පැවිදි උතුමන්ටත්, ආදී වශයෙන් මේ පිළිබඳව අනවබෝධයෙන් කටයුතු කරන්නෝ අනවශ්‍ය ප්‍රශ්න ඇතිකර ගනිමින් තමාද පරිහානියට පත්වෙමින් අන් අයද විනාශ මුඛය කරා ඇද දමති. ඔවුන් මුළු මහත් විශ්වයටම පිළිළයකි. තම යුතුකම් හා වගකීම් පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කිරීම මුළු මහත් සමාජයටම සෙතකි. එය පුද්ගලයා සතු පෞද්ගලික මෙන්ම

සමාජ වගකීමක් බවට ගිහි, පැවිදි, උපාසක, උපාසිකා සැම දැනුවත් වීම ඉතා වැදගත් වන අතර එය යහපත් සමාජයක් ගොඩ නැංවීමෙහිලා තම තමා විසින් සපයනු ලබන මහගු දායකත්වයකි.

විශේෂයෙන්ම විවාහක යුවලකගේ ප්‍රධාන යුතුකම වන්නේ ඇතුළත ගිනි පිටතට නොදීමත් පිටත ගිනි ඇතුළට නොගැනීමත්ය. තම පවුල යනු ස්වාමි, භාර්යා සහ දරුවන් බව අවධාරණය කරගෙන එහි සීමාවන් නොඉක්මවන සේ තොරතුරු සංනිවේදනයේදී වචන පාලනය කරගත යුතුය. එහෙත් නූතන මෙවලම් ඔස්සේ තම කාන්සිය මග හැරවා ගැනීමට වෙර දරණ ඇතැම් අන්ධබාලයිනට සිය වචනයේ සීමාව පාලනය කර ගැනීමට නොහැකිව හෝරා ගණන් දොඩමළු වන්නේ සිහි විකෘති වූවන් මෙනි. අවසානයේදී පවුලේ සීමාව අභිබවා යන මොවුන් අවශ්‍ය මෙන්ම අනවශ්‍ය සියලු දෑ සන්නිවේදනය කරමින් තම පවුලම විනාශ මුඛය කරා ඇද දැමීමට තරම් සාහසික වන අවස්ථා ද නැත්තේ නොවේ. **ධර්මයෙන් පිට පනින්නාගේ කර්මය එල දෙන හැටි? (විස්තර සාධු දැක්ම 8 ග්‍රන්ථයෙහි අන්තර්ගතයයි)**

**

බොජ්ඣංග පිරිත් සූත්‍ර

මෙම බොජ්ඣංග පිරිත් සූත්‍ර සංයුක්ත නිකායේ මහා වග්ගයේ සංගෘහිත වන්නේ **පඨම ගිලාන සූත්‍රය, දුතිය ගිලාන සූත්‍රය, තතිය ගිලාන සූත්‍ර නමිනි.** මෙම සූත්‍රයන්ට පදනම් වී ඇත්තේ සප්ත බොජ්ඣංග ධර්මයෝය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ රෝගාතුර වූ කල්හි මහා කස්සපථෙර බොජ්ඣංග සූත්‍රයත්, මහා මොග්ගල්ලාන මහ තෙරුන් දැඩිසේ රෝගාතුරව සිටි අවස්ථාවේ මහා මොග්ගල්ලානථෙර බොජ්ඣංග සූත්‍රයත් බුදු පියාණන් වහන්සේ විසින්ම දේශනා කිරීමෙන් උන් වහන්සේලාගේ රෝග සමනය වී ඇත. වරෙක බුදු පියාණන් වහන්සේ රෝගාතුර වූ කල්හි උන් වහන්සේ බැහැ දැකීමට චුන්ද මහ තෙරණුවන් වහන්සේ වැඩම කළහ. එවිට බුදු පියාණන් වහන්සේ චුන්ද තෙරණුවන් අමතා බොජ්ඣංග ධර්ම දේශනා කරවා ගැනීමෙන් අනතුරුව බුදු පියාණන් වහන්සේ ද සුවය ලැබ ඇත. **බොජ්ඣංග ධර්ම තුළද ගැබ්ව ඇත්තේ කායික මානසික රෝගාබාධයන් සුව කිරීමේ සුවිශේෂී ශක්තියකි. ලෙඩ රෝග සුව කිරීමට මහගු ඖෂධයකි.**

සකල රෝගාබාධයන්ගෙන් සුවය ලැබීමට ධර්ම ඖෂධය හා සමාන ඖෂධයක් නැත. එහෙත් මෙම ධර්ම රසය විඳීමට නුවණ තිබිය යුතුය. පානය කරන තරමට වැඩි වැඩියෙන් සුවය දනෙන මෙම ධර්මයෙහි රසය අනූනය. බලය අද්විතීය ය.

තඤ්ච අප්පටි වානීයං - අසෙචනක මොජචං
පිවන්ති මඤ්ඤෙ සප්පඤ්ඤා - වළාහකම්ම අද්ධගුති
(සං.නි)

කෙතරම් ඇසුවත් ඇති වීමකට නොපැමිණෙන්නා වූ පිටතින් යෙදූ පැණිවලින් නොව එහිම තිබෙන්නා වූ මිහිරි ගුණයෙන් සුමධුර වූ, එහෙයින්ම ඕජෝ ගුණවත් වූ ඒ **තථාගත ධර්මය**, වළාකුළු අතරින් නිකුත් වූ ජලය බොන පිපාසයෙන් පීඩිත මගීන් මෙන් නුවණ ඇත්තෝමය පානය කරන්නාහ.

***

ධර්මය තුළින් ලද හැකි කායික සහනය
HEALING POWER OF DHAMMA

There is no better medicine than truth for both mental and physical ills which are the cause of all sufferings and misfortunes

Ye keci osadhā loke	-	**Vijjanti vividhā bahū,**
Dhammosadhasamaṃ na-tthi;	-	**Etaṃ pivatha bhikkhavo.**
Dhammosadhaṃ pivitvāna	-	**Ajarāmaraṇā siyuṃ,**
Bhāvayitvā ca passitvā	-	**Nibbutā upadhikkhaye ti**

{The Healing Medicine of Dhamma (Milinda-pañho 335)

Of all the medicines in the world, manifold and various,
there is none like the medicine of Dhamma:
therefore, O monks, drink of this.

Having drunk this Dhamma medicine,
you will be ageless and beyond death;
having developed and seen the truth,
you will be quenched, free from craving.

Having drunk, the medicine of Dhamma, you will be untouched by age and death. Having meditated and seen the reality you will be healed by ceasing to cling.

These two verses point to the healing symbolism of the the Buddha's teaching. He is often pictured as the great physician who, seeing the suffering of all beings in the world, applies the medical formula of the four noble truths to...........

1) describe the symptoms of suffering;
2) investigate its specific causes;
3) using this information, reverse the causes to conceive a cure; and finally
4) lay out a flexible program of treatment that will lead a person out of affliction to lasting health of body and mind.

The medicine will only work if it is drunk. The heart of the Buddhist message is not so much the theoretical analysis of the human condition, subtle and compelling as it is, but rather the practical effect of actually taking the cure. The physician can do no more than offer us the medicine-it is up to each of us to drink of it ourselves. This is where the practice of meditation and the moment-to-moment cultivation of wholesome mind states is so important.

Since all of our afflictions ultimately grow from our attachments (upādāna), and from the clinging constructions we forge (*upadhi*), the path to freedom or health **(nibbutā=the cessation *of suffering)*** will unfold as we learn to abandon these constructions and as they begin to wane (*khaya*). **The mechanism for this cure is wisdom,** which emerges as we begin to meditate (bhāvayitvā) and hence see more clearly (passitve) the nature of our constructed experience.

Being cured does not mean that the process of aging and dying simply stops (since whatever is constructed must undergo change). But we can, through wisdom, be "untouched" by aging and death. Health consists of a sufficiently deep understanding of the nature of things that we do not cling to anything in the world. **Non-attachment is itself the cure.**

යෙ කෙ චි ඕෂධා ලොකෙ - විජ්ජන්ති විවිධා බහූ
ධම්මොෂධ සමං නත්ථි - එතං පිවථ භික්ඛවො

ධම්මොෂධං පිවිත්වාන - අජරාමරණා සියුම්
භවයිත්වා ච පස්සිත් වා - නිබ්බුතා උපධික්ඛ යෙ

(සුත්ත පිටක ඛුද්දක නිකාය මිලින්ද පඤ්ඤා 335)

කායික රෝග නිවාරණය පිණිස ලොව බහුලව විවිධාකාර වූ ඖෂධ වර්ග කොතෙක් තිබුණේ වුවද ධර්ම ඖෂධය හා සමාන ඖෂධයක් නොමැත. කය හා මනස අන්‍යොන්‍ය වශයෙන් බඳී පවතින බවත් සියල්ලට මනස පූර්වංගම වන බවත් බුදුපියාණන් වහන්සේ පෙන්වා දී ඇත. මනස අපිරිසිදු වීමෙන් අප පසුපස දුක ලුහුබඳින පීඩාකාරී ආකාරයත්, බෞද්ධයාගේ අත්පොත වූ **ධම්ම පදය** නම් වූ ග්‍රන්ථයෙහි පළමු ගාථා දෙක තුළින් ඉතාමත් පැහැදිලිව විදහා දක්වෙයි.

**

ගිරිමානන්ද සූත්‍රය

කායික මානසික රෝගාබාධයන්ට පමණක් නොව, බව සංසිඳීමට ජරාව, මරණයට පත් නොවන අජරාමර නිවන් සුවය හැර සදාකාලික සුවය දෙන වෙනත් ඖෂධයක් චතුරාර්ය සත්‍යයෙන් පරිබාහිරව නැත්තේමය. මෙය පිරිසිඳ දැකීමෙන් කිසිවක් උපාදාන කර නොගෙන, තෘෂ්ණාව සහමුලින්ම උපුටා දමා සදා සැප දෙන නිවන් සුවයම ලද හැකි බව ගිරිමානන්ද සූත්‍රයෙන් මනාව පැහැදිලිය.

බුදුපියාණන් වහන්සේ විසින් දේශිත **දස සඤ්ඤා** ඇතුළත් ගිරිමානන්ද සූත්‍රය, අසාධ්‍ය තත්ත්වයේ පසු වූ ගිරිමානන්ද ස්වාමීන් වහන්සේ වෙත වැඩම කළ ආනන්ද ස්වාමීන් වහන්සේ විසින් දේශනා කරන ලදී. සයනය මත සිට එය හොඳින් ශ්‍රවණය කළ ගිරිමානන්ද හිමියන් එහි අන්තර්ගත දස සඤ්ඤා විදර්ශනා නුවණින් දකින්නට වූයෙන් සූත්‍ර දේශනාව අවසන් වීමත් සමඟම සියලු කායික මානසික පීඩා සංසිඳුවමින් සම්පූර්ණ සුවය ලැබූහ.

***

මෙවන් අම්ල ඵල ලැබිය හැකි සූත්‍ර දේශනා දාහත් දහස් ගණනකි. බුදු පියාණන් වහන්සේ විසින් **වසර 45ක් පුරා දේශනා කරන ලද අසූ හතර දහසක ධර්මස්කන්ධයක්** මෙලෙස ලියා, කියවා, සජ්ඣායනා කර අවසන් කළ හැක්කක් නොවේ. ධර්මය, බුද්ධියට ගෝචර වන්නකි. එය තම තමාගේ ප්‍රඥාවට සාපේක්ෂව නුවණින් විනිවිද දැකිය හැකිය. ධර්මය **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ගුණයෙන් බල ගැන්වී ඇත.**

අසාරේ සාරමතිනො - සාරේ චසාර දක්ඛිනො
තෙ සාරං නාධි ගච්ඡන්ති - මිච්ඡා සංකප්ප ගොචරා

Asare sāra matino - sãre cãsãra dassihino
Te sãram nadhi gaccanti – micchā sankappa gocara

නිසරු දේ සරු කොටත් සරු දේ නිසරු කොටත් දකින්නා වූ වැරදි කල්පනාවල එල්බුණ පුද්ගලයෝ සරු දෙයක් සරු දහමක් නොලබති. (ධ.ප 11 යමක වග්ග)

They who see untruth as truth and truth as untruth, will not see 'Truth' because they are lost in erroneous thoughts.

සාරං ච සාරතො ඤත්වා - අසාරංච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති - සම්මා සංකප්ප ගොචර

Sāraň ca sārato ňatvā - Asāraň ca asārato
Te sāram adhi gaccanti – samma sankappa gocara

සරු දේ සරු හැටියටත් නිසරු දේ නිසරු හැටියටත් හැඳිනගෙන නිවැරදි කල්පනාවල යෙදෙන්නෝ සරු දෙයක්ම (හරවත් ඵලයක්ම) ලබත් (ධ.ප 12 යමක වග්ග)

They who see truth as truth and untruth as untruth will see 'Truth' and gain rich profit because they consider right thoughts.

***

ධර්ම චක්‍රය
THE WHEEL OF DHAMMA

ප්‍රතිවේද ධර්ම චක්‍රය සහ **දේශනා ධර්ම** චක්‍රය යනුවෙන් ධර්ම චක්‍රය දෙයාකාර වේ. අතීතයේ සතුරන් නසනු පිණිස චක්‍රායුධ නම් ආයුධ විශේෂයක් තිබිණි. එය කැරකෙන කල්හි එයට හසු වූවන් කැපී යන රෝදයකි. සතුරු ජනයා මැදට එය ගෙන ගොස් කරකවති. එයට හසුවන සැම දෙනම කැපී යති. එය ප්‍රතිවාදීන් මෙල්ල කිරීමට යොදන්නකි.

තථාගතයන් වහන්සේගේ ධර්මයෙන් එය පවත්වන කල්හි කෙලෙස් සතුරෝ කැපී යති. එබැවින් ඒ ධර්මයට ද **ධර්ම චක්‍රය යි** කියනු ලැබේ. තථාගතයාණන් වහන්සේ බෝධිපර්යංකයෙහි වැඩ හිඳ ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උන් වහන්සේගේ සන්තානයෙහි උපදවා ගන්නා ලද **ඉන්ද්‍රිය බල, බෝධ්‍යංග මාර්ගාංග ආදී** වූ **ධර්ම සමූහයේ බලයෙන්** උන් වහන්සේට සතුරුවන එක් දහස් පන්සියයක් ක්ලේශයෝ චක්‍රායුධයෙන් මෙන් කැපී ගියහ.

කෙලෙසුන් නැසීමට තථාගතයන් වහන්සේට උපකාර වූ ඒ ධර්ම සමූහය **ප්‍රතිවේද ධර්මචක්‍රය නම් වේ.** තථාගතයන් වහන්සේ බෝධි මූලයේදී ප්‍රතිවේද ධර්මචක්‍රය පවත්වා සව් කෙලෙසුන් නසා ලොව්තුරා බුදු බවට පැමිණ වදාළ සේක.

සර්වඥයන් වහන්සේ විසින් පවත්වන ධර්ම දේශනය අසන්නා වූ මනුෂ්‍ය, දේව, බ්‍රහ්මයන්ගේ සන්තානවල පවත්නා වූ රාගාදී ක්ලේශ ධර්මයෝ, ධර්ම දේශනා බලයෙන් කැපී යෙති. දුරු වෙති. එබැවින් ඒ ධර්මය ද සතුරන් කපන චක්‍රායුධයක් වැනිය. එබැවින් එයට **දේශනා ධර්ම චක්‍රය යි** කියනු ලැබේ.

තථාගතයන් වහන්සේ විසින් පළමු වරට බරණැස ඉසිපතනාරාමයේ දී **දේශනා ධර්ම චක්‍රය** පවත්වන ලදී. එය ඇසූ පස්වග මහණුන් ඇතුළු බොහෝ දේව, බ්‍රහ්මයන් තුළ පැවති කෙලෙස් සතුරෝ එහි ආනුභාවයෙන් දුරු වූහ.

දේශනා ඥානයට ද ධර්මචක්‍රය යි කියනු ලැබේ. සත්ත්වයනට ඒ ධර්ම දේශනය කිරීම **දම්සක් පැවැත්වීම** නම් වේ. ඉතා තියුණු වූ ද, වේගවත් වූ ද නුවණ ඇත්තා වූ ද සර්වඥයන් වහන්සේට කිසි තැනක පැටලීමකින්, ඇණහිටීමකින් තොරව, අහසින් පොළොවට ගලා හැලෙන ජලයෙන් පිරි ගඟක් වේ නම් එහි ජල වේගය මෙන් ඉතා වේගයෙන් ගලා බස්නා සේ ඒ ධර්මය දේශනා කළ හැකිය. අසන්නවුන්ගේ සිත් තුළට කා වැදෙන පරිද්දෙන් සිත් තුළ පිහිටන ආකාරයෙන් දේශනය පැවැත්විය හැකිය. යොදුන් සියයක් ඔබ්බෙහි සිට අසන්නෙකුට වුවද ළඟ සිට අසන්නෙකුට ඇසෙන පරිද්දෙන් ධර්මය දේශනා කළ හැකිය. සතර දිගම සිට අසන්නවුන්ට නොවෙනස්ව ඇසෙන පරිදි ඒ ධර්මය දේශනා කළ හැකිය.

ලෝකයේ අන් කිසි ශ්‍රමණයෙකුට, බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ එලෙසින් දම්සක් පැවැත්වීමක් කළ නොහැකිය. තථාගයන් වහන්සේම දම්සක් පැවැත්වීමට සුදුසු වූ සේක. ඒ සුදුසු බවද **අරහං යන පදය** තුළද අරුත් ගැන්වී ඇත.

ඒකං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණෙන වා, බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනෙචි වා ලොකස්මිං

(සංයුක්ත නිකාය ධම්මචක්ක සූ.)

*

මෙම ධර්ම පර්යායෙන් ද තථාගතයන් වහන්සේගේ ධර්ම චක්‍රයේ අනුත්තර භාවය දක්වා තිබේ. යම්කිසි ශාස්තෘවරයෙකු විසින් ප්‍රකාශිත ධර්මය එසේ නොවිය හැකිය යි කියා අනෙකෙකු විසින් කරුණු සහිතව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ අවලංගු කරන්නේ නම් හෝ ඒ ධර්මය යහපත් නොවේ.

තථාගතයන් වහන්සේ **විසින් මෙය දුකය කියා යම්** ධර්මයක් ප්‍රකාශ කරන ලද නම් ඒ ධර්මය දුක්ඛ සත්‍යය නොවේය. කියා ලෝකයෙහි කිසිම ශ්‍රමණයෙකුට, බ්‍රාහ්මණයෙකුට, දෙවියෙකුට හෝ බඹකුට කරුණු සහිතව ඔප්පු කොට ප්‍රතික්ෂේප නොකළ හැකිය.

තථාගතයන් වහන්සේ විසින් **ප්‍රකාශිත දුක්ඛ සත්‍යය** නියම දුක්ඛ සත්‍යය නොවේ ය. නියම දුක්ඛ සත්‍යය මේ ය. අනිත් දුක්ඛ සත්‍යයක් ද **නොදැක්විය හැකිය.**

තථාගතයන් වහන්සේ විසින් වදාළ **සමුදය නිරෝධ මාර්ග සත්‍යයන්** ද කරුණු සහිතව කිසිවෙකුට ප්‍රතික්ෂේප **නොකළ හැකිය.** ඒවා වෙනුනට **අන් සත්‍යයන් නොදැක්විය හැකිය.**

තථාගතයන් වහන්සේ විසින් වදාළ කුසලාකුසලාදී ධර්මයන් ද කිසිවකු විසින් අවලංගු **නො කළ හැකිය.** ඒවා වෙනුවට අන්‍ය ධර්මයන්ද **නො දැක්විය හැකිය.** ලෝකයේ කිසිම සමතෙකුට තථාගතයන් වහන්සේගේ ධර්ම චක්‍රය අනික් අතර පෙරළිය හැකි නොවන බැවින් එය **අනුත්තර ධර්ම චක්‍රය** වේ. **අනුත්තර යන්නෙහි අදහස සියල්ලට උතුම් යනුයි. බුදු පියාණන් වහන්සේගේ විශ්වීය අනුපමේය නායකත්වය මෙතුළින් ද මොනවද පැහැදිලි වේ.**

තථාගතයන් වහන්සේ විසින් පවත්වන අනුත්තර ධර්ම චක්‍රහි මහානුභාවයක් ද ඇත්තේය. තථාගතයන් වහන්සේගේ ධර්මය කන වැටීමෙන්

- අංගුලිමාලාදී මහා ප්‍රචණ්ඩයෝ සෞම්‍යයෝ වෙති.
- අහක දමන දෙයක් පවා දීමට නොකැමති මහ මසුරෝ ත්‍යාගවත්හු වෙති.
- පාරදාරිකයෝ සජ්ජනයෝ වෙති.
- මෘෂවාදීහු සත්‍යාවදීහු වෙති.
- සුරා සොණ්ඩයෝ, සුදු කාරයෝ සජ්ජනයෝ වෙති.
- අලසයෝ වීර්ය ඇත්තෝ වෙති.
- පඤ්චකාම නමැති මඩෙහි එරී සිටියෝ එයින් ගොඩවෙති.
- ගිහියෝ පැවිදි වෙති.
- නොරහත්හු රහත් වෙති.
- රෝගීහු නිරෝගී වෙති.
- මරණාසන්නවුන් දිවි ලබති.
- අපායට යන්නට සිටින්නෝ සුගතියට යෙති.

- අපමණ සත්ත්වයෝ ජාති, ජාරා, ව්‍යාධි මරණාදී දුක්වලින් මිදී නිවන් සුව ලබති.

මේ ධර්ම චක්‍රයේ මහානුභාවයයි.

මෙවන් වූ මහානුභාව සම්පන්න වූ බලයක් සහිත වෙනත් නායකයෙකු, මාර්ගෝපදේශකයකු මේ විශ්වය තුළ මෙතෙක් පහළ වූ බවට කිසිඳු සාක්ෂියක් නැත.

නායකයෙකු වූ කලී තනතුර මත බැබළෙන්නෙකු නොව, තනතුර බබළවන්නෙකු බව වත්මන් නායකයින්ට අවබෝධ කරගැනීමට වෙනත් සාක්ෂි අවශ්‍ය නොවනු ඇත.

මෙවන් වූ ශ්‍රේෂ්ඨ නායකත්වයකට පත්වීමට කිසිවෙකුගේ ඡන්දයක් හෝ බාහිර බලපෑමක් අවශ්‍ය නොවේ. මෙය ස්වයං වීර්යයෙන්, ස්වයං භූත ඥානයෙන් මිනිස් චිත්ත සන්තානය තුළින් පැන නගින්නකි. අවශ්‍ය ස්වාභාවික සාධක සියල්ලක් සම්පූර්ණ වූ විට දියෙහි ඇති නෙළුම් පොහොට්ටු විකසිත වී අවට සුවඳවත් කරන්නා සේ මුළු විශ්වය පුරා එහි ගුණ සුවඳ ඉතිරී පැතිරී යනු ඇත. එය සකල ලෝ වැස්සන්ගේ යහපත පිණිස ම වේ. එවන් නායකත්වයක් සතු බලය, කීර්තිය කිසිඳු බලවේග යකින් විනාශ කළ නොහැක. ඒ විශ්වීය ධර්මතාවයයි.

*

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මෙවන් වූ සුවිශේෂී නායක්තවය උරුම කර ගැනීමට නම් ගමන් කළ යුතු මාවතක් ඇත. එය තථාගතයන් වහන්සේ ලොවට හඳුන්වා ඇත්තේ මීට වසර 2600 කට පෙරදී, මිනිස් වර්ගයා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙනි. ඒ මඟ හෙළි පෙහෙළි කර ගැනීම තම තමා සතු කාර්යයකි. වෙනත් විකල්ප මාර්ග නොමැති හෙයින් සර්වඥයන් වහන්සේ පෙන්වා දුන් ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයටම අප කවුරුත් ප්‍රවිශ්ඨ විය යුතුමය. ඒ සඳහා **සාධු දුක්මක්** අවශ්‍යම ය. ප්‍රාඥා ඇස විවර වන්නේ එතුළින් පමණි. ඒ ඔස්සේ ගමනාන්තයට ළඟා වන්නා **පටිච්ච සමුප්පාදය** නුවණින් දකී.

"ධර්මය දකින්නා පටිච්ච සමුප්පාදය දකී. පටිච්ච සමුප්පාදය දකින්නා ධර්මය දකී." ඒ බුදු වදනයි.

- අවිජ්ජා - සංඛාර
- සංඛාරා - විඤ්ඤාණං
- විඤ්ඤාණං - නාම රූපං
- නාම රූපං - සළායතන
- සළායතන - ඵස්ස
- ඵස්ස - වේදනා
- වේදනා - තණ්හා
- තණ්හා - උපාදාන
- භව - ජාති
- ජාති ජරා, මරණ, දුක්ඛ, දොමනස්ස...

මේ සියල්ල එකින් එකට බැඳී පවතී. අවිද්‍යාව සිඳලන තුරු සසර ගමන නවතා ගත නොහැක. උපත දුකකට විනා සැපතකට නොවන්නේමය. එසේ නම් එයට හේතු වන තෘෂ්ණාව සහමුලින්ම සිඳලිය යුත්තාහ.

සියලු සත්ත්වයෝ ධර්මයේ පිහිට ලබත්වා !!!

***

VISIBLE DHAMMA IN ENGLISH
(for comprehension)

"Buddha" means "enlightened." The path to enlightenment is attained by utilizing morality, meditation and wisdom. Buddhists often meditate because they believe it helps to awaken,"Truth". The Basic Teachings of Buddha which are core (interior) to Buddhism are as follows.

1 **The 3 Universal Truths;**

2 **The 4 Noble Truths; and**

3 **The Noble (8) Eightfold Path.**

They are the 3 basic teaching of Buddhism. Without retaining at least a bit, the Buddha taught this Truth within 45 years on behalf of the suffering beings. **What a prominent charactor?**

The real nature of the natural world that the Buddha realized at the enlightenment is mainly based on ***"Tilakhana"*** : **Anicca, Dukkha, Anatta.** The 1st feature is the dynamism of the universal energy *(Anicca)* causing the regular transformation **(Dukkha)** of the the universal energy so that nothing created by the universal energy retains a permenant identity ***(Anatta).***

Everything is subjected to change. One who born as an infant, passing stages childhood and youth becomes feeble and get into dotage decaying little by little and finally reaches the death. *(Jāthi, Jarā, Marana). Then, due to the rebirth again follow the same routine. This is an eternal truth. NO one could ever stop this chain until the BUDDHA found the reason.*

According to the scriptures, the Buddha understood that in life there exist 'Dukkha' which in real meaning is 'sorrow, pain and suffering', that is caused by desire and it can be brought to cessation by following the **Noble Eight Fold Path.**

This 1st teaching is called **"4 Noble Truth"** "Chathurariya sacca" in Pali-Language.

1. **Suffering - Dukka Sacca**
2. **Cause of suffering - Samudaya Sacca**
3. **Cessation of suffering - Nirodha Sacca**
4. **Magga – The 8 fold path leading to the cessation of suffering**

The 1st noble truth is mental suffering ***(Dukkha Dukkha)***. Understanding how it arises ***(Samudaya)***, Understanding how it plays and ends ***(Nirodha),*** *Realizing the way* how to end, ***(Magga)***

This ***(Magga) :*** path is nothing other than The **Noble Eightfold Path: Middle Path:** Eight Great Truth. Anyone who likes to have liberation should follow this path. It is the whole law of life, the whole rule of conduct. It is the threshold to Arhatship. When it is understood and practice human evolution would be rapid and secure.

1. Right Vision ....(Wisdom / **Panna**)

2. Right Intention........... . (Wisdom / **Panna**)

3. Right Speech....................(Morality / **Seela**)

4. Right Action....................(Morality / **Seela**)

5. Right Livelyhood......... ....(Morality / **Seela**)

6. Right Effort.....................(Meditation / **Samadhi**)

7. Right Mindfulness...............(Meditation / **Samadhi**)

8. Right concentration.............(Meditation / **Samadhi**)

"This noble Truth must be penetrated by cultivating the path; such as the vision, insight, wisdom, knowing and light that arose in me about things not heard before" the Buddha preached. (Samyukta Nikaya vi-ii)

After the enlightenment the Buddha declared all these techniques on behalf of suffering beings to follow and escape from this long sansara as there is no other routes to follow to release from this endless sansaric journey.

"Nibbana or Nirvana" is the ultimate bliss of emancipation from suffering . It is for this end result that the **Four Noble Truth** should be perceived and followed up with the **Noble Eight Fold** Path.

Some people tries to raise-up the question **"What or where is Nibbana?** but Buddhism totally denies the existence of a permanent being or an immortal soul. So this pertinent question does not arise

The cessation of suffering can be attained through ***Nirodha .*** "*Nirodha*" means the unmaking of sensual craving and conceptual attachment. The 3rd Noble Truth expresses the idea that suffering can be ended by attaining dispassion. ***'Nirodha'*** attains by extinguishing all forms of clinging and attachment.

This means that suffering can be overcome through human activity, simply by removing the cause of suffering. Attaining and perfecting dispassion is a process of many levels that ultimately results in the state of ***Nirvana.***

Nirvana means the freedom from all worries, troubles, complexes, fabrications and ideas. ***Nirvana*** is not comprehensible for those who do not attain it earnestly. One who destroy craving can get into this supreme stage. The Buddha had showed the one and only correct and direct route to step on and reach the destination. Until we ourselves reach this supreme destination no one can

escape from sufferings. To achieve this highest stage one should see "Dhamma" not through the naked eyes but only through the wisdom eyes. Through the widened vision of "Dhamma", Craving can be destroyed.

The more we expand the **"Vision of Dhamma"** the more we can get the profit of this human life.

The path for this destination is visualized at the end of each section such as "Sutta", preached by the Buddha. When recite them tracing the meaning carefully the reader's eyes as well as the mind glues to the **Dhamma:** the reality of the world. It itself illuminates the path to emancipation.

*

" The Turning of the Wheel of Law"

In the very first sermon at Isipathana **The Turning of the Wheel of Law,** the Buddha's expounding of the 'four Noble Truth ' can be understood on the analogy of a pathological analysis of affliction and cure.

There in the present predicament of man is analysed in the First Noble Truth with its physical,psychological ,and phycho-physical aspect , showing how those affliction are woven in to the fabric of our existence.

In the **Second Truth,** the root cause of the present affliction, which exist in the form of desire, is broken down into its constituents for the better understanding of that cause.

In the **Thired Truth,** the state of being redeemed from afflictions by regaining health is described, whch is nothing but Nibbana, the Supreme Bliss .

In the **Fourth Truth**, the remedy to ameliorate the affliction is prescribed by way of the "Noble eight Fold Path" . It is quite clear that the theory of casuality also applies to the analysis of suffering , the cause of suffering and its appeasement and path.

*Such a clear path has been pointed out by the Buddha to be cured and escape from this life circle. We all should follow this path to reach **the destination of Blissful Nibbana** without being stupid.*

***

පටිච්ච සමුප්පාදය ඉංග්‍රිසි බසින්
DEPENDENT ORIGINATION

The Buddha's teaching called Paticca- Samuppada, usually translated as **"Dependant Origination"**. It is fundamental to the Dhamma **(Truth)** awakened by the Buddha on the Light of His Enlightenment. The Buddha is recorded to have said ;

"One who sees **"Dependant Origination",** sees the Dhamma. One who sees the Dhamma sees **"Dependant Origination"**

The forward order of **"Paticca-samuppadaya",** when analysed, shows that only some of the first 11 factors are a sufficient condition for the factor following. Those facters linked by a sufficient condition, meaning that the following factor must come about sooner or later as a consequence of the preceeding factor, are as follows

- **Avijjâ paccayâ -Sankharâ**
- **Sankharâ paccayâ -Vinnana**
- **Vinnana paccayâ - Namarupa**
- **Namarupa paccayâ - Salayatana**
- **Salayatana paccayâ -Phassa**
- **Phassa paccayâ-Vedana**
- **Vedana paccayâ - Tanhâ**
- **Tanhâ paccayâ - Upadana**
- **Upadana paccayâ - Bhavo**
- **Bhava paccayâ - Jati**
- **Jati paccayâ – jara- Maranam…**

Thus when there is **avijja,** there will inevitably occur some 'kamma' formation inclining to rebirth. When there is **vinnana** there must be Namarupa which causes **Salayatana. Phassa,** and **Vedana.** When there is **Tanha** there will be **Upadana** also, Bhava is sufficient to produce birth (see An 3, 76). Then most probably, **'Jati'** must produce **'Dukkha'**. Having been born one must suffer; **dukkha.** Therefore the only escape from suffering is to **cease** from being reborn.

In brief to be born is Dukka. Not to be born is Sukkha (Happiness)

This is how life arises, exist and continues. If we take this formula in its reverse order, we come to the cessation of the process.

It is clear that each of these factors is conditioned (paticcasamuppanna). So, they are all relative, interdependent and interconnected and nothing is absolute or independent; hence no first cause is accepted by BUDDHISM as we have seen earlier. Conditioned Genesis shold be considered as a **circle and not as a chain.** So the Buddha advised us to **destroy craving.**

*

Destroy craving

"There is no satisfying sensual desires even with a rain of gold coins' " for sensual pleasures give little sweetness (satisfaction) and much pains." "Having understood the wise man finds no delight even in heavenly pleasure" ' The disciple of Supreme Buddha delights in the destruction of craving.

න කහාපන වස්සෙන - තිත්ති කාමෙසු විජ්ජති

අප්පස්සාද දුඛා කාමා - ඉති විඤ්ඤාය පණ්ඩිතො

(ධ.ප 186)

කහවනු වැස්සකිනුත් මිනිසාට, වස්තුකාම ක්ලේශකාම යන ආශාවන්හි තෘප්තියක් ඇති නොවේ. මේ නිසා පණ්ඩිතයා කාමය මඳ ආස්වාද ඇත්තක් බවත් දුක බහුල දෙයක් බවත් නුවණින් දැනගත යුතුය.

අපි දිබ්බෙසු කාමෙසු - රතිං සො නාධිගච්ඡති

තණ්හක්ඛය රතො හොති - සම්මා සම්බුද්ධ සාවකො

(ධ.ප 187)

සැබෑ පණ්ඩිතයා දිව්‍යව කාම සම්පත්වලින් පවා නොඇලෙයි. සම්බුද්ධ ශ්‍රාවකයා (ආශාවෙන් බැඳෙනවා වෙනුවට) තණ්හාව නැති කිරීම් සංඛ්‍යාත නිවණෙහි ඇලුනෙක් වෙයි.

Greed of a person not quenched even by a shower of gold coins. Sensual pleasure is short-lived and painful. Knowing this a wise man do not desire even celestial pleasure. A disciple of the Buddha is keen only about putting an end to craving.

***

13

අනුගාමික සංඝරත්නය
SUBSEQUENT DISCIPLES

භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දුක් විඳින ලෝක සත්ත්වයාගේ කෙලෙස් ප්‍රහාණය සඳහා දේශනා කර වදාළ ත්‍රිවිධ පුණ්‍යක් ක්‍රියාවන් ද, කාමයන්ගේ දෝෂ ද, පහත් බවද, කෙලෙසීම ද, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද, අසා ගිහි ගෙයිහි කළකිරී පැවිදිව, සමථ විදර්ශනා වඩා සකල ක්ලේශයන් නසා සතර මඟ, සතර ඵලවලට පැමිණි සර්වඥයන් වහන්සේගේ **සාරිපුත්ත, මොග්ගල්ලාන යන අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ ප්‍රධාන සංඝ සමූහයා සංඝ රත්නය නම් වන්නේය.**

මහා සංඝරත්නයෙහි ගුණ මෙනෙහි කරන විට මෙසේ ද සිහිපත් කිරීම අර්ථවත් ය. අපගේ ධර්ම සේනාධිපති, ප්‍රඥාවෙන් අගතැන්පත් **සාරිපුත්ත මහ රහතන් වහන්සේ, මහා ඍද්ධි බල සම්පන්න මොග්ගල්ලාන මහරහතන් වහන්සේ,** පළමුවන සංඝායනාවේදී මූලිකව කටයුතු කළ **මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ** බුදුපියාණන් වහන්සේ දේශනා කළ සියලුම ධර්මය දරාගෙන වැඩසිටියා වූ ධර්ම භාණ්ඩාගාරික **ආනන්ද මහ රහතන් වහන්සේ** දෙවන ධර්ම සංඝායනාව පැවැත්වීමට මූලික වූ **සබ්බකාමී මහ රහතන් වහන්සේ,** තුන්වන ධර්ම සංඝායනාවට මුල් වූ **මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ** ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය ස්ථාපිත කිරීම සඳහා මෙහි වැඩම කළ **මිහිඳු මහ රහතන් වහන්සේ** සංඝමිත්ත මහරහත් තෙරණිය ඇතුළු රහත් තෙරණිය වසර 12 ක පමණ කාලයක් මුළුල්ලේ පැවති දුර්භීක්ෂයේදී ගස්වල කොළ පොතු ආදිය වළඳමින් ජීවිතය රැක ගනිමින්, ශ්‍රී සද්ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ දැවැන්ත ශාසනික මෙහෙවරට ඇප කැප වූ අවස්ථාවලදී දිවි පරදුවට තබා බුද්ධ ශාසනය ආරක්ෂා කරගනිමින්, ශ්‍රී සද්ධර්මය සුරක්ෂිත කළ **වාරියපොළ ශ්‍රී සුමංගල, සරණංකර** ආදී වූ ස්වාමීන් වහන්සේලා

මෙන්ම, **අනගාරික ධර්මපාල** තුමා ද එදා සිට මේ දක්වා ශ්‍රී සද්ධර්ම ආරක්ෂා කරගෙන වත්මන්හි අප වෙනුවෙන් ශ්‍රී සද්ධර්මයන දේශනා කර සියලුම ධර්මධර, විනයධර, ශාසන ශෝභන, බහුශ්‍රැත මහා සංඝ රත්නය ද අපගේ මතකය අවදි කිරීමේ ද අමතක නොකලයුතු චරිතයන් බවට පත්ව ඇත.

මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ **ශ්‍රාවක සංඝ** රත්නය කවුරුන්දැයි නිසි ලෙස හඳුනා ගැනීම වැදගත් ය. මෙම ශ්‍රාවක සංඝයා යුගල වශයෙන් ගත කල හතරකි. පුද්ගල වශයෙන් සලකා බලන කළ අට දෙනෙකි. **යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා** ඒස භගවතො සාවක සංඝො එනම් සෝතාපන්න මාර්ගයට බැසගත් (මාර්ගස්ථ) සහ සෝතාපන්න ඵලය ලද (ඵලස්ථ) වශයෙන්ද සකෘදගාමී මාර්ගයට බැසගත් (මාර්ගස්ථ) සහ සෝතාපන්න ඵලය ලද (ඵලස්ථ) වශයෙන්ද අනාගාමී මාර්ගයට බැසගත් (මාර්ගස්ථ) සහ අනාගාමී ඵලය ලද (ඵලස්ථ) වශයෙන්ද අර්හත් මාර්ගයට බැසගත් (මාර්ගස්ථ) සහ අර්හත් ඵලය ලද (ඵලස්ථ) වශයෙන්ද වේ.

මෙලෙස හඳුන්වා ඇති අෂ්ඨ ආර්ය පුද්ගලයෝ ශ්‍රාවක සංඝ රත්නයයි. මෙයින් පරිබාහිර කිසිවකු මහා සංඝ ගණයෙහි ලා සැලකෙන්නේ නැත. යම් භික්ෂුවක් තමාට කැප වූ සීලයෙහි පිහිටා, අදාළ ඇවතුම්, පැවතුම්වල යෙදෙමින් ධර්මය හදාරමින් සක්කාය දිට්ඨි ප්‍රහාණය පිණිස, බුදු පියාණන් වහන්සේ විසින් වදාළ කායගතිසති භාවනාවේ යෙදෙමින් වාසය කරන්නේ නම් පමණක් උන්වහන්සේ සෝතාපත්ති මාර්ගයට බැසගත් අයෙකු ලෙස ධර්මයේ සඳහන්ය. බුදු පියාණන් වහන්සේ නව ආකාරයකින් ගුණ සඳහන් කර ඇත්තේ, මෙවන් වූ මාර්ග හතරට හෝ ඵල හතරට අවතීර්ණ වී ඇති ශ්‍රාවක සංඝ පරපුරෙහි ය.

මෙකී **සඟ පරපුරෙහි ආර්ය සංඝයා** වහන්සේ ලෝභ, ද්වේශ. මෝහ අකුසල් මුල් සිඳළමින් නිර්වානගාමී මාර්ග ප්‍රතිපදාවෙහි ම යෙදෙති. කිසිවක් කෙරෙහි තද ඇලීම් ගැටීම් උපාදාන කර නොග න්නා මෙම උතුම් සංඝ රත්නය සියල්ල **ත්‍රි ලක්ෂණයට** යටත් කරමින් විදර්ශනා නුවණින් දකී. සියලුම සංඛත වස්තූන්, සතර මහා භූතනයට

(ආපෝ, තේජෝ, වායෝ, පඨවි) අයිති බවත් තමාගේ යැයි උපාදාන කර ගැනීමට කිසිවක් නොමැති බවත් මනා සිහි නුවණින් දකිමින් තම ශීලය ආරක්ෂා කරගනිමින් පැවිදි දිවි පෙවත ඉතාමත් එලදායී ලෙසින් ගෙන යන්නේ තමන් වහන්සේට ප්‍රත්‍ය සපයන දායක දායකාදීන්ගේ යහපත් බලාපොරොත්තු ඉටුවන පරිද්දෙන් පින් අනුමෝදන් කරවමිනි.

තමන් වහන්සේ වෙත පුදනු ලැබූ කිසිවක අඩු පාඩු නොසයන උන් වහන්සේ ප්‍රත්‍යවේක්ෂා කරමින් පූජා කරනු ලැබූ දාන වස්තු පරිහරණය කරති. එදා බුද්ධ සමයෙහි ලාදුරු රෝගයෙන් පෙළෙමින් සිටි සැදැහැවතෙකු විසින්, සාරිපුත්ත මහ වහන්සේ නමකගේ පාත්‍රයට දන් පූජා කරමින් සිටියදී, **සිය ඇඟිලි පුරුකක් ගැලවී පාත්‍රයට වැටුණේ වුවද, එය පමණක් ඉවත්කර දානය වැළඳීමට තරම් නිවුණ සිතක්, කාරුණික සිතක් මෛත්‍රී සහගත සිතක් උන් වහන්සේ සතුව තිබිණි.**

අද සමාජයේ වුවද, සැදැහැවතෙකු විසින් සංඝ රත්නය වෙනුවෙන් දානයක් පිළියෙල කොට පූජා කරන්නේ අසීමිත භක්තියකිනි. ඉමහත් කැපවීමකිනි. මහත් වෙහෙසකිනි. එහි සුළු හෝ අඩුපාඩුවක් දුටුවේ වුවද, කිසි දිනක **සඟ පරපුරෙන් පැවතෙන ආර්ය සංඝයා වහන්සේ** නමක් ඒ පිළිබඳව චෝදනා නොකරති. **ඒ සුසිල්වත් බවෙහි ලක්ෂණයයි.** එහෙත් ඇතැම් දුසිල්වක් භික්ෂුවේශධාරීන් එවැනි තත්ත්වයන් හමුවේ කෝප සහගතව, තමාට තමා පාලනය කරගත නොහැකිව, ලැබුණාවූ ප්‍රත්‍යලාභයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමට තරම් සමතුලිත මානසිකත්වයක් පවා නොමැතිව, විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ අනුග්‍රාහක දායක භවතුන් අපහසුතාවයට පත්කිරීමට උත්සුක වෙයි. **එහෙත් ධර්මාවබෝධයකින් යුතු ප්‍රඥාවන්ත සුපින්වතුන් ඒ කිසිවකට ප්‍රතිචාර නොදක්වයි.** බුදු පියාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ එකම එක ධර්ම පර්යාසයක් පවා මෙවන් තත්ත්වයන් හමුවේ හදවත් තුළ දිදුළයි. එනම්, **"නච කිංචි ලෝකෙ උපාදියති."** කිසිවක් කිසිවෙකු විසින් උපාදාන කරගතයුතු නැත. **මෙළෙස සිතන්නන්ගේ දිවි ගමන කෙතරම් සුන්දර ද?** ඔවුහු මෙම භවය තුළ සියලු යුතුකම් ඉටු කරමින්, සියලු පුද පූජා නිසලෙස පවත්වා ගනිමින්, ආර්ය සඟ ගුණ මෙනෙහි කරමින්, නිර්වාන මාර්ග ප්‍රතිපදාව ඔස්සේ සුවසේ දිවි ගෙවන්නෝ වෙති.

*

දෛනිකව තෙරුවන් සරණ යාමෙන් පසු බුද්ධ රත්නයේ ගුණ, ධර්ම රත්නයේ ගුණ සහ සංඝ රත්නයේ ගුණ පිළිවෙළින් සිහිපත් කරමින් සජ්ජායනා කිරීම බෞද්ධ සම්ප්‍රදායයි. බුදුගුණ, සඳහම් ගුණ සවිස්තරාත්මකව පසුගිය පරිච්ජේද දෙක තුළ අන්තර්ගතය. සංඝ රත්නයේ ගුණ ද නව ආකාරයකින් වර්ගීකරණය කෙරේ. පහසු උච්ජාරණය සහ අවබෝධය සඳහා සංඝ රත්නය වැඳීමේ ගාථාව ද ඉංග්‍රිසි භාෂාවෙන් ද මෙහි සංගෘහිතය.

සුපටිපන්නො භගවතො සාවකසංඝො, උජුපටිපන්නො භගවතො සාවකසංඝො, ඤායපටිපන්නො භගවතො සාවකසංඝො, සාමිචිපටිපන්නෝ භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ටපුරිස පුග්ගලා ඒස භගවතො සාවඛ සංගෝ අහුනෙය්‍යයෝ පාහුනෙය්‍යයෝ දක්ඛිනෙය්‍යයෝ අංජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්කෙත්තං ලොකස්සාති.

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ, මැනවින් ගුණ ධර්ම පිළිපැදීම නැමැති ආර්ය මාර්ගයට පිළිපඳින්නේය. ඇද නැති ගමන් මාර්ගයෙහි ගමන් කරන්නේය. නිවන් මඟට පිවිසියේය. නිවන් මඟට සුදුසු ප්‍රතිපත්තියට පිවිසියේය. **ඒ සංඝයා පුරුෂ යුගල වශයෙන් හතරකි. වෙන් වෙන්ව ගත්කල අට දෙනෙකි.** භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුර සිට ගෙනවුත් පුදන සිව්පසය පිළිගැනීමට සුදුසු ය. දක්ෂිණාවට සුදුසුය. පරලොව සඳහා දිය යුතු දන් ලබන්නට සුදුසුය. දොහොත් මුදුන් තබා වන්දනීයත්වයට සුදුසුය. ලෝ වැසියන්ට උතුම් පින්ඵල හටගන්වන පින් කෙතකි.

Salutation to Sangha~

Supatipanno Bhagavato savaka-sañgho; **Ujupati-panno** Bhagavato savaka-sañgho; **Ńaya-patipnno** Bhagavato savaka sañgho; **Sãmi-ci- patipanno** Bhagavato savaka sañgho; Yadidam cattãri, puri-sa –ugani, ****Attha-purisa*** puggala, Esa Bhagavato savaka sañgho; Ãhuneyiyo , Pahu neyiyo , Dakkhi **neyiyo , Anjalikaraniyo,** Anut-taram, puññakkhettam lokassã'ti.

Meaning in English

The disciples of the Blessed one are…..

- of good conduct is the order
- of up-right conduct is the order
- of wise conduct is the order
- of dutiful conduct is the order

This Order of the disciples of the Blessed one (namely, in those Four Pairs of persons: (Eight kinds of individuals)

- is worthy of offerings,
- is worthy of hospitality,
- is worthy of gifts,
- is worthy of reverential salutation.
- Is an incomparable field of merits to the world.

***Attha-purisa puggala** *– - The four pairs of persons are the four kinds of Noble (ariya) disciples who have attained the FOUR Paths and FOUR Fruits of the nobility in Dhamma, namely ; Sothåpatti (stream winner), Sakadågami (once returner), Anågåmi (non-returner) and arhatta(One of supreme Worth). The FOUR pairs becomes EIGHT when the Path and Fruit are regarded separately.*

*

01. සුපටිපන්නෝ - Supatipanno - Enter the true path and practice

බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රාවක සංඝයා** සුපටිපන්න වන සේක. එනම් යහපත් පිළිවෙතකට බැසගත් යන අදහස මෙහි අන්තර්ගතය. මෙහි යහපත් පිළිවෙත යනු **රාග, ද්වේශ, මෝහ** නැසෙන පිළිවෙතයි. නිවන් අවබෝධයට උපකාර වන පිළිවෙතයි. යමෙක් රාග, ද්වේශ, මෝහ නැසෙන පිළිවෙතක් තම ජීවිතය තුළින් නොදකී නම් ඔහු ශ්‍රාවක සංඝ ගණයට අයිති නොවේ.

02. උජුපටිපන්නො - Enter the straight path and practice

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා උජුපටිපන්න වන සේක. ඍජු වූ පිළිවෙතකට අවතීර්ණ වූ යන අදහස මෙහි අන්තර්ගත ය. එනම් ඒකාන්ත වශයෙන්ම නිවන කරා යොමු වූ මාවතට පිළිපන් බවයි. එනම් **ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.** එම ඍජු පිළිවෙත නම් වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යම් භික්ෂුවක් තම ජීවිතය තුළ අනුගමනය නොකරන්නේ නම් ඔහු **ශ්‍රාවක සංඝ** ගණයට අයිති නොවේ.

03. ඤායපටිපන්නො - Enter the wise path and practice

බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රාවක සංඝයා** උජුපටිපන්න වන සේක. එනම් ආර්ය න්‍යාය අවබෝධ කෙරෙන පිළිවෙතකට පිවිස බවයි.

ආර්ය න්‍යාය යනුවෙන් **චතුරාර්ය සත්‍යය** හා **පටිච්ච සමුප්පාදය** ද අරුත් ගැන්වෙයි. යමෙකු පටිච්ච සමුප්පාදය අවබෝධ කළේ ද ඔහු චතුරාර්ය සත්‍යය අවබෝධ කලේ වෙයි. යමෙකු චතුරාර්ය සත්‍යය අවබෝධ කළේ ද ඔහු පටිච්ච සමුප්පාදය අවබෝධ කළේ වෙයි. එම පිළිවෙත මහා විදර්ශනාවයි. යම් භික්ෂුවක් අප්‍රමාදීව විදර්ශනා භාවනාවන්හි නොයෙදී ඉන් බැහැරව කටයුතු කරයි. නම් ඔහු **ශ්‍රාවක සංඝ ගණයට** අයිති නොවේ.

04. සාමීචිපටිපන්නො - Enter the dutiful path and practice

බුදු පියාණන් **ශ්‍රාවක සංඝයා** සාමිචිපටිපන්න වන සේක. නිවන් පිණිස හේතුවන සඳහම් පිළිසඳරට බැසගත් හෙයින් සාමීචිපටිපන්න ගුණයෙන් යුක්තය. උන්වහන්සේලා තමන් වෙත පැමිණෙන ගිහි, පැවිදි කිසිවෙකු සමඟ නිෂ්ඵල කථාවන්හි නොයෙදෙති. ධර්මය පිළිබඳවම සාමීචියෙහි යෙදෙයි. ගිහියෙකුගේ චිත්ත පීඩාවක් හමුවේ වුවද

සැනසීමක් ලබා දෙන්නේ ධර්මය ඔස්සේ කරුණු පැහැදිලි කරමිනි. **සාමීචි** යන වචනය තුළ **නිවැරදි පිරිසිදු** යන අදහස් ද ගැබ්ව ඇත. **පිරිසිදු වූ පිළිසඳර කථාවන්හි නොයෙදී කෙලෙස් වැගිරෙන වෙනත්** කථාවන්හි යෙදේ නම් ඔහු ද ශ්‍රාවක සංඝ ගණයට අයිති නොවේ.

ශ්‍රාවක සංඝ රත්නය තුළ පවත්නා නියම ගුණ හතර මෙලෙසින් දැක්වෙන අතර අනතුරුව දැක්වෙන්නේ මෙම ගුණ පිරීම් නිසා ඇතිවන යෝග්‍යතා හතරකි. ඉහත සඳහන් ගුණ හතර පිරීම පසෙක ලා වෙනත් මඟක ගමන් කරන්නෝ පහත සඳහන් යෝග්‍යතාවනට සුදුසු නොවුන ඇත. එකී යෝග්‍යතාවයන් අවසානයේ දී **ශ්‍රාවක සංඝ** රත්නයේ වටිනාකම පැහැදිලි කෙරෙයි.

05. ආහුණෙය්‍යො - worthy of receiving offerings

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය, ඉතා දුර සිට ගෙන එනු ලැබූ ආමිෂයන් වුවද පිළි ගැනීම සුදුසුය. එසේ සුදුසු වන්නේ එම පූජා මහත්ඵල මහානිසංස කිරීමට **ශ්‍රාවක සංඝ** රත්නය සමත්වන හෙයිනි.

06. පාහුණෙය්‍යො - worthy of receiving any offerings from any distence

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය ආගන්තුක සත්කාරයන් ලැබීමට සුදුසු ය. එසේ සුදුසු වන්නේ ද එම පූජා මහත්ඵල මහානිසංස කිරීමට ශ්‍රාවක සංඝ රත්නය සමත්වන හෙයිනි.

07. දක්ඛිණෙය්‍යො - worthy of receiving gifts such as robes & alms bowls

බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රාවක සංඝ රත්නය,** දක්ෂිණාව පිළිගැනීමට සුදුසු වන සේක. සැදැහැවතුන් විසින් අනාගතයේ උසස්ඵල ප්‍රාර්ථනා කර ගෙන පූජා කරනු ලබන දෙය **දක්ෂිණාව** නම් වෙයි. එය පිළිගැනීමට සුදුසු වන්නේ එම ප්‍රාර්ථනාව සඵල කරදීමට සමත් අය පමණි. බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රාවක සංඝයා** එයට සුදුසු වන හෙයින් **දක්ඛිණෙය්‍ය** වන සේක.

08. අන්ජලීකරණෙයො - worthy of reverential salutation

බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රාවක සංඝ රත්නය** දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසුවන සේක. ඒ එසේ වඳින සැදැහවතුන්ගේ යහපත් ප්‍රාර්ථනා සඵල කිරීමට ශ්‍රාවක සංඝයා සමත් වන හෙයිනි.

09. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස
incomparable field of merits to the world

බුදු පියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය ලොවට උතුම් පින් කෙතක් වන්නේය. කෙතක් යනු බීජ වපුරා සිය දහස් ගුණයකින් අස්වැන්න ලබාගත හැකි ස්ථානයකි. එලෙස එලදායී ඇස්වැන්නක් ලබාගත හැක්කේ කෙත සරු සාර වුවහොත් පමණි. භාග්‍යවතුන් වහන්සේගේ **ශ්‍රාවක සංඝයා** නිසා සැදැහැති මිනිසුන්, දානාදිය පිදීමෙන් පුද සත්කාර කිරීමෙන්, ගරු බුහුමන් කිරීමෙන්, වැඳුම් පිදුම් කිරීමෙන් **අවම වශයෙන් සාධු දැක්මෙන් යුතුව සිත පහදවා ගැනීමෙන් පවා මහත් ඵල මහානිසංස ලබා ගනී. එබැවින් උන් වහන්සේලා ලෝකයාට සැප නමැති අස්වැන්න ලබා ගැනීමට තිබෙන සරුසාර පුණ්‍ය ක්ෂෙත්‍රය වන්නේය.**

***

තෙවන කොටස
PART - III

14

සූවිසි ගුණ බලය
SUPERMACIES OF TRIPLE GEM

අනන්ත ගුණයෙන්, අනන්ත ඤාණයෙන්, මහා කරුණාවෙන් යුත් තුන් ලොවට අධිපති බුදු පියාණන් වහන්සේ සතු බුද්ධ බලය අචින්ත්‍ය ය. මෙවන් අප්‍රමාණ ගුණ බලයක් ඇති බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරනු ලැබූ ශ්‍රී සද්ධර්ම මහානුභාව බල සම්පන්නය. බුදු පියාණන් වහන්සේගේ අනුගාමික මහා සංඝ රත්නයේ ද ගුණ අනන්තය.

නව අරහාදී බුදු ගුණ බලයත් සය ආකාරයකට සම්පිණ්ඩනය කර ඇති ධර්මස්කන්ධයේ ගුණ බලයත් නව ආකාර වූ සංඝ රත්නයේ ගුණ බලයත් ඒකරාශී වීමෙන් ගොඩනැඟී ඇති ශක්තිය සූවිසි ගුණ බලයයි.

මෙම අනන්ත වූ සුවිසි ගුණ නිරන්තරයෙන් මෙනෙහි කිරීමෙන් සජ්ජායනා කිරීමෙන් හෝ සවනට යොමු කිරීමෙන් මහත් ආරක්ෂාවක් සැලසෙයි. එනම් නිසිලෙස දෛනිකව බුද්ධ, ධම්ම සහ සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ සිහි කිරීමෙන් ම අපගේ දෛනික ජීවිත මහත් සෞභාග්‍යයකින් පිරී ඉතිරී යයි. දෛනික ගැටළු අභියෝග හමුවේ සමතුලිත මානසිකත්වයක් පවත්වා ගැනීමට **මෙම සූවිසි බුදු ගුණ මහත් පිටුවහලකි.** එමගින් ඉමහත් සෙතක් උදාවනු ඇත.

නිසි පරිදි නමස්කාරය, තිසරණ සහිත පංචසීලයෙහි පිහිටා මෙම සූවිසි බුදුගුණ සිහි කිරීමෙන් සජ්ජායනා කිරීමෙන් මහත් වූ ආශීර්වාදයක් වඩාත් තීව්‍ර ලෙස තම තමාගේ දෛනික ජීවිතවලට බලපානු ඇත. එදිනෙදා ජීවිතය තුළින් ම විදර්ශනා නුවණින් ජීවමානව දකිය හැකි මෙම සුවිශේෂත්වය තුළින් ත්‍රිවිධ රත්නයේ බලය මනාව පිළිබිඹු කෙරෙයි.

මුළු ලෝකයම දෝලනය වන්නේ සත්‍යය මත බව බුදු පියාණන් වහන්සේ අපට අනුදැන වදාලහ. සත්‍යය මතම පදනම් වී ඇති **බුදු ගුණ, දම් ගුණ, සඟ ගුණ සිහි කිරීම ම** භාවනා කමටහනක් වන්නේය. ඉංග්‍රිසි භාෂාව කෙරෙහි වැඩි රුචිකත්වයක් දක්වන පාඨක භවතුන්ගේ ද යහපත හා චිත්තප්‍රීතිය වෙනුවෙන් **බුදු ගුණ, දම් ගුණ සහ සඟ ගුණ** සංක්ෂිප්තව මෙහි ඉංග්‍රිසි බසින් ද අන්තර්ගතය. එය නිසි ලෙෂ නිතර පරිශීලනය කිරීමෙන් නිසි ඵල ලඟා කර ගැනීමට පාඨක අවධානය යොමු වේවා.!

**

THE 24 SUPREMACIES OF TRIPLE GEM

Three sets of verses are recited to pay homage to the Triple – Gem: Buddha, Dhamma and Sangha. These words explain some of the great qualities and virtuous pertaining to the Triple Gem. By reciting these words one can understand the admirable qualities of the Triple Gem and also develop one's confidence in their intrinsic worth.

The Buddha himself explained these qualities in many of his Suttas. He also advised the devotees to recite these words to be mindful of the Buddha, Dhamma and the Sangha in times of fear or disturbance, whether arising from external sources or through evil influences so that such disturbances can be vanquished. This is because Buddha, Dhamma and Sangha are free from all kinds of defilements and hindrances such as **greed, anger and ignorance.**

Furthermore according to the Buddha, there are some people who pray to gods or devas in times of danger for their own protection not realizing that these same gods are themselves not free from greed, anger, ignorance and impermanence. **It has also to be remembered that even the gods themselves are subject to fear.** Therefore for our protection, it is more advisable to remember the **Buddha, Dhamma and Sangha .**

*

බුදු ගුණ වන්දනාව

"ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝක විදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවාති."

අදහස :-

මාගේ ස්වාමී වූ ඒ අර්හත් වූ බුදු පියාණන් වහන්සේ සම්මා සම්බුද්ධය. අෂ්ඨ විද්‍යා, පසළොස්වරණ ගුණයෙන් යුක්තය. නිර්වාණ දක්වා යා යුතු ඍජු ගමන් මඟ අවබෝධ කරගෙන ලෝක සත්ත්වයාට පෙන්වා වදාළහ. දමනය කළ යුත්තන් දමනය කිරීමෙහි සමත් වන්නාහ. දෙවි මිනිසුන්ට ශාස්තෘ වන්නාහ. චතුරාර්ය සත්‍යය අවබෝධ කළ හෙයින් බුද්ධ ගුණයෙන් යුක්තය. සියලු කෙලෙස් නැති කළ බැවින් භාග්‍යවත් ගුණයෙන් යුක්තය. අනන්ත බුදු ගුණයන්ගෙන් පරිපූර්ණ වූ ඒ බුදු පියාණන් වහන්සේට මම වන්දනා කරමි.

" ***I forfeit my homage to*** the Exalted One, the worthy One, Perfectly Enlightened One: Endowed with clear vision and virtuous conduct, walked on the correct path having a clear destination, the knower of the world, the incomparable leader of all beings to be tamed, the teacher of god and men"

දම් ගුණ වන්දනාව

"ස්වක්ඛාතො භගවතා ධම්මෝ සන්දිට්ඨිකො අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකො පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති"

අදහස :-

බුදු පියාණන් වහන්සේ තමා අවබෝධ කොට ගත් ධර්මය මුල, මැද, අග මනාකොට සකසා දේශනා කළහ. මෙලොවදීම එම ධර්මයේ ඵලය අත්විඳිය හැක. කල් නොයවා විපාක දෙන්නේය. පවතින්නා වූ දැකිය හැකි ධර්මයක් හෙයින් පැමිණ බලන ලෙස ධර්මය තුළ ම විවෘත ආරාධනයකි. තමා වෙත පමුණුවා ගැනීමට සුදුසුය. නුවණැත්තන් විසින් තම තමාගේ ප්‍රඥාවට අනුව තනි තනිව අවබෝධ කට යුතුය. ඒ උත්තරීතර ශ්‍රී සද්ධර්මය මම වන්දනා කරමි.

*“ **I forfeit my homage to** the **Dhamma** of the Exalted One , which is perfectly expounded from the beginning to the end: exist and can be seen; not limited for a certain period; inviting one to come and see; leading onwards to Nibbana ; to be individually realized by the wise.”*

සඝ ගුණ වන්දනාව

“සුපටිපන්නො භගවතො සාවක සංඝො, උජුපටිපන්නො භගවතො සාවක සංඝො, ඤායපටිපන්නො භගවතො සාවක සංඝො, සාමිචිපටිපන්නෝ භගවතො සාවක සංඝො, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතො සාවක සංඝො අහුණෙයොා පාහුණෙයොා දක්ඛිණෙයොා අංජලීකරණෙයොා අනුත්තරං පුඤ්ඤක්කෙත්තං ලෝකස්සාති”

අදහස :-

මැනවින් ගුණ ධර්ම පිළිපැදීම නැමැති ආර්ය මාර්ගයට පිළිපන්, ඍජු වූ ධර්ම මාර්ගයෙහි ගමන් කරන, ආර්ය සත්‍යය අවබෝධ කරන පිළිවෙතට පැමිණි නිවනට හේතුවන සඳහම් පිළිසරණ කථාවෙහිම යෙදෙන යුගල වශයෙන් හතරක් වූ අෂ්ඨ ආර්ය පුද්ගල ශ්‍රාවක සංඝ රත්නය, දුර සිට ගෙනැවිත් පුදන සිව්පස ලැබීමට සුදුසු ය. පරලොව සඳහා දිය යුතු දන් ලබන්නට සුදුසුය. දෙහොත් මුදුනේ තබා වන්දනීයත්වයට සුදුසුය. ලෝ වැසියන්ට උතුම් පින් එල හටගන්වන පින් කෙතකි. මෙකී ගුණයන්ගෙන් ශෝභමාන වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය මම වන්දනා කරමි.

*“ **I forfeit my homage** to the **Sangha** who walk along the true path, straight Path, correct path and proper path ; having path and fruit both: they are worthy for gifts: worthy for hospitality: worthy for offerings and reverential salutation , as the unique field of merit for the entire world.”*

බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ මහ රහතන් වහන්සේලාගේ පටන් සියලුම මාර්ග ඵල ලාභී ශ්‍රාවක සංඝ රත්නය

මම සරණ යමි. මුළු හදවතින් ම සරණ යමි. මාගේ ජීවිතයේ අවසාන හුස්ම පොද දක්වාම මම සංඝ රත්නය සරණ යමි.

මාගේ ජීවිතය තිබෙන තුරාම බුද්ධ රත්නය මුළු හදවතින්ම මම සරණ යමි. ධර්ම රත්නය මුළු හදවතින්ම සරණ යමි. සංඝ රත්නය මුළු හදවතින්ම සරණ යමි. නිවන් දක්නා තුරාම මුළු හදවතින්ම මම ත්‍රිවිධ රත්නය සරණ යමි.

The Triple Gem consisted with 24 virtuous as categorized in Dhamma. In short 9 great qualities of Buddha, 6 great qualities of Dhamma, and another 9 great qualities of Sangha. When we consider all these qualities as a whole, there are 24 great qualities inside the TRIPLE GEM. The influence of all these qualities is immeasurable and invaluable. It is so powerful. One who recites this daily with faith in mind gets the utmost benefit in this life itself. The result is vivid and can be seen in day to day life.

May the ***Buddha*** *be at my head,* ***Dhamma*** *in my heart and* ***Sangha*** *at my side to protect and guide me always****!!!***

මේ උතුම් ත්‍රිවිධ රත්නයේ අනන්ත මහා ගුණ බලය මාගේ ජීවිතයට

එකම ආලෝකය වේවා!

එකම රැකවරණය වේවා!

එකම සැනසීම වේවා!

අනන්ත බුදු ගුණස්කන්ධය ඇතුළත් මෙම ත්‍රිවිධ රත්නයේ ගුණ (සූවිසි ගුණ) නිතර වඩමින්, සජ්ජායනා කරමින් ජීවිතයට ආශිර්වාදයක් කරගැනීමට පාඨක ඔබ සැමගේ ද නෙත් සිත් පහන් වේවා!

සාධු! සාධු! සාධු!

***

15

ත්‍රිවිධ රත්නයේ සත්‍ය බලය තහවුරු කරන මහානුභාව සම්පන්න රතන සූත්‍රය

රතන සූත්‍රය යනු බුදු පියාණන් වහන්සේ විසින් දේශිත මහානුභාව බල සම්පන්න පරිත්ත සූත්‍රයකි. මෙම රතන සූත්‍රයේ නිදාන කථාවට **(The origin of the Jewel Discourse)** අනුව විසාලා මහනුවර වැසියන්ට උදා වූ ඉතාම අභාග්‍යසම්පන්න කාලයක, නගර වැසියන්ගේ ශ්‍රී විභූතිය නැවත ස්ථාපිත කරනු වස් බුදු පියාණන් වහන්සේ, ආනන්ද හිමියන් සහ තවත් භික්ෂුන් වහන්සේලා විශාල පිරිසක් සමඟ එහි වැඩම කර දින ගණනක්පුරා අඛණ්ඩව පිරිත් සඣ්ඣායනා කරමින් විපුල පල ලද බවට බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන මහාර්ඝ සූත්‍ර දේශනාවකි.

ඒ වනවිට දස දහසක් මිනිසුන් මරුමුවට පත් කරවමින් රෝග, දුර්භික්ෂ, අමනුෂ්‍ය උවඳුරු ආදියෙන් ගහණ වී තිබු නගරය අමු සොහොනක් සේ දිස්වන්නට විය. රජගහ නුවර සිට විශාල භික්ෂු පිරිසක් සමඟ බුදු පියාණන්වහන්සේ විශාලා මහනුවරට වැඩම කිරීමත් සමඟ අධික වර්ෂාවක් ඇද හැළෙමින් තැන තැන තිබූ මළමිනී ගසා ගෙන යන්නට වූහ. නගරය පිරිසිදු වීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ, ආනන්ද හිමියන් ඇතුළු සංඝ රත්නය සමඟ මෙම රතන සූත්‍රය දේශනා කරමින්, නගරය පුරා පිරිත් පැන් ඉසිමින්, නගර වැසියනට සෙත් පතමින් විශාලා මහනුවර විථි සංචාරය කරන්නට වූහ. වර්ෂාව නිසා පිරිසිදු වූ නගරයෙහි අමනුෂ්‍යයෝ ද පලා යන්නට වූහ. රෝග බිය ද පහව යන්නට විය. සියලු දෙනාම සුවපත් වූහ.

විශ්මයට සහ ප්‍රීතියට පත් සුවපත් වූ ජනතාව නගර මධ්‍යයේ ශාලාවක් සකස් කොට බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා රහතන් වහන්සේ 500 ක් වැඩමවා අසුන් ගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ නැවතත් රතන සූත්‍රය දේශනා කළ සේක. රට වැසියෝ ධර්මය

අවබෝධ කර ගත්හ. දින හයක් අඛණ්ඩව මෙම පිරිත දේශනා කරමින් දහස් සංඛ්‍යාත ප්‍රාණීන්ට සෙත් පතා බුදු රජුන් ප්‍රමුඛ මහා සංඝ රත්නය ආපසු රජගහ නුවර බලා වැඩම කරවීය.

The origin of the Jewel Discourse

During the period of Buddha the people of Vesali spent a luxurious life in every way. But later on there was a famine and it highly influenced to the lives specially causing death. Due to the presence of decaying corpses the evil spirit began to haunt the city. This calamity was followed by a pestilence: virulent deadly diseases. The miserable situation became worse day by day. Suffering by these 3 fears of famine, non human beings and pestilence the citizens sought the help of the Buddha who was living at Rajagaha.

The Lord Buddha and Ananda thera accompanied with number of disciples visited to Vesali city. When they approached it started to rain and started to flow away all the stinking dead bodies. After that this Jewel Discourse was chanted by the Buddha, Venerable Ananda was given instruction how to organize the walk around the city as a mark of protection. Following the given instruction venerable Ananda sprinkled sanctified water from the Buddha's own alms bowl. As a consequence the evil spirit were exorcised, the deadly diseases were subsided.

The recovered citizens blissfully arranged a preaching hall in the middle of the city and invited the Buddha and his 500 disciples . The Jewel Discourse was chanted for six days continuously. By the power of the truth of this Jewel Discourse all the citizen of Vesali became well beings and understood the reality of Dhamma. At last the Buddha and his 500 disciples were taken back to Rajagaha.

*

16

සඟ ගුණ බලය රතන සූත්‍රය තුළින්
Power of Sangha through Jewel Discourse

බොහෝ දෙනෙකුට රතන සූත්‍රය කටපාඩමින් සඣ්ඣායනා කළ හැකි වුවද, එහි අර්ථය පිළිබඳව මනා අවබෝධයක් නොමැති බව පැහැදිලිය. රතන සූත්‍රය ගාථා 17 කින් සමන්විත සත්‍ය ක්‍රියාවක් ලෙසින් සැකසී ඇති පරිත්ත සූත්‍රයකි.

මෙහි **ආරම්භක ගාථා දෙක** අහසේ සහ භූමිගතව සිටින සියලුම අමනුෂ්‍ය කොටස් වෙත කරනු ලැබූ ආරාධනයකින් සහ දේශනාව ශ්‍රවණය කිරීමට පෙර සියලු භූතයන්ගේ සිත් සතන් පවිත්‍ර කර ගන්නා ලෙස කරන ලද කෙටි අනුශාසනාවකින් ද සමන්විතය.

අවසාන ගාථාත්‍රය සක් දෙව් රජු විසින් අහසේ සහ භූමියෙහි වසන සියලු භූත කොටස් අමතා ප්‍රකාශිත අදහසක් මෙන්ම විධානයකි. තථාගතයන් වහන්සේ දෙව් මිනිසුන් විසින් පුද ලබන්නා වූ උත්තමයෙකු බව සඳහන් කරමින් රැස්ව සිටි සියලු භූතයින් සමඟ බුදුන් වහන්සේටත් ශ්‍රී සද්ධර්මයටත් ආර්ය මහා සංඝයාටත් සක් දෙව් රජ නමස්කාරය කරමින් සෙත් පැතූ ආකාරය විදහා දක්වෙයි.

සූත්‍රය තුළ අන්තර්ගත **ඉතිරි ගාථා රත්නයන්** 12 තුළින් ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණස්කන්ධය පිළිබිඹු වෙයි. තථාගතයන් වහන්සේ අපිරිමිත බුද්ධ ගුණයත් උන්වහන්සේගේ ශ්‍රී මුඛයෙයන් දේශිත නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයේ ගුණයත් උන් වහන්සේගේ ශ්‍රාවක අෂ්ඨ ආර්ය පුද්ගල මහා සංඝ රත්නයේ ගුණයත් නිසා ත්‍රිවිධ රත්නය තුන් ලෝකයෙහිම ඇති සියලු රත්නවලට වඩා උතුම් රත්නය බවට පත්ව ඇත. රතන සූත්‍රය තුළ අන්තර්ගත ගාථා **රත්නයන් හතක් පුරාම විහිදී ඇත්තේ සඟ ගුණ බලයයි. (එනම් 6 වන ගාථාවේ සිට 11 වන ගාථාව දක්වා මෙන්ම 14 වන ගාථාවයි.)** එම ගාථා රත්නයන්ගේ සත්‍ය භාවය තහවුරු කරමින් සජ්ඣායනා කරනු ලැබූ මෙම රතන සූත්‍රයේ අන්තර්ගතය

සත්‍ය වූ ගුණ සම්භාරයකින් බල ගැන්වී ඇත. එම සුවිශේෂී බලයෙන් විශාලා මහනුවර තුන් බිය දුරු වී සියලුම සත්ත්වයින්ට සැනසීම සඳහා භෞතික මෙන්ම නරගවාසීන්ගේ කායික මානසික පසුබිම් ද සකස් වූ අයුරු කෙතරම් විශ්මිත ද?

(බුදු දහම යනු සත්‍යය පදනම් වී ඇති සත්‍යයෙන්ම පණ ගැන් වී ඇති විශ්මිත දර්ශනයකි. මෙය සාර අසංඛෙය්‍යය කල්ප ලක්‍ෂයක් පුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් සිදු කරනු ලැබූ ආර්ය පර්යේෂණයේ අග්‍ර ප්‍රතිඵලයයි. නූතන නායකයන් විසින් වසර කීපයක් පුරා පර්යේෂණ පවත්වා ගොඩනගනු ලබන කල්පිතයන් ඔස්සේ නොයෙකුත් සොයා ගැනීම් තිබුණේ වුවද ඒ සියල්ලක් බුදු පියාණන් වහන්සේ විසින් ස්වකීය ආර්ය පර්යේෂණය තුළින් සොයාගත් අග්‍ර ඵලය හෙවත් විශ්මිත දර්ශනය හා සසඳා බලන කල සූර්යයා හමුවේ ඇති කදෝකිමියන් මෙනි. බුදුපියාණන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨ නායකත්වය උත්තරීතර අනුපමේය වැනි වදන්වලින් විශේෂිත වන්නේ එබැවිනි.)

The **1st two verses are an introduction.** Here the Buddha addresses right away the audience present before commencing His discourse and determination based on the power of true statements.

The 2nd verse is the urgent advice of exhortation of Buddha gives to all those gods and deities present by urging them to show their friendliness, benevolence and kindness to the human kind which is afflicted with 3 calamities of famine, evil spirits and diseases.

Next 12 verses reveal the noble qualities of Buddha, Dhamma and Sangha. After concentrating the greatness of all those 12 verses of Jewel Discourse which points out the exclusive virtues in the 3 superb jewels, Sakkha thought that he also should recite something based on the superb jewel for the well being of the city. So the last 3 verses were recited by Sakkha.

Buddhism is a wonderful sight empowered by the truth.

රතන සූත්‍රයේ අන්තර්ගත ගාථා 17 න් ධ්වනිතාර්ථ වන කරුණු දෙස සවිස්තරාත්මකව බලන කල්හි සත්‍යයේ බලය වඩාත්

තහවුරු වෙයි. ගාථාවන්හි අදහස අනුපිළිවෙලින් සිංහල ඉංග්‍රිසි භාෂා ද්විත්වයෙන් මෙහි සංගෘහිතය.

1 වන ගාථාව

යානීධ භූතානි සමාගතානි

භුම්මානි වා යානිව අන්තලික්ඛෙ

සබ්බේව භූතා සුමනා භවන්තු

අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

මෙහි පැමිණ සිටින ආකාශවාසී හෝ භූමි වාසී සියලුම භූතයෝ යහපත් සිත් ඇත්තෝ වෙත්වා වෛරය, තණ්හාව, ද්වේශය වැනි කුරිරු චේතනාවන්ගෙන් යුක්තව ධර්මය ශ්‍රවණය කිරීමෙන් නිසි ප්‍රතිඵල ලද නොහැකි බැවින් යහපත් මනසක් ඇතිකර ගැනීමෙන් අනතුරුව මෙම ධර්මය මැනවින් ශ්‍රවණය කරත්වා. **අථොපි සක්කච්ච සුනන්තු භාසිතං**

Here the Buddha addresses right away the audience present before commencing His Discourse to make their minds purify to get the best result and determine the power of true statements.

2 වන ගාථාව

තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

දෙවන ගාථාවෙන් ද සියලුම භූතයින් අමතා දිවා රාත්‍රී දෙක්හිම තොපි වෙනුවෙන් විවිධ පුද පූජා පවත්වන මිනිස් ප්‍රජාව කෙරෙහි අප්‍රමාදව, කරුණාව, දයාව දක්වන ලෙසටත් ඔවුන් දුර්භික්ෂ, රෝග, අමනුෂ්‍ය බියෙන් පීඩාවට පත්ව සිටින මේ මොහොතේ අප්‍රමාදව ආරක්ෂා කරන ලෙසටත් අනුශාසනා කර ඇත. **තස්මාහි නෙ රක්ඛත අප්ප මත්තා**

This is the urgent advice exhortation of Buddha gives to all those gods and deities present by urging them " show your friendliness to human beings who make offerings to you day and night , be kind to them (metta), arouse friendship 'kiarothamanu' benevolence and kindness to this human kind which is afflicted with 3 calamities of famine , evil spirit and deseases . **"Therefore guard them diligently"**

3 වන ගාථාව

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

තෙවන ගාථාවේ සිට සත්‍යයේ බලයෙන් සෙත් පැතීම ඇරඹෙයි. මිනිස් ප්‍රජාව විසින් සිදු කරන ලද පූජා සත්කාර සිහිපත් කර දීමෙන් අනතුරුව ත්‍රිවිධ රත්නයේ ගුණ සමුදාය හුවා දක්වමින් එම ගුණ දෙලොවටම වැඩදායී සත්‍ය ගුණ බවත් එම සත්‍යයේ බලය නිසාම රත්න හෙවත් රුවන් බවට පත්ව ඇති බවත් පැහැදිලි කෙරෙයි. මෙකී සත්‍ය භාවය පසක් කරමින් යහපතක් වේවා යි සත්‍ය ක්‍රියා කිරීම රතන සූත්‍රයේ අරමුණයි. **විපත් දුරුවීම සඳහා මෙම සත්‍ය වචනයේ සත්‍ය බලය සිහිපත් කරමින් රැස්ව සිටි සැමට ධර්මය අසන්නට සැළැස්විණි.** මිනිස් ලොවෙහි දෙව් ලොවෙහි හෝ අවශේෂ ලෝකයන්හි කිසියම් ධනයක් ශ්‍රේෂ්ඨ සහ උතුම් ලෙස සැලකෙයි ද ඒ කිසිවක් බුද්ධ රත්නය හා සමාන නොවේ. එය සත්‍යයකි. එම සත්‍යයේ බලයෙයන් යහපතක්කම වේවා. **ඉදම්පි බුද්ධෙ රතනං පණීතං ඒතෙන සච්චේන සුවත්ථි හෝතු**

Thus after pointing out to the gods and deities, how humans are helpful by making offerings and bestowing merits to them, the Buddha commenced now to gradually invoke the virtuous of the Buddha, Dhamma and Sangha for the disappearance of the

calamity and for the Gods and humans to hear the Dhamma. Therefore he applies the power of true statement (sacca-vacana) by reciting the verses beginning with the 3rd stanza. “" Idhampi buddhe ratanam panitam – Ethena saccena suvatthi hotu O"

4 වන ගාථාව

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙයද ධර්ම රත්නය පිළිබඳ වූ සත්‍ය ක්‍රියාවකි. ධර්ම රත්නය පිළිබඳ වූ සත්‍ය ක්‍රියාව, සූත්‍රයෙහි එන 4 වන ගාථාවෙන් කියවෙයි. ශාක්‍ය මුණින්ද්‍රයන් වහන්සේ විසින් බෝධිමූලයෙහි දී සියලු කෙලෙස් දුරු කර, රාගය යලිත් මතු නොවන ශ්‍රේෂ්ඨ වු නිර්වාණ ධර්මය පසක්කර ගන්නා ලදහ. ඒ උතුම් නිර්වාණ ධර්මයට සම කළ හැකි වෙනත් කිසිම රත්නයක් සකල ලෝක ධාතුවෙහි නැත. මේ සත්‍යානුභාවයෙන් ලෝ වැස්සනට සෙතක් ශාන්තියක් වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි. තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරගත්, ක්‍ෂය, විරාග, අමත, පණීත, සමාහිත ගුණයන්ගෙන් යුක්ත මෙම නිර්වාණ ධර්මයට සමාන වෙනත් දහමක් ලොව නැත. එය නිර්වාණ ධර්මයෙහි ඇති ශ්‍රේෂ්ඨ රත්න භාවයයි.

නතෙ න ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

Thus after invoking the truth with the Budha’s virtues (Budu guna) the Buddha commences now to invoke it with the virtuous of the Teaching of Nibbana (Daham Guna) . Here Extinction, Dispassion, and deathlessness are all terms of Nibbana: more precisely here of the Buddha.

5 වන ගාථාව

යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නයෙන් සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන සරත මාර්ග ඥාන මාර්ග සමාධි පිළිබඳව කියැවේ. ශ්‍රේෂ්ඨ බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කළ පිරිසිදු වූ ආනන්තරික මාධියට සම වූ වෙනත් සමාධියක් නැත. සෝවාන් මාර්ගයට අනතුරුවම සෝවාන් ඵලය ලැබෙන බැවින් සෝවාන් මාර්ගයෙහි තියෙන සමාධිය ආනන්තරික සමාධියයි. පිළිවෙලින් මාර්ගඵල ලැබීමෙන් අනතුරුව ලබන සමාධිය හා මාර්ග සමාධියයි. මෙය පසුව බිඳ වැටෙන්නා වූ සමාධියක් නොවේ. ධර්ම රත්නය කෙරෙහි පවත්නා වූ ශ්‍රේෂ්ඨ රත්න භාවයයි. ඒකාන්ත සත්‍යයකි. මෙම සත්‍යානුභාව බලයෙන් සෙතක් ශාන්තියක් වේවා යි සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි.

ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

The purity prased by the Supreme Bhuddha commences now to invoke the truth with the virtues of the teaching of the supermundane path which unfailingly brings concentration. There is nought comparable to this awareness. Here the Buddha means the person who concentrated with 4 Noble Truth. This precious jewel is the Dhamma. By the power of this truth may there be happiness. **"Idam pi Dhamme ratanam panītam** Etena saccena suvatthi hotu"

6 වන ගාථාව

යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තෙ අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි. සතංපසත්ථා බුදු පසේබුදු මහරහතන් වහන්සේලා සහ දිව්‍ය බ්‍රහ්ම ආදී සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරන ලද ආර්ය පුද්ගලයෝ 8 දෙනෙකි. එනම් සෝවාන් මාර්ග ස්ථ සහ ඵලස්ථ, සකෘදගාමී මාර්ගස්ථ සහ ඵලස්ථ, අනාගාමී මාර්ග ස්ථ සහ ඵලස්ථ සහ අර්හත් මාර්ගස්ථ සහ ඵලස්ථ යනුවෙනි. ඔවුන් දන් ලැබීමට සුදුසුය. තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝය. ඔවුනට දන් පිදීමෙන් මහත් ඵල ලැබෙයි. ඒ තෙසු දින්නාහි මහප්ඵලානි. මෙය අෂ්ඨ ආර්ය මහා සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි. මේ සත්‍යානුභාවයෙන් ලෝ වැස්සනට සෙතක් ශාන්තියක් වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි.

ඉදම්පි සංඝෙ රතනං පණීතං - ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences now to invoke the truth with the virtuous of the orders of noble disciples. The 8 individuals mentioned here are the 8 noble (ariya) individuals who have realized one of the 8 super mundane stages of holiness; that is any of the 4 super mundane paths (magga) and the 4 super mundane fruit (phala) of this path. Precisely they are the noble individuals who realize the path & fruits. They are the disciples of Buddha and are worthy of offerings. Gifts given to them yield rich results. This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **“Idam pi Sanghe ratanam panītam** Etena saccena suvatthi hotu”

7 වන ගාථාව

යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතමසාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි. චිත්ත සමාධියට පත්වීමේ දෘඩ අධිෂ්ඨානයෙන් අධිෂ්ඨානයෙන් යුක්තව, ශරීරය සහ ජීවිතය කෙරෙහි පවා කිසිම ආකාරයේ බැඳීමකින් තොරව, කෙලෙස් නසමින් ගෞතම තථාගත සම්බුදු පියාණන් වහන්සේගේ බුද්ධ ශාසනයෙහි ප්‍රතිපත්ති වඩා රහත් බවට පැමිණ, අනිත්‍ය දැක අම්ල වූ නිවන් සුවය ලබා එම නිවන් සුවය නිරතුරුවම භුක්ති විඳීම ආර්ය සංඝයාගේ ලක්ෂණයයි. ලද්දා මුධා නිබ්බුතිං භුඤ්ජමානා. ඒ උතුම් රත්න භාවයේ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවායි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි. ඉදම්පි සංඝෙ රතනං පණීතං ඒතෙන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences now to invoke the truth with the virtues of Arhanth who experience the bliss of the attainment of fruition. With the dedicated mind, applying themselves well in the special consideration of Buddha, free from defilement they have attained Arhanthship encountering the Deathless. They enjoy the peace of Nibbana freely obtained. . This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **“Idam pi Sanghe ratanam panītam etena saccena suvatthi hotu”**

8 වන ගාථාව

යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සූත්‍රයේ එන මෙම 8 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද අෂ්ඨ ආර්ය සංඝයාගේ ඇති උතුම් රත්න භාවයයි. සතර දෙසින් හමන සුළඟට කම්පා නොවන අයුරින් ශක්තිමත් ලෙස පොළොවෙහි සිටුවන ලද කණුවක් හෙවත් ඉන්ද්‍රකීලයක් සේ සතර විධ සත්‍යය, ප්‍රඥාවෙන් අවබෝධ කරගත සත්පුරුෂයා කිසිවකින් කම්පාවට පත් නොවේ. මෙය ද ආර්ය සංඝයාගේ ලක්ෂණයයි. ඒ උතුම් රත්න භාවයේ සත්‍ය බලයෙන් සැමට සෙත් වේවායි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.

ඉදම්පි සංඝෙ රතනං පනීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences now to invoke the truth with the virtuous of the stream winner 'Sothapanna" As a post deeply rooted in the earth stands unshaken by the wind from the 4 quarters, I declare the righteous man who comprehends the wisdom is never shaken This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **"Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

9 වන ගාථාව

යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නය පෙන්වා දී ඇත්තේ සෝවාන් ආර්ය වහන්සේගේ ගුණයකි. යෙ රිය සච්චානි විභාවයන්ති Those who comprehend the Noble truth" බුදුරජාණන් වහන්සේ ගැඹුරු ප්‍රඥාවෙන් දැක මැනවින් දේශනා කරනු ලැබූ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට උත්සාහ ගනිමින් සම්බුද්ධ ශාසනයෙහි යමෙක් සෝවාන් මාර්ගඵල ලැබුව් නම් කිසි ලෙසකින් ඔහු ආත්ම 8 ක් උපදින්නේ නැත. සත්තක්ඛත්තුපරම සෝවාන් ඵලයට පත් ඒ තැනැත්තා නිර්වාණය සාක්ෂාත් කරගැනීමට මඳක් ප්‍රමාද වුවද අටවන භවයක් දක්වා සංසාරයේ ගමන් නොගනී. මෙය සංඝ රත්නයේ ශ්‍රේෂ්ඨ ගුණානුභාවයකි. සත්‍යයකි. **න තෙ භවං අට්ඨ මං ආදියන්ති** එම සත්‍යානුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.

ඉදම්පි සංඝේ රතනං පණීතං

ඒතේන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences now to invoke the truth with particular virtuous of stream winner who do not take up an eigth rebirth. Those who realized the 'Noble Truth' well taught by him who is well profound in wisdom (the Buddha), although they might be exceedingly heedless they (sattakkattuparama) will not take an existence in the realm of sense spheres after the seventh birth . This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness.

"Idam pi Sanghe ratanam panītam
Etena saccena suvatthi hotu"

(ආර්ය පුද්ගලයින් 108 දෙනෙකු ලෙසට ද මෙසේ වර්ගීකරණය කෙරෙයි.)

ඒක බීජ, කොලං කොල, සත්තක්ඛත්තු පරම යනුවෙන් සෝවාන් පුද්ගලයින් තිදෙනෙකි. කාම භව, රූප භව, අරූප භව යන තුන් භවයන්හි ඵල ඇති සදහැමි පුද්ගලයෝ 3 දෙනෙකි. ඒ සියල්ලෝම චතුර්විධ(4) ප්‍රතිපදාවන්ගේ වශයෙන් 24 කි. අන්තරා පරිනිබ්බායි, උපහච්ච පරිනිබ්බායි, සංඛාර පරිනිබ්බායි, අසංඛාර පරිනිබ්බායි, උද්ධංසොත අකනිට්ඨගාමී යනුවෙන් අවිහ බඹලොව 5 දෙනෙකි.

එසේම අතප්ප, සුදස්ස, සුදස්සී යන තුන් බඹලොව 15 දෙනෙකි. අකනිටා බඹලොව උද්ධංසොත පුද්ගලයා හැර ඉතිරි 4 දෙනෙකි. මෙලෙසින් අනාගාමී පුද්ගලයෝ 24කි. සුක්ඛවිපස්සක, සමථයානික ආදී වශයෙන් රහතුන් දෙනමකි. මාර්ගස්ථ පුද්ගලයෝ 4 කි. මෙම සියල්ලෝම 54 ශ්‍රද්ධා ප්‍රඥාධූර වශයෙන් ද්විගුණ වන හෙයින් ආර්ය පුද්ගලයින් සංඛ්‍යාව 108 සේ වර්ගීකරණය කර ඇත.

10 වන ගාථාව

සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නයේ පෙන්වා දී ඇත්තේ ද සෝවාන් ආර්ය වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි. සෝතාපත්ති ඵලයට පත් වූ ඉහත ගාථා රත්නයෙන් පෙන්වා දුන් තැනැත්තා ස්වකීය නිවැරදි ආර්ය මාර්ග දර්ශනයෙන්ම සක්කාය දිට්ඨී, විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයෝජන 3 ප්‍රහීණ කරයි. එනම් සතර අපාය ගමනින් සම්පූර්ණයෙන්ම මිදුනේ වෙයි. මව මැරීම, පියා මැරීම, රහතුන් වහන්සේ ජීවිතක්ෂයට පත්කිරීම, තථාගත සිවුරේ ලේ සෙලවීම සහ සංඝ භේදය යන පංචානනත්රිය පාප කර්ම සහ නියත මිසදිටුකම වැනි සය ආකාර අභිඨාන අකුසල කර්ම කිසිවිටකත් සිදුනොවනු ඇත. මෙය ආර්ය සංඝයාගේ උතුම් රත්න භාවයකි. සත්‍යයකි. මෙම සෝවාන් ආර්ය සත්‍ය නමැති සංඝ රත්නයේ ශ්‍රේෂ්ඨ ගුණයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.

ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

With his gaining of insight he abandons 3 states of mind; namely self-illusion,doubt and indulgence in meaningless rites and retuals. He is also fully freed from the 4 status of woe and incapable of committing the six major wrong doings such as Matricide, Patricide, The murder of Arhanth, The shedding of the Buddha's blood , Causing schism in the Sangha and Pernicious false beliefs (Niyata Micca Dhtthi) . This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. "Idam pi Sanghe ratanam **panītam** Etena saccena suvatthi hotu"

11 වන ගාථාව

කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙම ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද සෝවාන් ආර්ය වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි. සෝතාපන්න වූ ආර්යයන් වහන්සේ නමක් සිත, කය වචනය යන තිදොරින් සුළු හෝ වරදක් වැරදීමකින් හෝ සිදු කළේ වී නම් වහාම ඒ තෙමේ පාපය අතහැර ආර්යසංවරයෙහි පිහිටයි. තමන් කළ පාපාය කිසිවිටක නොසඟවයි. වහාම පිරිසිදු බවට පත්වෙයි. මෙය ද ආර්ය සංඝයාගේ උතුම් රත්න භාවයකි. සංඝ රත්නයේ මෙම ශ්‍රේෂ්ඨ ගුණයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි.

ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences now to invoke the truth with the stream winner's special virtue of not being able to conceal any evil action committed even by negligence. Thus he now shows that

not only is a stream winner incapable of committing the 6 major misdeeds , but is also incapable of even concealing a slight evil action done by deed ,word or thought since it has been proclaimed that such concealing is impossible for one who has seen the path .(He is sothapanna, stream enterer, one who has attain the first stage of sanctity) . This precious jewel is the Sangha. By the asseveration of this truth may there be happiness. **"Idam pi Sanghe ratanam panītam Etena saccena suvatthi hotu"**

(After invoking the truth based on the determination upon the Sangha Jewel in regarding to various excellent qualities and virtues of noble persons included in the Sangha, the Buddha commences how to invoke the truth again on the determination upon the Buddha with reference to his excellence of experiencing the explanatory part of the Dhamma (Pariyaththi dhamma) by elucidation here in brief and elsewhere in other discourses in more detail the superior virtuous of the 3 Jewels and the Dhamma that leads to Nibbana)

12 වන ගාථාව

වනප්පගුම්බෙ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයී
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සූත්‍රයේ එන 12 වන ගාථා රත්නයේ නැවතත් පෙන්වා දී ඇත්තේ තථාගතයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගුණයකි. ග්‍රීෂ්ම සෘතුවෙහි මුල් මාසයේ හෙවත් වසන්යේ ගස් වැල්වල අතුපතර එකිනෙක පැටලීගිය වන ලැහැබක් ගස් මුදුන් මලින් බරව සුන්දරව පවතින විටක මී මැස්සෝ බඹර මැස්සෝ රොන් උරාගන්නා සේ මුළු ලොවටම දහම් සුවඳ විහිදුවමින් තථාගතයන් වහන්සේ නිර්වාණගාමී උතුම් දහමක් දේශනා කරන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ මෙම ශ්‍රේෂ්ඨානුභාව බලයෙන්,

සත්‍යානුභාව බලයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක්ම වේවා යි කියා සෙත් පැතීම මෙම ගාථාරත්නයේ අදහසයි.

ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

"As the woodland groves though in the early heat of the summer month are crowned with blossoming flowers even so is the sublime Dhamma leading to the calm of Nibbana which is taught by the Buddha for the highest good. This precious jewel is the Buddha. By the asseveration of this truth may there be happiness. **Idam pi Buddhe ratanam panītam Etena saccena suvatthi hotu"**

13 වන ගාථාව

වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සූත්‍රයේ එන 13 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ ද බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයයි. උත්තම, අති ශ්‍රේෂ්ඨ (වරෝ) සත්ත්වයින්ට විමුක්තිය සුවය ලබාදෙන ප්‍රඥා අධිෂ්ඨාන පිරිපුන් කරන්නා වූ (වරඤ්ඤූ) උතුම් ප්‍රතිපදාවට යොමු කරන්නා වූ (වරදෝ) උතුම් මාර්ග යට පමුණුවන්නා වූ (වරාහරෝ) අනත්තර වූ ශ්‍රේෂ්ඨ ධර්මයක් දේශනා කර තිබීම අනුත්තරෝ ධම්මවරං අදේසයි) තථාගතයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයකි. මෙම සත්‍යයේ ආනුභාවයෙන් සියලු ලෝ සතුන්ට සෙතක් ශාන්තියක් වේවා යි කියා සෙත් පැතීම ගාථාරත්නයේ අදහසයි.

ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences how to invoke the truth with is exclusive virtues in regards with the supermundane (Lokuththara) Dhamma. The peerless Excellent Buddha: the knower of Nibbana, the giver of Nibbana, the bringer of the Noble path taught the excellent Dhamma. This precious Jewel is the Buddha.By the

asseveration of this truth may there be happiness.

"Idam pi Buddhe ratanam panītam
Etena saccena suvatthi hotu"

14 වන ගාථාව

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සූත්‍රයේ එන 14 වන ගාථා රත්නයෙන් පෙන්වා දී ඇත්තේ රහතන් වහන්සේලාගේ විශේෂ ගුණයකි. මෙම ගාථාව රතන සූත්‍ර සත්‍යක්‍රියාවේ අවසන් ගාථාවයි. මෙහි රහතන් වහන්සේගේ සුවිශේෂි ගුණයක් ඇතුළත් වේ. රහතන් වහන්සේගේ පැරණි කර්ම සියල්ලම අහෝසියි (ඛිණං පුරාණං) අළුතෙන් කර්ම රැස් කිරීමක් ද නැත. (නවං නත්ථි සම්භවං) මතු භවයේ ඉපදීමේ ආශාවක් ද නැත. (විරත්තචිත්තා ආයතිකේ භවස්මිං) පුනර් භවයක් ද ඇතිවීමේ බීජ ක්ෂය කල (තේ ඛීණබීජා) නැවත ඉපදීමේ කැමැත්තක් ද නොවන හෙයින් (අවිරූළ්හිච්ඡන්දා) පොල් තෙල් පහනක පහන් වැටිය දැල්වී අවසන් වූ පසු නිවී යන්නා සේ නිවි සැනසී නිවනට පැමිණෙති. එය අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවට පත්වීමයි. මෙය සංඝ රත්නය පිළිබඳ අසහාය ශ්‍රේෂ්ඨ ගුණයකි. සංඝයාගේ මෙම රත්න භාවයේ සත්‍යයෙන්ද ලෝකයට සෙතක් ශාන්තියක් ම වේවා යනුවෙන් සෙත් පැතීම මෙම ගාථා රත්නයේ අදහසයි.

ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

The Buddha commences how to invoke the truth once more with the determination upon the Sangha in regard to the excellence of attaining "Nibbana" with no residue remaining (Anupadisesa Nibbana) for those disciples who have listened to the expounding of the Dhamma (Pariyatti Dhamma) practiced accordingly and attained the Supermundane (Lokuttara) Dhamma of Arhanthship. Their past (kamma) is exhausted, New (kamma) no more arises.Their mind to future becoming is unattached. Their germ (of re-birth consciousness) is died. They have no more desire for re-birth. Those wise men fade out (of existence) as the flame of the oil lamp (which has just faded away). This precious jewel is the Sangha. By the asseveration of this truth may there be well and happiness. **"Idam pi Sanghe ratanam panītam -Etena saccena suvatthi hotu"**

15,16,17 වන ගාථාව

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

මෙම ගාථාත්‍රය සක් දෙවි රජ විසින් ප්‍රකාශ කරන ලද්දකි.

ඛිණං පුරාණං නවං නත්ථි සම්භවං ගාථාවෙන් සත්‍යක්‍රියාව අවසාන වනවාත් සමඟම වසංගත රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂ සියලු බිය පහව ගියෙනක් ප්‍රීති ප්‍රමෝදයට පත් සක් දෙවි රජ එම ස්ථානයට

පැමිණ අහසේ සහ භූමියේ රැස්ව සිටි සියලු භූතයන් අමතා තථාගතයන් වහන්සේටත් ශ්‍රී සද්ධර්මයටත් ආර්ය මහා සංඝයාටත් (උතුම් තුරුණුවට) නමස්කාර කරමින් යහපතක්ම වේවායි සෙත් පැතූ ආකාරය අවසන් ගාථා 3 න් පැහැදිලිය.

බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

Last 3 stanzas (15,16 ,17) of the Jewel Discourse were recited by The Lord of the God. After realizing that the Buddha applied the power of true statements based on the exclusive virtues in the superb jewels and brought well-being to the city, Sakha thought that he too should recite some thing based on the 3 superb jewels for the well being of the city. Thus he recited the last 3verses beginning as follows…

"Yānīdha bhūtāni samāgatāni
Bhummāni vāyāni va antalikke
Tathāgatam devamanussa –pujitam
Buddham namassama suvatthi hotu……
Dhammam namassama suvatthi hotu……
Sangham namassama suvatthi hotu……"

…and ending with venerating **to the Noble Triple Gem Buddha, Dhamma and Sangha**

***

17

ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණස්කන්ධය ජීවමානය
Virtuous of Trple Gem is perceptible with naked eyes

විශ්වය තුළ තවමත් ජීවමිනව පවතින මෙම ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ සමුදාය දැන, දැක අවබෝධ කරගත හැකි, මිහිපිට සිටින එකම සත්ත්වයා මිනිසා පමණි. නෙතට, සිතට ගෝචර වන මෙම ධර්මය අවබෝධ කර ගන්නා වූ පුද්ගලයා, මෙම භවය තුළ ලද හැකි අමිල දායාදයට හිමිකම් කියයි. එම දායාදය ලැබිය හැකි අවසාන අදියර ද වේගයෙන් ක්ෂය වීගෙන යාමේ දුර්නිමිති වත්මන් සමාජය තුළ හිස ඔසවන බවක් පෙනෙන්ට තිබීම අඳුරු සේයා පලයක ඡායාවකි. එය ඝන අන්ධකාරයකට පත් වීමට ඇති සියලු ඉඩ කඩ ආවරණය කිරීමේ භාර දූර වගකීම ද ඔබ අප ඉදිරියේ පැන නැඟී ඇති දැවැන්ත අභියෝග යකි. සම්බුදු දහම අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිත කර තැබීම ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිතිය පිණිසම වන බැවින් ඒ සඳහා වහා නිසි පියවර ගැනීම සසුන් ලැදි සැමගේ ඒකායන අභිප්‍රාය විය යුතුමය.

අවාසනාවකට මෙන් අද සමාජයේ ශ්‍රාවක සංඝ යන උත්තරීතර නාමය කෙලෙසමින් චීවරධාරීන් පිරිසක් බිහිවෙමින් පැවතීම සංඝ රත්නයේ අනුපම ගුණස්කන්ධයට මහත් වූ කැළලකි. එහෙත් බහුශ්‍රැති, විනයධර, සංඝශෝභන, මාර්ගඵල ලාභී භික්ෂූන් වහන්සේලාගෙන් සහ සිල්වත් ගුණවත් මෙහෙණින් වහන්සේලාගෙ න් ද සැදැහැවත් උපාසක උපාසිකාවන්ගෙන්ද මේ සමාජය තවමත් හිස් වී නැත. ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයක් නොවන්නේ නම් අඳුරු සේයා පටලය ඝන අන්ධකාරයක් බවට පත්වීමේ සම්භාවීතාව වත්මන් දරු පරපුර ඉදිරියේ ම ස්ථාපිත වනු ඇත. දැන් උදාවී ඇත්තේ හැකි පමණින්, තම තමාට හැකි ආකාරයකින් ස්වකීය දායක්තවය සමාජයට අවශ්‍යම මොහොතයි.

එහෙත් වැටත්, නියරත් ගොයම් කා නම් කාට පවසනු ඒ අමාරුව? වැනි ආප්තෝපදේශයන්හි සත්‍යය අද දෙනෙත් අබිමුවය. අද සමාජයේ ඇතැම් දෙමාපියන් තම දරුවා මත්ද්‍රව්‍ය සහ දුෂ්චරිතයන්ගෙන් බේරා ගැනීමට අධික ලෙස වෙර දරද්දී තවත් පිරිසක් තම දරුවා මෙහෙයවමින් සමකාලීන දරුවන් අතර මත්ද්‍රව්‍ය අඩංගු රසකැවිලි සහ බීම වර්ග ව්‍යාප්ත කිරීමේ නින්දිත ජාවාරමක් යෙදෙයි. මෙලෙස ගුප්ත ක්‍රමවේදයන් ඔස්සේ අනාගත පරපුර වන වත්මන් දරු පිරිසට විනා කරන්නෝද අද සමාජයේ නැත්තේ නොවේ.

ශ්‍රාවක සංඝ රත්නයෙන් ගිහි සමාජයට සිදු වන්නේ අපරිමිත සේවයකි. එහෙත් ඇතැම් චීවරධාරීන්ගේ නොමනා ක්‍රියාකලාපයන් නිසා ගිහි හවතුන් මෙන්ම මුළු මහත් සමාජයම අසීරු අවස්ථාවනය මුහුණ දෙන අවස්ථා ද නැත්තේ නොවේ. පවුල් ආරවුල්වල පැටලෙන ගිහි හවතා බොහෝවිට සහනය පිණිස තුන්වන පාර්ශවයක සහාය පතයි. විශ්වාසවන්තයෙකු ලෙස පෙනී සිටින තුන්වන පාර්ශවය අසත්පුරුෂයෙකු හෝ චීවරධාරියෙකු වී නම් එම අවස්ථාවට ඔවුන් මැදිහත් වන්නේ ගැටළුව ධර්මානුකුල පදනමක් ඔස්සේ, සාකච්ඡා මාර්ගයෙන් කරුණු පහදා දී සහනයක් ලබාදීමට නොවේ. ගැටළුව තුළින් පවුලට වඩාත් සමීප වන මොවුන් අවසානයේදී අනපේක්ෂිත අගාධයකට දරු පවුලම හෙලා දමමින් ස්වාමියා සතු දේපල බිරිඳට වසන් කරමින් හෝ බිරිඳ සතු දේපල ස්වාමියාට වසන් කරමින් හෝ තම සන්තකයට ගන්නා උපක්‍රමශීලී අවස්ථා ද අද සමාජයේ බහුලව නැතත් ව්‍යාප්ත වී ගෙන යන නිර්ලජ්ජිත ක්‍රියාමාර්ග බවට පත්වී ඇත. මෙවන් වංචනික, දූෂිත ක්‍රියාමාර්ග හිස එසවීම, **සමාජ සාරධර්මයන්හි සෝදාපාළුවක් විනා කිසිවිටක සමාජ ප්‍රගතියට ඉවහල් වන්නක් විය හැකිද? මේ උදාවී ඇත්තේ රට, ජාතිය මෙන්ම ශ්‍රී සද්ධර්මය සුරැකීමට දිවි පරදුවට තැබිය යුතු මොහොතයි.**

අවුරුදු **5000** ක් ශ්‍රි ලංකාවේ නිර්මල බුද්ධ ශාසනය පවතින බව බුදු පියාණන් වහන්සේ ශ්‍රී මුඛ දේශනා තුළින් වදාළ සේක. එම කාල සීමාවෙහි වසර 2600 ක් පමණ ගෙවී ගොස් ඇතත් තවත් වසර 2400 ක් පමණ ඉදිරියට ඇත. මෙම ධර්ම දායාදයට උරුමකරුවන් ඔබ අප අතරේ ම තවත් දස දහස් ගණනක් සිටින බව නොඅනුමානය. ඔවුන්ගේ ධර්ම ප්‍රබෝධය පිණිස වටපිටාව සකස් කර තැබීම ධර්ම ලාභය ලැබූවන්ගේ යුතුකම මෙන්ම වගකීමයි. වත්මන් සමාජයේ

ව්‍යාප්ත වීගෙන යන චීවරධාරීන් නිසි ලෙස හඳුනාගනිමින්, ඔවුන් මිත්‍ර ප්‍රතිරූපකයන් සේ සළකා ඇසුරෙන් බැහැරව කටයුතු කිරීමට වග බලා ගැනීම කාගේත් යහපත පිණිස හේතුවනු ඇත. මිත්‍ර ප්‍රතිරූපකයා සෑම විටම උත්සාහ කරන්නේ තමා වැටී සිටින අගාධයට අනෙකා ඇද දැමීමට පමණි. විශේෂයෙන් අද සමාජයේ තරුණ දරුවන් මෙවන් ගොදුරකට බිලිවීමේ ප්‍රවණතාවය ඉතා අධිකය.

ධම්මො හවේ රක්ඛති ධම්මචාරී

යන බුදු වදනට අනුව දහම් මග පා නගන්නෝ දහමින් නම ආරක්ෂා කරනු ලබයි. එබැවින් පංච ශීලය දිවි හිමියෙන් සළකමින් සල්ලාලයින්ගේ ගොදුරු බවට පත් නොවී, දෛනික ජීවිතයට ඉමහත් යහපතක් සලසන සිගාලෝවාද සූත්‍රයේ අඩංගු උපදෙස් පිළිපදිමින්, මිත්‍රද්‍රෝහීන්ගෙන් ඈත් වී කළණ මිතුරු සම්පත්තිය ශක්තිමත් කර ගනිමින් ධර්මාවබෝධය ලබමින් සසර දුක් නිමා රක ගැනීමට සියලුම තරුණ දූ පුතුන් මේ ලද මොහොත තුළ අප්‍රමාදීව කටයුතු කිරීම කාලෝචිත වැයමක් වන්නේමය.

විෂමචාරී සමාජයක යහ ගුණ වැළලී යයි. සමාජද්‍රෝහී, සදහම් විරෝධී ක්‍රියාකාරකම් හිස ඔසවයි. රහසිගත මත්ද්‍රව්‍ය ජාවාරම් ඔස්සේ මුදල් උපයමින් සමාජයේ විරාජමාන වීමට වෙර දරන ඇතැම්හු මව පියා නොහඳුනති. දුව පුතා නොහඳුනති. තරුණ දූ පුතුන් අද අන්ද මන්ද වී කලයුත්ත නොකලයුත්ත අවබෝධ කරගත නොහැකිව මංමුලා වී සුසුම්ලයි.

හරි දේ හරි විදියට දකින්නත් වැරදි දේ වැරදි ආකාරයට දකින්නත් ධර්මය ධර්මය ලෙස දකින්නත් අධර්මය අධර්මය ලෙස දැකීමටත් හැකි පෞරුෂයක් ගොඩනගා ගැනීමට වත්මන් තරුණයා අද උපක්‍රමශීලී විය යුතුය. ඒ සමාජ රැල්ලට එරෙහින උඩුගම් බලා පිහිනිය හැකි විශිෂ්ඨ පෞරුෂයකි.

ඒ සඳහා සද්ධර්මයේ පිහිට, ත්‍රිවිධ රත්නයේ බලය විශ්වය තුළ පවතී. ඒ තාක්කල් යෞවනත්වයට පා තැබූ බුද්ධිමත් දරුවා වල්මත් නොවනු ඇත. මෙය පදනම් වන්නේ කල්‍යාණ මිත්‍ර ඇසුර මතයි. ධනය, බලය, උගත්කම සහ වයස කල්‍යාණ මිත්‍රත්වයට අත්‍යාවශ්‍යම සාධක නොවේ. ඔබේ කල්‍යාණ මිත්‍රයා මව, පියා හෝ වෙනත් ඥාතියෙකු

විය හැකිය. නොඑසේ නම් ප්‍රඥාවන්ත ගුරුභවතෙකු විය හැකිය. ඔහු වයසින් වැඩි වුවද, අඩු වුවද ඔබට යා යුතු යහ මඟ ආදර්ශයෙන්ම පෙන්වන්නේ නම් සහ නොයා යුතු මාවතින් ඔබ වළක්වාගන්නේ නම් ස්වකීය සම්මතයෙහි පිහිටා අනුන්ට අවවාදයක් දිය හැකි ස්ථාවරයක පවතින අයෙක් නම් ඔහු හෝ ඇය කල්‍යාණ මිත්‍රයෙකු සේ සැලකීමට වටී.

මෙම ධර්මද්වීපය තුළ යම් තැනැත්තෙකු අධර්මවාදීව ජීවත් වන්නේ නම්, මව් පිය, දූ දරු, ගුරු ගෝල, ස්වාමි භාර්යා ආදීන් සමඟ පවත්වන අන්‍යෝන්‍ය ඇසුරේ දී තම තමාගේ සීමාවන් නොදන කටයුතු කිරීමට පෙළඹෙන්නේ නම් ඒ කාට වුවද ස්වභාවධර්මය සර්ව සාධාරණ ලෙස දඬුවම් පමුණුවයි. යමෙක් ධන බලයෙන් ආඪ්‍යව, නිල බලයෙන් විරාජමානව, උගත්කමින් හිස උදුමවාගෙන මිනිස් කයකට ආරූඪ වූ තිරිසනෙකු ලෙසින් තම යුතුකම් පැහැර හරින්නේ නම් හෝ එසේත් නැතිනම් තම සීමාව නොදන කටයුතු කරන්නේ නම් හෝ රහසිගතව තම විෂමචාරයන් පවත්වන්නේ නම් හෝ එම කර්ම විපාක ඔහු පසු පස ම හඹා එන්නේ මුළු මහත් සමාජයටම විවෘත වන පරිද්දෙනි. ඒ විශ්වීය ධර්මතාවයයි. සමාජය දෙස විර්ශනාත්මකව බලන්නෙකුට මෙය ඉතා සුලභ දසුනකි. මත් ද්‍රව්‍ය සංසරණයට රහසේ හෝ දායකත්වය ලබාදෙමින් එසේත් නැත්නම් වෙනත් වංචනික ක්‍රියා මාර්ගයකට අනුගත වෙමින් අයථා ලෙස උපයන මුදල්මගින් කිසිවෙකුට කිසිඳු යථාලාභයක් ලද නොහැකිය. වංචනික මුදල් ආයෝජනය කර මන්දිර ඉදිකළ ද ඒ තුළ සතුටින් ජීවත් විය නොහැක. ඇතැම්විට ස්වාමි භාර්යා, දරු දෙමාපියන් ආරවුල්, එසේත් නැත්නම් සුව නොවන ලෙඩ රෝග, ගුප්ත බලපෑම්, අමනුෂ්‍ය කරදර, ජලයෙන්, ගින්නෙන්, නාය යාම්වලින් ඇතිවන ස්වාභාවික විපත් මගින් එසේත් නැත්නම් සතුරු බලවේග මගින් ඔවුන් ලද සෞභාග්‍යය විනාශ වී යයි. මේ සියල්ලක් වත්මන් මිනිසාගේ පියවි ඇසට ගෝචර වී ඇති සුලභ දසුන්ය. ඒ සියල්ලක් මෙන්ම ජීවිත ද ත්‍රි ලක්ෂණයට යටත්ය. කිසිවක් අපට අවශ්‍ය පරිදි පවත්වාගත නොහැක. එම ධර්මතාවයන් හඳුනාගෙන විශාල විපත්, දුක් කරදර ආදියට ආරාධනා නොකර, කළ යුතුව ඇත්තේ **ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කිරීමයි.** එවිට මෙලොව, පරලොව දෙක්හිම ජයග්‍රහණය තමා සතුවනු ඇත.

අපගේ පියවි නෙතට ගෝචර වන, ත්‍රිවිධ රත්නයේ ජීවමාන ගුණ සමුදාය අත් දකිමින් පස්පව්, දස අකුසලයන්ගෙන් තොරව ජීවිතය පිළිබඳ යථාවබෝධයකින් එනම් **සාධු දැක්මකින්** යුතුව, ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩන්නෝ සුවපත් ජීවිත ගතකරමින් සසර ගමනට තිත තබති. ඒ සද්ධර්මයේ සත්‍යයයි. ත්‍රිවිධ රත්නය ජීවමාන මෙන්ම මහානුභාව සම්පන්නයි.

සාධු! සාධු! සාධු!

***

18

රත්නමාලී ගාථාත්‍රය

ත්‍රිවිධ රත්නයේ මහානුභාව සම්පන්න ගුණස්කන්ධය, සුවිශේෂී අක්ෂර බන්ධනයක් ඔස්සේ ඒකරාශී කොට නිබන්ධනය කොට ඇති මෙම **ශ්‍රේෂ්ඨ රත්නමාලී ගාථාත්‍රය,** බුදු පියාණන් වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේලා ද්‍රෝණයක් (ධාතු කොටස් 1/8) නිරුපද්‍රිතව වැඩ සිටින **ස්වර්ණමාලී මහා සෑ රජාණන් වහන්සේගේ** මහානුභාව සම්පන්න පාදම මත රන් පත්වල ලියා නිදන් කොට ඇති අතර ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විරාජමාන වන සෙංකඩගල පුර **දළදා මාළිගාවේ ද,** උඩු වියන් මත වර්ණවත් ලෙසින් මුද්‍රිතව ඇත. මෙය **දර්ශනය වීමෙන්,** අර්ථාන්විතව වැඩි වාර ගණනක් නිවැරදි උච්ඡාරණයෙන් යුතුව **සජ්ඣායනා කිරීමෙන්** සහ **ශ්‍රවණය කිරීමෙන්** ලද හැකි ආරක්ෂාව සහ ආශීර්වාදය මා හැඟිය. ජීවිත ජයග්‍රහණය සහ ස්ථාවරත්වය පිණිස දෛනික භාවිතයට යොදා ගනිත්වා. !

සං සාර සාරෝස විනීත ණී — සං
සං ණීත සාතං සුවිසාර ධී — සං
සං ධීරකං සොණ්ණ තනූ පලා — සං
සං ලාප දේසිං පණමේහි සා — සං

සං සාභිගං කේවල මෝහ නා — සං
සං නාහකං මාර රණේ විසේ — සං
සං සේවිතං දාසි මුදාර හා — සං
සං හාර ධම්මං පණමේ සදා — සං

සං දාසගං නාසිත පාප නා — සං
සං නාපධං සිං හත සෝර පා — සං
සං පාර ගාමිං සුවිසාර වා — සං
සං වාර සංසං පණමේ රසා — සං

අර්ථය සිංහල සහ ඉංග්‍රිසි භාෂාවන්ගෙන් අක්ෂර බැඳීම් සමග පහත සංගෘහිතය.



මෙම ගාථාත්‍රය තුළ "සං" යන අක්ෂර බැඳීම්, විසි හතර අවස්ථාවක දී එම එක් එක් පදය ආරම්භයේ දී මෙන්ම අවසානයේ දී ද, පද එකිනෙකට සවි බල ගන්වමින් සංයෝජනය වී පවතී. "සං" යනුවෙන් යහපත්, බලවත්, ආනුභව සම්පන්න යන අරුත් මතුකෙරෙන අතර, මෙම සුවිශේෂී අක්ෂර බන්ධනය තුළ **සූවිසි අනන්ත මහා ගුණ** බලය ඒකරාශීව ශක්තිමත් ලෙසින් **ස්ථාපිත වී ඇත.** එකින් එකට බැඳී ඇති අක්ෂර සංයෝජනය දෙස විමර්ශනාත්මකව බලන්නෙකුට සියපත් පියුමක පෙති මත ඉතාමත් ක්‍රමානුකූල ආකාරයකට ගොඩනැගී ඇති මෙම අක්ෂර සංයෝජනය විද්‍යාමාන වනු ඇත.

මහානුභාව සම්පන්න මෙම ගාථාත්‍රය සජ්ඣායනා කරන වාර ගණන මත එහි බලයේ තිව්‍රතාවය වැඩි වෙයි. නිවාස තැනීමේ දී මෙම ගාථාත්‍රයෙන් නිධන්ගත කෙරෙන මුල්ගල 108 වාරයක් ජීවන් කිරීම ඇත අතීතයේ සිට පැවත එන බෞද්ධ සම්ප්‍රදායකි. එහි නිසි ඵල ලැබීමට එම

චාරිත්‍රයෙහි නිතර වන පුද්ගලයා ගතින් සහ සිතින් ඉතා පිරිසිදුව බුදු පියාණන් වහන්සේට මල් පහන් සුවඳ දුම් ආදිය පූජා කොට තිසරණ සහිත පංචශීලයෙහි පිහිටා නිසි ලෙස උච්චාරණය කරමින් මෙත් සිතින් යුතුව හැකි උපරිම වාරයක් සජ්ඣායනා කළ යුතු ය. වාර ගණනකට සාපේක්ෂව ගාථාත්‍රයේ ඇති මහානුභාවය සම්පන්නක බලය මුල්ගල මත ආරෝපණය වීමෙන්, එම නිවසටත් එහි පදිංචි නිවැසියන්ටත් දෘඪතර ආරක්ෂාවක් ලැබෙනු නියතය. ඒ අන් කිසිවක් නොව ත්‍රිවිධ රත්නයේ මහානුභාවයි. පිරිසිදු හදවතකින් මුදාහළ ආශිර්වාදයක බලමහිමයයි.

ගාථාවන්හි අදහස ඉංග්‍රිසි සහ සිංහල භාෂාවන්ගෙන් මෙසේ දක්වෙයි. එහෙත් නිසිඵල ලැබීමට ගාථා සජ්ඣායනා කළ යුත්තේ ඉහත සඳහන් භාෂිතයෙන් ම බව අවධාරණය කරගත යුතුය.

I foreit my homage to the virtuous Lord Buddha who quench the sorrow of all beings (Human & Inhuman/ worldly & outer space) by practicing 10 virtues in Samsara (in the circle of Birth and Death)

භවයෙන් භවය පෙරුම් පුරා ලෝසත දුක් සුසුම් නිවූ
ඒ භගවත් මුණි ගෞතම නමදිමි ගුණ අනන්ත වූ

I pay my homage to Dhamma of the Lord Buddha which made us to see the eternal bliss , by breaking off the screen of darkness

අවිඳු අඳුර බිඳ හැරලා සඟමොක් සුව සෙත සැදූ
හිමි දෙසූ සඳහම් තෙවලා මම නමදින්නෙමි සාධු

I venerate Maha Sangha who practice moral virtuous and walk straightly along the Middle Path having a clear destination being an example to all humans.

සසර කතර තරණය කර එතෙර දකින මඟ පෑදූ
බහු ජන හිත ගුණ ප්‍රමුදිත නමදිමි සඟ ගණ සාධු

මෙම ගාථාත්‍රය පාඨක අවබෝධය පිණිස මෙලෙසින්ද පද බැඳී ඇති අතර අරමුණ වන්නේ අර්ථාවබෝධයකින් යුතුව නිසි ඵල ලැබීමයි.

සසර සඬ පහර නවතා නිවන් — වැද
පැතිර නැණති දිරිමත් රන් පතක් — ලෙද
නිතර දිලෙන තුම් සදහම් දෙසන — ලද
වැතිර වඳිමි මගෙ සම්බුදු මහිම — සඳ

සැක තැන් දුරු කරන එලෙසින් මෝ — නසන
යුදදුම් ලෙසින් මර යුදයෙහි දිවි — රකින
ඇසුරින් සතුට දෙන කෙලෙසුන් ඇති — නසන
නමදිමි බැතින් සිරි සදහම් මිණි — පහන

සඟ සැප දෙන නැසිය යුතු පව් හැම — නසන
බව බැමි සුණු විසුණු කර නිති ගුණ — පුරණ
ලත් සැප දමා පර තෙර වෙත නෙත — යොමන
වඳිනෙමි නිති පතා පින්සරු මහ — සඟන

"Having stopped the flow of sansara by eliminating re-birth: Having dispensed the wisdom like an up-right golden flag: Having widely spoken eternally, sparkling Noble Dhamma, My GUIDING LIGHT enshrines the universe

19

සම්බුද්ධ පරිනිර්වාණය
The Passing away of the Buddha

The Buddha also faced with the realty of life when 45 years passed since the attainment of Enlightenment. When the Buddha was 80 years old His cheeks were not as full as when he was young, the cheeks, bones appeared feeble and fragile. His complexion had changed into pale and skin wrinkled. As an old cart needed constant repairs, His body too needed much care remedying. The headache and the back-ache that developed as side-effects of His ascetic practice troubled him more at this dotage. His endless tours to distant places to preach the doctrine, further annoyed his physical illnesses. Though he was getting weaker physically, yet he was mentally agile and alert as ever before.

By that time many senior desciples such as Venerable Sariputta, Moggallana were no more. Devadatta,Ajasatta also has faced with death and the king Pasenadi Kosala who was of the same age as the Buddha died a natural death. The closest leity: Anathapindikassa too was died by then. But the Buddha remained unshaken, in spite of his age, physical disabilities, and the passing away of his senior desciples and leading patrons. The mission He began from Gaya was in process. It was not over. With courage, Dedication and out of compassion to the masses he once again decided to leave from Rajagaha. **It was His last journey.**

However before leaving Rajagaha he explained the seven reasons for the success and prosperity of the Vajji People. Then He preached the monks about the factors they should cultivate in order to achieve success and prosperity of the community of monks.

From Rajagaha he went to the city of Nālanda and from there to Pātaliputta. Having crossed the river "Gangas" He reached a rural community of Nādikā. It is the place where Ambapali : came to invite Buddha for alms. Later the Liccavi Princess also came to invite Buddha for alms on the very same day. But the Buddha declined that invitation as He had accepted the invitation of Ambapali. After the alms-giving Ambapali donated the Mango-Grove to the Buddha. The monks used it as a place of retreat.

When the rainy season started the Buddha asked the monks to stay at Visali and He left for the villge of Beluwa to spend the rainy season there. He was accompanied by Venerale Ananda. While spending the rainy season the Buddha felt seriously ill. Venerable ananda became worried thinking that Buddha mght pass away without giving any final advice. But after some times the Buddha recovered and ven ananda was pleased. He requested the Buddha to give some advice. **"The Buddha said that the only advice he wishes to give is that, One should be an island { lamp} unto oneself, One should make Dhamma an island {lamp}, that one should not seek refuge in any external power, but cultivate self – reliance"**

He went on his alms round next day as usual in spite of his ailments and spent the day near at Chāpāla. He felt that the death was approaching. He started to revise the activities he rendered during the last 45 years. He was happy to find that He could have been able to find a large number of disciples and firmely established the community of monks,nuns, and lay devotees. Also He had preached the Dhamma to a large number of people.He felt that he had successfully completed his **'misson'.** He called Ananda and made the monks to be assembled. Buddha told them that his physical health is deteriorating fast and would not live long.

In spite of his physical weaknesses mentally He is active in missionary activities. So he visited to the rural community: **Pāva** sympathyizing on village folks. He was offered alms by **'Chunda'.**

It was consisted with a curry **'sukaramaddava'** which did not agree with him. It was indigested and it led to severe diarrhoes. Bearing all difficulties then He proceeded to 'Kushinagar, He was faintish again & again. He said venerable Ananda that He could walk no more. After laying the robe under a shady tree the Buddha laid on it but He was thirsty. So, venerable Ananda was told to fetch him some water. He hurried to a stream close by, but the water was muddy. So he did not bring water and suggested to proceed little further up to drink pure waer from the river ' Kukkuthā. But the Buddha insisted on water to drink for his thirst was unbearable. venerable Ananda again went to the strem and this time found the watercrystal clear. So he immediately brought some and made the Buddha to quench His thirsty.

The Buddha stepped on with much difficulties and reached the **'Sal flower Grove'** in Kushinārā and said His feet do not take him further. Both feet were swollen. Ven Ananda made a place for Him to lie down.**'The Buddha lay on his right with his head resting on his right palm and his left hand stretched straight along his body'.** Venerable Ananda knew that the Buddha would pass away soon. He could not bear up the grief. He wept and cried aloud. The Buddha consoled him **"Ananda… everything is impermanent: even the things that are dear and near".**

People started to come in thousands to pay homage. Meanwhile one ascetic named 'Subhadra' wanted to speak to the Buddha. But ven Ananda prevented him requesting not to disturb the Buddha. By hearing that, the Buddha asked Ananda to allow 'Subhadra' to come in. The Buddha preached to him and 'Subhadra' became the last disciple of the Buddha. Further up the Buddha asked the monks whether they have any doubt to be cleared. The monks remained silent.The Buddha addressed the monks for the last time and preached thus, **"All compounded things are impermanent. So. be heedful" These were the last words of the Buddha.**

By knowing the Buddha's passing away. there was such a large crowd to pay their last respect to the remains of the Buddha. So the body was kept for 7 days allowing the public to pay their last respect and homage. Finaly on the 7th day the Buddha's body was cremated with the same honour and respect as to a Universal King(Cakkawatti – Rāja). That was the End of the **Greatest Leader of the Universe**

*

(පුරා වසර හතළිස් පහක් දහම් අමා වැසි වසින්නට සැලැස් වූ තුන් ලෝකාග්‍ර බුදු පියාණන් වහන්සේ ගේ මුව මඩලින් ගලා හැලෙන්නට වූ ඒ සඳහම් අමා බිඳුවල සිසිල් පහස ලැබීමට තරම් ඔබ අප ද භාග්‍ය සම්පන්න වූවෝ වෙමු. ලද භාග්‍යයේ නිසි ඵල ලැබීමට අප්‍රමාදීව කුසල් වැඩිය යුතුව ඇත.)

බුදු පියාණන් වහන්සේ පිරිවනට වැඩි මඟ පවා සැදැතියන්ගේ ධර්ම සංවේගය පුබුදුවාලයි. ගම් දනව් සිසාරා ලෝ සතුන්ගේ යහපත පිණිස චාරිකාවේ යෙදුණ බුදු පියාණන් වහන්සේ විශාලා මහනුවර චාපාල නමැති නියම් ගමෙහිදී ආයු සංස්කාරය හරිමින් තෙමසකින් පිරිනිවවන් පාන්නේ යි වදළාහ.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත, ශෝභමාන, සවිබල පිරි, රැස් විහිඳුන, එම බුදු සිරුර දැන් දුබල වී ඇත. විශ්වීය ධර්මතාවයට අනුව පවතින ත්‍රිලක්ෂණයට දැන් බුදු සිරුර ද අනුගත වී ඇත. අසූවන වියෙහි පසුවන බුදු පියාණන් වහන්සේගේ ද කායික ශක්තිය දුර්වල වෙමින් පවතී. ගමන වේගවත් නැත. උන් වහන්සේ වරෙක මෙසේ වදාළහ. **"මා දැන් මහලු ය. සිරුර දිරා ගොස්ය. අවුරුදු 80 ට පැමිණ ඇත. මේ සිරුර දැන් දිරා ගිය කරත්තයක් බඳුය. මෙම සිරුර ද දැන් පවත්වා ගත යුත්තේ පිළියම් කරමිනි. ජරාව, ව්‍යාධිය උපතත් සමඟ සැමට උරුම වී ඇත. තමන් වහන්සේට ද එම ධර්මතාවය සාධාරණය."**

අතර මඟ නැවතෙමින්, විඩා හරිමින් බුදු පියාණන් වහන්සේ තවමත් දහම් දෙසමින් සඳහම් චාරිකාවේ ය. **මහණෙනි, සත්‍ය ධර්ම හතර අවබෝධ නොකිරීමත්, විනිවිද නොදැකීමෙන්** මෙසේ දීඝ සංසාරයක මාත්, ඔබත් භවයෙන් භවයට ගමන් කළා. විවිධ ආත්ම

භව ලබමින් සසර සැරිසැරුවා, ඒ ධර්ම හතර වන ආර්ය ශීලය, ආර්ය සමාධිය, ආර්ය ප්‍රඥාව, ආර්ය විමුක්තිය අවබෝධ නොකිරීම යි. විනිවිද නොදැකීම නිසයි මේ සසර ගමන නවතා ගත නොහැකිව සැරිසරන්නේ. මෙය ඉතා දුක්ඛිතයි. සම්බාධක සහිතයි.

මහණෙනි, ඒ සත්‍ය ධර්ම හතර මම මෙම භවයේදී අවබෝධ කළෙමි. විනිවිද දැක්කෙමි. භව තණ්හාව සිඳ දැමීම. නැවත නූපදින විදියට සුණු විසුණු කළෙමි. දැන් ඉතින් යළි ඉපදීමක් නැහැ. මහණෙනි, මේ **ශීලයයි,** මේ **සමාධියයි.** මේ **ප්‍රඥාවයි.** ශීලය අනුව වඩන ප්‍රඥාව මහත් ඵලදායකයි. මහත් ආනිශසංසදායකයි. සමාධිය අනුව වඩන පඥාව මහත් ඵලදායකයි. මහත් ආනිශසංසදායකයි. ප්‍රඥාව අනුව වඩන සිත මනාව ආශ්‍රවයන්ගෙන් මිදෙනවා. ඒ ආශ්‍රවයන් නම් **කාමශ්‍රව, භාවශ්‍රව, දෘෂ්ඨශ්‍රව** සහ **අවිද්‍යාශ්‍රව යි.** ඒ ආශ්‍රවයන්ගෙන් මිදීම මහත් ඵලදායකයි. මහත් ආනශංසදායකයි.

බුදු පියාණන් වහන්සේ ඇතැම් විට විඩාවට පත් වූවාක් මෙනි. එහෙත් භික්ෂූන් අමතා සසරින් එතෙර වීම පිණිස ධර්මාවබෝධය ලබාදෙන විට කිසිඳු වෙහෙසක් නොදැක්විනි. අනතුරුව බුදු පියාණන් වහන්සේ වැඩියේ පාවා ග්‍රාමයටයි. විශාල රමණීය වෙල් යායන් අසල අඹ වනයකි. අඹ සෙවනෙහි ගසක් යට බුදු හිමි විවේකීව වැඩ සිටියහ. ගොවීහු බුදු හිමි අසළට පැමිණ දහම් අසන්නට වූහ.

අනතුරුව චුන්ද නම් වූ කම්හල් කරුවෙකු බුදු හිමි සමීපයට පැමිණියේ පසු දින දහවල දානයට තම නිවසට වඩින්නැයි ආරාධනා කිරීමටය. එම ආරාධනාව පිළිගත් බුදුන් වහන්සේ පසුදින එහි වැඩම කළහ. චුන්ද පිළිගැන්වූ දානයේ සූකර මද්දව නමැති ආහාරය ද විය. එය කුඹුරු අද්දර පිපෙන බිම්මල් විශේෂයකින් සකස් කරන ලද්දක් බවට ද සැළකේ.

දානයෙන් පසු බුදු හිමියන් කුසිනාරාව දෙසට වැඩම කළහ. කුසෙහි යම් වේදනාවක් මේ අපහසුවක් දැනුණි. පිපාසයක් ද දැනිණි. රක්ත අතීසාරය නමැති රෝගයට තමන් වහන්සේ ගොදුරුව ඇති බව දැනිණි. තුරු සෙවනක නැවතී බුදු පියාණන් වහන්සේ ආනන්ද හිමි අමතා මෙසේ කීහ. ආනන්ද, **මේ සිවුර හතරට නමා එළන්න. මට ක්ලාන්තය ගතියක් දැනෙනවා. ටිකක් විවේක ගන්න ඕනෑ.** බුදු හිමියෝ ඒ මත හිඳ ගත්හ. **ආනන්ද, මට පිපාසයි. වතුර ටිකක් බොන්න ඕනෑ.**

"කකුත්ථා" නදිය නුදුරෙන් ගලා බසී. එහෙත් එය කැලතී, බොරවී තිබුණි. ගැල් පන්සියයක් ගමන් කිරීම නිසා බොරවී තිබු ජලය පානයට නුසුදුසුය. ඒ බව බුදු හිමිට දන්වා සිටිය ද, පිපාසය උග්‍රව සිටි බුදුපියාණන් වහන්සේ යළිත් ජලය ඉල්ලූහ. නැවතත් නදිය දෙසට පාත්‍රය රැගෙන ගියද, විකල්පයක් නොවීය. තෙවන වරට ද බුදු පියාණන් වහන්සේ පැන් ගෙනන ලෙස ආනන්ද හිමියන්ට දැන්වූහ.

මහා ආශ්චර්යය කි. කැලතී, බොරවී තිබු දිය දැන් ඉතා පැහැදිලිය. ඉතා පිරිසිදුය. විශ්මයට පත් වූ ආනන්ද හිමි පාත්‍රයට පැන් පුරවා ගෙනවිත් බුදුපියාණන් වහන්සේට පුජා කළහ. බුදු පියාණන් වහන්සේ පැන් වළඳා පිපාසය සංසිඳුවා ගත්හ.

අනතුරුව එතනට ආලාර කාලාමගේ ශ්‍රාවකයෙකු වූ පුක්කුස නමැති මල්ල රාජ පුත්‍රයා පැමිණියේ ය. ඔහු බුදු හිමියන්ගෙන් දහම් අසා අඟනා සිවුරු දෙකක් පරජා කළේය. එකක් ආනන්ද හිමියන්ට පුදන්න, බුදු හිමි පැවසූහ. පුප්කුස සිවුරු පුජා කර බුදු හිමියන්ට වැඳ පිටව ගියේය.

ආනන්ද හිමියෝ තමා ලද සිවුරෙන් බුදු හිමියන්ගේ සිරුර වැසීය. බුදු සිරුර දිළිසෙන්නට විය. ආනන්ද හිමියෝ විශ්මයට පත් වූහ. බුදු පියාණන් වහන්සේ සිය කටහඬ අවදි කළහ. **ආනන්ද, තථාගතයන් වහන්සේ බුදු වන දවසේත් පිරිවන් පාන දවසේත් මේ ලෙසට සිරුර දිලිසෙනවා. අද රාත්‍රී අවසන් යාමයේ කුසිනාරාවේ මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේ සල් ගස් දෙකක් අතර තථාගතයන් වහන්සේගේ පිරිනිවීම සිද්ධ වෙනවා. ආනන්ද හිමි දරාගත නොහැකි වේදනාවකි.**

යළි ගමන් ඇරඹිණි. මදදුරක් වැඩම කල උන් වහන්සේ හිරඤ්ඤවතී නදිය දැක එහි මඳක් නතර වූහ. පැන් පහසු වීමෙන් අනතුරුව අසල තිබූ අඹ වනයට වැඩියහ. අසල සිටි චුන්දක හිමි අමතා බුදු හිමි මෙසේ පැවසූහ.

චුන්දක, සඟල සිවුර හතරට නමා එලන්න. මට ටිකක් දිගා වෙන්නට ඕනෑ. සිවුර එළිණ. බුදු හිමියෝ එහි සැතපුණහ. මඳ වේලාවකට පසු පිබිදුණ බුදු පියාණන් වහන්සේ ආන්නද හිමියන් ඇමතූහ.

ආනන්ද, චුන්ද කර්මාර පුත්‍රයාගේ සූකර මද්දව වැළඳීම නිසා තථාගතයන් වහන්සේට පිරිනිවන් පෑමට සිදු වී යැයි යමෙකු ඔහුට චෝදනා කළහොත් එය ඔහුගේ බලවත් සිත් තැවුලකට හේතු වේවි. ඒ නිසා ආනන්ද, ඒ අවස්ථාව දුරු කළ යුතුයි. ඔහුට මෙසේ කියන්න, චුන්ද, ඔබ බුදුරජාණන් වහන්සේගේ අවසාන දානය පුදා සිදු කර ගත්තේ විශාල ලාභයක්. බුදු වීමට පෙර පිදූ දානයත්, පිරිනිවන් පෑමට පෙර පුදන දානයත් ආනිශංස අතින් එක සමානය. අනෙක් දානවලට වඩා **ඒ දාන දෙකේ විපාක උතුම්, මහත්ඵල මහානිසංස වැඩියි.**

අනතුරුව බුදුපියාණෝ කුසිනාරාවේ උපවත්තන සල් උයනට හිමිහිට වැඩම කළහ. ශාරීරික විඩා බර ගතිය එලෙසම ය. **ආනන්ද, මට ක්ලාන්තයක් දැනෙනවා. මේ සල් ගස් දෙක අතර මට සැතපෙන්න තැනක් සකස් කරන්න. බුදු හිමියෝ වදාළහ.**

බුදු පියාණෝ දකුණු පය මත වම්පස මඳක් මෑත් කොට තබා සිංහ සෙය්‍යාවෙන් සැතපුණහ. සල් ගස් දෙකෙහි අකලට පිපුණ මල් බුදු හිමියන්ගේ සිරුර මත පතිත විණි. අහසින් දිව සඳුන් සුණු වැගිරිණි. දිව්‍ය මදාරා මල් ද පතිත විණි. දිව්‍යමය සංගීතයක තත්සර නාද වැයෙන්නාක් බඳු කන්කලු නින්නාදයකි.

බුදු නෙත් විවර විණි. ආන්නද හිමියනට මෙසේ ප්‍රකාශ කළහ. ආනන්ද, මේ මල් සුවඳ තථාගතයනට කරන සැබෑ පූරා නොවෙයි. යමෙකු ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තව, ධර්මානුකූලව වාසය කරයි ද අන්න ඔහු තථාගතයන් වහන්සේට උතුම් ප්‍රතිපත්ති සත්කාරය කරයි. පුද දෙයි.

සැදැහැවත් කුල පුත්‍රයෙකු විසින් දැකීමට සුදුසු වූ, අත් නොහල යුතු සංවේග කටයුතු වූ ස්ථාන හතර කුමක් දැයි බුදු හිමියෝ මෙහිදී වදාළහ. බුදුහිමි උපන් **ලුම්බිණි,** බුද්ධත්වයට පත් **බුද්ධගයාව.** ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ **ඉසිපතන මිගදාය** සහ පරිනිර්වාණය සිදුකරනු ලබන **කුසිනාරාව** යන ස්ථාන 4 **සතර අවිජහිත ස්ථාන** වශයෙන් බුදු හිමි දේශනා කළ වදාළහ.

සංවේගයට පත් ආන්නද හිමි බුදු හිමියන් කෙරෙන් මඳක් ඈත්ව, ඉකි බිඳිමින් කඳුළු සලන්නට විය. සිතට නැගෙන සිතිවිලි අතරේ අතරමං විණි.

අහෝ.. මට තවමත් රහත් වීමට බැරිවුණා. මට මෙතරම් දයාවෙන්, කරුණාවෙන් අනුශාසනා කළ බුදු පියාණන් වහන්සේ අද පිරිනිවන් පානවා. හෙට සිට මා කාහට උපස්ථාන කරම් ද? මුහුණ සේදීමට වතුර සපයන්නේ කාහට ද? පා සෝදන්නේ කාගේ ද? සේනාසන පිළියෙල කරන්නේ කාහට ද? පාත්‍රා සිවුරු ගෙන පසුගමන් යන්නේ කාගේ ද? අනේ මෙම දුක මම කෙසේ දරාගනිම් ද?

ආනන්ද හිමියන්ගෙ සිත දුටු බුදු හිමියෝ ආනන්ද හිමි තමා ළඟට කැඳවා ගත්හ. අවවාද දුන්හ. ආනන්ද හඬන්න එපා. ශෝක වන්න එපා. කැමති දේවලින් වෙන් වීමට සිදුවන බව මා කලින් ම කිව්වා නොවේ ද? අති වූ සැම දෙයක්ම නැති වෙනවා. ඒවා කැඩෙනවා. බිඳෙනවා. පලුදු වෙනවා. එසේ නොවේවා කියා කීවාට, සිතුවාට එය වැළැක්වීමට කිසිවෙකුට කොපමණක් උත්සාහ කළත් බැහැ.

ආනන්ද, ඔබ බොහෝ කලක් මට හිතවත්ව සිටියා. මා ඇති තැන මෙන්ම මා නැති තැන ද, එක සිතින් මෛත්‍රියෙන්, කරුණාවෙන් යුතුව මට නිසි ලෙස උවටැන් කළා. සේවය කළා. ඔබ සසර පුරා බොහෝම පින් රැස්කර ගෙන තියෙනවා. පවාවන්න එපා. වැඩිකල් නොගොස් ඔබ රහත් වෙනවා.

විඩාපත්ව, ක්ලාන්ත ගතියෙන්, පිරිවන් මඤ්චකයේ වැතිර සිටි බුදුහිමියන්ගේ ප්‍රශ්නයක් ඇසීමට සුභද්‍ර නමැති එක්තරා පරිබ්‍රාජකයෙකුට අවශ්‍ය විය.

"උන් වහන්සේට මහන්සියි. කරදර කරන්න එපා." ආන්නද හිමියෝ සුභද්‍ර ට පැවසීහ. එය බුදු හිමියන්ට ඇසුණි.

"ආනන්ද, ඔහුට එන්න ඉඩදෙන්න." ඒ බුදු හඬයි.

සුභද්‍ර මෙසේ ඇසීය.

"බුදු හාමුදුරුවනේ. විමුක්තිය සළසන අය ලෙස සැලකෙන 'ෂඩ් ශාස්තෘවරු' ඔවුන්ගේ ප්‍රතිඥාවේ හැටියට සියල්ල දත් අය ද? නොඑසේ නම් නොදත් අය ද?"

බුදු රජාණන් වහන්සේ පිළිතුරු දුන්හ. ඒ හඬ ප්‍රභාෂ්වරය. එහි විඩාවක්, පීඩාවක්, වෙහෙසක් නොතිබිණ. සුභද්‍ර කෙරෙහි හුදු අනුකම්පාවෙන් ම ධර්මය දේශනා කළහ.

සුභද්‍ර මේ ගැන සිතන්න. යම් ආගමක, දර්ශනයක ආර්ය අෂ්ඨාංගික මාර්ගය දක්නට නොලැබෙන්නේ නම් එහි **සෝවාන් වූ ශ්‍රමණයෙක්** දක්නට ලැබෙන්නේ නැත. දෙවැනි ඵල **සකෘදගාමී ශ්‍රමණයෙක් ද** දක්නට ලැබෙන්නේ නැත. තෙවැනි ඵල ලද **අනාගාමී ශ්‍රමණයෙක් ද** දක්නට ලැබෙන්නේ නැත. සිව් වැනි **අර්හත් ශ්‍රමණයෙක් ද** දක්නට ලැබෙන්නේ නැත.

යම් ආගමක, ආර්ය අෂ්ඨාංගික මාර්ගය දක්නට ලැබෙන්නේ නම් එහි සෝවාන් වූ ශ්‍රමණයෙකුත් දෙවැනි ඵල ලද සකෘදාගාමී ශ්‍රමණයෙකුත් තෙවැනි අනාගාමි ඵල ලද ශ්‍රමණයෙකුත් සිව් වැනිය අර්හත් ශ්‍රමණයෙක් ද දක්නට ලැබෙනවා.

සුභද්‍ර අපගේ ධර්මයෙහි ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් තිබෙනවා. පළමුවැනි, දෙවැනි, තුන් වැනි, සිව් වැනි ශ්‍රමණයන් ද දක්නට ලැබෙනවා. **එවැනි ශ්‍රමණයන් නැති අනෙක් සියලුම ආගම් ධර්ම හිස්, ඒවා ශූන්‍ය බව දැනගන්න. සුභද්‍ර යම්තාක් කල් මේ භික්ෂූන් ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කරනවා නම්, ඒ තාක් කල් මේ ලෝකය රහතුන්ගේ හිස් වන්නැ නැහැ.**

සුභද්‍ර වයස අවුරුදු 29 දී සර්වඥතා ඥානය සොයා මා පැවිදි වුනා. පැවිද්දට දැන් අවුරුදු පනස් එකක් ගෙවිලා. ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ස්වල්ප වූ කොටසක්වත් අනුගමනය කරන ශ්‍රමණයෙක් මේ ධර්මයෙන් පිටස්තර අනෙකුත් ආගම් ධර්මවල නැහැ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් ශ්‍රමණයන් නැති අනෙත් ආගම් ධර්ම හිස්, ධර්ම ශූන්‍යයි.

සුභද්‍ර යම්තාක් කල් මේ භික්ෂූන් මනාව වාසය කරනවා නම්ඒ තාක් කල් මේ ලෝකය රහතුන්ගෙන් හිස්වන්නේ නැහැ.

නිසොල්මන්ව බුදු රජාණන් වහන්සේට මනාව සවන් දී සිටි සුභද්‍ර මෙසේ කීය.

ස්වාමීනි, ආශ්චර්යයි ස්වාමීනි, ආශ්චර්යයි. ඉතාමත් යහපත් යටිකුරු කර තැබූ දෙයක් උඩුකුරු කළ ආකාරයට, වසා තැබූ දෙයක් විවෘත කළ ආකාරයට, මං මුලා වූවෙකුට පාර පෙන්වූ ආකාරයට, අඳුරේ සිටින්නෙකුට රූප දැකීමට පහන් දැල්වූවාක් මෙන් ඔබ වහන්සේ මට ධර්මය දේශනා කළා.

ස්වාමීනි, මම බුදුන්, දහම්, සඟුන් සරණ යනවා. ස්වාමිනී, මට ඔබ වහන්සේ සමීපයේ පැවිදි වීමට, උපසම්පදා වීමට අවසර දෙන්න.

බුදු පියාණන් වහන්සේ මෙසේ ද පැහැදිලි කරන්නට වූහ.

සුභද්‍ර, වෙනත් ධර්මයක සිටින කෙනෙක්. මේ ධර්මයෙහි පැවිදි උපසම්පදාව කැමති වේ නම් ඔහු මාස හතරක් සංඝයා ඇසුරේ සිටිය යුතුයි. ඒ මාස හතර තුළ ඔහු තම හැසිරීමෙන් සංඝයාගේ සිත් ගත් විට ඔහුට පැවිදි උපසම්පදාව ලබාගත හැකියි.

බුද හඬට සවන් දුන් සුභද්‍ර සාධු ස්වාමීනි, මම මාස හතරක් භික්ෂූන් වහන්සේ සමඟ ඉන්නම්. ඊට පසු මට පැවිදි උපසම්පදාව ලබා ගැනීමට හැකිවේවා.

බුදු රජාණන් වහන්සේ ආනන්ද හිමි කැඳවූහ.

"ආනන්ද සුභද්‍ර පැවිදි කරන්න.

පැවිදි උපසම්පදාව ලැබූ සුභද්‍ර, වහා කෙලෙස් නිවන වීර්යයෙයන් යුතුව, තෘෂ්ණාව හෙවත් ඇල්ම දුරු කරමින් විදර්ශනාවේ යෙදෙමින් දින කිහිපයකින් රහත් බව ද ලැබීය.

මඳ වේලාවකට පසු බුහුදු නැවතත් ආනන්ද හිමියන් ඇමතුහ.

"ආනන්ද මගෙන් පසු මා දෙසූ දහම ශාස්ත්‍ර වශයෙන් සළකන්න.

අනතුරුව, අවට සිටි භික්ෂූන් වහන්සේලා දෙස බලා බුදු හිමි මෙසේ විමසූහ.

"මහණෙනි.... මේ එක් භික්ෂුවකටත් බුදුන්, දහම්, සඟුන් කෙරෙහි හෝ මෙම ධර්ම මාර්ගය කෙරෙහි, එසේත් නැත්නම් මෙම ප්‍රතිපදාව කෙරෙහි කිසියම් සැකයක් හෝ විමතියක් තිබෙනවා ද? එසේ නම් දැන් මාගෙන් විමසන්න. අපට මෙම ගැටලුව විසඳගන්න බැරිවුනා. යැයි සිතමින් පසුව කණගාටුවන්න එපා."

භික්ෂුහු නිහඬව සිටියහ. බුදු හිමියෝ තෙවරක්ම පිරිස අමතා එම අවස්ථාව ලබා දුන්හ. එහෙත් නිහඬතාවය නොබිඳිනි.

"එසේ නම් මහණෙනි.... මා දැන් අවසාන වශයෙන් ඔබ සැම අමතන්නෙමි. සියලු සංස්කාරයෝ වෙනස්වන සුලු ය. අප්‍රමාදීව නිවන් අවබෝධයට උනන්දු වන්න.

"වය ධම්මා සංඛාරා - අප්පමාදෙන සම්පාදේථ"

මේ අවසන් හඬත් සමඟ උන් වහන්සේ ප්‍රථම ධ්‍යානයට සම වැදුණහ. එතැන් සිට පිළිවෙළින් දෙවන ධ්‍යානයට, තෙවන ධ්‍යානයට සහ සිව් වන ධ්‍යානයට සම වැදුණහ. අනතුරුව ආකාසඤ්ඤායතනයට, විඤ්ඤාණංචායතනයට, ආකිඤ්චඤ්ඤායතනයට සහ නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට සහ සඤ්ඤා වේධහිත නිරෝධයට සම වැදුණහ.

බුදු සිරුර නිසලය. ආනන්ද හිමියෝ අනුරුද්ධ හිමියන් සිහින් හඬින් අමතමින් '**බුදු පියාණන් වහන්සේ පිරිනිවන් පෑවා**' යි සැළකළහ. එහෙත් එය ප්‍රතික්ෂේප කළ අනුරුද්ධ හිමියෝ පවසා සිටියේ බුදු පියාණන් වහන්සේ **සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට** සමවැදුණා පමණක් බවත්, ඒ වන විට පිරිනිවන් පා නැති බවත්ය.

අනතුරුව බුදු පියාණන් වහන්සේ එම සමාපත්තියෙන් නැගිට, නේවාසඤ්ඤායතනයේ සිට ප්‍රථම ධ්‍යානය දක්වා සම වැද, යළි ප්‍රථම ධ්‍යානයෙන් නැගිට, දෙවන, තෙවන, සිව් වන ධ්‍යානවලට පැමිණ පිරිනිවන් පා වදාළ සේක.

සම්බුද්ධ පරිනිර්වාණය

කුසිනාරාව

20

සම්බුදු පරිනිර්වාණයේ ත්‍රිවිධ අවස්ථා සහ ධාතු ස්ථාපනය
3 STAGES OF EXPIRING & INSERSION OF RELICS

සම්බුද්ධ පරිනිර්වාණ අවස්ථාව තුනකදී සිදු වෙයි. එනම් **කෙළෙස් පරිනිර්වාණය, අනුපාදිසේස හෙවත් සම්මුති පරිනිවර්වාණය සහ ධාතු පරිනිර්වාණය යි.** සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ දස බිම්බරක් මාර සේනාව පරදවා, වයස අවුරුදු 35 දී ජය ශ්‍රී මහ බෝධි මූලයේදී සියලු කෙලෙස් ඉතිරි නොමැතිව සිඳලමින් උතුම් සම්බෝධියට පත්වීම ක්ලේශ පරිනිර්වාණයයි. **(defeating Mara hoards ascetic Siddhartha became Supreme Boddhahood)**

සිද්ධාර්ථ ගෞතම බුදු පියාණන් වහන්සේ එතැන් පටන් පුරා අවුරුදු පහක්, දිනකට පැය දෙකක පමණ සුළු විවේකයක් පමණක් ලබමින්, ලෝ සතුන්ගේ යහපත පිණිස, තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් පරම ගම්භීර උතුම් සද්ධර්මය දේශනා කරමින්, අනූහාර දහසක ධර්මස්කන්ධයක් ලොවට මුදාහැර, වයස අවරුදු අසූවේදී තම බුදු කිස නිමාකර කුසිනාරාවේ මල්ලව රජ දරුවන්ගේ උපවත්තන නම් සල් උයනේදී පරිනිවන් පෑම අනුපාදිසේස පරිනිර්වාණය හෙවත් **සම්මුති පරිනිර්වාණය යි. (Attaining Supreme Nibbana at Kusinara)**

බුද්ධ අධිෂ්ඨානය පරිදි බුද්ධ ශාසනය ඉදිරියට තවත් අවුරුදු 5000 ක් නිරුපද්‍රිතාව ජීවමානව පවතී. එතෙක් මෙම බුදු සසුන මාර්ගඵල ලාභීන්ගෙන්, හිස් නොවනු ඇත. ඒ දක්වාම සියලු සර්වඥ ධාතුන් ලොව පුරා විසිර පවත්නේය. **ධාතු පරිනිර්වාණය (The evaporation of all relics)** සිදු වන්නේ ඉන් අනතුරුය. එය බුදු වදනයි.

සම්මුති පරිනිර්වාණයෙන් මේ වන විට වසර 2606 ක් ඉක්ම ගොස් ඇත. ඔබ අප කවුරුත් තවම සංසාරයේ ය. නැවතත් මිනිසත්

භවයක් ලැබෙතැයි කාට නම් කිව හැකි ද? වර්තමානයේ අවුරුදු, මාස, දින ගණන ගෙවී යන්නේ කෙතරම් වේගයෙන් ද යන්න කිසිවෙකුට අමුතුවෙන් මතක් කළ යුතු නැත. එසේ නම් අප විසින් කළ යුතුව ඇත්තේ බුදු පියාණන් වහන්සේගේ අවසාන අවවාදය සිත්හි ධාරණය කරගෙන අප්‍රමාදීව කුසල් වැඩීමයි. ධාතු පරිනිර්වාණයෙන් පසු උදා වන්නේ බුද්ධ ශූන්‍ය කාලයකි.

ධාතු පරිනිර්වාණයේ දී ලොව පුරා විසිර ඇති සියලුම සර්වඥ ධාතූන් වහන්සේලා එකතුවීමෙන් ජීවමාන බුදු රුවක් මැවී, අහසේදීම යමා මහ පෙළහර පා, දෙව් බඹුන්ට ඇසීමට **"සාමුක්කන්තික ධර්ම දේශනාව"** සිදුකර, අවසානයේ බුද්ධ අධිෂ්ඨාන බලයෙන්, අහසේදී ම විශාල ගිනි ජාලාවකින් ධාතු සියල්ල ආදාහනය වී අතුරුදහන් වී යයි. එවිට බුද්ධ සාසනය අවසන්ව මුළු ලොවම අඳුරු වෙයි.

අද මිනිස් භවය ලබා සිටින අප කෙරතම් පින්වන්ත ද? මෙම මිනිසත් භවය පෙර කුසල් බලයෙන් ලද පූණ්‍යලාභයකි. එහෙත් මාරයා නිතරම බලා සිටින්නේ අප ව සංසාරයේ රඳවා තැබීමටය. මෙයින් ගැලවීමට නම් අධික ලෙස වීර්ය වඩමින් සමාජ රැල්ලට එරෙහිව උඩුගම් බලා පිහිනිය යුතු ම ය. සියලු සමාජ සාරධර්ම, බෞද්ධ සංකල්ප, ජාතික සංස්කෘතිය සීඝ්‍රයෙන් සෝදාපාළුවකට ලක්ව ඇති මෙම යුගයේ ඔබ අප, ප්‍රඥාව මෙහෙයවා කටයුතු නොකරන්නේ නම් අභාග්‍යය අප පසු පස ලුහුබඳිමින් නැවතත් සසරටම ඇද දමනු නියතය. තවමත් අවසාන ජයග්‍රාහී මොහොත අප අබිමුව ඇත. **"අප්පමාදො අමතපදං"** පමා නොවීම නිවනට හේතු වේ. ඒ බුද්ධ වචනයයි.

දඹදිව් තලයෙහි එනම් බුදුන් උපන් පින් බිමෙහි තවමත බුදු ගුණ සුවඳ විහිදෙන **සතර අවජිහිත ස්ථාන තවමත් නිරුපද්‍රිතව පවතී.** එහෙත්, පසඟ පිහිටුවා වැඳ නමස්කාර කොට ධර්ම සංවේගය උපදවා ගැනීමට යම් සැදැහැවතෙකුට අවශ්‍ය වුව ද, ඒ සඳහා අවශ්‍යවන ආර්ථික, සමාජයික හා භෞතික පසුබිම පවා අද අනාරක්ෂිතය. විවෘත නැත. විනිවිද දැකිය හැකි ස්වරූපයෙන් අද වන්දනා ගමනක් පවා සංවිධානය වන්නේ නම් ඒ **ඉතා අල්ප වශයෙනි.** බහුතරයකගේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ **"වන්දනා චාරිකා"** නාමයෙන් සංවිධානය කර සැදැහැවතුනට වසන් කරමින් ස්වකීය ගුප්ත වාණිජමය අරමුණු සාක්ෂාත් කර ගැනීම පමණි.

ජීවමාන බුදුරජාණන් වහන්සේ හා සමාන වූ සර්වඥ ධාතූන් වහන්සේලාගේ "**ද්‍රෝණයක්**" එනම් බිඳී ගිය සම්පූර්ණ ධාතූන් වහන්සේලාගේ 1/8 ක්ම, මෙම සිරිලක් පොළවේ, **ස්වර්ණමාලී මහා සෑ රජාණන් වහන්සේගේ ධාතු ගර්භය තුළ** වැඩ සිටින අතර, ධර්මාශෝක රජුගෙන් ලබාගත් සර්වඥ ධාතූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් ලක්දිව පුරා ඉදිකරනු ලැබූ මහා චෛත්‍ය තුල වැඩ සිටී. **නොබිඳී පැවති** සප්ත මහා ධාතූන් වහන්සේලාගෙන වැඩි කොටසක් ද අද මෙම පින් බිමෙහි විරාජමානව පැවතීම ශ්‍රී ලාංකික සැදැහවතුන්ගේ පහන් සංවේගය උපදවා ගැනීමට ඉමහත් රුකුලකි.

බුදු පියාණන් වහන්සේගේ පාද ස්පර්ශය තුන් වරක් ලද මේ පින් බිම ධාතු මන්දිරයකි. මහිංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාද ලාංඡනය, දිවා ගුහාව නොහොත් භගවා ලෙන, දීඝවාදී චෛත්‍යය, මුතියංගණය, අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධිය පිහිටි ස්ථානය, මිරිසවැටිය, රුවන්වැලි සෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනාරාමය, සේල චෛත්‍ය, කතරගම කිරි වෙහෙර යනු බුද්ධ ස්පර්ශය ලද පූජාර්හ වූ සොළොස්මස්ථාන වේ.

සර්වඥයන් වහන්සේ ස්වකීය ශාසනය ආරක්ෂ කරනු පිණිස, පළමුකොට ලක්දිව යම් තැනක වැඩහිඳ යකුන් දමනය කළ සේක් ද, ඒ ස්ථානයෙහි කේශ ධාතූන් සහ ග්‍රීවා ධාතූන් නිදන් කොට **මහියංගණය චෛත්‍යය** ස්ථාපනය වී ඇත. සර්වඥයන් වහන්සේ වැඩ හිඳ ධර්ම දේශනා කිරීමෙන් පාරිභෝගික වස්තුවක් වූ උත්කෘෂ්ඨ මාණික්‍ය පර්යංකය පිහිටුවා **නාගදීප චෛත්‍යය** ස්ථාපනය වී ඇත. මණිඅක්ඛිත නම් නාගරාජයාගේ ආරාධනයෙන් බුදු පියාණෝ වැඩ හුන් මැණික් මණ්ඩපය මතතෙහි **කැලණි චෛත්‍යය** රාජයා ස්ථාපනය වී ඇත. කැලණියේ සිට අහසින් වැඩම කළ බුදු පියාණන් වහන්සේගේ **ශ්‍රී පාද ලාංඡනය** සමන්තූට පර්වත රාජයා මත ස්ථාපනය වී ඇත. එම පර්වත ප්‍රාන්තයෙහිදී 500 ක් රහතුන් වහන්සේලා දිවා විහරණය ලද ස්ථානය ද සර්වඥයන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත්ව දිවා ගුහාව පිහිටා ඇත. රුහුණු රට පිහිටි **දීඝවාපී චෛත්‍යය** පිහිටි පින් බිමද යම් කළෙක බුදු පියාණෝ සමාධි සමවත් සුවයෙන් වැඩ සිටීම නිසා පාරිශුද්ධ බවට පත්ව ඇත. බදුලු නගරයෙහි පිහිටි උස්වූ **මුතියංගන චෛත්‍යය** දෙවිවරුන්ගේ වන්දනීයත්වයට පාත්‍ර වී ඇත. කාවන්තිස්ස රජු විසින් කරවන ලද **තිස්ස මහාරාමයෙහි** සර්වඥයන්

වහන්සේගේ, චන්ද්‍ර මණ්ඩලය බඳු වූ ලලාට ධාතුව නිදන් කොට ඇත. සම්මා සම්බුද්ධත්වයට පත්වීමේ දී සෙවන දුන්, උත්තරීතර පාරිභෝගික චෛත්‍ය සේ සැලකෙන ජය **ශ්‍රී මහ බෝධි රජාණන් වහන්සේ** අනුරාධපුර මහමෙවුනා උයනෙහි විරාජමානව පවතී. **මිරිසවැටි** චෛත්‍යයෙහි සර්වඥ ධාතූන් සහිත වූ ජයධ්වජය නිදන් කොට ඇත. **රුවන්වැලි මහ සෑය** සර්වඥ ධාතූන් ද්‍රෝණයක් නිදන් කොට ඇති මහානුබල සම්පන්න අතර මහාරස චෛත්‍ය රාජයා ලෙස සැලකේ. දෙවන පෑතිස් රජතුමා විසින් බුදු පියාණන්ගෙ දකුණු අකුධාතුව නිදන් කොට ථූපාරාම චෛත්‍යරාජයා ඉදි කර ඇත. වළගම්බා රජු විසින් **අභයගිරි චෛත්‍යය** ඉදිකර ඇත. බුදු පියාණන් වහන්සේ පටි ධාතුව සහ කේශ ධාතූන් නිදන් කර මහාසේන රජ විසින් **ජේතවනාරාමය** ඉදි කෙරිණි. සේල චෛත්‍ය ද ඉදි වී ඇත්තේ බුදුපියාණන් වහන්සේ ශ්‍රී මුඛ පද්මයෙන් දහම් දෙසු ස්ථානයකය. මහාසේනදිව්‍ය රාජයාණන් විසින් සම්මානනීය වූ කතරගම කිරි වෙහෙර ද දෙවියන්ට දහසම් දෙසූ බුද්ධ ස්පර්ශය ලද ස්ථානයකි.

මෙලෙස සර්වඥ ධාතූන් වහන්සේලාගෙන් ප්‍රභාෂ්වර වූ බුද්ධ ස්පර්ශයන් පූජනීයත්වය පත් සොළොස්මස්ථානයක් මිහි පිට තවමත් බුදු අනුහසින් බැබලෙමින් විරාජමානව සැදැහැතියනගේ පූජණීයත්වය පාත්‍ර වෙමින් පැවතීම සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට ඍජුවම එල්ලවන ආලෝක ධාරාවකි.

21

මහානිශංස ගෙන දෙන ත්‍රිවිධ චෛත්‍ය වන්දනා සහ පූජා
MIRACULOUS TRIPLE CHETHIYA POOJA

යම් සැදැහැවතෙකු විසින් ධාර්මිකව, සාධාරණව වෙහෙස මහන්සියෙන් උපයා සපයාගත් දෙයකින් ත්‍රිවිධ චෛත්‍ය පූජාවන් සිදු කිරීමට සිතක් පහළ වන්නේ නනම් ඒ සසර පුරා සිදු කර ගත් පුණ්‍ය බල මහිමයකි. එවන් බැතිමතෙකු ජීවත් වන්නේ **තමා තමාට ම පහනක් වනසේ ය.** ඒ බුද්ධ වචනයයි. අඳුරේ සිටින්නවුන පවා ඇතැම් අවස්ථාවලදී එම පහන් ආලෝකය ඔස්සේ යා යුතු මග දකී. එයට ද පෙර පින් තිබිය යුතුය.

බුද්ධ පරිනිර්වාණයෙන් පසු සැදැහැවතුන්ට **ත්‍රිවිධ චෛත්‍ය** වෙනුවෙන් පුද පූජා පැවැත්විය හැකි බවත්, එය **ශාරීරක, පාරිභෝගික, උද්දේසික** වශයෙන් පිළිවෙලින් අදියර තුනකින් පවත්වන ආකාරයත් මහා පරිනිබ්බාන සූත්‍ර විශ්ලේෂණානුසාරයෙහි සඳහන්ව ඇත. ශාරීරය චෛත්‍ය වෙනුවෙන් පුද පූජා පැවැත්වීමට ශ්‍රී ලංකා පින් බිම අද පරිපූර්ණ ලෙස නිරාවරණය වී පවතී. දස දහසක් බැතිමත්හු වසරේ දින 365 පුරාම බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව මෙම පූජා භූමි තුල ඇතුරු සිදුරු නැතිව, සුදෝ සුදු ඇඳුමෙන් සැරසී පුද පූජා පවත්වයි. ත්‍රිවිධ චෛත්‍ය පූජාවකින් පසු හදට දැනෙන සතුට අපමණය.

යමක් කොට සිට සතුටට පත්වේද, සිනාමුසු මුහුණින් යුතුව එහි ඵලය භුක්ති විඳීද, සැපතට හේතුවන එවන් යහපත් ක්‍රියාවන් නිරුතුරුවම කළ යුතු බව ද නුවණැත්තා උත්සහායෙන් ද අප්‍රමාදයෙන් ද සංයමයෙන් ද ඉන්ද්‍රිය දමනයෙන් ද කෙලෙස් වතුරට යට නොවන දිවයිනක් තනා ගන්නා බව ධර්මයේ සඳහන් ය.

උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මේධාවී යං ඕඝෝ නාභි කීරති
(ධ.ප අප්පමාද වග්ග)

The wise man by endeavour , alertness, self control makes for himself an island which no flood of defilement overwhelms.

අනුවණයා මෙවන් විශ්වාසනිය පසුබිමක් ගොඩනගා ගැනීමට අපොහොසත් වෙයි. ඔහු අයථා, නීතිවිරෝධි, විවිධ ක්‍රියා මාර්ග ඔස්සේ මුදල් උපයයි. තාක්‍ෂණයේ දියුණුවත් සමඟ සියලු සමාජ සාරධර්ම උඩු යටිකුරු වී ඇති මෙවන් යුගයක සාධාරණව, වෙහෙස මහන්සියෙන් උපයා සපයා ගත් මුදලක් යමෙකු සතුවේ නම් ඒ ඉතා දුර්ලභ ගණයේ අවස්ථාවකි, අසාධාරණ, අපිරිසිදු වංචනික ලෙස උපයා සපයාගත් මුදල් (කලු සල්ලි) **උත්තරීතර ත්‍රිවිධ චෛත්‍ය පූජාවකට යෙදිය නොහැක්කේම ය.** යමෙකු වෙනත් කෙනෙකුගේ ඉල්ලීමක් හෝ බලපෑමක් නිසා හෝ මෙවන් පූජාවකට එවන වංචනික මුදලක් වැය කළේ වුවද, එම පූජාව අපවිත්‍ර වීමේ හේතුවෙන් නිසි ප්‍රතිඵල නොලැබෙන අතර, ඔවුන්ගේ මානසික සතුට ද පලායයි. තමා තමාට පහනක් කොට ජීවත්වන්න යැයි බුදු පියාණන් වහන්සේ දුන් එම ඔවදන අද සමාජයට කෙතරම් ගැලපේ ද?

ත්‍රිවිධ චෛත්‍ය පූජාවන්හි අනුසස් සහ බල මහිමය හඳුණන්නෝ කිසිවිටක පමා නොවෙති. රුවන්වැලි සෑය වටා අද දිනකට පූජා කෙරෙන අෂ්ඨ පරිශ්කාර ගණන අසීමිතය. බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී මුඛ පද්මයෙන් ගලා ගිය දහම් අමා ගඟෙහි සෑම දිය බිඳුවක්ම ස්පර්ශ වූ, සෙංකඩගල පුර විරාජමාන වන **ඒ වාම ශ්‍රී දළදා වහන්සේගේ මහානුභාවය සැදැහැවතුන්ගේ හදවත් තුළ ජනනය කරන්නේ අසීමිත භක්තියකි.**

තමා සන්තකයේ ඇති වටිනා වස්තුවක් පිරිසිදු චේතනාවෙන් යුතුව බුදුපියාණන් වහන්සේ අබිමුව පුද දෙන බැතිමතෙකුට එහිදී මතකයෙන් ගිලිහී නොයන ආශ්චර්යමත් සිදුවීම් අත් දැකිය හැක. එය වචනයේ ප්‍රකාශ කළ නොහැකි තරමේ ප්‍රීතියක්, පස්සද්ධියක් උත්පාදනය කරයි. රය සිහිවන වාරයක් පාසා හදවතට දැනෙනුයේ ඉමහත් සංසිහිඳියාවකි. එය මෙළොව, පරලොව දෙකක්හිම සුව දෙන ආශ්චර්යමත් ආලෝක ප්‍රභවයක් වැනිය. දෙඇස් අඩවන් කොට මෙනෙහි කරන වාරයක් පාසා ප්‍රීති ප්‍රමෝදය හදවතින් මෙන්ම දෙනෙතින් උතුරා යයි. ඒ සර්වඥධාතුන් වහන්සේ වෙනුවෙන් සිදුකරනු ලබන ශාරීරක චෛත්‍ය වන්දනාවේ අනුසස්ය. මෙවන් පින්කම් අවසාන "චුති" සිතට ද නැගෙනු නොඅනුමානය.

ස්වර්ණමාලී - චෛත්‍ය පූජාවක්

පිත්තල මල් බඳුන් දෙකක් රැගෙන ගියා මුණී පුදනට
සිත්වල ඇති ලෝභ, ද්වේෂ මෝහ ගියා ඉන් ඔබ්බට
සක්වල බල විහිදෙන චූඩා මැණික ත් බිම් මහළට
දක්නට ලැබුණා වැඩම තිබෙන අයුරු මගේ පිනට

සිතට නැගුණ සන්තෝෂය නිම් හිම් නැති වුනා මෙමට
නෙතට ගැටුණි මල් ගොන්නක් පාට පාට ඒ වටේට
ළඟට ම ගිය විට දුටු වා මල් පාවෙන හැටි ඇතට
දක්නට ලැබුණා දෙපසින්, ඉඩ මාගේ බඳුන් දෙකට

සුදු නෙළුමෙන් පිරුණු බඳුන් පුද දුන්නා චෛත්‍යයට
මුදු වී ගිය හද මඩලින් තුටු කඳුළුයි ආවෙ නෙතට
හුදු බැතිබර හැඟුම් ගියා හද තුල තව තව පතුලට
බුදු ගුණ කඳ රැව් දෙනවා හදේ ජීවමාන ලෙසට

අසිරිමත් ය පුද පූජා ස්වර්ණමාලී මහ සෑයට
ඉසුරුමත් ය දිවි මග නම් නැත යන්නේ තව පහළට
හසුරුවනට මෙලද 'භවය' නිසි ලෙස සිත පැදෙන විට
තුනුරුවණගෙ පිහිට ලැබෙයි සසර ගමන නැවතීමට

සසර ගමනේ බිය හඳුණන සැදැහැවත්හු අනතුරුව **පාරිභෝගික චෛත්‍ය** වන්දනාව සඳහා යුහුසුළු වෙති. බුදුන් වහන්සේ පරිභෝග කළ පාත්‍රා ධාතුන් වහන්සේ, චීවර ධාතුන් වහන්සේ, පටි ධාතුන් වහන්සේ, ශ්‍රී පාද ලාංඡනය, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙයට අයත්ය. බුද්ධගයා ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව **සංඝමිත්තා තෙරණිය විසින්** ලක් බිමට වැඩම කරන ලදුව, මහ මෙවුනා උයනේ ශ්‍රී මහ බෝධිය ලෙසින් ද බැතිමතුන්ගේ පූජනීයත්වයට පාත්‍ර වී ඇත. එයින් හටගත් ආෂ්ඨ ඵල බෝධි, දෙතිස් ඵල බෝධි අද ලක්දිව පුරාව මහානුභාවයෙන් යුතුව බැතිමතුන් ගේ වැඳුම් පිඳුම් ලබමින් විරාජමාන වැඩ සිටිති.



ලක්දිව විරජමාන වන ජය **ශ්‍රී මහ බෝධි රාජාණන් වහන්සේ** පාරිභෝග චෛත්‍යයන් අතර අප සතුව ඇති **මුදුන් මල්කඩයි.** යමෙකුගේ මොහාන්දකාරය දුරු කිරීමට, ප්‍රඥා ඇස පෑදීමට මෙම ස්ථානයට කරන පුද පුජා මහත් ඵල මහානිශංසස ළඟා කර දෙයි. බුදු පියාණන් වහන්සේ දස බිම්බරක් මාර සේනාව පරදවා සර්වඥතා ඥානය ලබද්දී සෙවන දුන් මෙම මහා **බෝධි වෘක්ෂ රාජයාණන් වහන්සේගේ** බෝ මළුව ඒකාලෝක කිරීමට අධි ධාරිතාවයකින් යුත් විදුලි ප්‍රභව, සද්ධර්මය සන්නිවේදනය පිණිස ලිඛිත මුද්‍රිත ග්‍රන්ථ, අෂ්ඨ පරිශ්කාර ආදී පූජාවන් සිදු කිරීම මහත් ඵල මහානිශංසස ගෙන දෙන්නකි. මෙවන් පාරිභෝගික

චෛත්‍යයක් මෙම ලක්බිම විරාජමාන වෙද්දි සැදැහැවත් බැතිමත්හු **පාරිභෝගික චෛත්‍ය පූජාව** කිසිවිටකත් මඟ හැර නොගනිති. එහෙත් අන්ධබාල ඇතැම්හු මෙවන් අවස්ථා මහඟහැර ගනිමින් ලෞකික සතුට පමණක් සොයමින් කාලය, ධනය, ශ්‍රමය වැය කරමින් දින ගණන්, **සති ගණන් අපතේ දැමීමට පෙළඹීම කෙතරම් අභාග්‍යයක් ද?**

*

උද්දේසික චෛත්‍ය පූජාව යනු බුද්ධ ප්‍රතිමාවලට දක්වන පූජා සත්කාරයි. බුදුපියාණන් වහන්සේ උදෙසා මෙන්ම රහත් වහන්සේලා වෙනුවෙන් ද ප්‍රතිමා නෙළීම ධර්මයේ අනුමත කළ බෞද්ධ සම්ප්‍රදායකි. තනි කළුගලෙහි නිර්මාණ කරන ලද මහමෙවුනාවෙ ස්ථාපිත **සමාධි බුදු පිළිම වහන්සේ** බෞද්ධ ඉතිහාසයේ මාහැඟි නිර්මාණයකි. අද කළුගල්, බදාම, ලෝහ, කිරිගරුඬ, ඇත්දත් ලී ආදියෙන් ද මෙම ප්‍රතිමා නිර්මාණය වෙයි. හිටි පිළිම, ඉඳි පිළිම සහ සැතපෙන පිළිම අතර අවුකන බුදු පිළිමය, පොළොන්නරුවේ ගල් විහාරයේ සැතපෙන බුදු පිළිමය බුදු සසුනෙහි ශ්‍රී විභූතිය විදහාපායි. ශාසන ඉතිහාසයෙන් උරුම වූ මූර්ති අතුරෙන් බුද්ධ ප්‍රතිමාව ප්‍රධාන වී ඇත. මහනුවර සහ නූතන යුගයේ නිර්මාණ රාශියකි. මේවායේ වටිනාකම අවබෝධ කරගන්නා සැදැහැවත්හු මෙම ප්‍රතිමා නිර්මාණයේ දී ස්වකීය දායකත්වය බාහු බලයේ මෙන්ම මුල්‍යමය හෝ ද්‍රව්‍යමය වශයෙන් ලබාදීමට යුහුසුළු වෙති. සාධාරණ ලෙස උපයා සපයා ගත් යමක් මෙම ප්‍රතිමා ඉදිකිරීමේ දී පූජා

කිරීමට අවස්ථාවක් ලැබීම මහාර්ඝ පුණ්‍ය කර්මයකි. විශේෂයෙන්ම **නේත්‍රා ප්‍රතිෂ්ඨාපනය** මගින් ශෛලමය බුද්ධ ප්‍රතිමාවකට යම් පමණක හෝ ජීවමාන සංඥාවක් ලබාදීමට හැකිවීම අති විශාල පුණ්‍ය කර්මයකි.

ශාන්ත වූ බුදුරුවක් දෙස බලා, දස දහසක් බැතිමත්හු සිත පහදා ගනිති. මිනිස් සන්තානයේ ඇති දුක්ඛ දෝමනස්සයන් තුනී කර එලවා හැරීමේ බලයක් මෙම ප්‍රතිමා දර්ශනය වීමෙන් මිනිස් හද තුළ ජනිත වෙයි. එවන් සුවිශේෂී බලයක් ඇති බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කිරීමේදී දෙනු ලබන දායකත්වය මාහැඟිය. මෙලෙස සිදු කරගනු ලබන පුද පුජා මෙළොව, පරලොව දෙකෙහිම සැප පිණිස හේතුවන අතර, සිහිවන සෑම අවස්ථාවකදීම සිතට දැනෙන්නේ අති විශාල බුද්ධාලම්බන ප්‍රීතියකි. අප්‍රමාණ සැනසීමකි.

උද්දේසිත චෛත්‍ය වෙත එළඹෙන සැදැහැවතුන් ජීවමාන සර්වඥයන් වහන්සේ දුටු කලක මෙන් සිත පදවාගෙන බුද්ධ, ධම්ම, සංඝ ත්‍රිවිධ රත්නයම සිහි කොට වන්දනා කළ යුතු අතර, නිසි පිළිවෙල වරදවා වන්දනා කිරීමෙන් අචිත්තිකාර නම් අකුසලයක් සිදු වේ. එබැවින් ත්‍රිවිධ චෛත්‍ය වන්දනාවේදී ක්‍රමානුකූල ලෙස වන්දනාවේ යෙදිය යුතුය. සැහැදැවතුන් පන්සලකට ගිය අවස්ථාවකදී වුවද, වන්දනා කිරීමේ දී මෙම අනුපිළිවෙල සිහිපත් කර ගත යුතුව ඇත. එනම් පළමුව චෛත්‍ය වන්දනාව, දෙවනුව බෝධි වන්දනාව සහ තෙවනුව ප්‍රතිමා වන්දනාව ආදී වශයෙනි. පුජා භාණ්ඩ අතැතිව චෛත්‍ය සහ බෝධිය පැදකුණු කිරීමේ දී ස්වකීය දකුණ අත ඒ දෙසට යොමුවන සේ සක්මනෙහි යෙදීම නිසි පිළිවෙල බව අවබෝධ කටයුතුම ය.

අවංක සේවයකින් උපයා සපයාගත් යමක් තමා සන්තකයේ නොමැත්තේ නම් මෙවන් ත්‍රිවිධ චෛත්‍ය පූජාවන්හි පින් එල ලැබීම ඉතා අසීරුය. බුදු පියාණන් වහන්සේ තමා තමාට ම පහනක් වන්න යැයි වරෙක දේශනා කළ සේක, සිතැගි පරිදි මෙවන් චෛත්‍ය පූජාවකට දායක වීමට නම් කිසිවෙකුට ණය නැතිව, ඒ සඳහා සුදුසු ආර්ථිකයක් තමා විසින්ම ගොඩනගා ගෙන තිබිය යුතුමය. **ශාරීරක, පාරිභෝගික, උද්දේසිත** වශයෙන් කුමන හෝ පූජාවක් කරගැනීමට සිත් පහළ වුවද, අවස්ථාවක් ලැබුණ ද, තමාගේ සන්තකය හිස් වී ඇත්නම් එම අනගි අවස්ථාව ගිලිහී යයි. අන් කවරෙකුගෙන් හෝ මුදල් ලැබුණේ වුව ද එම මුදලෙහි පිරිසිදු අපිරිසිදු භාවය නොදන්නේ නම්, එම පාපයට තමාගෙන් ද වක්‍රාකාර දායකත්වය ලැබෙයි. තමාගේ ආත්මය තමා විසින් ම දිනා ගත යුතුමය. ඒ සඳහා **ආත්මාභිමානය, ආත්ම ගරුත්වය, ආත්ම විශ්වාසය, ආත්ම ශක්තිය, විශිෂ්ඨ පෞරුෂය** නිර්මාණය කර දෙන්නේ මාහැඟි භූමිකාවකි. **මේ සියලු ගුණාංග ඒකරාශී කොට බුදු පියාණන් වහන්සේ තමා තමාට ම පහනක් වන්න යැයි දෙනු ලැබූ අවවාදය කෙතරම් අර්ථාන්විත ද?**

උත්තරීතර ශාරීරික ධාතු පූජාවක්



සිහිවටනයක්

පුදන්නට සිත් පහළ විණි නම් සමිඳුහට රන් පළඳනාවක්
කුසල් සිත පිබිදිලා ම ය ඒ පුදන තෙක් නැත හදට සුවයක්
නසන්නට හැක ලෝභ මූලික සිත් සියල්ල එක විලස ජවයක්
ලබන්නට හැක මහා අනුසස් දිවි මඟට සුවිශාල එළියක්

මෙවන් රන් පළඳනා සමිඳුට පුදන්නට සිත් පහළ වන විට
සොයන්නට ඇවැසිම දෙයයි එය ලද අයුරු තම සන්තකයට
බලන්නට කිසි දෙයක් නැත එය ඔබේ පිරිසිදු මුදල් යටකොට
ලබන්නට වූ දෙයක් නම් යනු වහා සුදුසු යි එය පුදන්නට

දෙසූ දහම් කඳ බුදු පියාණන් පුරා පන් තිස් වසරක් අරා
ඇසූ කන් දෙක ලබන්නට මම තිබුණි සසරේ පින් පුරා
අසූ හාර දහසක්ය දම් කඳ දන්ත ධාතූන් වට සරා
නැසූ කෙළෙසුන් බලෙන්ම ය බුදු ආනුභාවය ලොව පුරා

අපිරිසිදු මුදලකින් කිසිවිට සුදුසු නැත බුදු හිමි පිදීම ට
සුපිරිසිදු අයිතියක් වී නම් පමණි පූජා බුද්ධ සසුන ට
සුසිනිඳුය හද එවන් පූජා නැගී එන විට නිතර මනසට
පිවිතුරුය ලබනා ඵලය එහි ජීවමානයි පියවි දෙනෙතට

බුදුන් පුදනට මෙලෙස සැමට ම පහන් සිතිවිලි පහළ වේවා!
අනුන් පුද දුන් දෙයක් හෝ දැක සාධු සිතිවිලි පහන් වේවා!
තමන්ගේ වීරිය ම යොදලා සසර සයුරෙන් එතෙර වේවා!
ලබන්නට ඵල උපන් භවයේ ඔබේ නෙත් සිත් මෝදු වේවා!

*

ධර්මයේ පෙන්වා දෙන ආකාරයට මිනිසා සතුව **සැප 4** තිබිය යුතුයි. ඒ සැප හතරෙන් ආඪ්‍ය වූ සුපින්වත්හු සසර ගමනේ අතරමං නොවන මඟ දකිමින් භව ගමන අවසන් කරති. ජීවත් වීමට තරම් ප්‍රමාණවත් ස්ථාවර ආර්ථික මට්ටමක මෙන්ම භෞතික මට්ටමක සිටීමේදී ඇති වන සතුට **අත්ථි සුඛය ය.**

ඔම ආර්ථිකය ස්වකීය පරිභෝජනයට ප්‍රමාණවත් බව සිතෙන විට ඇතිවෙන සතුට **භෝග සුඛය යි.** කිසිවෙකුට ණය නොවී පරාර්ථ චර්යාවෙහි යෙදීමටත්, පින් දහම් කර ගැනීමටත් හැකි පමණ මුල්‍යමය ස්ථාවරයක සිටීම සහ තමා කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට ණය නොමැතිව බව දැනෙන විට ඇති වන සතුට **අණන සුඛය යි.**

දිළිඳු පවුල්වල දරුවනට උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වය ලබාදීම, සඳහම් ග්‍රන්ථ සම්පාදනය කරමින් සමාජයට තිළිණ කිරීම, ආබාධිත සරණ සේවය වැනි සමාජ සුභ සිද්ධිය වෙනුවෙන් දීඝ කාලීනව සිදු කරනු ලැබූ උත්තුංග සමාජ සේවා සඳහසා කරනු ලැබූ මූල්‍යමය ආයෝජනයක් තුළින් සහ කාලය, ශ්‍රමය වැනි කැප කිරීම් තුළින් ලද හැකි ආධ්‍යාත්මික ප්‍රතිලාභ සිහිපත් වන විට ඇතිවන මානසික සුවය **අනවජ්ජ සුඛය යි.** මෙම සුඛ හතර බුදු පියාණන් වහන්සෙ වදාළ පරිදි මිනිසෙකුට ලද හැකි පරම ධනය යි. උතුම් සැපයයි.

ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව සහ පූජා නිසි ලෙස පවත්වන බැතිමතෙකුට ඒ පිළිබඳව සිහිපත්වන වාරයක් පාසා කුසල් වැඩේ. එය ම සත්‍ය ක්‍රියාවක් ලෙසට වඩමින් ප්‍රාර්ථනා පිහිටුවා ගත හැක.

*

වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානෙසුපතිට්ඨිතං

සාරීරක ධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා

භාවය මෙසේය - සියලු තන්හි පිහිටියා වූ සියලු ශාරීරික ධාතු චෛත්‍යයට ද පාරිභෝගික වූ මහා බෝධි චෛත්‍යට ද, උද්දේසිත වූ සියලු බුද්ධ ප්‍රතිමා වහන්සේලාට ද හැම කල්හි මම නමස්කාර කරමි.



මහානුභාව බල සම්පන්න ස්වර්ණමාලී චෛත්‍ය වන්දනාව බොදු හදවත් තුළ ජනිත කරවනුයේ අති මහත් භක්තියකි. මහත් වූ අනුසස් ඇති මෙම චෛත්‍ය රාජයාණන්ගේ ආනුභාවය අති ප්‍රබල බව සැදැහැවතියන් විසින් අත් දුටු සංසිද්ධීන් මත සනාථ වී ඇති වාර ගණන අපමණය. ජීවමාන සර්වඥයන් වහන්සේ මෙන් බබලන බුදුරුව සතරකින් නිර්මිත කොට එහි ද්‍රෝණයක් ධාතු පිහිටුවා කරන ලද ස්වර්ණමාලී යන නමින් ප්‍රකට මෙම මහාර්ඝ චෛත්‍ය රාජයා ඉදි කිරීමේ දී අධිතාලම නම වාරයක් පෘථිවියට ගිලා බැසීම නිසා එම අධිතාලම ඉතාමත් ශක්තිමත් වී ඇති. එම පෘථිවිගත ගර්භය තුළ බුද්ධ චරිතයේ වැදගත් සංධිස්ථාන ජීවමාන ලෙසින් රනින් නිර්මිතව පවතින බව ද සැළකේ. මෙම පුජනීය ස්ථානයේ ආශ්චර්යය අත්දුටු බැතිමතකු වී නම් එය කිසි දිනක අමතක නොවන අතර තම චුති සිතට ද එම දර්ශනය ඉලක්ක වීමේ සම්භාවිතාව අති මහත් බව අවබෝධ කටයුතුම ය.

සයිංසු යස්මිං සුගතස්ස ධාතුං - නිම්මාන රංසුජ්ජල බුද්ධරූපං

ස්වණ්ණමාලීති පතීත නාමං - වන්දාමහං ථූපවරං මහග්ඝං

ජීවමාන සර්වඥයන් වහන්සේ මෙන් බබලන බුදුරුව හතරකින් නිර්මිත කොට එහි ද්‍රෝණයක් ධාතු පිහිටුවා කරන ලද ස්වර්ණමාලී යන නමින් ප්‍රකට මහාර්ඝ චෛත්‍ය රාජයාට මම නමස්කාර කරමි. සාධු! සාධු! සාධු!

***

"අන්ධබාල අතැම්හු මහා ධන කුවේරයන් සේ බාහිර ලෝකයා ඉදිරියේ විරාජමානවීමට මහත් වූ නීච උත්සාහයක් දරති. එහෙත් ඔවුන් සතු වස්තුව සාධාරණව කැප වීමෙන් උපයා සපයාත් දෙයක් දැයි හදවතට එකගව තහවුරු කරගැනීමට පවා ඔවුන් අපොහොසත්ය. මේ එක් සත්‍ය සිදුවීමකි. ඒ පූජනීය ස්ථානයක් අසළය ලොතරැයිපත් විකුණමින් තම ජීවිකාව රැක ගන්නා අහිංසකයෙකු මෙවන් මිනිසුන් පසුපස ගමන් කරමින් "ලොතරැයි පතක් ගන්න මහත්තයා අද දිනනවා හෙට කෝටිපතියෙක් යයි" කියද්දී, ඔහුව සමච්චලයට ලක් කරමින් හෙට වෙනකන් ඉන්න ඕන නෑ අදටත් අපි කෝටිපති තමයි" කියමින් තම පුරාජේරුව එහි ද වමාරා, ඉවත ලබාගෙන එම ස්ථානයෙන් බැහැරව යන, කෝටිපතීන් යැයි කියාගන්නා හිඟන්නන් ද අද සමාජයේ නැත්තේ නොවේ. මෙය කෙතරම් අමනෝඥ දර්ශනයක් දැයි අවබෝධ කර ගැනීමට තරම්වත් ප්‍රඥාවක් ඔවුන් සතුව නැත. අභාග්‍යයක තරම ? ධර්මයේ පෙන්වා දෙන සැප හතර කවදා මොවුන්හට උරුම වේවි ද? මෙවන් පුද්ගලයින්ගේ දූෂිත මුදල් අත පත ගෑමට තරම් ඒ අහිංසක ලොතරැයි පත් වෙළෙන්දා පව් කර නැති බව සිද්ධිය දුටු සැමට පසක් වන්නට ඇත. දුප්පතාගේ දුක නොදකින සමාජයක මෙවන් සංසිද්ධීන් අපමණය.

22

සතර අවිඡහිත ස්ථාන

ලුම්බිනි
මායා සුතො සුගත සාකිය සීහ නාථො
ජාතක්ඛණෙ සපදස මහි වංකමිත්වා
යස්මිං උදීරයිගිරං වර ලුම්බිනිම්හි
තං ජාත චෙතිය මහං සිරසා නමාමි

බුද්ධගයාව
යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනෙන
ජෙත්වා සවාසන කිලෙස බලං මුනින්දො
සම්බොධි ඤාණමවගම්ම විභාසි සම්මා
තං බොධි චෙතියමහං සිරසා නමාමි

ධම්මිකා චෛත්‍යය (ඉසිපතනය)
සංකම්පයං දස සහස්සිය ලොක ධාතුං
දෙසෙසි යතු භගවා වර ධම්ම චක්කං
බාරාණසි පුර සමීප වනෙ මිගානං
තං ධම්ම චෙතිය මහං සිරසා නමාමි

පරිනිබ්බාන චෛත්‍යය
කත්වාන ලොක හිත මත්ත හිතංච නාථො
ආසීති කොටි උපවත්තන කානනම්හි
යස්මිං නිසජ්ජ භගවා නිරුපාධිසෙසං
නිබ්බාන චෙතිය මහං සිරසා නමාමි

මෙම ගාථාවන්හි භාවය මෙසේය.

1. මහාමායා දේවියගේ පුත් ශාක්‍ය සිංහ සිදුහත් කුමරු උපන් විගසම විකසිත වූ සත් පියුම් මත පා තබමින් අග්ගෝ හමස්මි ලෝකස්ස යනුවෙන් සිංහනාද කළ සේක් ද ඒ උප්පත්තිය ලද ඇති පූජනීය වූ ලුම්බිණියෙහි කළ ජාත චෛත්‍ය දොහොත් මුදුන් දීම මම නමස්කාර කරමි.

2. තිලෝගුරු මුණීන්ද්‍රයාණන් වහන්සේ යම් ශ්‍රී මහ බෝධි මූලයක වැඩ හිඳ සකල ක්ලේශයන් ප්‍රහීණ කොට සම්මා සම්බුද්ධත්වයට පැමිණි වැඩ වවිසූ සේක් ද ඒ ශ්‍රී මහ බෝධි චෛත්‍යය මම සිරසින් නමස්කාර කරමි.

3. දස දහසක් ලෝක ධාතුව කම්පා කරවමින් භාග්‍යවතුන් වහන්සේ උතුම් දම්සක් පැතුම් සූත්‍රය බරණැස ඉසිපතනයේ මිගදායේදී දේශනා කළ සේක් ද ඒ ධර්ම චෛත්‍ය මම සිරසින නමස්කාර කරමි.

4. ලෝක නාථ වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයාට හිත සුව පිණිස ස්වකීය බුදු කිස නිමවා උපවත්තන නම් සල් උයනෙහි වැඩ හිඳ නිරුපධිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක්ද ඒ පරිනිර්වාණ චෛත්‍ය මම සිරසින් නමස්කාර කරමි.

බුද්ධගයාව ලුම්බිණිය

ඉසිපත මිගදාය

කුසිනාරාව

(සැදැහැති කුල පුතෙකුට දැකීමට සුදුසු වූ, සංවේග කටයුතු වූ ස්ථාන 4 කුමක්දැයි බුදුපියාණන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේ දී ආනන්ද හිමියන්ට වදාළ සේක.)

"මහා පරිනිබ්බාන සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කර ඇති මෙම හතර අවිජහිත ස්ථාන, වන්දනා කිරීම සඳහා වන ශ්‍රේෂ්ඨ ගාථා රත්නයන් 4 ධර්ම දානයක් සේ සැදැහැවතුන් අතට පත් කිරීමේ අදහස මා සිත තුළ පහළවන්නට වූයේ තෙවරක් දඹදිව ශුද්ධ භූමිය වන්දනා කර ගැනීමෙන් අනතුරුවය. 1981 දී දඹදිව ශුද්ධ භූමිය වන්දනා කර ගත් අපගේ දයාබර පියතුමාණන් විසින්, සිය අත් අකුරින්ම ලියා තබනු ලැබූ මෙම ගාථා, 2014 දී නොසිතූ අයුරින් මා අතට පත්වීම මසිත තුළ පහන් සංවේගය ඉපදවීමට හේතුවිය. එය එලෙසින්ම සකසා ධර්ම දානයක් සේ බෙදා හරිමි. පඤ්චශීලය තම ජීවිතයට ආභරණයක් සේ සුරකිමින් පුරා වසර 85 ක් අයු වළඳා 2005 ජූලි මස 19 වන දින දිවියෙන් සමුගත් අපගේ දයාබර පියාණන් වූ විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාට මෙම ධර්ම දානය තුළින් රැස්කරගන්නා වූ සියලුම පින් උතුම් නිවන පිණිසම හේතු වේවා! යි පතමි (කතු සටහනකි. 3 වන මුද්‍රණය 19.07.2023)

23

ශ්‍රී සද්ධර්මය රැකගත් අයුරු

"ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද නම්, විනයක් පනවනු ලැබුවේ නම් ඒ ධර්මය හා විනය මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේය".

(මහා පරිනිර්වාන සූත්‍රය)

"විනයෝ නාම සාසනස්ස ආයු"

එම බුදු වදනට අනුව ශාසනමාමක මහ තෙරුන් වහන්සේලා දිවි හිමියෙන් කැප වූ බවට ශාසන ඉතිහාසය සාක්ෂි දරයි. බුද්ධ පරිනිර්වානයෙන් පසු විවිධාකාර බාහිර සහ අභ්‍යන්තරික බලපෑම් හේතුවෙන් **ත්‍රිපිටක බුද්ධවචනයේ** විනාශයට හේතු විය හැකිව තිබූ අනතුරු වළක්වා ගැනීමටත්, නොයෙක් ආගම්වලින් බුදුසසුන විකෘති කර හුවා දැක්වීමට තිබුණු ඉඩකඩ අවම කිරීම පිණිසත් **ධර්ම සංඝායනාවක** අවශ්‍යතාවය පැන නැගිණ. ධර්ම සංගීතිකාවන්හි අවශ්‍යතාව සහ ඵලදායීතාව බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේදී පෙන්වා වදාරා ඇත.

ඒ අනුව ධර්මධර, විනයධර, සුපේශල, සුපූජිත, ශික්ෂාකාමී තෙරුන් වහන්සේලා එක්රැස්ව සැබැවින්ම බුදුන් වහන්සේ වදාළ ධර්මය කුමක් ද? එහිලා කුමන සූත්‍ර දේශනාවන් කෙසේ වදාරණ ලද්දේ ද? කුමන විනය ශික්ෂාවක් කෙසේ පනවන ලද්දේ දැයි සාකච්ඡා කොට සාමූහික එකඟතාවයකට පත්වීම මෙම ධර්ම සංඝායනාවන්හි සාර්ථක ලෙස සිදුවිණි. එමෙන්ම නිර්මල ථෙරවාදී බුදු දහම ආරක්ෂා කර ගනිමින් විනය ගරුක ව, ශික්ෂාකාමී ව භික්ෂු සමාජය පවත්වා ගැනීමේ වගකීම ඉටු කිරීමට ද තෙරුන් වහන්සේලා ඇප කැප වූහ. මේ සියල්ලක සාර්ථකත්වයට හේතු වූයේ ධර්ම සංඝායනාන්ම ය.

මේ අනුව ප්‍රථම ධර්ම සංගායනාව, බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු සුභද්‍ර නම් වූ භික්ෂුවකගේ නොමනා ප්‍රකාශයක් නිසා මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් අජාසත්ත රජු කල, රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය අභියස ආනන්ද, උපාලී මහ තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරසත්ත රජු කල, රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තතරණී ගුහා ද්වාරය අභියස ආනන්ද, උපාලි මහ තෙරුන් වහන්සේලා ඇතුලු 500ක් භික්ෂූන්ගේ සහභාගීත්වයෙන්, පුරා සත් මසක්, පැවැත් වූ අතර, එය පංචසතික සංගීතය නමින් හැඳින්විණි. මෙහිදී විසිරී ගිය ධර්ම විනය එක් රැස් කොට සම්මුතියකට ගෙන ඒමත්, ධර්ම විනය කොටස්කර භාණක පරපුරකට පැවරීමත්, නව විනය නීති නොපැනවීමටත් පැනවූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම සිදු කෙරිණි.

"අදටත් සැදැහැසිතින් දඹදිව වන්දනා කරන්නෙකුට මෙම සප්තපර්ණී ගල් ගුහාව සියැසින් දැක බලාගත හැක. ගුහාව තුල දිගින් පළලින් අඩි 2 ක් පමණ වන කවුළුවකි. එතනින් හාත්පස නරඹන්නෙකුට 500 ක් මහ තෙරුන් වැඩ සිටි ගල් තලාව දෘශ්‍යමාන වෙයි. එදා මෙම ස්ථානය කෙසේ කසාවතින් බැබළෙන්නට ඇත් ද?"

අනතුරුව බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂයකට පසු වජ්ජිපුත්තක භික්ෂූන්ගේ අකැප දස වස්තුව නිසා සබ්බකාමී මහ රහතන් වහන්සේගේ මූලිකත්වයෙන් කාලාශෝක රජු සමයෙහි, විශාලා මහනුවර වාලුකාරාමයේදී, රේවත, සබ්බකාමී, යස, සාළ්හ, ඛුජ්ජිසෝභිත, වසභගාමී, සුමන, සානවාසී, සම්භූත ඇතුලු 700ක් භික්ෂූන්ගේ සහභාගීත්වයෙන් පුරා අට මසක් පැවැත් වූ අතර, එය සංස්කෘතික සංගීතය නමින්

හැඳින්විණි. මෙහිදී විනය විරෝධී කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම. අකැප දස වස්තූන් ප්‍රතික්ෂේප කිරීම, පළමු සංගීතියෙහිදී ඇතිකරගත් සම්මුතිය අනුව ශික්ෂා පද ලිහිල් නොකොට ඉදිරියට පවත්වාගෙන යාම සහ අටළොස් නිකාය බිහිවීම ද සිදුවිණි.

විශාලා මහනුවර පිහිටි මෙම වාලුකාරාමය ද අද ප්‍රතිසංස්කරණය කොට ඇති අතර, සාසනයේ පැවැත්මට ඉවහල් වූ මෙම ඓතිහාසික ස්ථාන නැරඹීමට බැතිමතුන්ට අවස්ථාව සැළසී තිබීම ඔවුන්ගේ අවෙච්ඡප්‍රසාදයට හේතු වී ඇත.

වසර 236 පසු තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමේ අවශ්‍යතාව පැන නැගිණි. එයට හේතු වූයේ ලාභ අපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන්ගත වීමයි. මෙය ධර්මාශෝක රජු කළ, මොග්ගලී පුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ දී, මහින්ද මහාරක්ඛිත, මහා දේව ආදී තෙරුන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් මාස නමයක් පුරා පැවැත්වුණි. මෙය (1000) සාහස්සිකා සංගීතිය නමින් හැඳින්විණි. මෙහිදි දුසිල් මහණුන් හැට දාහක් (60,000) සුදුවත් අන්දවා සසුනෙන් නෙරපා හැරීම, ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම. කථාවත්තුප්කරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම, ත්‍රිපිටකය සම්පූර්ණ කරවීම ආදී හරවත් ප්‍රතිඵල ලද අතර, දේශීය, විදේශීය ධර්ම ප්‍රචාරය ද ඇරඹිණි.

*මෙවන් වු ධර්ම සංගීතිකාවක අවශ්‍යතාව වත්මන් යුගයේදී නැවත පැන නැගී ඇති බව නොරහසකි. චීවර ධාරීන් හතු පිපෙන්නා සේය. එහෙත් ඔවුන් සතු ශීලයක් නැත.බුදු පියාණන් වන්සේගේ ශ්‍රී මුඛ පද්මයෙන් දේශනා කළ ශ්‍රී සද්ධර්මය උඩු යටිකුරු කරමින් විවිධ අර්ථ කථන ඉදිරිපත් කරමින් සමාජය මුළා කරවීමට දරන්නා වු නීච වැයම අප්‍රමාදීව පිටුදැකිය යුතුමය. මේ උතුම් ලක්බිම සිව්වනක් පිරිසෙන් ගහණ ය. රහතුන් වහන්සේලාගෙන් හීන වී නැත.සතර මග සතර ඵල ලැබුවෝ ද නැත්තේ නොවේ. උත්තරීතර නායකත්වය නිසි ලෙස හඳුනාගෙන සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස සැදී පැහැදී අවදි වීමට සුදුසු ම කාලය උදා වී ඇත.***ශාසනකාමී සැමගේ ප්‍රඥා ඇස විවර වේවා !!!***

අනතුරුව ක්‍රි.පු පළමුවැනි සියවසේ දී, ත්‍රිපිටකධාරී මහ තෙරුන් වහන්සේලා ධර්මය විනාශවීමේ අවදානම දැකීමේ හේතුවෙන්, කණිෂ්ක රජුගේ දායකත්වයෙන් මාතලේ අළුවිහාරයේ දී 500ක් තෙරුන් වහන්සේලා ඒකරාශීව **පුස්තකාරූඪ සංගීතිය** නමින් සිව්වන ධර්ම සංඝායනාව ද පැවැත්වීම, නිර්මල බුදු දහම අද දක්වා නොනැසී පැවතීමට මහඟු පිටිවහලක් වී ඇත.

***

මෙම ථෙරවාදී ධර්ම සංඝායනා, සසුනේ චිර පැවැත්මට මහතේ සේ ඉවහල් වන්නක් බව මේ වන විට සනාථ වී ඇත. එවන් සංඝායනා වඩාත්ම සමාජයට අවශ්‍ය යුගය වත්මන් යුගයයි. එයට හේතු වන්නේ ධර්මය විකෘතිකර හුවා දක්වමින්, සමාජය නොමඟ යවමින්, පෞද්ගලික ලාභ ප්‍රයෝජන තකා ශාසන විනාශයට සැරසෙන අන්ධබාල පෘතග ජන මනුසතුන් සහ ශ්‍රාවක සංඝයා නොවන චීවර ධාරීන්ගේ නොමනා ක්‍රියාකලාපයන්මය. මෙය රත්‍රන් වැනිදේ සමාජය තුල සංසරණය වීමට සැළැස්වීම වැනි කූට උපක්‍රමයකි. කෙසේ වුවද, මෙම අමිල ශ්‍රී සද්ධර්මය සුරැකීමත්, එය විකෘති වන්නට ඉඩ නොතබා ප්‍රකෘති ලෙසින්ම අනාගත පරපුරට උරුම කර දීමත් ඔබ අප ඉදිරියේ පවතින දැවැන්ත අභියෝගයකි. මේ පිළිබඳව පාලක, පාලිත, නායක අනුගාමී සැමගේ දැඩි අවධානය යොමු විය යුතු අතර, ක්‍රියාශිලී සහභාගීත්වයේ අවශ්‍යතාවය මෙම මොහොතේම විනා කල් දැමිය හැක්කක් නොවන බවද අවධාරණය කළ යුතුව ඇත. සසුන් ලැදි සැමගේ ප්‍රඥා ඇස විවර වේවා! සත්‍ය අවබෝධ වේවා! අධර්මවාදී අසත්‍ය තොරතුරු කොතෙක් සංනිවේදනය වුවද, ඒවායේ සාවද්‍යතාවය, නිරවද්‍යතාවය ස්වයං තක්සේරුවකට යොමුකර විදර්ශනා නුවණින් ජීවිතයේ යථාර්ථය දකීවා! ලබා උපන් මිනිසත් භවයට නිගරු නොවන සේ භව ගමනට තිති තැබීමට "සාධු දක්ම" සැම දෙනාටම මාර්ගෝපදේශයක් ම වේවා!

***

හතරවන කොටස
PART - IV

24

උත්තරීතර නායකත්වය
THE GREATEST LEADERSHIP

"**නායකත්වය**" යනු කෙනෙකුට පියවි ඇසින් දකිය හැකි භෞතිකමය රාමුවක් තුළ ලෙළදෙන්නක් නොවේ. ඇතැම්හු මෙය නිසි අර්ථාවබෝධයකින් තොරව තමා සතු කර ගැනීමට මහත් වෙහෙසක් දරති. කුඩාම සමාජ ඒකකය වූ **මව, පියා,** සහ **දරුවන්ගෙන්** සමන්විත පවුලේ සිට ගමක, නගරයක, ආයතනයක, පාසැලක, පූජණීය ස්ථානයක, ප්‍රදේශයක සහ රටක ආදී විවිධ ජන සමූහයකට මෙන්ම සමස්ථ ලෝකයාට ද නායකත්වයක් අවශ්‍යමය. බොහෝ දෙනෙකු කෙසේ හෝ එයලබා ගැනීමට යථා, අයථා සෑම අයුරින්ම වෙර දරන්නේ එය අමිල වටිනාකමික් යුතු පළඳනාවක් ලෙස දකිමිනි. එහෙත් ඇතැම්හු නායකත්වය උර චක්‍රමාලාවක් ලෙස ද දකිති. මෙම දෘෂ්ඨී දෙකම බැහැර කර නියම නායකත්වය හඳුනාගන්නෝ නායකත්වයේ නිසි ගෞරවය ලබමින් තමාගේ අනුගාමික පිරිස යහපත කරා ගෙන යති. ඔවුන් තනතුර මත බැබලෙන්නේ නොවේ. **තනතුර** ඔවුන් මතින් බබළවන, ශ්‍රේෂ්ඨත්වය ලොවට විදහාපාන ගෞරවණීයත්වයට පාත්‍ර වූ පිරිසකි.

අද සමාජයේ නායකයින් බිහිවන්නේ හතු පිපෙන්නාක් මෙනි. එහෙත් එහි දීර්ඝ කාලීන පැවැත්මක් හෝ ඵලදායීතාවක් නැත. එයට හේතු වන්නේ නායකත්වය තුළ පිහිටිය යුතු ගුණාංග නිසිලෙස අවබෝධ කර නොගැනීමයි. "**නායකත්වය**" හිස මත පළඳන ඔටුන්නක් සේ දකින්නවුන් ගේ හිස පමණක් නොව මතකය ද ආවරණය වී ඇත. මනස ද විකෘති වී ඇත. තමා එතනට පැමිණි ආකාරය, හදාවඩා පෝෂණය කළ දෙමව්පියන්, තමාට උසස් ලෙස විභාග, සම්මුඛ පරීක්ෂණ ආදියෙන් සමත් වීමට අත හිත දුන් ගුරුවරු පවා මතකයෙන් ගිලිහී ඇත. ඒ සියල්ලක් ඔවුන් ඉදිරියේ ම අවතක්සේරු කිරීමට තරම් ධීන මානසිකත්වයක් ගොඩනගා ගන්නා මොවුහු, තමාට ලැබෙන ලාභ, ප්‍රයෝජනන, සත්කාර, තාන්න මාන්න, නම්බු නාම, රන් රිදී පිත්තල, නිල ලාංඡන, සම්මාන ආදී භෞතික වටිනාකම් ඇති

දේ පිළිබඳව උද්දාමයට පත්ව අහසින් පොළවට පතිත වූවන් සේ අමනෝඥ රගපෑමක යෙදෙති. එහෙත් සිදුවන්නේ තමා හිස් මිනිසෙකු බව ලොවට කියාපෑම පමණි. එවන් අකෘතඥ පුද්ගලයින්ගේ විනාශය ද වේගයෙන් තමා පසුපසම හඹා එන බව මොහොතකටවත් ඔවුනට සිතෙන්නේ නැත. ජීවිතයේ සැබෑ අරුත, සමාජ සාර ධර්ම මොවුන් තුළින් පලාගොස්ය.

"**නායකත්වය**" තුළින් තමාගෙන් පිරිසකට ආදර්ශයක් ලබා දියු යුතු බවත්, සමාජයට, රටට, ජාතියට, ආගමට සිදුවිය යුතු යුතුකම් රැසක් තමා මත පැවරී ඇති බවත්, අමතක කරන මොවුන්, තම යුතුකම් අන් අයගේ අයිතිවාසිකම් බව මොහොතකටවත් නොසිතයි. අඩු තරමින් තම වගකීම් හරියාකාරව ඉටුකිරීමට හැකි ක්‍රමවේදයක් සකසා ගැනීමට ප්‍රමාණවත් බුද්ධිමය ප්‍රඥාවක් ඔවුන් සතුව නැත. බුදු පියාණන් වහන්සේ **සිගාලෝවාද සූත්‍රයේ** පෙන්වා දී ඇත්තේ ද එක් එක් පුද්ගලයා සතු යුතුකම් ය. එම **යුතුකම්** නිසි ලෙස ඉටුවන්නේ නම් අන් අයගේ සියලු **අයිතිවාසිකම්** නිරන්තරයෙන්ම සුරැකෙයි. යහපත් සමාජයක් නිර්මාණය වෙයි. මෙම බෞද්ධ න්‍යායන්ට පටහැනිව කටයුතු කිරීම නිසා අද සමාජයේ සෑම පැතිකඩකින්ම දැකිය හැක්කේ විශාල කඩා වැටීම් පමණි.

වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, නීති, කලා, සෞන්දර්ය ආදී කුමන පිඨයකින් හෝ ආචාර්ය, මහාචාර්ය, කථිකාචාර්ය පදවි ලබා දැනුම (knowledge) කෙතරම් විශාල වපසරයක් තුළ විහිදී තිබුණේ වුවද, ප්‍රඥාව (Wisdom/intelligence) එයට සාපේක්ෂව පාඨාංක නොදක්වයි.

(In Budhism ***'Wisdom'*** *is, realizing or perceiving the true nature of reality: seeing things as they are, not as they appear. This '**wisdom**' is bound by conceptual knowledge. It must be intimacy experienced to be understood 'Pragna' also is sometimes translated as 'consciousness', 'insight' or 'discernment'. 'Pragna' or 'panna' is* ***'Wisdom'*** *in Buddhsm**.)***

දැනුම තමාට අදාළ ක්ෂේත්‍රයට ප්‍රයෝජනවත් වුවද, ප්‍රඥාව නොමැත්තේ නම් පිරිසකට නායකත්වයක් ලබාදීම තබා ඔහුට තමා පාලනය කර ගැනීමටවත් නොහැක්කේමය. එවන් පුද්ගලයාගේ විනාශය ධම්ම පදයේ බාල වග්ගයේ පෙන්වා දී ඇත්තේ මෙසේය.

යාවදේව අනත්ථාය - ඤත්තං බාලස්ස ජායති

හන්ති බාලස්ස සුත්තංසං - මුද්ධ මස්ස විපාතයං

අනුවණයා උගත් සියල්ල, ඔහුගේම අනර්ථය පිණිස හේතු වේ. ඒ උගත්කම යහපත් නුවණ නසා ඔහුගේම යහපත් ගතිද නසයි.

Any knowledge gained by the fool will be to his ruin. It will cleave to his head of intelligence and destroy all virtues (in him).

අද සමාජයේ සිටින ඇතැම් නායකයින් තුළින් හැකි මෙම "**සත්‍යය**" එදා බුදු නෙතට ගෝචර වූ අයුරු කෙතරම් නිරවද්‍ය ද?

නාග මාණික්‍යක් ඇති නාගයා ඉතා වටිනා වුවද, උග්‍ර භයානක සර්පයෙකි. ඒ වාගේම උගත්කම තිබුණත්, වටිනාකම තිබුණත් **සමාජයට අයහපත පිණිස කටයුතු කරන්නේ නම්** ඒ පුද්ගලයා ද ඉහත කී සර්පයා මෙනි. මෙවැනි දුර්ගුණ ඇති පුද්ගලයින් අද සමාජයේ බහුල ය. ලොව ඇති සතුන් අතර තේරුම් ගැනීමට අපහසු ම සතා **මනුසතා** බැවින් නායකත්වය හමුවේ ඉතාමත් **ප්‍රඥා සම්පන්නව** තීරණගැනීම ස්වකීය ආරක්ෂාවට මහත් පිටිවහලකි. නො එසේනම්, තමාගේ විනාශය පසුපස ම තම අනුගාමිකයින්ගේ විනාශය ද හඹා එයි. **නිසි නායකත්වයක්** එහි නැත.

ස්ථානෝචිත ප්‍රඥාවෙන් තොර අදක්ෂ නායකයෙක් හෝ පාලකයෙක් පසුපස සිටින, ඔහුව අනුගමනය කරන පිරිස ද අනපේක්ෂිත ගැටළුවලට මුහුණ දීම නිසා නායකයා කෙරෙහි ඇති වන්නේ **කලකිරීමකි, අප්‍රසාදයකි. ඇතැම්විට කෝපයකි. වෛරයකි.** නායකයා නිසි කළට නිසි උපදෙස් දීමට හැකි ප්‍රඥාසම්පන්න පෞරුෂයකින් හෙබි කාරුණික, නිහතමානී, මනු ගුණ දම් සුරකින එමෙන්ම තම අනුගාමිකයින්ගේ ආරක්ෂාව සැලසිය හැකි **අප්‍රමාදීව** කලට වේලාවට කටයුතු කළ හැකි අයෙක් වේ නම් ඔහු කෙරෙහි අනුගාමික පිරිස දක්වන්නෙ **ප්‍රසාදයකි, ගෞරවයකි, මෛත්‍රියකි, දයාවකි, විශ්වාසය කි. තම නායකයා කෙරෙහි ඔවුන් තුළ ජනිත වන්නේ සුවිශාල අභිමානයකි.**

එහෙත් නායකත්වය, නාමිකව පමණක් රැක ගැනීමට වෙර දරණ ඇතැම් පුද්ගලයින්, තම දවසේ යෝජිත කටයුතු ටික පවා **නිසි කාල කළමණාකරණයකින් යුතුව** සංවිධානය කර ගත නොහැකිව

තම අනුගාමික පිරිස මහත් අපහසුතාවයට පත්කරවන අවස්ථා ද එමටය. අපේක්ෂිත අදාළ කටයුතු ප්‍රමාද වී ඉටුකරන මොවුන් තම **අකාර්යක්ෂමතාව** ආවරණය කරගැනීමට ද නොදන්නේ නොවේ. තමා විවිධ සංසඳ, සංවිධාන ආදියෙහි ද නායකත්වය, අනුශාසකත්වය හොබවන බවත්, එම රැස්වීම් දීර්ඝ ලෙස ඇදී ගිය බවත් සඳහන් කරන මොවුන්ගේ අකාර්යක්ෂම පාලනය හෙලා දකිමින්, අවසානයේ දී ඔහු විසින්ම පත් කරනු ලැබූ නිලධාරීන් පවා තනතුරුවලින් ඉවත්ව යන අවස්ථා ද නැත්තේ නොවේ. ඒ නායකත්වය පිළිබඳව ඔවුන් තැබූ විශ්වාසය බිඳීයාමෙනි. "**මොහු බොරු කාරයෙක්, මොහු මෙලොවට වැඩක් නෑ. මොහුගේ වචන විශ්වාස කිරීමෙන් සමාජය අප කෙරෙහිඅ තබා ඇති විශ්වාසයත් බිඳී යනවා. පඤ්ච ශීලයවත් නැති මොවුන් විශ්වාස කළහොත් අපි මෙළොව, පරලොව දෙක්හිම පිරිහී යනවා**" කියන හැඟීම අනුගාමික හදවත් තුළ දෝංකාර දෙන විට එම නායත්වයේ ගෞරවය ස්වභාවයෙන්ම පිරිහියාම කාහට නම් වළක්වාලිය හැකිද? ඒ ලෝක ධර්මතාවයයි.

මිනිසුන් සියයක් රැස්ව සිටින ස්ථානයකට ප්‍රවිෂ්ඨ වීමට නියමිත නායකයාගේ **එක් පැයක** ප්‍රමාදය, මිනිස් පැයවලට සාපේක්ෂව බලන කළ **පැය සියයක** ප්‍රමාදයකි. ඇතැම් විට ඔවුන් දහසකුත් එකක් අත්‍යාවශ්‍ය වැඩ පසෙක ලා එම අවස්ථාවට සහභාගී වූවා විය හැකිය. **කාලකළමණාකරණය** දුර්වල නායකත්වයක් වේ නම් එම ජනකොට්ඨාශයේ පරිහානිය විනා ප්‍රගතියක් කෙලෙස දකින්න ද?

නායකත්වය, අධිපතීත්වය, අනුශාසක්තවය, අපක්ෂපාතීව යම් කිසි පිරිසකට විශ්වාසනීය ලෙස ලබාදිය නොහැක්කේ නම් සහ ඔවුන්ට සෘජුව ශක්තියක් වීමට තරම් ප්‍රමාණවත් ආත්මශක්තියකක් නොමැත්තේ නම් එම තනතුරු මතින් වැජඹීම පසෙක තබා **යථාරූප්ප සන්තෝෂයෙන්** යුතුව අධික කාර්ය භාරයෙන් ඉවත්ව තමාට කළ හැකි ප්‍රමාණයක කාර්යය භාරයකට පමණක් උරදීම බුද්ධිගෝචර ය. නොඑසේ නම් ඔහුට සිදුවන්නේ ද තණ්හාවට දොඩම් ගොඩ බදාගත් පුද්ගලයාට සිදු වූ දෙයම ය.

බෞද්ධ නායකත්වයට අනුව, නායකත්වයක් හොබ වන්නාගේ **සිත, කය, වචනය** ස්වකීය නායකත්වයට මහඟු බලපෑමක් ඇති කරයි. එනම් විශේෂයෙන්ම තීරණ ගැනීමේ දී **සිත සන්සුන්** විය

යුතුය. නිරතුරුවම **කය සංවර විය යුතුයි. වචනය අව්‍යාජ විය යුතුයි.** (කාල සූත්‍රය) වචන හැසිරවීමේ දී එනම් සිතුවිලි වචනයට නැංවීමේ දී ඉතා ප්‍රවේශම් විය යුතුයි. ප්‍රකාශ කරන ලද්දක් සාවද්‍ය වුවහොත් තමා අසීරුවට පත්වන බව අවබෝධ කටයුතුම ය. බොරු පොරොන්දු දී අනුගාමිකයන් අපහසුතාවයට පත්කිරීම නායකයාගේ පෞරුෂයට අතිමහත් කැළලකි.

"**නායකත්වය**" පළමුවෙන්ම සමාජයේ කුඩාම ඒකකය වන පවුල තුළින් දැකිය යුතු සංහිඳියාවකි. පිතෘ මූලික ජන සමාජයකට අනුගතව සිටින ඔබ අප සැවොම පිතෘ නායකත්වය පිළිගන්නෙමු. හිස නමන්නෙමු. එහෙත් එම කුඩා කුටුම්බිය තුල **යුතුකම් හා වගකීම්** පිළිබඳව අනවබෝධයෙන් යුතුව නායකයා තම චර්යා ධර්ම පවත්වාගෙන යන්නේ නම් එම කුඩා කුටුම්බිය පවා දෙදෙරා විනාශ වී යන්නේ තම දරු පවුලට නොව පරම්පරා ගණනාවක්ම අගාධයට ඇද දමමිනි. නායකයා ප්‍රථමයෙන් ම **තම සීමාව හඳුනාගත යුතුයි.** එය බුදු පියාණන් වහන්සේ අනු දැන වදාළ පංචශීල **ප්‍රතිපත්තියම** විනා අනෙකක් නොවේ. සීලය මත පිහිටා තම සීමාව නිර්ණය කර ගැනීම ප්‍රඥා ගෝචරය.

"**මම ගෞරවණීය පියෙක්**" කියන හැඟීම හදවතට ගෙන මත්වතුරෙන්, දුරාචාරයෙන්, සුරා සූදුවෙන්, සත්ව හිංසනයෙන්, බොරුවෙන්, වංචාවෙන්, සොරකමින් සම්පූර්ණයෙන්ම වැළකී සිටීමට හැකි **ආත්ම ශක්තිය** පළමුවෙන්ම ගොඩනගා ගැනීම **උත්තරිතර පීතෘත්වයේ පළමුවන ස්ථාවරයයි.** එහෙත් එවන් අවස්ථාවලදී තමා වටා සිටින අන්ධබාලයින් එයට අකුල්හෙළයි. නින්දා කරයි. එහෙත් තමාගේ පැවැත්ම තමාට අවශ්‍ය පරිදි සකසා ගැනීමට හැකි ආත්මශක්තිය නායකයෙකු සතු විය යුතුයි. ප්‍රිය සම්භාෂණයක දී වුවද දහසක් ඥාතී මිත්‍රාදීන් මත්වතුර පානය කරද්දී ඒ සඳහා ඇරයුම් ලබද්දී තම ස්ථාවරයෙහි ඍජුව නොසෙල්වී සිටීමට හැකි පෞරුෂයක් යමෙකු සතු වේ නම් ඒ නායකයෙකු සතු විය යුතු **විශිෂ්ඨ පෞරුෂය යි.** එවන් පියවරුන් පිළිබඳ වාර්තාගත සටහන්, ග්‍රන්ථ ආදිය බහුලව නැතත් කවදා හෝ කවරෙකු හෝ විසින් කුමන් හෝ තැනක තිසි කල්හි සුදුසු ස්ථානයන්හි ඔවුන් පිළිබඳ අවශ්‍ය තොරතුරු සටහන් කර තබනු ඇත. ඒ යහපත් සමාජයකට ආදර්ශයක් වශයෙනි. **මෙම ග්‍රන්ථය අද සමාජගත වන්නේ ද එහි ප්‍රතිඵලයක් ලෙසිනි.**

ආත්ම අභිමානය, ආත්ම ගරුත්වය, ආත්ම ශක්තිය, පෞරුෂය ආදී ඉහත සඳහන් සංකල්ප පුද්ගල යහපැවැත්මට බෙහෙවින් ඉවහල් වෙයි. පෙර පින් ඇත්තෝ එවන් පුද්ගලයෙකු දැකීමෙන් පවා ඔහුව ආදර්ශයට ගනිමින් තම ජීවිතයේ ද, හැරවුම් ලක්ෂයක් ලෙසට එම චර්යාධර්මවලට අනුගත වීමට උත්සාහ කරති. එහෙත් අශ්‍රැතවත් අන්ධබාල ඇතැම්හු ඒ **විශිෂ්ඨ පෞරුෂත්වය අවඥාවට ලක් කරමින් තම අපගාමී පෞරුෂය හා දුශ්චරිත මතු කොට හුවා දැක්වීමට අසාර්ථක වෑයමක යෙදෙති.** එහෙත් ඒ සියල්ලක් හමුවේ සිදුවන්නේ අනෙකාගේ **විශිෂ්ඨ පෞරුෂය** වඩාත් ඔප් නැංවීම පමණි. **"ධම්මො හවේ රක්ඛති ධම්මචාරී"** යන ධර්ම පර්යාය ලොවට විදහා පාමිනි. විශිෂ්ඨ පෞරුෂය තමාගේ ආධ්‍යාත්මික ශක්තිය තුළින් පැන නගින්නක් විනා, බාහිරින් මුදල් ගෙවා ලබා ගත හැක්කක් නොවේ. එකම පවුලේ සාමාජිකයින් අතරේ වුවද තම තමා ලද ආධ්‍යාත්මික සුපෝෂණයට සාපේක්ෂව විවිධ චර්යා රටා පවතී. බුදු පියාණන් වහන්සේ **"නානත්ථ කායා නානත්ථ සංඥා"** යන ධර්ම පර්යාව ඔස්සේ මෙය ලොවට පහදා වදාළ සේක.

මත් වතුර පානය කර නිවසට එන ස්වාමියාට (පවුලේ නායකයට) පවුල තුල ආරවුල් ඇතිකර ගැනීමට හේතු අවශ්‍ය නැත. පවුලේ සමඟිය දෙදෙරා යයි. අසත්පුරුෂ අන්ධබාලයින් මෙය අවස්ථාවක් කර ගන්නේ පවුලේ සමගිය ඇති කිරීමේ මුවාවෙන්ම පවුලට ඉතාම හිතෛෂියෙකු ලෙසිනි. වචන ඉතා මිහිරි ය. ලෙන්ගතු ය. ඉතා සූක්ෂම ලෙස **නිර්ලජ්ජිතව** අනුන්ගේ පවුල්වල තොරතුරු එක්රැස් කර ගනී. **ඒ වෙනත් පවුලක අභ්‍යන්තරයට රිංගා ගන්නා තෙවන පාර්ශවයාගේ ස්වභාවය යි.** අනතුරුව පැය ගණන් දුරකථනයෙන් හෝ බිරිඳට වසන් කරමින් ස්වාමියාට පාක්ෂික ලෙස රඟපාමින් ද, තවත් විටෙක ස්වාමියාට වසන් කරමින් බිරිඳට පාක්ෂික ලෙස රඟපාමින් ද, ඔපා දූප එක් රැස්කර, තවත් එවැනිම දුර්ජනයින්හට තොරතුරු සංනිවේදනය කරමින් සන්නද්ධගතව ප්‍රසිද්ධියේ හෝ ඉතා සූක්ෂම ලෙස ගුප්ත ක්‍රියාමාර්ග වලින් හෝ පවුලට වින කරයි. **කුමන අවස්ථාවකදී වුවද තුන්වන පාර්ශවයකට පවුලේ අභ්‍යන්තරික තොරතුරු සංනිවේදනය නොකිරීමට සහ එසේ නොවීමට වග බලා ගැනීම පවුලක නායකයාගේ යුතුකම මෙන්ම වගකීමයි.** එවන් ලිහිලක්, හිඩැසක් දුටු විගසම, සහෝදරත්වයේ නාමයෙන් හෝ මිත්‍රත්වයේ නාමයෙන් හෝ එම පවුලේ අභ්‍යන්තරයට රිංගා ගන්නා අන්ධබාල, අකෘතඥ පාපතරයින් පවුලේ ප්‍රශ්න උඩුදුවන

තැනට කටයුතු සළසා, ඉතාමත් උපක්‍රමශීලි ලෙස පවුලේ ආර්ථිකය ඉතා ඉක්මණින්ම පහත හෙළයි. අවසානයේ දී පරම්පරා ගණනක් ඉදිරියට පවත්වා ගැනීමට දෙමව්පියන්ගෙන් ලද දේපල ආදියෙහි පවා, නීතියම අයිතිය පවරා ගැනීමට තරම් **දුෂ්ඨ, වංචනික, කයිරාටික, මිත්‍රද්‍රෝහී මෙන්ම සහෝදරද්‍රෝහී න්** ද අද සමාජයේ නැත්තේ නොවේ. මෙවන් අභාග්‍ය සම්පන්න කඩා වැටීමකට සිය දරු පවුල පත්වන්නේ නම් එහි වගකීම සෘජුවම නායකයා කරා එල්ලවන අතර ඔහු කවර හෝ දිනක තම අකාර්යක්ෂම, දූෂිත පැවැත්ම ගැන සිතමින් පසුතැවෙයි. විවාහපත් පුද්ගලයෙකු තම පවුලේ පෞද්ගලික තොරතුරු ස්වාමි භාර්යා අතර පමණක් රඳවා ගනිමින් ඉන් ඔබ්බට යාමට ඉඩ කඩ නොතබා කටයුතු කරන්නේ නම් එය **ගෘහස්ත නායකත්වයේ උත්තරීතර පෞරුෂයයි.** ප්‍රකෘති මානසිකත්වයක් පවත්වා ගැනීමට **අන්‍යෝන්‍ය ආචාරශීලීත්වය,** පවුලක් තුළ මාහැඟී භූමිකාවක් නිර්මාණය කර දෙයි.

තමා තමාව පාලනය කරගන්නේ නම් තමාගේ නායකයා තමාම ය. අනතුරුව තම පිරිස පාලනය කර ගැනීමේ ශක්තිය තමා වටා ගොඩනැගෙනු ඇත. මේ සඳහා බුදු පියාණන් වහන්සේ නොවරදින මග පෙන්වා දී වදාළහ. එය, අවබෝධ කරගත නොහැකි කටු පඳුරු ගහණ වී ඇති, දුෂ්කර මාවතක් නොවේ. තම තමා ස්වකීය ප්‍රඥාවට අනුව තනි තනිව ගමන් කළයුතු මාවතකි. එහි පළමුව පියවර **පංචශීලය යි.**

බුදු පියාණන් වහන්සේට දොහොත් මුදුන් තබා වැඳ නමස්කාර කොට තෙරුවන් සරණ යාමෙන් පසු මෙම සිල්පද පහ රකින බවට තම හෘදය සාක්ෂියට එකඟව ප්‍රතිඥා දීමෙන් අනතුරුව දිවි හිමියෙන් එය සුරැකීමට වග බලා ගත යුතුව ඇත. බුදු පියාණන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් යුතුව, යම් හෙයකින් සිල් පදයක් කැඩී ගිය හොත් එවිට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ද මහා කරුණාවෙන් යුතුව දේශනා කර වදාළහ. මාර්ගය නිවැරදි කර ගැනීමට නම් **තමාට පාර වැරදුන බව, එනම් තමා මංමුලා වූ බව ප්‍රථමයෙන් අවබෝධ කර ගත යුතුයි.** එමෙන්ම වරද, වරද ලෙසින් දැක නිවැරදි කර ගැනීමේ මග සෙවිය යුතුය. එය නොයෙකුත් සිද්ධාන්ත ඔස්සේ තම දෘෂ්ඨී කෝණයට අනුව සාධාරණීකරණය කරන්නේ නම් නිවැරදි මඟට කිසි දිනක ප්‍රවිශ්ඨ විය නොහැක. තර්ක තිබුණ පමණින් තර්ක කිරීමට හැකි වූ පමණින් තමාට නිවැරදි මඟ දිස්වන්නෙ නැත. ඒ සඳහා ද ප්‍රඥාව අවශ්‍යමය. ගමන් කිරීමට සිදු වන්නේ අඳුරෙන් අඳුරටම පමණි. ඇතැම්හු ධර්මය

තුළින් ම යම් යම් කරුණු ගෙන හැර පාමින් ඒවා විකෘති කරමින් තම වරද නිවැරදි ලෙසට හුවා දක්වීමට වෙහෙසෙති. විශේෂයෙන්ම සමාජයට කැපී පෙනෙන ඇතැම් පුද්ගලයින් තම තමාගේ වරද ලඝු කර හුවා දක්වීමට, **ලෝණ ඵල සූත්‍රය** පවා උපමාවට ගන්නා අවස්ථා නැත්තේ නොවේ. කෙසේ උත්සාහ කළ ද වරද, වරද බවට නොදකින පුද්ගලයා කෙසේ නම් නිවැරදි මාවතට ප්‍රවිෂ්ඨ වන්නද? කළ යුතුව ඇත්තේ බුදු පියාණන් වහන්සේ ඉදිරියේ සිදු වූ වරද පාපොච්ඡාරණය කර ආයති සංවරයෙහි පිහිටා නැවතත් තිසරණය සහිත පංචශීලයෙහි පිහිටීමයි. එසේ කරන්නා එම වරද කිසිම ලෙසකින් කිසිම ව්‍යවස්ථවික තත්ත්වයක් හමුවේ නැවත සිදු නොවීමට වගබලා ගනී. යම් ආකාරයකින් තමා වරදෙහි පොළඹවන අන් අයෙකු වී නම් **ඔවුගේ උත්සාහය ද බල රහිත, අසාර්ථක වෑයමක් බවට පත්වනු නොඅනුමාන ය.** එතුළින් ඔහු ද යහමගට පිවිසෙන අතර, තමා වක්‍රාකාරව හෝ සිදු කරගෙන ඇත්තේ විශාල පුණ්‍ය කර්මයකි. එය සිහිවන සෑම වාරයක් පාසාම හදට දැනෙනුයේ විශාල සංහිඳියාවකි.

අංගුලිමාල 999 ක් මිනිස් ඝාතන සිදුකළේ වුවද, සාසනයේ උපත ලැබූ දා පටන්, ශාසන ශෝභන ශ්‍රැතවත් සංඝ රත්තනයක් ලෙසින් මහණ දම් පුරා, ධර්මයේ පෙන්වා දෙන පරම නිෂ්ඨාවට පත් ව දේශනා කරන්නට යෙදුණ **"අංගුලිමාල පිරිත"** වත්මන් සමාජයට පවා ලබා දී ඇත්තේ මහගු සහනයකි.

අද සමාජයේ දස සීල, අධි සීල, කෝටියක් සංවර සීල රකින බව කියන එහෙත් පංචශීලයවත් තමා සතු නොවන ඇතැම් සංඝ වේශධාරීන් සහ තවුස් වේශධාරීන්, ධ්‍යානලාබී මාර්ගඵල ලැබුවන් යැයි කියාගනිමින් සහ කියවා ගනිමින් දහැමි සමාජය නොමඟ යැවීමට දරණ නීච උත්සහය හමුවේ ප්‍රඥාසම්පන්න නොවන අශ්‍රැතවත් පෘතග්ජන පිරිස් මංමුළා වී, සංසාරයේ අතරමංවීමේ සම්භාවිතාව වැඩි වෙමින් පවතී. මෙවන් අභාග්‍යසම්පන්න ඉරණමකට ගොදුරු වී ඇති ජන සමාජය එයින් මුදවා ගැනීමේ පරම අභිලාෂයෙන් යුතුව, ධර්මය නිසි ලෙස දැන, ධර්මය දැක ගැනීමට භාග්‍ය සම්පන්න වූ ප්‍රඥාවන්තයින් සංවිධානාත්මකව හෝ පෞද්ගලිකව තමතමාට හැකි පමණින් හෝ කිසියම් සාධනීය ක්‍රියා මාර්ගයකට අප්‍රමාදව අවතීර්ණ වන්නේ නම්, එය සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස ම හේතු වන කාලෝචිත වෑයමක් වනු නොඅනුමානය. **උත්තරීතර බෞද්ධ නායකත්වය අවශ්‍යම යුගය අද ඔබ අප අබිමුවය.**

සිරි දේවමිත්ත ධර්මපාල නමින් අවසානයේ දී උතුම් ප්‍රව්‍රජ්ජාවට පත් එවකට සදහම් ලොව කිරුළු පැළඳු අනගාරික ධර්මපාල තුමාගේ ඒක පුද්ගල අප්‍රතිහත ධෛර්යය නොවන්නට, අද අපට රැකීමට ශාසනයක් නොවන්නට තිබුණි. විදේශ රටකදී පවා, එවන් ලොව මවිත කරවන සුළු, **උත්තරීතර නායකත්වයක් දරමින්** සිදු කළ කැප කිරීම් අපමණය. මුහුණදුන් දේශීය, විදේශීය අභියෝග හදකම්පා කරවන සුළුය. විවේචන අනල්පය, එහෙත් **රට, ජාතිය, ආගම** වෙනුවෙන් කැප කළ නොහැක්කක් ඔහු සතුව නොතිබිණි. මෙම අසාහය මිනිස් රත්නය, එඩිතර නායකයෙකු සතු විය යුතු සියලු චරිතාංගයන්ගේ පරිපූර්ණ වීම නිසා අප ලද ධර්ම දායාදය වඩාත් ස්ථාපිත වෙමින් මේ දක්වා පිරිසිදුව බැබලෙන්නට වූ බව නොරහසකි. **පළමුවත් ශ්‍රී සද්ධර්මය, දෙවනුවත් ශ්‍රී සද්ධර්මය, තෙවනුවත් ශ්‍රී සද්ධර්මය** යන හැඟීම ඔහුගේ රුධිරයට කා වැදී තිබීම නිසා අදටත් එම නාමය සදහම් ලොව කිරුළු දරයි. මෙවන් අසහාය එඩිතර පුද්ගලයින්ගේ **ශ්‍රේෂ්ඨ නායකත්වය සැමකල්හිම දිදුළයි.**



"සිංහලයිනි නැගිටිව්! බුද්ධගයාව බේරාගනිව්!" යන කාහළ නාදය අදත් සිත් සතන් පුබුදුවාලමින් දෝරේ ගලා යයි. හදතුළ දෝංකාර දෙයි. එහෙත් මෙම ශ්‍රී සද්ධර්මය අද මන්දපෝෂණයට පාත්‍ර වූවක් මෙනි. මන්දපෝෂිත දරුවාගේ අතපය මෙන්ම ධර්මය ද ටිකෙන් ටික විකෘති වී යයි. **ශාසනකාමී ශක්තිමත් බලධාරීන්ගේ සහ එඩිතර නායකයින්ගේ ප්‍රඥා ඇස පැදේවා!** කියා ප්‍රාර්ථනා කරනවා විනා වයෝවෘද්ධ බුද්ධිමතුනට අද කළ හැක්කක් නැත. ඔවුනට කළ හැක්කේ එවන් විරෝධාර නායකයින්ගේ ශ්‍රී නාමය මෙලෙසින් හෝ **සිහිපත් කරමින් අනාගත පරපුර වෙනුවෙන් ලියා තබා සමාජයට තිළිණ කිරීම පමණි.**

*

බුදු පියාණනක් වහන්සේ බෞද්ධ **රාජ්‍ය පාලන න්‍යායන් ලොවට හඳුන්වා දුන් සේක.** එම බෞද්ධ නායකත්වයට අනුගත වන්නෝ සාර්ථක පාලකයන් මෙන්ම විනිවිද දැකිය හැකි නායකත්වයට ද හිමිකම් කියති. ඔවුහු සිය තනතුර බබළවමින්, පාලිත පක්ෂය ද යහපත කරා යොමු කරති, ඔවුන්ගේ ඕනෑ එපාකම් පිළිබඳව සුවිශේෂී අවධානයකින් යුතුව තම නායකත්වයේ ගෞරවය ද රැකගෙන **යහගුණ දම් සුරකින පාලිත පිරිසට** නිසි ආරක්ෂාව ද සපයයි. ධර්මිෂ්ඨ නායකයෙකු නිසිලෙස **අධිෂ්ඨාන පිහිටුවා** කටයුතු කරන්නේ නම් සිය නායකත්වය, ශ්‍රේෂ්ඨත්වය දිනෙන් දින දිදුළයි. නො එසේ නම් ඔහුගේ බලය දිනෙන් දින පිරිහේ. අවසානයේ දී ඉතිරි වන්නේ පිරිහිගිය රටක්, පිරිහිගිය ජාතියක්, පිරිහිගිය සමාජයක්, පිරිහිගිය නායකත්වයක් පමණි. **එතුළින් පිරිහිගිය ආර්ථිකයක් නිර්මාණය වීම නිසා සොරකම්, මංකොල්ලකෑම්, මනුෂ්‍ය ඝාතන වැනි අසත්දම් හිස ඔසවයි.**

නිසි නායකත්වයක් තුළ **ප්‍රබල අධිෂ්ඨානයක්** තිබිය යුතුමය. එනම් කුමන අභියෝගයක් හමුවේ වුවද තම පාලිත පිරිසට තමා නිසි ආරක්ෂාව සලසන බවට ය. පිටතින් කුමන ආකාරයේ අනුග්‍රහය, ආධාර, අනුබල නොලැබුණ ද, තමා වටා ප්‍රමාණවත් ආධ්‍යාත්මික මෙන්ම ආර්ථික ශක්තියක් තිබීම **ගෞරවණීය නායකත්වයක සුවිශේෂී ලක්ෂණයකි.** එවැනි නායකත්වයක් කිසිවිටක නොපිරිහේ. ජය ටැඹ කරා ගෙනයයි. **කුමක් ද? ඒ බලය, ධර්මානුකූල පැවැත්ම සහ අධිෂ්ඨාන බලයයි.**

නායකත්වය තුළ වැජඹීම එකම අරමුණ කරගත් නායකයා තම අනුගාමික පිරිස දෙස බලන්නේ වෙනත් කෝණයකිනි. නිසි අවවාදයක්, අනුශාසනාවක් නිසිකලට, ප්‍රායෝගිකව, ඍජුව නොදෙන මොවුන් ඉතා උපක්‍රමශීලි ලෙස වගකීමෙන් බැහැරව සිටීමට ද නොදන්නේ නොවේ. අනාගාමිකයෙකු හෝ පාලිතයෙකු යම් කටයුත්තක් ඉටුකිරීම සඳහා උපදෙස් හෝ අනුශාසකත්වය ඉල්ලා සිටිය ද, **"හොඳ විදියකට කරන්න"** යනුවෙන් ප්‍රතිචාර දක්වා නිහඬ වන නායකත්වය හමුවේ අනුගාමිකයින් අසරණ නොවන්නේ ද? එම කටයුත්තෙහි ප්‍රතිඵලය කෙසේ වුවද, එයින් ගම්‍ය වන්නේ නායකත්වය එහි වගකීමෙන් බැහැර බවයි. **මෙය වංචනික නායකත්වයක දුර්වල පැතිකඩකි.** අද සමාජය තුළ මෙවන් අවස්ථා බොහෝය. එහෙත් එයට නෛතික රාමුව තුළ ඉඩ හසර ලබා දී නැත. ස්වභාව ධර්මය සාධාරණය ඉටු කරයි.

ධර්මිෂ්ඨ නායකත්වයක් තුළ බාධක අභියෝග විටින් විට පැමිණිය ද, **ධර්මයේ ශක්තියෙන්** ඒ සියල්ලක් විශ්මයජනක ලෙස යථා තත්ත්වයට පත් කිරීමේ බලයක් ගැටලුව තුළින්ම නිර්මාණය වෙයි. මේ සඳහා අවශ්‍ය වන්නේ ප්‍රඥාව යි.

ප්‍රඥාව මනසෙහි දිදුලන බලයකි. මෙය, උත්සාහවන්තයාට වර්ධනය කර ගත හැක. ඒ සඳහා වන, බුදු පියාණන් වහන්සේ පෙන්වා වදාළ ප්‍රතිපදාව අනුගමනය කරන්නෝ ජයග්‍රහණය කරා යති. එය, කිසිම අභියෝගයකින් හෝ කිසියම් කෙනෙකු විසින් හෝ පරාජයට ලක් පත් කළ නොහැකි **උත්තරීතර ජයග්‍රහණයකි. එවන් ජයග්‍රාහී පුද්ගලයෙකුගේ නායකත්වය අනුපමේය උත්තරීතර නායකත්වයයි.** බොරුවෙන් සහ කපටිකමෙන් මිනිසුන් රවටා ජනතාව අතර ප්‍රසිද්ධියක් ලබනවාට වඩා සත්‍යවාදීව, ප්‍රසන්න වචන කථාකර ලබන ප්‍රීතියත් ප්‍රසිද්ධියත් ප්‍රතිඵලදායක ය. එය තමාගෙත් අනුන්ගේත් යහපතට ම හේතුවනු ඇත.

නෙව දෙවො න ගන්ධබ්බො - න මාරො සහ බ්‍රහ්මුනා
ජිතං අපජිතං කයිරා - තථා රූපස්ස ජන්තුනො

(ධ.ප. සහස්ස වග්ග)

තම ආත්මය දිනූ තැනැත්තාගේ ජයග්‍රහණය පරදවන්නට දෙවියෙකුවත් ගාන්ධර්වයෙක්වත්, බ්‍රාහ්මයා සමඟ වූ මාරයාවත් සමත් නොවේ.

Self coquest is, in deed, far greater than defeating other people. No Gods, Gandarvas or Mara with Brahmas can vanquish the victory of a man who by restraint has conquered himself/ herself

ප්‍රඥා වර්ධනයට අවශ්‍ය මානුෂික ගුණ ධර්ම බුදු පියාණන් වහන්සේ ලොවට හඳුන්වා දී ඇත්තාහ. එවන් උත්තරීතර ධර්මයක් අප ඉදිරියේ දී පවතිද්දී, නායකත්වය නිසි ලෙස දරාගැනීම කෙතරම් ප්‍රායෝගික ද? **සප්තාර්ය ධනයෙන් ආඪ්‍ය නායකයෙකු සතු ප්‍රඥා ධනය** ම පිරිසට නිසි නායකත්වය ලබාදෙයි. ලෝක ධර්ම හමුවේ ඔහු නො සැලෙයි. පිරිහීමට හේතුවන කිසිවක් තම බල ප්‍රදේශය තුළ ඇති නොවීමට බෞද්ධ දර්ශනය උගත් පාලකයා දනී. නායකයෙක් සතුව පැවතිය යුතු දස රාජ ධර්ම වන දානය, **සීලය, පරිත්‍යාගය, ඍජු බව, කෙළෙස් තවන බව, කෝප නොවන බව, අවිහිංසාව, ඉවසීම, රාජ ධර්ම, නොරවදින බව ඔහු තුළින් විනිවිද පෙනෙයි. සතර සංග්‍රහ වස්තු දානය, ප්‍රිය වචන කථා කිරීම, අර්ථ චර්යා, සමානාත්මතා** ආදියෙන් යුක්ත පාලකයාගේ පාලනය ජනප්‍රිය වේ. එය බොහෝ දෙනාගේ හිත සුව පිණිස පවතින පාලනයකි. තමා බලයෙන් උඩඟු නොවී අනුන් හා සමව හැසිරීම බුද්ධිමත් පාලකයාගේ නිරහංකාර බවේ ලක්ෂණයකි. කුමන තනතුරක හෝ වේවා! සිය පදවියට හිමි ගෞරවය රැක ගනිමින් එහි පාලනය තමාට ඉටුකළ නොහැකි බව වැටහේ නම් එම වගකීම සුදුසු අයෙකු අප්‍රමාදීව පවරා **යථා රූප්ප සන්තෝෂයෙන්** නිහඬ වීමට හැකි වීම ද නායකයෙක් සතු විය යුතු සුවිශේෂී ලක්ෂණයකි. **ධර්මානුකූල නායකත්වය එයයි.**

ධර්මය යනු කුසල පථය යි. එනම්, **පාණාතිපාතා අකුසලය, අදත්තාදාන කර්මය, කාම මිත්‍යාචාරය, මුසාවාදය, පිසුන වචනය, පරුෂ වචනය, සම්පප්‍රලාප, අභිද්‍යාව, ව්‍යාපාදය, මිත්‍යා දෘෂ්ඨිය** ආදි වූ දස **අකුසලයන්ගෙන් ඈත් වීමෙන් ලබන කර්ම පථයයි.** සතර බ්‍රහ්ම විහරණ යනුවෙන් හැඳින්වෙන **මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා** යනු බුදුන් වහන්සේ ඉගැන්වූ උතුම් ගුණ දහම් සතරකි. බ්‍රාහ්මණයනට අයත් ශ්‍රේෂ්ඨ වූ ධර්මතාවයන් බැවින් **සතර බ්‍රහ්ම විහරණ** නමින් හැඳින්වෙන අතර, සතර ඉරියව්වෙහිම මෙය ප්‍රගුණ කළ හැකි ධර්මතාවයන් ය. සියළුම සත්ත්වයන් කෙරෙහි යහපත් හැසිරීම පෙන්වන මෙම උතුම් ප්‍රණීත ගුණ දම් සතර, සිය පවුල් ඒකකයේ පටන් ඕනෑම ජන සමූහයක අන්‍යොන්‍ය යහ පැවැත්මට, සුහදතාවයට ඉමහත් දායකත්වයක් සපයයි. පාලක,

පාලිත දෙපාර්ශවය අතර පරිත්‍යාගශීලිභාවය අගයමින්, පරාර්ථකාමී හැඟීමෙන් යුතුව තම යුතුකම් සහ වගකීම් නිසි ලෙස දැරීමටත්, පවරනු ලබන කාර්ය භාරය අවංක හැඟීමකින් යුතුව හරියාකාරව ඉටු කිරීමට හැකි ශක්තියක්, ජවයක් හද තුළ නිර්මාණය වීමටත් මෙම සතර බ්‍රහ්ම විහරණ සෘජුවම ඉවහල් වන බව ප්‍රඥා නෙතට දෘශ්‍යමාන වෙයි. එවිට **ඡන්ද, ද්වේශ, භය, මෝහ** යන **සතර අගති** හෙවත් අනර්ථය පිණිස පවතින අධර්මතා පැන නොගනී. ඒවා **උත්තරීතර නායකත්වයට පළිබෝධයන්ය.** ඡන්දයෙන්, ද්වේශයෙන්, භයෙන්, මෝහයෙහ් ගන්නා තීන්දු තීරණ කිසිවක සාර්ථකත්වයක් නැත.

ඡන්දය යනු බලවත් ආශාවයි. සල්ලාලකමට, මුදලට, දේපලවලට, නම්බුවට, තනතුරුවලට කෑදර පුද්ගලයා **ඒ ඡන්දය** නිසාම අගතියට යයි.

වෙහෙස මහන්සියෙන් හෝ සේවයට සරිලන වැටුපකින් හෝ උපයා සපයා ගන්නා මුදලට අනුව තම ජීවන පැවැත්ම සකස් කරගන්නා පුද්ගලයාගේ ආත්ම තෘප්තිය කිසිදිනෙක හීන නොවනු ඇත. ඔහු තම පවුලට ප්‍රමාණවත් පරිදි නිවසක් ගොඩනගාගෙන දස කුසල කර්මයන්හි යෙදෙමින් සාර්ථක ජීවිතයක් ගෙන යයි. ඔහු විසින් දෙනු ලබන දාන, කරනු ලබන පරිත්‍යාග තුළින්, සසර කෙටිකර ගැනීමට හෙතුවන අප්‍රමාණ නිරාමිස සතුටක් ඔහු භුක්ති විඳියි. ඒ ඔහු සාධාරණ ලෙස මුදල් ඉපයූ ආකාරය සිහිපත් වීමත් සමඟය.

ඡන්දයේ අගතිගාමී වූ මුදලට කෑදර පුද්ගලයා, ලැබෙන ආදායමෙන් තෘප්තිමත් නොවී තණ්හාව මුල් කරගත් නොදූනුවත්කම (මෝහය) නිසාම අවසානයේදී බන්ධනාගාර ගතව සුසුම්ලයි. නොඑසේ නම් ජීවිතයෙන් පවා වන්දි ගෙවයි. දරු පවුල අයාගේ යයි. මත්ද්‍රව්‍ය ජාවාරමකට, සූදුවකට, අයථා පරිදි හොර රහසේ පවත්වාගෙන යන මිනිස් සම්පත් ජාවාරමකට, එසේත් නැත්නම් ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණයකට හෝ තමා හසු වී ඇති බව අවබෝධ වනවිට සියල්ල සිදු වී හමාරය. පෙර පිනකින් මිනිස් භවයක උපත ලබා, දෙමාපියන්ගේ දැතේ දහඩිය මහන්සියෙන් උපයා සපයා ගත් මුදලින් පෝෂණය සහ අධ්‍යාපනය ලබා, ස්වයං තීරණ ගත හැකි වයසට පැමිණි කළ, තම ජීවිතය තමා විසින්ම පරිහානියට කේන්ද්‍රගත කරන්නේ නම් ඒ සංසාරගත කර්ම විපාකයක් මය. එය මේ භවයේදී ද ඵල දීමට තරම්

අසත්පුරුෂ ඇසුරකට පත් වූ ආකාරයත්, මවට, පියාට සවන් නොදී තම මතයම තහවුරු කළ ආකාරයත් සිහිපත් වන්නේ එහි අනිසි ඵල භුක්ති විඳින කලටය. මොවුන් කූට උපක්‍රමශීලීන්ගේ ගොදුරු බවට පත්වන්නේත් සිහි බුද්ධියෙන් තොරව අනුන් අනුගමනය කරන්නේත් "අවිජ්ජාව" හේතුකොට ගෙන බව බුදුපියාණන් වහන්සේ ලොවට වදාළ සේක.

ධර්මිෂ්ඨ මනුෂ්‍යයන් හැටියට ශ්‍රද්ධාව සහ ප්‍රඥාවෙන් සමන්විතව. මධ්‍යම ප්‍රතිපදාවට අනුගාමී නිවන් මඟට අවතීර්ණව ගමන් ගන්නා පුද්ගලයා නිරන්තර අනුගමනයට සහ ප්‍රායෝගික අවබෝධයට විද්‍යාත්මකව සකස් කරන ලද ධර්ම කර්ම විඥාන චක්‍රය ද අවබෝධ කර ගනී. ඒ සඳහා අවශ්‍ය වන්නේ සම සමව දියුණු කරගත් ශ්‍රද්ධාව සහ ප්‍රඥාවයි.

*

අභියෝග හමුවේ නායකයා තුළ ද්වේෂය පැන නගින ඇවස්ථා නැත්තේ නොවේ. එහෙත් එය පාලනය කර ගැනීමට නායකයා අදක්ෂ නම්, ඒ ද්වේශයෙන් යුතුව ගන්නා වූ තීරණ අසාර්ථක බව දත යුතුය. එය පාලනය කර ගැනීමට ශක්‍යතාවයක් නායකයා ෂතු නොවේ නම් ඔහු අසාර්ථක පාලකයෙකි. ඔහු ජනප්‍රියතාවයෙන් ඈත් වෙයි. එහිදී ස්ව කැමැත්තෙන් නායකයාගේ අණ පිළිපැදීමක් බලාපොරොත්තු විය නොහැක්කේමය. නායකයාට ඇති භය නිසා ඇතැමුන් නායකයාගේ අණ පිළිපදිනවා විය හැකිය. එවිට ද ලැබෙනුයේ අසාර්ථක ප්‍රතිඵලම ය. මේ සියලුම අවස්ථාවලදී තමා ලද අණ ක්‍රියාත්මක කිරීමට හද තුළින්ම පැන නගින උත්තේජනයක් නැත. ඒ දුර්වල නායකත්වයක ස්වරූපයයි. සතර අගතීන්හද අවසාන අගතිය **මෝහය යි.** කුමන නිලයක, කුමන තනතුරක පසුවන්නෙක් වුවද, තම සීමාව සහ තම භූමිකාව පිළිබඳව හොඳ අවබෝධයකින් කටයුතු නොකරන්නේ නම් එයට හේතු වන්නේ මෝහය යි. එනම් මෝඩකමයි. පියා, පියාගේ සිමාවෙන් ඔබ්බට නොගොස් සිය පවුල තුළ ස්වකීය නායකත්වය, බලය පතුරවන්නේ නම් ඔහු සාර්ථක නායකයෙකි. මවක් මාතෘත්වයේ සීමාව දැන සිය ගෘහස්ථ බලය පතුරුවන්නේ නම් ඇය සාර්ථක නායිකාවකි. එලෙසම පාසලක, ආයතනයක හො පූජනීය ස්ථානයක

හෝ වේවා! **එහි අධිපති තම නිලයට, බලයට අයිති පරාසය, සීමාව දත යුතුයි.** මෙය ගෞරවනීය ස්ථානයක්, මෙහි ගෞරවය නොකෙලෙසසෙ විදියට, තනතුරෙහි ගෞරවය නොකෙලෙසන විදියට මාගේ සීමාව මා පාලනය කර ගත යුතුයි. කියන හැඟීම හදවතේ දරාගෙන අගතිගාමී නොවී, තමාට අදාළ දෛනික කාර්යයන්හි පමණක් නිරතවීම තුළින් නායකත්වයේ ගෞරවය රැකෙන අතර, ස්වකීය අවවාද සහ අනුශාසනා පරිදි අනුගාමිකයින්ගේ කාර්යභාරය ද නිසි ලෙස ඉටුවනු ඇත.

බෞද්ධ නායකත්වය තුළින් දෘෂ්‍යමාන වන ලෝක ධර්ම, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, අපරිහාණීධර්ම, ආර්ය විනය ආදී වූ ස්වභාව ධර්මයේ න්‍යායන්ට **එරෙහිව යන සැවොම** අගතියට යාම ස්වභාවිකයි. නිසි පාලනයෙන් ගිලිහෙන පවුල් ඒකකය, ආයතනය, ප්‍රදේශය, රට පමණක් නොව ලෝකයම තුළ ගුණ ධර්ම සෝදාපාළුවකට ලක්වීම නිසා අධර්මය හිස ඔසවමින් විනාශය කරා වේගයෙන් ළඟා වීමට කෙතරම් ඛේදනීය ද?

බුදුපියාණන් වහන්සේ දේශනා කර තිබෙන මෙම ධර්මය අද සමාජය තුළින් කෙතරම් ජීවමාන ලෙස නිරූපණය වන්නේ ද?

වත්මන් සමාජයේ කිසිම ශික්ෂාවක් නොමැති පිරිසක්, සිල්වත් බවක් ආරූඪ කරගනිමින් සිදුකරගෙන යන සමාජ ද්‍රෝහි, දේශද්‍රෝහී, සදහම් විරෝධි සංවිධානාත්මක ක්‍රියා මාර්ග බොහෝය. ප්‍රඥාව අවදි කර ගැනීමට අපොහොසත් වූ මොවුන් ලද මිනිස් භවයේ ඇති ඵලය කුමක් ද? ඉතා දුර්ලභ මිනිස් භවය බුද්ධෝත්පාදයක ලැබුවේ වුවද එයින් ලද හැකි ඵලය අවබෝධ කරගැනීමට තරම් ප්‍රඥාවක් නොමැතිවීම කෙතරම් අභාග්‍යයක් ද? '**සියල්ල මුදල් මත සාක්ෂාත් කරගත හැකිය**' යි. සිතන මොවුන්හට, සියලු දේ අතහැරී යාමෙන් බුදුපියාණන් වහන්සේ ලද පූර්ණ ජයග්‍රහණය පිළිබඳව මොහොතකටවත් සිහිපත් නොවීම, මෙම දුක්ඛිත සසර ගමනට ඉන්ධන සපයා ගැනීමක් පමණි. ස්වකීය ඉරණම එය නම්, එය භුක්ති විඳිය යුතුමය. බුදු පියාණන් වහන්සේ යා යුතු මඟ පෙන්වා දී ඇතත් ඒ මඟ ඔස්සේ කිසිවෙකුට වෙනත් අයකු රැගෙන යා නොහැක.

තුම්හෙහි කිච්චං ආතප්පං - අක්ඛාතාරො තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති - ඣායිනො මාරබන්ධනා

(ධ.ප මග්ග වග්ග)

තම තමා විසින් කෙලෙස් තවන වීර්ය කළ යුතුයි. බුදුවරු ඒ සඳහා මඟ කියන්නෝ ය. ඒ මාර්ගයට පැමිණ ධ්‍යාන වඩන්නෝ මාර බන්ධනයෙන් මිදෙති.

You yourself should strive towards perfection. Buddhas are only revealers of the path and strive will be released from the bondage of Mara.

ධර්මානුකූලක පසුබිමක හිඳ ජීවිතය සැළසුම් කරන්නා තමාටම පහනකි. මානසික සුවපත් භාවයට කැමති, මිහිරි වචනයට කැමති, සන්සුන් සිතිවිලිවලට කැමති පුද්ගලයා ස්වකීය ජීවිතය හැඩ ගසා ගනී. ජීවිත කාලය නිසි ලෙස සැලසුම් කරයි. එතුළින් සිය යුතුකම් කලට වේලාවට ඉටුවනවා මෙන්ම අන් අයගේ අයිතිවාසිකම් ද සුරැකේ. සමාජයක යුතුකම් සහ අයිතිවාසිකම් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට බැඳී පවතී. ඒ පිළිබඳව දැඩි අවධානයකින් යුතුව කටයුතු කිරීම ස්වකීය ප්‍රඥාවට සාපේක්ෂ වනු ඇත. ප්‍රඥාව පුද්ගලයා තුළින් විනිවිද දැකිය හැකි ගුණාංගයකි. ප්‍රඥා වර්ධනය ලද හැක්කේ සද්ධර්මය මත පිහිටීමෙන් පමණි.

බුදු පියාණන් වහන්සේ අනු දන වදාළ පරිදි සීල, සමාධි, ප්‍රඥා වශයෙන් බෙදා දක්වා ඇති ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ විනා, ප්‍රඥා වර්ධනය සඳහා වෙනත් විකල්ප මාර්ග නැත්තේමය. අප්‍රමාදීව නිසි මඟට ප්‍රවිශ්ඨ වන්නෝ ජය ටැඹ කරා යති. සෝවාන් මඟට පිළිපන්නෙ නම් එය සක්විති රජකමට වඩා වටිනා බව, විශ්වීය අනුපමේය නායකත්වට පත් වූ බුදු පියාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාළ සේක. එය අත්දැකිය හැක්කේ එම තත්ත්වයට පත්වූවෙකුට පමණි. සදෙව් ලොවට අධිපති සක්විති රජ පවා ධර්මය ගුරු තන්හිලා කටයුතු කරන බව බුදුපියාණන් වහන්සේ ලොවට වදාළහ.

*

නායකත්වය චරිතාංග වශයෙන් බලන කළ විවිධ අර්ථ කථන දිය හැකිය. පිරිසක් පාලනය කිරීම, පිරිසකට මඟ පෙන්වීම නීති රීති, චක්‍රලේඛන, ව්‍යවස්ථා වලට අනුව තීන්දු තීරණ ගැනීම් ඒවාට අනුගත නොවුනවුනට දඬ දඬුවම් පැමිණවීම් ආදී සියල්ලක් නායකත්වය තුළ සූක්‍ෂමව ගැබ්ව ඇති විටින් විට සමාජයට එළි දැක්වෙන ලක්‍ෂණයන් ය. එහෙත් **"උත්තරීතර නායකත්වය"** යනු එයින් ඔබ්බට විහිද යන ශ්‍රේෂ්ඨත්වයකි. **එතුළින් විනිවිද දැකිය හැක්කේ බලවත් බව හා සැපවත් බව තුළින් විනිවිද පෙනෙන පෙර කී ලක්‍ෂණයන් නොවේ. එතුළින් විද්‍යාමාන වන්නේ ප්‍රඥාවන්ත බව, ගුණවත් බව, නැණවත් බව සහ තීක්‍ෂණ බුද්ධිය යි.**

මෙහිදී පිරිසක් පාලනය කිරීමට පෙර තමා පාලනය කර ගැනීම උසස් බව දත යුතුමය. තමා පළමුව සුදුසු ගුණයෙහි පිහිටා අන් අයට අනුශාසනා, උපදෙස් ආදිය ලබාදිය යුතු බවත් එසේ කරන පණ්ඩිතයා නොකෙලෙසෙන බවත් බුදු පියාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

අත්තනාමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ

අතඤ්ඤ මනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො

(ධ.ප අත්ත වග්ග)

Let one establish oneself on the correct path first and then only should be admonish others. Let not the wise man polutes himself.

මෙහිදී තමා පාලනය යනු තම සිත, කය, වචනය පාලනය කර ගැනීමයි. එයි සුපිරිසිදු ලෙසින් පැවතිය යුතුමය. මේ සඳහා ප්‍රඥාව මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දෙයි.

පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස

(මෙය උතුම් දහම නුවණ ඇත්තන්ට ය. නුවණ නැත්තන්ට නොවේ)

මෙය බුදු වදනකි. බුදුපියාණන් වහන්සේ නායකත්වය ලබා දුන්නේ **පුද්ගල මනසට. බුද්ධිය සහ ප්‍රඥාවටයි.** දස බලධාරී බුදු පියාණන් වහන්සේ මනෝ මූලික න්‍යායක්, සුවිශේෂී ක්‍රමවේදයක් ආධ්‍යාත්මික ශක්තිය තුළින් ගොඩනගා ගැනීම නිසා සක්විති රජකමින් ඔබ්බට විහිදී ගිය අනුපමේය නායකත්වයට පත්ව තුන් ලෝකයම සැනසූ අයුරු

කෙතරම් ප්‍රායෝගික ද? විශ්මය ජනක ද? සාර්ථක ද? මෙම නායකත්වය අන් කිසිවක් නොව **බෞද්ධ නායකත්වයයි.**

මහින්දාගමනයේදී, මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජු හමු වූ අවස්ථාව ලක් ඉතිහාසයේ අනුස්මරණීය යි. **තිස්ස** යන නම සවන් ගැටෙනවාත් සමඟ විමසිලිමත් වූ රජ විශ්මයට පත් වුවද, හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සංවාදය කෙතරම් ඵලදායී ද? නායකත්වයට සුදුසු බුද්ධියක් රජතුමා සතු බව අවබෝධ වීමෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ ඔහු තිසරණ සහිත පංචශීලයෙ හි පිහිටුවා ඒ නිර්මල බුදු දහම මෙම පින්බර ලක් මැණියන් හට දායාද කළ සේක.

මෙහිලා මිහින්තලා ගල මුදුනෙහි වැඩ සිටි මිහිඳු මහ රහතන් වහන්සේට අවශ්‍යවුයේ, බුද්ධ ධර්මය වැනි ගම්භීර ධර්මයක් ලක්දිවට දායාද කිරීමේ දී එය දරාගත හැකි නායකත්වයක්, එය සුරක්ෂිත කළ හැකි නායකත්වයක්, රට වාසීන්ගේ ගෞරවාදරයට පත් නායකත්වයක් මෙම ලක්බිමෙහි ඇත්දැයි පරීක්ෂා කර බැලීමට ය. ඇසූ ප්‍රශ්නවලට

රජතුමාගෙන් ලද ප්‍රතිචාර හමුමේ මිහිඳු මහ රහතන් වහන්සේට තහුවරු වුයේ තමන් වහන්සේ පැමිණි අරමුණු සාක්ෂාත් වන බවයි.

රජතුමා සතුව තිබු විනිවිද දැකිය හැකි ප්‍රඥාව පහත සඳහන් වාචික යෝග්‍යතා පරීක්ෂණයෙන් පැහැදිලි වෙයි. ශ්‍රී ලාංකික අප කවුරුත්, අඹ ගසක් තේමාකර ගෙන පැවැත්වූ මෙම සංවාදය හොඳින් අසා ඇත්තෙමු. එබැවින් එම සංවාදය පාඨක සැමගේ යහපත පිණිස ඉංග්‍රිසි භාෂාවෙන් පහත සංගෘහිත ය.

The Dialogue between Arhath Mahinda & the King Devanampiyatissa was at an aptitude test (To test the intelligence: wisdom of the king)

According to history Arhath Mahinda Thero had made an verbal aptitude test to check the intelligence of the king Devanampiyatissa on Poson Poya Day at Mihinthale when both met each other. The dialogue is simple as it appears at the 1st glance. But it is deep. This dialogue is to be understood carefully & sensibly.

Arhath Mahinda	**-**	**What name does this tree bear? . Oh King ?**
The King	-	The tree is called *Mango*
Arhath Mahinda	**-**	**Are there any other mango trees besides this?**
The King	-	Yes,There are many mango trees.
Arhath Mahinda	**-**	**Are there any trees other than this mango tree ….. .. and other mango trees ? Oh.. King ?**
The King	-	Yes, There are many trees.. but,those are not Mango trees.

Arhath Mahinda - And.. .... Are there yet another trees, besides other mango trees and those trees which are not mango trees?

(The king thought for a moment and replied)

The King - O Yes, my Lord .. There is. It’s **this** mango tree.

(The King replied pointing out to the nearest mango tree)

Arhath Mahinda - Oh! Great ruler of men You have a shrewd intelligenc and...You have a judicious Aptitude and .. The catch was in my last question.

Arhath Mahinda the disciple of Buddha: the son of King Ashoka had pleased with the answers and realized that the purpose of his visit would be flourished in Sri Lanka, and made the king first, to go for refuges ***Buddha, Dhamma, and Sangha.****It was successful and flourished in Sri Lanka*

දහැමි නායකත්වයක් තුන් ලොවටම එකසේ ලබාදීමට දසබලධාරී බුදු පියාණන් වහන්සේ සතුව පැවති අධ්‍යාත්මික ශක්තිය, පාරමී බලය කිසිවකට සම කළ නොහැක. එය ඉතාම කාරුණිකය. නිර්මල ය. සුමට සුගම වදන්වලින් පමණක් පරිපෝෂණය වී ඇති බුදු ඔවදන් අනුගාමික චිත්ත සනාතානය තුළට කිඳා බැසීම නිසා ඇතිවන ස්වයං උත්ප්‍රේරකය මගින් ඇතිවන මානසික උත්තේජනය සත්ත්වයා යහමඟට යොමු නොකළේ ද?

බුදු වදන අෂ්ඨ සමන්නාගත බ්‍රහ්මස්වරයෙන් යුක්තය. එය පැහැදිලිය. නිවැරදිය. ඍජු ය. අරුත්බරය. සවනීයය, ගාම්භීරය, නින්නාද දෙයි. හදවත් සනසයි. එම නායකත්වය වටා විශේෂ ආරක්‍ෂා සපයා නැත. හමුදාවක් නැත. අවි ආයුධ ගත් භට පිරිස් නැත. කෙතරම් සුවිශේෂී අද්විතීය නායකත්වයක් ද? ඒ අන් කිසිවක් නොව බෞද්ධ නායකත්වයයි. උත්තරීතර විශ්වීය නායකත්වය එයයි.

*

පසුගිය වසරක අප විසින් සංවිධානය කරන්නට යෙදුණ දීප ව්‍යාප්ත ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයකට ආරාධිත අමුත්තා ලෙසින් සැපැමිණි, පුනරුත්ථාපන කොමසාරිස් ලෙස දීර්ඝ කාලයක් සේවය කොට, නොමඟ ගිය ජවසම්පන්න තරුණයින් දහස් ගණනකට යා යුතු මඟ හෙළි කර දුන්, එමෙන්ම වසර ගණනාවක්ම හමුදා නිලදරුවනට නිසි නායකත්වයක් දෙමින් විනය ගරුක හමුදා භට පිරිසක් රටට දායාද කළ, මේජර් ජනරාල් ආනන්ද වීරසේකර මැති තුමා විසින් 2004 අගෝස්තු මස 21 වන දින, උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යත්වලාභීන් අමතා පවත්වනු ලැබූ දේශනයේ උපුටා ගත් කොටසක් පහත දක්වේ. (සම්පූර්ණ දේශනය 2009 දී අප විසින් මුද්‍රණය කරනු ලැබූ දරිද්‍රතාව හඹා යයි නමැති ග්‍රන්ථයේ අන්තර්ගත ය.)

ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම
SRILANKA-CANADA SCHOLARSHIP FOUNDATION

දේශනයට සවන් යොමු කරන සභාගර්භය

"**නායකත්වය** ගැන නොයෙකුත් ලස්සන සිද්ධාන්ත, චරිතාංග න්‍යාය ගැබ් වෙලා තියෙනවා. ඒ ගැබ් වූ සාරාංශය තරමක් හෝ ඉගෙන ගත් නිසා මගේ හමුදා සේවයත් බොහෝම සාර්ථකව ඉටු කරන්න මට පුළුවන් වුණා. හතළිස් දාහක් පමණ සෙබළු පුහුණු කරන්න හැකි වුනා. තුවක්කු ගත්ත . නා නා චරිවලින් හෙබි දැඩි මනස් ඇති තරුණයන් පුහුණු කරන්න හැකියාව ලැබුණා. **ඒ බෞද්ධ නායකත්වයට** අදාළ **න්‍යාය** මා ඉගෙන ගෙන තිබුණ නිසයි."

"දැන් ප්‍රශ්නයකින් මේ දේශනය පටන් ගන්නවා. **නායකත්වය** යනු කුමක්ද ? අනාගතයේ නායකයින් වෙන්න ඉන්න සිසු දරුවන් කියන්න බලන්න ***What is Leadership ?*** ඔව් කියන්න බලන්න."

ඔව් කණ්ඩායමක් හැසිරවීම, තමා ආදර්ශමත් වීම, සංවිධාන ශක්තිය තිබීම, ඔව් ඒ සේරම කිව්වේ නායකත්වයේ තියෙන චරිතාංග හොඳයි. වාඩිවෙන්න. මේ නායකත්වය ඒ සියලුම වචන වලින් විග්‍රහ කරන්න පුළුවන්. එයින් තේරුම් යන්නේ..

..........තමා මෙහෙයවන කණ්ඩායම.......
තමා දෙන අණට ස්ව කැමැත්තන් ක්‍රිය කිරීමයි.
*මතක තියාගන්න මුළු ජීවිතේටම **එයයි, නියම***
නායකත්වය.
නායකයාට භය කරලා වැඩ ගන්න පුළුවන්.....
***එය සාර්ථක නෑ.** චක්‍ර ලේඛ පෙන්වලා*
*වැඩ ගන්න පුළුවන් **එය සාර්ථක නෑ.......***
ව්‍යවස්ථා උපුටා දක්වමින් වැඩ ගන්න
පුළුවන් එය සාර්ථක නෑ අල්ලසක් දීලා
*වැඩ ගන්න පුළුවන්...... **ඒ කිසිම***
නායකත්වයක් සාර්ථක නෑ......

“ස්ව කැමැත්තෙන් නායකයා පසු පස යනවා නම් මොහු ආදර්ශවත් මොහු අවංකයි මොහු පසු පස ගියොත් අපට ජයග්‍රහණය තියෙනවා මොහු හොඳ මිනිසෙක් මොහු හොඳ නායකයෙක් කියන හැඟීම හදවතට ඇවිල්ලා මනසට කා වැදිලා ඔවුන්ගේ වැඩ කෙරෙනවා නම්, කරනවා නෙමෙයි කෙරෙනවා නම්, අන්න එතනයි. නියම නායකත්වය තියෙන්නේ.”

“**උත්තරීතර නායකත්වයකට අවශ්‍යවන ප්‍රධාන සාධකය** වන්නේ පංචශීලයයි. අවම වශයෙන් මෙම පංචශීලය රැකගන්න තරමට යමෙකුගේ ආධ්‍යාත්මය සුපෝෂණය වී නැත්නම් තමා නායකත්වය දෙන පිරිස තම අණට කීකරු වන්නේ නෑ. ඔහු පීතෘ මුලික පවුලක පියා වන්න පුළුවන්, ගමක, නගරයක, ආයතනයක, පාසැලක, පූජණීය ස්ථානයක, ප්‍රදේශයක සහ රටක ආදී විවිධ ජන සමූහයක නායකයා වන්න පුළුවන් ඔහුගේ අණ පිළිපදින්න අනුගාමී පිරිස සුදානම් නෑ...”

පංචශීලයෙහි පස්වන ශික්ෂාපදය කඩන පියෙකුට බෑ මත් වතුරට යොමු වුන දරුවාට අණ දෙන්න. දුන්නත් වැඩක් නෑ. ඒ නායකත්වය **දියාරු වෙලා ගිහින්. බල රහිත වෙලා.** මත්පැන් පානය කරන කිසිම කෙනෙකුට තම දරු පවුල යහමඟට ගන්න බෑ. ඒ පවුල දිනෙන් දින පිරිහෙනවා. ගමක, රටක පාසලක හෝ වෙනත් ආයතනයක වුවද නායකත්වයේ ගෞරවය මත් වතුර හෝ මත්ද්‍රව්‍ය නිසා කෙලෙසී ඇත්නම් එය නැවත යථා තත්ත්වයට පත්කර ගැනීම අසීරුය.

“අයථා ක්‍රම වලින් මුදල් උපයමින් දිවා රාත්‍රී විවිධ සම්භාෂණ වලට කාලය ධනය විනාශ කරන කිසිවෙකු ළඟ **හතරවන ශික්ෂාපදය** නෑ. බිරිඳට ස්වාමියා එසේත් නැත්නම් ස්වාමියාට බිරිඳ, සත්‍ය වසන් කරනවා, දරු දෙමාපියන් අතර සම්බන්ධය දුරස්ථ වෙනවා. පවුල් තුල එකිනෙකා පිළිබඳ සැකය ඔඩු දුවනවා. ඒ කුටුම්බිය තුළ ද නිසි නායකත්වයක් නෑ. දරුවන්හට නිසි මඟ පෙන්වීමක් නෑ. ආදර්ශමත් අයුරින් සංනිවේදනයක් නෑ. දරුවන් ආයාලේ යනවා.” **නායකත්වයේ ගෞරවය** එහි රැඳී නැත.

සිත කය වචනය සංවර කරගත නොහැක්කා ළඟ **තුන්වන ශික්ෂාපදය** පිහිටන්නේ නෑ. එවිට හතරවන ශික්ෂාපදය කැඩීයන්නේ නොදැනුවත්වමයි. එළිපිට කළ නොහැකි සෑම දෙයක්ම හොර රහසේ ඉටු කර ගැනීමට සැළසුම් කරන්නා තවත් කිහිප දෙනෙක්ව දෙවන

ශික්‍ෂාපදය කඩන්න පොළඹවනවා. එයට අදාලවන්නේ භෞතික සම්පත් පමණක් නොවෙයි. අනුන්ගේ ආධ්‍යාත්මය පවා විනාශ කරනවා. කිසියම් ජන සාමාජයක සාමාජිකයින් විවිධ අයුරින් සොරකමට අවතීර්ණ වී සිටී නම් එහි පාලනය දූෂිත මෙන්ම නායකත්වය අකාර්යක්‍ෂමයි.

සාර්ථක, කාර්යක්‍ෂම නායකයා යනු ධර්ම පථයෙන් ඉවතට නොගොස් අකුසල කර්මවලින් රට බේරාැ ගැනීමේ ක්‍රමවේදය හඳුනන ශ්‍රේෂ්ඨ මිනිස් රත්නයකි. නායකයා වූ කලී නිරන්තරයෙන්ම විවේචනයට පාත්‍ර වන අයෙකි. රටවැසියගේ දෘෂ්ඨී පථය නිරන්තරයෙන්ම ඔහු දෙස එල්ල වී ඇත. බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් පරිදි යමෙක් වැඩියෙන් කථා කරන්නේ නම් ඔහුව විවේචනයට පාත්‍ර වෙනවා. අඩුවෙන් කථා කලත් විවේචනයට පාත්‍ර වෙනවා. කථා නොකර හිටියත් විවේචනයට පාත්‍ර වෙනවා. ඇතැම් අය උද්ගෝෂණය කරනවා. ඒ සියල්ල නායකයා අපේක්‍ෂා කළයුතු අතර ඒ අවස්ථාවනට සරිලන ක්‍රමවේද දියත් කිරීමේ ශක්තිය ද නායකයා සතු විය යුතුයි. **ස්ථානෝචිත ප්‍රඥාව** මෙහිදි මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දෙයි.

බුදුන් වහන්සේ අංගුත්තර නිකායේ විවේචනය කළ යුතු ආකාරය පැහැදිලිව අනු දැන වදාළ සේක. විවේචනයට පෙර **කරුණු 5 ක් පසක් කර ගත යුතු බව එහි පැහැදිලිය.** 1. විවේචනය කරන විෂය සත්‍ය දෙයක් වීම. 2. විවේචනය කරන විෂය තමන්ට යහපතක් දැයි සෙවීම. 3. විවේචනය කරන විෂය අනුන්ට යහපතක් දැයි සොයා බැලීම 4. විවේචනය කරන විෂය විවේචනයට භාජනය කිරීමට සුදුසු කාලයක් දැයි සොයා බැලීම. 5. විවේචනය කරන විෂය මෘදු වචන භාවිතයෙන් සිදු කිරීම, අදාල සත්‍ය කරුණක් මත තමන්ටත් ප්‍රයෝජන අනුන්ටත් ප්‍රයෝජන විෂයයක් ඔස්සේ සුදුසු කල්හි මෘදු වදනින් කරන විවේචනවලට නායකයා කෝපාවිෂ්ඨ නොවී සවන්දීමේ ශක්තියත් නිසි ප්‍රතිචාර ලබාදීමේ ශක්‍යතාවත් නායකයා සතුවන්නේ නම් එම නායකත්ව සාර්ථක නායකත්වයකි.

සාර්ථක නායකත්වයකට අවශ්‍යවන ප්‍රධාන සාධකයක් වන්නේ **බලයයි.** මෙය මුදලට ලබා ගත හැක්කක් නොවේ. එය තමා වෙත ආකර්ශනය කරගැනීමට අවශ්‍ය ක්‍රමවේද ධර්මය තුළ අන්තර්ගතය.

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධා පචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං
(ධ.ප සහස්ස වග්ග)

සීලාදි ගුණයෙන් පිරිපුන් වැඩිහිටියන්හට අභිනන්දනය කරන්නහුන්ගේ එනම් නිතර වැඳුම් පිදුම් කරන්නවුන්ගේ ආයුෂය, වර්ණය, සැපය, බලය යන සතර ගුණයෝ වැඩෙත්.

He who reveres the elders constantly will be blessed with Long life , Beauty(pleasant look) , Happiness and Strength.

මෙයින් අදහස් වන්නේ, සීලාදි ගුණයන්ගෙන් පිරිපුන් වැඩිහිටයන්හට සවන් දෙමින්, ඔවුනට ගෞරව, ප්‍රශංසා වැඳුම් පිදුම් කරන්නන් මෙන්ම නිරතුරුයහ වයෝ වෘද්ධ, ගුණ වෘද්ධ, ඥාන වෘද්ධ අය සමඟ පිළිසඳරෙහි යෙදෙමින් ඔවුන්ගේ සුව දුක් සහ අත්දැකීම් විමසා බලන්නන්ගේ ද **ආයුෂ, වර්ණ, සැප, බල** නැමැති උත්තුංග ධර්මතා හතරක් වැඩෙන බවයි. මෙම ධර්මතා හතර යමෙක් තුළ වැඩීමට නම් ආශිර්වාදය අත්‍යවශ්‍යම සාධකයක් බව මෙයින් ගම්‍ය වේ. කායික රෝගාබාධයන්ට සහ කායික වර්ධනයට බාහිර ඖෂධ වර්ග මගින් සහනය ලැබුවේ වුවද, ආධ්‍යාත්මික සහනය සහ මානසික සංහිඳියාව එලෙසින් ළඟා කරගත නොහැක. ඒ බව බුදු පියාණන් වහන්සේ ආයුවර්ධන කුමරාගේ කථාව ඇසුරෙන් ලොවට වදාළ සේක. වැඩිහිටියන්ට ගරු කිරීමේ ඇති ශ්‍රේෂ්ඨත්වය සහ එයින් ලද හැකි ඵලදාව මෙලෙස මිනිස් මනසට ඍජුවම කා වැද්දීමට සමත් අසම සම ශ්‍රේෂ්ඨ නායකයෙකු වූයේ නම් ඒ සම්මා සම්බුදු වරයෙක්මය. මෙම **උත්තරීතර විශ්වීය නායයකත්වයට කාහට නම් අභියෝග කළ හැකි ද?**

ආයුෂය, වර්ණය, සැපය, බලය යනු සියල්ලෝම තම තමාගේ ජීවිත කාලය තුළ ස්වකීය පැවැත්ම වෙනුනේ අසීමිත ලෙස සොයමින් යන ධර්මතාවයන් හතරකි. ඒ සඳහා කරන කැපකිරීම් සහ දරන වියදම් සුළු පටු නොවේ. කායික රෝගයනට පිළියම් කරමින් ආයුෂය රැක ගැනීමට මිනිසා දරණ වෙහෙස අප්‍රමාණය. ඒ වෛද්‍යවරුන්ගේ පිහිට පතමිනි. බුදු පියාණන් වහන්සේ ප්‍රතිකර්ම ලබා දී ඇත්තේ මනසට ය. ඒ මානසික සුවයට සාපේක්ෂව ශාරීරක සුවය ලැබෙනා බව බුදු පියාණන් වහන්සේ අවබෝධ කරගත් හෙයිනි. එම නිර්ණායකයන් සොයා වදාළේ මීට වසර දෙදහස් හයසිය ගණනකට පෙර, සාරා

සංඛෙයාාය කල්ප ලක්ෂයක් පුරා සිදු කරනු ලැබූ ආර්ය පර්යේෂණයක ප්‍රතිඵල මතය. ඒ කිසිවක් මේ දක්වා කිසිදු විද්‍යාඥයෙකුට හෝ සත්‍ය ගවේෂණයෙකුට හෝ අසත්‍ය බවට තහවුරු කිරීමට සාක්ෂි ලැබී නැත. අඩු තරමින් සංශෝධනය කිරීමට හෝ දෙයක් බුදු වදන් තුළ නැත. බුදු **වදන් සියල්ලම කේවල පරිපූර්ණය.**

මෙම ගාථාවෙහි සඳහන් වන වර්ණය ද බාහිර ආලේපන මගින් ලබා ගත හැකි වර්ණ නොවේ. **"Face is the mirror of his heart "** මෙම ඉංග්‍රිස ප්‍රස්ථා පිරුළෙන් ද සඳහන් වන්නේ මුහුණ හදවතෙහි කැඩපතක් යන්නයි. **ඊර්ෂ්‍යා, ක්‍රෝධ, මද, මාන නොමැති** මෘදු හදවතක් යමෙකු සතු නම් එය ඒ පුද්ගලයාගේ මුහුණෙන් නිරූපණය වෙයි. එය වර්ණවත් ය. ප්‍රසන්න ය. සුනිමලය. දකින්නවුන්ගේ පවා නෙත් සිත් ඇදී යයි. එවන් වර්ණවත් භාවයක් මුව කමළ තුළින් දිස්වන්නේ නම්, ඒ හදවතේ ඇති පිරිසිදු භාවය විනා, එය රූපලාවණ්‍යයන්ගේ හාස්කමක් නොවේ. කෘතීම වර්ණවත් භාවය, ධර්මයේ පෙන්වා දෙන ස්වභාවික වර්ණයට හාත්පසින්ම වෙනස්ය. මෙම වර්ණ වෙනස අවබෝධ කර ගත හැක්කේ ද ප්‍රඥාවෙන් පමණි.

මෙම ගාථාවෙහි සඳහන් වන සැපය ද, සුවිශේෂී සැපයකි. සාමාන්‍ය පෘතග්ජනයින් සැපය ලෙස සලකන්නේ, ගෙවල්-දොරවල්, ආහාර-පාන, යාන-වාහන, ආදී භෞතික සම්පත්වල අනූණ භාවයයි. එහෙත් ශ්‍රැතවත් පෘතග්ජනයාගේ හද තුල ඇත්තේ ඉන් ඔබ්බට ගිය සැපයකි. ධර්මයේ පෙන්වා දෙන අන්දමට එය සතර ආකාරයකි. **අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ, අනවජ්ජ සුඛ** යනුවෙනි. **අත්ථි සුඛ** යනුවෙන් අදහස් වන්නේ තමා ලද සම්පත් ප්‍රමාණවත් බවයි. **භෝග සුඛ** යනුවෙන් අදහස් වන්නේ තමා ලද ධාන්‍ය භෝග ආදිය ප්‍රමාණවත් බව දැනෙන විට ඇතිවන සැපයයි. **අණන සුඛ** යනු තමා කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට ණය නැති බව දැනෙන විට ඇතිවන සැපයයි. **අනවජ්ජ සුඛ** යනුවෙන් අදහස් වන්නේ තමා ඉනාමත් සාධාරණ ලෙස, තමන්ගේ වීර්යයෙන්ම, වෙහෙස මහන්සි වී උපයා සපයා ගත් දෙයින් සිදුකරගත් පුද පූජා සහ එයින් රැස්කර ගත් පින්, කුසල් ආදිය පිළිබඳව සිහිවන සැම මොහොතකම ඇතිවන සතුටයි. ඒ වූ කලී මිනිස් සන්තානය තුළ උපදවා ගත හැකි **අනවජ්ජ සුඛයයි.** මෙවන් **සැප හතරක් කිසිම භෞතික වස්තුවක් තුළ නැත.**

මෙම ගාථාව තුළින් අවසානයේ පෙන්වන "බලය" කුමන ආකාරයේ අදෘශ්‍යමාන බලවේගයක් දැයි විමර්ශනාත්මකව අවබෝධ කර ගත යුතුමය. ධර්මය දැන, දැක ගැඹුරින් අවබෝධ කරගැනීමට වෙහෙසෙන්නෙකුට මෙම බලය ඉතා පැහැදිලිව දෘශ්‍යමාන වනු ඇත. ඒ සඳහා *"ප්‍රඥාව"*මා හැඟි භූමිකාවක් නිර්මාණය කර දෙයි.

සීලාදී ගුණයෙන් වැඩි වයෝ වෘද්ධ, ගුණ වෘද්ධ, උතුම් පුද්ගලයින්ට අභිනන්දනය කරන්නන්, එනම් ඔවුන්ට සමීපව, යටහත් පහත් ගති පැවතුම් ඇතිව වැඳුම් පිදුම් කරමින්, ඔවුන්ගේ සුව දුක් විචාරමින්, ඔවුන්ට ගෞරව ප්‍රශංසා කරමින්, දානම, පෝෂණය, භෞතික සම්පත් ආදී ඔවුන්ගෙන් ලද යම් දෙයක් වේ නම් එය ද අගයමින්, ඔවුන්ගේ අත් දැකීම් ආදියට කරුණාවෙන් සවන්දෙමින්, ඒවායින් ලද හැකි ආදර්ශ උකහා ගනිමින් ඔවුන් සමඟ නිරන්තරයෙන් පිළිසඳරෙහි යොදන්නවුන්ගේ " ආයුෂය, වර්ණය, සැපය, බලය" යන ධර්මතා හතරම වර්ධනය වන බව ධර්මයෙහි අන්තර්ගතය. මේ සියල්ලක් තම තමාගේ ප්‍රඥාවට අනුව තම තමාට අත් දැකිය හැක. ඒ ධර්මයේ පවතින "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී" ගුණයයි.

"One,who constantly, respect, worship, and venerate the ethically characterized elders ; restricted with moral virtues, will be blessed with Long life , Beauty (Pleasant look), Happiness & discriminate Strength to control anything or anyone due to the improving intellect." This is an eternal truth.

*

"The extracts taken from the speech, mainly based on "The Buddhist Leadership" which was delivered by Major General Ananda Weerasekara, at the 7th Awards Ceremony of SLCSF, held at Battaramulla Siri Sudassanaramaya on 21st August 2004 being the Guest Speaker of the Occasion."

මෙම සඳහම් ග්‍රන්ථය 2023 වෙසක් පුර පොහොය නිමිත්තෙන්
ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ
ආරම්භක සම්බන්ධීකරණ ලේකම්
මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා
සීතා ගුණතිලක මැතිණිය විසින්
නොමිලයේ බෙදාහැරීම පිණිස
සම්පාදනය කර මුද්‍රණය කරවන ලදී.

මෙම ධර්ම දානය
අපවත් වී වදාළ බුද්ධංගල ආනන්ද හිමිපාණන්ට
උපහාරයක්ම වේවා !!!

BLESSINGS TO THE WORLD

දෙවො වස්සතු කාලෙන
සස්ස සම්පත්ති හේතුච
පීතො භවතු ලොකොච
රාජා භවතු ධම්මිකො

Devo vassatu Kalena
Sassa sampatti hetu ca
Phito bhavatu loko ca
Raja bhavatu Dhammiko

May the rains fall in due season !
May there be a rich harvest !
May the world prosper !
May the ruler be righteous !

නිසි කලට නිසි පරිදි වැසි ලැබ පොළෝ තලයෙහි පතිත වේවා!
භෝග අස්වනු කෙත් හි වැඩි එල දරා ගනිමින් සාර වේවා!
ලොවට සිරිකත කැඳවමින් සැම දෙනාගේ සිත් පහන් වේවා!
බුදුපියා දෙසූ පරිද්දෙන් ලොව පාලනය ධර්මිෂ්ඨ වේවා!

***

මිනිසත් භවයේ - නිසි ඵල ලබමු

දිවි මඟ මාරකය, බලවත් අභියෝග
සිහි - බුද්ධිය පමණි අපහට සහයෝග
නිසි ලෙස සිටින මුත්, දස අත ප්‍රයෝග
මිහි පිට නොමැත සරණක්, මර බලවේග

ගැලවෙන්නට ඇති එකම මඟ බුදුපියාණෝ
දැන, දැක සියලු තතු දුක, ඒ නියමුවාණෝ
සැනසෙන්නට හෙළි කලා මග වීරයාණෝ
ලැබ ගනු පිහිට, මත ඒ කාරුණිකයාණෝ

අකුසල් මුල් තුනක් ඈත දුරු කර ගන්න
පෑමෙන් එඩිය ඔබටත් හැක ජයගන්න
රන්මසු එකතු කරනා සිත මැඬලන්න
පුළුවන් වුවොත්... ජය ඔබටයි දැන ගන්න

නිසි මග දකින්නට නෙත් සිත් පෑදේවා!
කිසි විටෙකවත් මග වරදා නොගනීවා!
රිසි ලෙස දිවි ගමන දහමින් සුරැකේවා!
විසි සූ ගුණ බලය දැක, දුක් නිම වේවා!

***

පුණ්‍යානුමෝදනාව

ධර්මාවබෝධයට රුචිකත්වයක් දක්වන සමාජයකට
තිළිණ කිරීම පිණිස සකසන ලද මෙම සදහම් ග්‍රන්ථය,

සම්පාදනය කර මුද්‍රණය කරවා, සිදු කරනු ලබන මෙම ධර්මදානයේ කුසලානිශංස, අප දෙපාර්ශවයේ, දිවියෙන් සමුගත් සෙනෙහෙබර දෙමාපියන්ටත්, ඥාති හිත මිත්‍රාදීන්ටත්, අප ලේලි දියණියන්ගේ දයාබර මෑණියන් දෙපළටත්

නිර්වාණ සුවය සාක්ෂාත් කර ගැනීමට හේතු වේවා !!!

එමෙන්ම මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී නොයෙකුත් අයුරෙන් මාහට සහාය ලබාදෙමින්, එක් වදනකින් හෝ මා දිරිමත් කරවනු ලැබූ සත්පුරුෂවුත්, කල්‍යාණවූත්, සැමදෙනා වෙත ද මේ පින් අනුමෝදන් කරවමි. අනුමෝදන් වේවා! ඔවුන්ගේ සියලු යහපත් අපේක්ෂාවන් ද එලෙසින්ම ඉෂ්ඨ සිද්ධ වේවා! යි පතමි.

අවසානයේදී මෙම සත්කාර්යයෙන් රැස්කර ගන්නා වූ සියලුම පින්, කුසල් ඔබ අප සැමටත්,

මෙම ඝෝර සංසාරයෙන් එතෙර වීම සඳහා,

අති උතුම් වූ පරම රමණීය නිර්වාණ සුවය සාක්ෂාත් කර ගැනීමට හේතු වාසනා වේවා!

සාධු! සාධු! සාධු!

පසුවදන

උත්තරීතර චරිතයක සැබෑ තොරතුරු ජීවමාන
ලෙස එළිදැක්වෙයි,

මාංශමය දෙනෙතින් බලා නුවණැස මෙහෙයවා
පරිශීලනය කරද්දී ...

ප්‍රඥා ඇසෙහි නිම් වළලු ඔස්සේ විහිදෙන
ආලෝක කිරණයන්හි
තීව්‍රතාවයට සාපේක්ෂව
මනස පුබුදුවාල යි.

ධම්මපීති සුඛං සෙති - විප්පසංනෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ - සදා රමති පණ්ඩිතො

(ධ.ප.79)

දහම් රසය බොන තැනැත්තා පහන් සිතින් සුවසේ වෙසෙයි. පණ්ඩිතයා ආර්යයන් විසින් ප්‍රකාශ කරන ධර්මයෙහි සැමදා ඇලේ.

He who takes delight in the Dhamma lives in peace in serene mind. The wise man always rejoices in the Dhamma revealed by the Ariyas.

This book is allowed for anyone to re-print in full or in parts for free distribution.

(ISBN 978-955-50082-7-3)
කර්තෘ ප්‍රකාශනයකි.



- සාධු දැක්ම යනු කවරේද ?
  What is the Excellent View?
- මෙම දැක්ම පියවි නෙතට ගෝචරද?
  Is it be wedged by the naked eyes?
- අනුපමේය නායකත්වය යනු කුමක්ද?
  What is the supreme leadership?
- එය සමස්ථ විශ්වයටම බලපාන්නේ කෙසේද?
  How is it influence to the entire universe?
- විශ්වීය නිධානය යනු කුමක්ද?
  What is the treasure of the universe?
- එම නිධානය කුමන ස්ථානයක කෙසේ පහළවීද?
  Where was it derived and how originated?
- මෙම නිධානයේ විශේෂ වැදගත්කම කුමක්ද?
  What is the special significance of this jewel?
- මෙම නිධානයේ උරුමය කාහටද? අයිති කරගත හැක්කේ කෙසේද?
  To whom is it inherited and how to posses it?
- එහි වටිනාකම තක්සේරු කළ හැකිද?
  Is it possible to assess?

ධර්මනානුකූල පිළිතුරු පාලි, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අන්තර්ගතයි.
Answers according to Dhamma are included in pali,Sinhala & English Languages

මෙම ග්‍රන්ථයෙහි පාලි පාඨයන්හි ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තනයන්, මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා, කොළඹ 07, ඩී.එස්. සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාමලත් ප්‍රවීන ඉංග්‍රීසි ආචාරිණී

කේ.එස්.එන්. ගුණතිලක මැතිනිය විසිනි.

සාධු දැක්ම The Excelxlent View 10